# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

එකොළොස්වන කලාපය - 2020 දෙසැම්බර්

ISSN 1800-1459
eISSN 2673-1177

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

## එකොළොස්වන කලාපය - 2020 දෙසැම්බර්

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනයකි

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

එකොළොස්වන කලාපය 2020 දෙසැම්බර්

ISSN 1800-1459

eISSN 2673-1177

ප්‍රථම මුද්‍රණය: 2020 දෙසැම්බර්

**සංස්කාරක** : ආචාර්ය චම්පා එස්. ද සිල්වා

**සියලු ම විමසීම්**

සංස්කාරක

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

තැ.පෙ. 02

බෙලිහුල්ඔය

දුරකථන/ෆැක්ස් - 045 22 80013

විද්‍යුත් තැපැල - sjseditor@crkd.sab.ac.lk

පරිගණක පිටු සැකසුම : ආචාර්ය සධීර බණ්ඩාර

සම්න්ධීකරණය සහ සංස්කරණ සහයක : එස්. එම්. එෆ්. ෂෆ්නාස්

මුද්‍රණය :

ප්‍රකාශනය : ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

බෙලිහුල්ඔය

## සංස්කරණ ප්‍රතිපත්තිය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය වූ කලී අඛණ්ඩ ව වාර්ෂික ව පළ වන විමර්ශිත සඟරාවකි. ඕනෑ ම විෂය ක්ෂේත්‍රයකට අදාළ ව සිංහල භාෂාවෙන් රචිත, පුරෝගාමී ඥානයක් සම්පාදනය කෙරෙන, උසස් ප්‍රමිතියෙන් යුතු ලිපි මෙහි පළ කෙරේ. සියලු ම ලිපි ප්‍රවීණ විමර්ශන මඬුල්ලකට යොමු කෙරෙන අතර ආරාධිත ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන්ගේ ලිපි සංස්කාරක මණ්ඩලයේ විමර්ශනයට පමණක් යොමු කෙරේ. සඟරාවේ පළ කෙරෙන ලිපිවල අන්තර්ගතය පිළිබඳ වගකීම ඒ ඒ ලේඛකයන් සතු ය.

## සංස්කාරක මණ්ඩලය


මහාචාර්ය ආර්. එම්. ඩබ්ලිව්. රාජපක්ෂ

මහාචාර්ය මනෝජ් ආරියරත්න

මහාචාර්ය කේ. වී. දීපානි එදිරිසූරිය මැණිකේ

මහාචාර්ය ඒ. සරත් ආනන්ද

ආචාර්ය පී. කේ. චම්පා එස් ද සිල්වා

මහාචාර්ය ආර්. ඒ. ඩී. ප්‍රියංකා වීරසේකර

සම්බන්ධීකරණ සංස්කාරක : ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය ආර්. සී. පල්ලියගුරුගේ

ඉංග්‍රීසි භාෂා සංස්කාරක : ආචාර්ය මහේෂ් හපුගොඩ

# සංස්කාරක සටහන

සිංහල භාෂාවෙන් ඥාන සම්ප්‍රදානය කෙරෙන ශාස්ත්‍රීය සඟරා දුර්ලභ මෙවන් කාල පරිච්ඡේදයක සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහයෙහි 11 වන කලාපය මෙසේ සමර්පණය කිරීමට ලැබීම සතුටුදායක කරුණකි. මෙම ශාස්ත්‍රීය සංග්‍රහය වෙත සබුද්ධිමතුන්ගේ විශේෂ අවධානයක් යොමු වෙමින් පවතින බව අප වෙත ලැබෙන ශාස්ත්‍රීය ලිපිවලින් අවබෝධකර ගත හැකි ය. එසේ යොමු කෙරෙන සියලු ශාස්ත්‍රීය ලේඛන ප්‍රවීණ විමර්ශක මඩුල්ලක් වෙත යොමු කෙරෙන අතර ඔවුන්ගේ නිර්දේශ ප්‍රාකාර ව විධිමත් ක්‍රමවේදයක් යටතේ පළ කිරීම සඳහා ලිපි තෝරා ගැනුණු බව සඳහන් කළ යුතු ය. තව ද ගෝලීය වශයෙන් සමස්ත මානව වර්ගයා ම අති ඛේදනීය වකවානුවක දිවි ගෙවන මෙම කාලයෙහි ශාස්ත්‍රවන්තයින් වඩ වඩාත් පර්යේෂණයන්හි නිමග්න වීම කළ යුතු එක් කාර්යයක් ලෙස සැලකිය හැකි ය. ස්වාභාවධර්මයට සාපේක්ෂ ව මනුෂ්‍ය ජීවිතයෙහි පවත්නා ශූන්‍යත්වය හා අල්පත්වය අප විඳිමින් සිටින මේ මොහොත එක් අතකින් ශාස්ත්‍රයන්ගේ අභිවෘද්ධිය සඳහා යෙදවීම අර්ථවත් ය.

පර්යේෂණ ලිපියක අන්තර්ගත විය යුතු මූලික කරුණු පිළිබඳ ව අවධානය යොමු කරමින් ක්‍රමවත් සංස්කරණ ප්‍රතිපත්තියක් යටතේ මෙම ලිපි සියල්ල පළ කෙරෙන අතර බොහෝ දුෂ්කරතා හේතු කොට ගෙන මෙම සඟරාව එළි දැක්වීමේ කිසියම් ප්‍රමාදයක් ද සිදු විය. කෙසේ වෙතත් ශාස්ත්‍රීය කර්තව්‍යයන්ට දායක වීමෙහි ලාලසාවෙන් යුක්ත ව ලිපි සම්පාදනය කළ ශාස්ත්‍රවන්තයින්ට ද මෙහි දී කෘතවේදිත්වය පළ කළ යුතු ය.

මෙම සද්කාර්යය සඵල කරගනු වස් නායකත්වය සැපයූ වැඩ බලන උපකුලපති වශයෙන් කටයුතු කළ කළමනාකරණ අධ්‍යයන පීඨයෙහි පීඨාධිපති මහාචාර්ය අතුල ඥානපාල මහතාටත්, වත්මන් උපකුලපති මහාචාර්ය උදය රත්නායක මහතාටත් මේ අවස්ථාවේ දී ප්‍රණාමය පුද කළ යුතු ය. එසේ ම මෙම ශාස්ත්‍රීය කර්තව්‍යය සඳහා කැප වන ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය පර්යේෂණ හා දැනුම ව්‍යාප්ත කිරීමේ ඒකකයෙහි අධ්‍යක්ෂ මහාචාර්ය චන්ද්‍රිකා දිසානායක මහත්මියටත්, මෙහි පළ කෙරෙන ලිපි විමර්ශනය කළ විද්වතුන්ටත්, නිරන්තරයෙන් මෙම කටයුත්තෙහි සාර්ථකත්වය පිණිස කැපවී කටයුතු කරන එස්. එම්. එෆ්. ෂෆ්නාස් මෙනවියවත් කෘතවේදී ව සිහිපත් කරමි. මෙම සත්කාර්යයට පූර්ණ දායකත්වය නොමසුරු ව ලබා දෙමින් සමස්ත සඟරාවෙහි පරිගණක පිටු සැකසුම කළ ආචාර්ය සධීර බණ්ඩාර මහතාට අපගේ විශේෂ ස්තුතිය පිරිනැමිය යුතු ය. එමෙන් ම මෙම සඟරාවෙහි ලිපිවල අන්තර්ගත ඉංග්‍රීසි බසින් රචිත සාරසංක්ෂේපය සංස්කරණය කොට දුන් ආචාර්ය මහේෂ් හපුගොඩ මහතාටත් අපගේ විශේෂ ස්තුතිය පිරි නැමෙ යි. තව ද මෙම කර්තව්‍යයේ දී මා හට උපකාරී වූ චතුරංගිකා, දිනිති, ශර්මිලා සමරවීර යන හිතවතුන්ට ද අපගේ ප්‍රණාමය හිමි වේ.

සබරගමුව ප්‍රදේශයෙහි ඥාන ගවේෂණයෙහි කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් ලෙස පවතින අප විශ්වවිද්‍යාලය ඥාන ගවේෂණය සහ ඥාන සම්ප්‍රදානය උදෙසා ගනු ලබන මෙවන් ශාස්ත්‍රීය මෙහෙවරයන් තව දුරටත් සුපෝෂණය කිරීම සඳහා විද්වත් ඔබ සැමගේ සහයෝගය අපේක්ෂා කෙරෙන අතර අපගේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ ගුණාත්මක බවින් පරිපූර්ණ ශාස්ත්‍රීය සඟරාවක් වශයෙන් මෙය සමාජ ගතවනු දැකීම ය.

**ආචාර්ය චම්පා එස්. ද සිල්වා**
**ප්‍රධාන සංස්කාරක**
**සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය.**

# ලිපි සම්පාදකයෝ

**ප්‍රියාන් ආර්. විජේබණ්ඩාර**
සන්නිවේදන උපදේශක, සොලිඩරිටි සෙන්ටර් ශ්‍රී ලංකා

**කේ. පී. කේ. සඳමාලි**
ලේඛකාධිකාරී, ගම්පහ ප්‍රදේශීය කාර්යාලය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

**එම්. ටී. එස්. ඩී. කුරේ[1] සහ එච්. එම්. එස්. ප්‍රියනාත්[2]**
[1]ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
[2]මහාචාර්ය, ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**එස්. එච්. එස් එම්. සිරිවර්ධන[1] සහ පූජ්‍ය පින්නවල සංඝසුමන හිමි[2]**
[1]කථිකාචාර්ය (කපිතන්) අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා යුධ හමුදා විද්‍යාපීඨය, දියතලාව
[2]ආචාර්ය, ශ්‍රී ලංකා යුධ හමුදා විද්‍යාපීඨය, දියතලාව

**ජේ. පී. සී. ආර්. බී. නවරත්න[1] සහ එම්. එස්. එම්. එල්. කරුණාරත්න[2]**
[1]මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යාපීඨය, ශ්‍රී ලංකා රුහුණ විශ්වවිද්‍යාලය
[2]ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යාපීඨය, ශ්‍රී ලංකා රුහුණ විශ්වවිද්‍යාලය

**පී. ජී.එන්. නිල්මිණි[1] සහ ජී.ආර්.එස්.ආර්.සී. සමරවීර[2]**
[1]ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය, සබරගමුව විශ්වවිද්‍යාලය
[2]ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය, සබරගමුව විශ්වවිද්‍යාලය

**කුමුදු කරුණාරත්න රණවීර**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

# පටුන


| පරිච්ඡේදය | | පිටු අංකය |
|---|---|---|
| 1 | ගෝලීය ත්‍රස්තවාදයේ ලංකාගමනය: ප්‍රචණ්ඩත්වයේ දේශපාලනය යළි වරනැගීම හෙවත් අප්‍රේල් 21 ට පසු ලංකාව<br>**ප්‍රියාන් ආර්. විජේබණ්ඩාර** | 1 |
| 2 | සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාව පිළිබඳ ආර්ථික භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයක්: මාතර දිස්ත්‍රික්කයේ පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්<br>**කේ. පී. කේ. සඳමාලි** | 12 |
| 3 | ආයතනයක කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව පාරිභෝගික තෘප්තියට ඇති කරන බලපෑම: ශ්‍රී ලංකාවේ මූල්‍ය සමාගමක සේවාලාභී පාරිභෝගිකයින් ඇසුරෙනි<br>**එම්. ටී. එස්. ඩී. කුරේ සහ එච්. එම්. එස්. ප්‍රියනාත්** | 21 |
| 4 | මිරිදිය වගුරු වනාන්තර පරිසර පද්ධති හායනය කෙරෙහි මානව ක්‍රියාකාරකම්වල බලපෑම: වලව්වේවත්ත වතුරාන වගුරු වනාන්තරය ආශ්‍රිත ජෛව භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයක්<br>**එස්. එච්. එස්. එම්. සිරිවර්ධන සහ ආචාර්ය පූජ්‍ය පින්නවල සංඝසුමන හිමි** | 31 |
| 5 | මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ අවකාශීය වෙනස කෙරෙහි බලපානු ලබන සාධක සහ සංරක්ෂණ අවශ්‍යතාව: ඉහළ කළු ගඟ ජල පෝෂක ප්‍රදේශයේ බලවනාව ඔය ආශ්‍රිත ව කරන ලද අධ්‍යයනය<br>**ජේ. පී. සී. ආර්. බී. නවරත්න සහ එම්. එස්. එම්. එල්. කරුණාරත්න** | 40 |
| 6 | ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් ව ශ්‍රී ලංකාවේ වැඩිහිටි ශ්‍රමිකයින්ගේ ඉපැයීම් සඳහා බලපාන සාධක පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනය<br>**පී. ජී.එන්. නිල්මිණි සහ ජී.ආර්.එස්.ආර්.සී. සමරවීර** | 54 |
| 7 | යටත්විජිත ලංකාවේ සමාජ ස්තරණය: නූතන සිංහල ප්‍රබන්ධ කතාව ආශ්‍රිත විමර්ශනයක්<br>**කුමුදු කරුණාරත්න රණවීර** | 64 |

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
එකොළොස්වන කලාපය 2020 දෙසැම්බර්
පිටු 1-11
ISSN 1800-1459 eISSN 2386-2041
© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ගෝලීය ත්‍රස්තවාදයේ ලංකාගමනය: ප්‍රචණ්ඩත්වයේ දේශපාලනය යළි වරනැගීම හෙවත් අප්‍රේල් 21 ට පසු ලංකාව

(The Alarm of the Arrival of Global Terrorism: Reemergence of Politics of Violence in the Sri Lanka after Easter Sunday attacks)

ප්‍රියාන් ආර්. විජේබණ්ඩාර

කොළඹ විශ්වවිද්‍යාලයීය, ශ්‍රීපාලි මණ්ඩපය
priyaravije1629@gmail.com

**සාරසංක්ෂේපය**

2019 අප්‍රේල් 21 පාස්කු ඉරිදා සිදුවූ ප්‍රහාරය මගින් සංකේතවත් වූයේ ශ්‍රී ලංකාව ඉතිහාසයේ පළමු වරට ගෝලීය ත්‍රස්තවාදය හා සහසම්බන්ධ වූ බවයි. 'ගෝලීයකරණය' සංකල්පයක් ලෙස පිළිගැනීම හෝ නොගැනීම මෙන් ම එහි නවලිබරල් ලෝක ආර්ථිකයේ පදනම පිළිබඳ විසංවාද පසෙක තිබිය දී කේන්ද්‍රයේ රටවල පැවති ඉස්ලාම් අන්තවාදී ත්‍රස්තවාදය මේවන විට පරිධියේ රටවල අභ්‍යාස වෙමින් තිබේ. එයට ජාත්‍යන්තර ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනික සාධක බොහොමයක් බලපා ඇති බව සැබෑවකි. ඒ ඒ රටවල ජාතිකත්වයන්, සංවර්ධනයේ ගතිකයන්, සංස්කෘතික පසුගාමිත්වයන්, මෙන් ම දේශපාලන නායකත්වය, පුරවැසි සහභාගිත්වයේ ගැටලු තීරණාත්මක වන්නට ද හැකි ය. ලංකාවට ද මේ සියල්ල අඩු වැඩි වශයෙන් අදාළ ය. ඒ සියලු සාධක ගැඹුරින් අධ්‍යයනය කළ යුතු වුව ද මෙහිලා අප විසින් උත්සාහ ගනු ලබන්නේ ගෝලීය ත්‍රස්තවාදයේ අරමුණු හා අභිමතාර්ථයන් දේශීය දේශපාලන සැකැස්මේ අවශ්‍යතාවන් හා සමපාතවීමේ ස්වරූපයයි. එනම් අයි. එස් ත්‍රස්තවාදී ප්‍රහාරය යනු අහම්බයක් නොව අනිවාර්යයක් ව පැවති බවයි. මෙම සංසිද්ධිය මහා ඛේදවාචකයක් ලෙස ලාංකේය ඉතිහාසයට එක් වුව ද එමගින් ලාංකේය මෙන් ම ලෝක දේශපාලනයට උගත හැකි පාඩම් බොහෝ ය.

කේන්ද්‍රීය වචන: ගෝලීයකරණය, ත්‍රස්තවාදය, නවලිබරල්කරණය, ප්‍රචණ්ඩත්වය, වාර්ගිකත්වය

The attacks which took place on April 21st 2019 Easter Sunday signaled Sri Lanka's interconnection with global terrorism for the first time in history. Despite the discourse about the acceptance or rejection of globalization as a concept and its basis in the neo-liberal world economy, Islamist extremism which was prevalent in the core countries has now moved to the periphery. It is also evident that international economic, social, cultural and political factors have influenced it. The nationalities, dynamics of development, cultural backwardness, as well as issues pertaining to the political leadership and citizens' participation in those countries may have played a crucial role in this. All of these are more or less relevant to Sri Lanka as well. Although all of these factors need to be studied in depth, here we are trying to determine whether the aims and objectives of global terrorism coincide with the nature of needs of the local political establishment. This paper derives that the Islamic State terror attacks were not accidental but inevitable. Although this phenomenon will go down as one of the greatest tragedies in Sri Lanka's history, it teaches us many a lessons for Sri Lankan and world politics.

Key words: Globalization, Terrorism, Neo-liberalization, Violence, Ethnicity

## හැඳින්වීම

2019 අප්‍රේල් මස 21 වන දින පාස්කු ඉරිදාවේ පෙරවරුවේ කොළඹ පිහිටි සුපිරි හෝටල් ද්විත්වයක් හා කතෝලික දේවස්ථාන කිහිපයක් ඉලක්ක කර ගනිමින් එල්ල වූ බෝම්බ ප්‍රහාරය පොදුවේ ලාංකේය සමාජය ම තිගැස්මකට හා භීතියට පත් කළ ක්ෂිතිමය අත්දැකීමකි. එය මරාගෙන මැරෙන බෝම්බකරුවන් විසින් එල්ල කරන ලද ප්‍රහාරයක්වීමත්, ඔවුන් අන්තවාදී ඉස්ලාම් සංවිධානයක සාමාජිකයින් බැව් හඳුනාගැනීමත්, අවසාන වශයෙන් එම ප්‍රහාරයේ වගකීම අයි.එස් සංවිධානය විසින් බාරගැනීමත් යනු මෙම සංසිද්ධිය යම් පමණකට හෝ හැඟවුමක් බවට පත්කර ගැනීමට රුකුලක් වූ බව පිළිගත යුතු ය. එහෙත් එසේ වූ පමණින් සෑහීමකට පත්වීමට බහුතර ලාංකේය සිංහල-බෞද්ධ ප්‍රජාවට නොහැකි විය. එහි තාර්කික අවසානය වූයේ මැයි 13 දා එනම් බෝම්බ ප්‍රහාරයෙන් දින 22ට පසු අවස්ථාවාදී දේශපාලනඥයින් හා ඔවුන්ගේ හෙංචයියන් විසින් මෙන් ම වගකීම් විරහිත ජනමාධ්‍ය භූමිකාව විසින් උසිගන්වන ලද අන්තවාදී සිංහල ජනයා විසින් මුස්ලිමුන්ට එරෙහි ව ප්‍රචණ්ඩත්වය මුදාහැරීම ය. මෙම පශ්චාත් බෝම්බ ප්‍රහාර ප්‍රචණ්ඩත්වය විසින් ජීවිත හානි සිදුවූයේ අවම වශයෙන් වුව ද, සිදුවූ දේපළ හානිය ඉමහත් ය. 2009 මැයි 17 වන දින පුරා තිස්වසරකට ආසන්න කාලයක් ලංකාවේ පැවති සිවිල් යුද්ධයේ අවසානය සනිටුහන් කිරීමත් සමගින් ලාංකේය දේශපාලන සංස්කෘතික සිතියම යළි අඳින්නට සිදුවූ පරිද්දෙන් ම 2019 අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසු ලාංකේය දේශපාලන සිතියම යළි සකස්වීම ආරම්භ වූ බව කිව හැකි ය.

ලාංකේය ඉතිහාසය පුරා ම සිංහල-මුස්ලිම් ගැටුම් ඇති වූ අවස්ථාවන් කිහිපයක් දැකිය හැකි වුවත්, ඒ සෑම අවස්ථාවක දී ම සුළු ප්‍රදේශයක යම් නිශ්චිත කාරණයක් පාදක කරගනිමින්, ඉතා සුළු පිරිසක් ඉලක්ක කර ගනිමින් ඉතා කෙටි කලක් පමණක් ක්‍රියාත්මක වූ ගැටුම් බැව් කිව හැකි ය. එහෙත් මෙවර සංසිද්ධිය වඩාත් වැදගත් වන්නේ සමස්ත මුස්ලිම් ප්‍රජාව ම ඉලක්කගත වීම මෙන් ම එහි බලපෑම සමස්ත සමාජයට ම දැඩි පීඩනයක් එල්ලකරන්නට සමත්වීම ය. මුස්ලිම් ජන සමාජයට ඔවුන්ගේ ම ප්‍රජාවෙන් සංස්කෘතික ලක්ෂණ වෙනස් කරගන්නට, යම් චර්යාවන් සීමා කරගන්නට බල කෙරෙන තත්ත්වයක් නිර්මාණය වීම ය.

පළමු ව ගෝලීය ත්‍රස්තවාදයේ අභිමතාර්ථයන් සාක්ෂාත් කරගනු පිණිස කතෝලික ප්‍රජාව ඉලක්ක කරගත් අයි. එස් ප්‍රහාරයන් ය. දෙවනුව අවස්ථාවාදී දේශපාලඥයින් හා ජනමාධ්‍ය විසින් උසිගන්වන ලදු ව මුස්ලිම් ප්‍රජාවට එරෙහි ව ප්‍රහාරයක් සිදු කළ සිංහල අන්තවාදී ප්‍රහාරයන් ය. පළමු වැන්න හා දෙවැන්න අතර ඍජු සම්බන්ධයක් පවත්නා බවට බැලූ බැල්මට පෙනී යයි. එනම් බෝම්බ ප්‍රහාරය එල්ල කිරීමට පළිගැනීමක් ලෙස මුස්ලිම් ප්‍රජාවට පහරදීමක් සිදුකරන්නට ඇති බව ය. එහෙත් ත්‍රස්ත ප්‍රහාරයේ වින්දිතයින් බවට පත්වූ කතෝලික ප්‍රජාව ඉවසීමෙන් කටයුතු කරද්දී සිංහල-බෞද්ධ අන්තවාදීන් පමණක් මෙම පහරදීමට පෙළඹෙන්නේ ඇයි? 83 කළු ජූලියේ දී ද්‍රවිඩ ජනයාට එරෙහි ව සිංහල-බෞද්ධ අන්තවාදී පිරිසක් විසින් ප්‍රහාරයක් එල්ල කරනු ලැබීම එල්.ටී.ටී.ඊ සංවිධානය බිහිවීමටත්, එය පෝෂණය කිරීමටත් රුකුලක් වූ බව පැහැදිලි ය. එහෙත් එල්.ටී.ටී.ඊ සංවිධානයේ මරාගෙන මැරෙන බෝම්බකරුවන් දකුණේ ආර්ථික මර්මස්ථාන මෙන් ම සිවිල් ජනයා ඉලක්ක කර ගනිමින් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල කරද්දී යළි කිසිදු විටෙක සිංහල අන්තවාදීන් හෝ අහිංසක ද්‍රවිඩ ජනයාට පහරදෙන්නට ක්‍රියා කළ අවස්ථාවක් දැකිය නොහැකි ය. ඊට වෙනස් ව මරාගෙන මැරෙන ඉස්ලාම් අන්තවාදයට එරෙහි ව පොදු මුස්ලිම් ජනයා ඉලක්කවීම වටහා ගත යුත්තේ කෙසේ ද? එය පළමු හා දෙවන ප්‍රචණ්ඩත්වයේ අවස්ථාවන්ගෙන් ඔබ්බට ගොස් ගෝලීය ප්‍රවණතාවන් සමග අනන්‍යවන බවක් හඳුනාගත නොහැකි ද? මෙම ගැටලු සැකෙවින් වුව ද, මෙහි ලා සාකච්ඡාවට බඳුන් කළ යුතු ය. එහි දී අපගේ අවධානය ප්‍රමුඛ වශයෙන් යොමුවිය යුතු ශීර්ෂයන් ත්‍රිත්වයක් කෙරෙහි අවධානය යොමු කළ හැකි ය.

1. ජාත්‍යන්තර දේශපාලනය තුළ ගෝලීය ත්‍රස්තවාදය සිතියම්ගත කිරීමේ උත්සාහයක් ලෙස
2. දේශීය අව-වර්ධිත දේශපාලන සංස්කෘතියේ හා ඌන සංවර්ධන ජාතිකවාදයේ ප්‍රතිඵලයක් ලෙස
3. එදිනෙදා දේශපාලනයේ ගණන් තැබීම් හා මැතිවරණ දේශපාලනයේ දිශානතිය

මෙම ප්‍රධාන ශීර්ෂයන් කෙරෙහි අවධානය යොමු කරන විට මෙම ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට නන් අයුරින් දායක වූවන් ද එහි වින්දිතයින් ද, පොදුවේ ලාංකේය සමාජයේ කොටස්කරුවන් වන සෑම සියලුදෙනා ම තමා සවිඥානක ව හෝ අවිඥානක ව කුමන හෝ දේශපාලන ව්‍යාපෘතියක ගොදුරක් බවට පත්ව ඇති බව පෙනී යනු ඇත. අවසාන අර්ථයෙන් ගෝලීය ත්‍රස්තවාදයේ ලංකාගමනය යනු මේ මොහොතේ අහඹුවක් නොවන බැව් තහවුරු වනු ඇත. මෙම ලිපිය මගින් උත්සාහ කරනුයේ එකී යථාර්ථය දේශපාලන සංවාදයට කැඳවීම ය.

## සාහිත්‍ය විමර්ශනය

ත්‍රස්තවාදය යනු කුමක් ද? ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයේ දැක්වෙන පරිදි එහි අරුත ''ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් භාවිත කරමින් ක්‍රමවේදයකට අනුව දේශපාලන ඉලක්ක මුදුන් පමුණුවා ගැනීමට ක්‍රියා කිරීම හෝ රජයකට ක්‍රියාකාරී වීමට බලපෑම් කිරීම'' (Hornby, 2005) යන්න ය.

ත්‍රස්තවාදය පිළිබඳ අමෙරිකානු විශේෂඥයෙකු වන බෲස් හොෆ්මන් සඳහන් කරන පරිදි ''බොහෝ ජනයා ත්‍රස්තවාදය යනු කුමක් ද යන්න පිළිබඳ නොපැහැදිලි අදහසක් හෝ හැඟීමක් ඇති නමුත් වඩා නිශ්චිත, සංයුක්ත හා සැබවින් ම පැහැදිලි අර්ථකථනයක් ඔවුන්ට නොමැත'' (Hoffman, 1998).

2004 දී ''ත්‍රස්තවාදය අර්ථදැක්වීමේ ප්‍රශ්නය'' යන මැයෙන් ඇලෙක්ස් ස්මිඩ් විසින් පර්යේෂණ පත්‍රිකාවක් ප්‍රකාශයට පත්කරමින් ත්‍රස්තවාදය අර්ථදැක්වීම 2001 සැප්තැම්බර් 11 ප්‍රහාරයෙන් පසු කෙතරම් සංකීර්ණ හා ප්‍රචලිත වචනයක් බවට පත්ව ඇත්තේ ද යන්න පෙන්වා දෙයි.

''ත්‍රස්තවාදය'' යන්න මේ දිනවල දේශපාලන වාග්මාලාවේ වැදගත් ම වචනය විය හැකි ය. ලෝකය පුරා විවිධ ස්වරූපයෙන් ඉස්මතුවී පවත්නා ත්‍රස්තවාදී යයි කියනු ලබන මෙම දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා ආකෘතිය හේතුවෙන් දිනපතා මිනිසුන් මිය යද්දී, එය පාලනය කිරීම සඳහා ඩොලර් බිලියන සිය ගණනක් වියදම් කරමින් තිබේ (Schmid, 2004). මේ අනුව ස්මිඩ් විසින් පෙන්වාදෙන පරිදි 2004 වසරේ ඔක්තෝම්බර් 04 වන දින සිට 2005 ජනවාරි 27 වන දින වනවිට අන්තර්ජාලයේ ගූගල් සෙවුම් යන්ත්‍රය තුළ 'ත්‍රස්තවාදය' යන්න සෙවීම පිළිබඳ Hits සංඛ්‍යාව 6,070 සිට 21,200,000 දක්වා වර්ධනය වී තිබේ. අන්තර්ජාලය තුළ පවා අර්ථ සෙවීම පිළිබඳ උනන්දුව ලොව පුරා කෙතරම් වර්ධනය වී ඇත්දැයි එමගින් නිර්ණය කළ හැකි ය. එහෙත් මෙහි දී අපගේ අවධානය යොමුවන්නේ 'ත්‍රස්තවාදය', ඉස්ලාමීය අන්තවාදී මුහුණුවරකින් ගෝලීය අත්දැකීමක් බවට පත් ව එනම් 'ගෝලීය ත්‍රස්තවාදය' එහි ම දිගුවක් ලෙස ලංකාවේ අභ්‍යාසවීම කෙරෙහි ය.

මෙම තත්ත්වය ආර්ථික ගෝලීයකරණය හා සමීප බැව් ආචාර්ය විජේවර්ධනගේ අදහස ය.

''බොහෝ අංශවලින් එය ආර්ථික ගෝලීයකරණයට කිට්ටු සමීපත්වයක් දක්වයි. ඒ දෙක ම උපදින්නේ විදේශයේ ය. අවශ්‍ය ආධාර ගලා එන්නෙත් විදේශයෙනි. ඒ අනුව කෙරෙන දේශීය බඳවා ගැනීම් හරහා ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා අවශ්‍ය භාණ්ඩයක් නිෂ්පාදනය කෙරේ. එක ම වෙනස වන්නේ, ආර්ථික ගෝලීයකරණය,


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සමාජය අභිමත ගෝලීය යහපත නිෂ්පාදනය කරන අතරේ ගෝලීය ත්‍රස්තවාදය සමාජය අප්‍රිය කරන ගෝලීය අයහපත නිෂ්පාදනය කිරීම යි. ගෝලීය යහපත මිනිසාගේ අභිවෘද්ධියට හේතුකාරක වන අතර ගෝලීය අයහපත මිනිස් අභිවෘද්ධියේ පරාභවයට හේතු වන්නේ ය. එබැවින් මේ දෙවනුව කී දෙය, නොකැමැති පාරිභෝගිකයා මත පැටවිය යුත්තේ ත්‍රස්තවාදී මාර්ගයන්ගෙනි'' (විජේවර්ධන, 2019). මෙහි දී ආර්ථික ගෝලීයකරණය විසින් සමාජ අභිමතය හෝ යහපත ම නිර්මාණය කරන්නේ ද යන්න පිළිබඳ විවාදපන්න කරුණු තිබිය හැකි වුවත්, මෙම ද්විත්වයෙහි යම් සමපාත බවක් පවත්නා බැව් පැහැදිලි ය.

ශ්‍රී ලංකාවේ දී අප්‍රේල් 21 වන පාස්කු ඉරිදාවේ ප්‍රහාර එල්ල වූයේ ක්‍රිස්තියානි හෝ කතෝලික ප්‍රජාව ඉලක්ක කරගනිමින් බැව් සැබෑ ය. දේවස්ථානවලට මෙන් ම කොළඹ සුපිරි හෝටල් ද එහි ඉලක්කයන් බවට පත්වූයේ පාස්කු ඉරිදාවේ කතෝලික ජනයාගේ උදෑසන ආහාරවේල කෙරෙහි පීඩනයක් එල්ල කිරීමට බැව් කිව හැකි ය. ඒ අනුව මෙය ආගමික මුහුණුවරකින් ප්‍රකාශයට පත්වූ ත්‍රස්තවාදයකි.

''මධ්‍යතන යුගයේ දී ක්‍රිස්තියානි ලබ්ධිය සහ ඉස්ලාම් ලබ්ධිය අතර සටන් සිදු විය. දෙපාර්ශ්වයට ම අවශ්‍ය කෙළේ අනිත් පාර්ශ්වය විනාශ කර දැමීමෙන් සටන අවසන් කිරීමට යි. එයින් අතිශය ගොරතර සටන ඇති වුණේ යෙරුසලමට අයිතිය පෑම සඳහා ය. මේ දෙපාර්ශ්වය ම ඒ භූමිය තම ආගමේ කේන්ද්‍රය වශයෙන් සැලකී ය. ඉතිහාසඥ යුවාල් නොවා හරාරි තමන්ගේ ''සේපියන්ස්'' නැමැති කෘතියේ පෙන්වා දෙන පරිදි මේ යුද්ධයේ ඇතැම් අවස්ථාවක යෙරුසලමේ පාරවල් වළලුකර උසට ලේ ගංගාවකින් පිරී යන තැනට මනුෂ්‍යයන් ඇන කොටාගෙන තිබේ (විජේවර්ධන, 2019). ලාංකේය අත්දැකීම් පිළිබඳ විමසා බැලීමේ දී ප්‍රචණ්ඩත්වය දේශපාලනික භාවිතයක් ලෙස යටි තලයේ ආර්ථිකමය කොන්දේසි සමග අනන්‍යව පැවති බවත්, 77 දී විවෘත ආර්ථිකය හඳුන්වාදීමෙන් පසු සිංහල සමාජයෙහි ඇතිවූ වෙනස්කම් 83 ජාතිවාදී කෝලාහලයන්ට පාදක වූ අයුරු ආචාර්ය ගුණසිංහ විසින් පෙන්වාදී තිබේ. (Gunasinghe, 1990). කෙසේ වෙතත් පාස්කු ඉරිදා ප්‍රහාරය යනු ආර්ථිකමය කොන්දේසි වාර්ගිකත්වය හා ආගමේ දිශානතියට තල්ලු කරන ලද අවස්ථාවක් ම විය. 'කාර්මික විප්ලවයේ සම්ප්‍රාප්තියත් සමග ඇති වූ සාමාන්‍ය ආර්ථික සමෘද්ධිය හේතු කොටගෙන, සටන් ආරම්මණය ආගමෙන් ආර්ථිකයට විතැන් විය. පළමු ලෝක යුද්ධයත්, දෙවැනි ලෝක යුද්ධයත් දියත් වුණේ ආගමික ආධිපත්‍යයක් වෙනුවෙන් නොව ආර්ථික ආධිපත්‍යයක් වෙනුවෙනි. එසේ වෙතත් මෑතක සිට ආර්ථිකය තවමත් ප්‍රධාන සාධකය වශයෙන් පැවතිය ද සටන් ආරම්මණය වාර්ගිකත්වය සහ ආගම දිසාවට මාරු වී තිබේ'' (විජේවර්ධන, 2019).

මේ අයුරින් ආගම දිශාවට යළි විතැන් වූ ත්‍රස්තවාදය ගෝලීය ත්‍රස්තවාදයක් ලෙසට ඔසවා තැබූ කේන්ද්‍රයේ රටවල සිට පරිධියේ රටවල විවිධ තැන්වලට එය ව්‍යාප්ත කරන ලද එක් සංවිධානයක් ලෙස ''ඉස්ලාමීය රාජ්‍යය'' (IS) වශයෙන් හැඳින්වෙන කණ්ඩායම සැලකිය හැකි ය. ලංකාවට එල්ල කරන ලද බෝම්බ ප්‍රහාරයේ වගකීම ද ඔවුන් විසින් බාරගෙන තිබේ. මීට සියවස් ගණනාවකට පෙර පැවති 'කැලිෆේට්' නමින් හැඳින්වෙන මුස්ලිම් අධිරාජයෙකුගේ පාලනයට සමානත්වයක් දරන, තනි ඉස්ලාමීය රාජ්‍යයක් බවට මුළු ලෝකය ම පත්කිරීම යි. මේ සංවිධානය සතු ව තිබූ හමුදාමය බලය, ඔවුන්ගේ පරිපාලනික කේන්ද්‍ර වශයෙන් පවත්වාගෙන ගිය ඉරාකයේ සහ සිරියාවේ ප්‍රදේශ මේවන විට ඔවුන්ගේ බලයෙන් ගිළිහී තිබේ. ඒ නිසා ම ඔවුන්ට තම බලය පෙන්වීම, පෙනී සිටීම (presence) වෙනුවෙන් ලෝකයේ පරිධියේ රටවල හුදකලා ප්‍රහාරයන් එල්ල කිරීමේ උපායමාර්ගික ක්‍රමවේදයක් දක්වා විතැන්වී තිබේ. 1997 වසරේ දී ටැන්සානියාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් කාර්යාලයටත්, කෙන්යාවේ එක්සත් ජනපද තානාපති කාර්යාලයටත් එකවර බෝම්බ ප්‍රහාර එල්ල කිරීම මගින් රාජ්‍යයන් දෙකක් එකවර ආවරණය කිරීම තුළින් නව ප්‍රචණ්ඩ අන්තවාදයක ආරම්භයක් (Trans National Terrorism) සලකුණු කළ බව විදානගේගේ මතයයි. ''ලංකාවේ ප්‍රචණ්ඩ ක්‍රියා සිදුකළ ඉස්ලාමීය අන්තවාදීන් යේමනය, ඊශ්‍රායලය, ඇෆ්ගනිස්ථානය, සිරියාව වැනි රටවල සටන් පෙරමුණේ සිටි අය විය යුතු යි. එම පෙරමුණුවල විදේශීය සටන්කරුවෝ 50,000ක් පමණ සිටියා. ඉරාකයේ හා සිරියාවේ භූමිය අහිමිවීමෙන් පසු මෙම පිරිස් සිය රටවලට යැවීමට නායකත්වය විසින් උපදෙස් ලබාදී තිබුණි. ඔවුන් වැඩි පිරිසක් ආසියානු හා අප්‍රිකානු රටවල පිරිස්ය. මේ පිරිස් යළි සිය රටවල් කරා පැමිණියේ තම අනන්‍යතාව සලකුණු කරමින්'' (විදානගේ, 2019). එහෙත් මෙම අන්තවාදීන්ට සිය රට ප්‍රචණ්ඩත්වය දියත් කිරීමෙන් පමණක් නොනැවතුණු ජාත්‍යන්තර දේශපාලනයේ සාධක ද පෙළගැසී තිබිණි. එහෙත් ජාත්‍යන්තර ලෝකය විසින් ඉස්ලාමීය ලෝකයට එරෙහි ව ගොඩනගා පවත්නා මතවාදය ද ඒකාකෘතිගත කරන ලද්දක් බැව් මුණසිංහ හා ආරියරත්නගේ අදහස යි. ''දැන් අන්තවාදී ම්ලේච්ඡ සුළුතරය සමස්ත ඉස්ලාමීය ශිෂ්ටාචාරයක ගති ලක්ෂණයක් ලෙස ඒකාකෘතිගත කළ බටහිර ආඛ්‍යානය, එය වර නගන බටහිර විරෝධී යයි කියාගන්නා තැනැත්තන් ද පිළිගෙන ඇත. අනෙක් අතට අතිශය විවිධත්වයන්ගෙන් ගහණ සමස්ත ඉස්ලාමීය ශිෂ්ටාචාරය තමන්ගේ මූලධර්මවාදය බවට ඒකාකෘතිගත කිරීම විසින් ඉටුවන්නේ අන්තවාදී සුළුතරයගේ අපේක්ෂාවයි'' (මුණසිංහ හා ආරියරත්න 2019). ඒ අනුව මෙය එක්තරා ආකාරයකට බටහිර පර්යාවලෝකයකින් ප්‍රශ්නය දෙස බැලීමෙන් යම් අගතියක පැටලීමට අවස්ථාව සැලසීමක් ද සිදුවිය හැකි බැවින් සීරු මාරුවට ගැටලුව අර්ථ දක්වා ගත යුතු ය.

## පර්යේෂණ ගැටලුව

පාස්කු ඉරිදා ප්‍රහාරය ලාංකේය ඉතිහාසය තුළ ප්‍රචණ්ඩත්වයේ දේශපාලනයට දක්වන සබඳතාව කෙබඳු ද?

## පර්යේෂණ අරමුණු

1. ගෝලීය ත්‍රස්තවාදයට ලංකාව නිරාවරණය වූ පළමු අවස්ථාව ජාත්‍යන්තර දේශපාලනයේ කොන්දේසි සහිත ව හඳුනා ගැනීම.



© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

2. ලාංකේය හු දේශපාලනයේ ක්‍රමික විකාශය හා වත්මන් සංදර්භය නිවරදිව වටහා ගැනීම.

3. පාස්කු ඉරිදා ප්‍රහාරය අහඹුවක් නොව අනිවාර්යතාවක් බැව් තහවුරු කර ගැනීම.

## පර්යේෂණයේ වැදගත්කම

පාස්කු ඉරිදා ප්‍රහාරය සමග සමස්ත රට තුළ උද්ගතවූ කැළඹිලිකාර ස්වරූපය පහව ගොස් ඇතත් එමගින් ජනිත කළ දේශපාලන මානයන් පහසුවෙන් යටපත් කළ නොහැකි ය. එය එක් පසෙකින් නව ලිබරල්වාදී ගෝලීය ආර්ථිකයේ උපාය උපක්‍රමයන් මත සමපාත වන තරමට ම අනෙක් පසින් දේශීය අව-වර්ධිත ජාතිකවාදයේ සිංහල-බෞද්ධ අන්තවාදී දෘෂ්ටිවාදයේ ඵල විපාකයන් හා සමපාත වෙයි. එසේ ම එහි නිෂේධනය ද එක ම මොහොතක සනිටුහන් කරයි. එබැවින් මහේක්ෂ පක්ෂ දේශපාලනය විසින් එකිනෙකා කෙරෙහි ඇඟිල්ල දිගු කරගනිමින් තවදුරටත් ජාතික වශයෙන් ආරක්ෂාව තර්ජනයට ලක්වූ මොහොත සැහැල්ලුවට ගැනීම විසින් මෙය හුදෙක් ජාතික ආරක්ෂාවේ ප්‍රශ්නයක් හෝ රටේ මුස්ලිම් ජනයාගේ ප්‍රශ්නයක් හෝ එසේත් නැතිනම් සුළු ජාතික ඡන්දවලට වටිනාකමක් ලැබී ඇති සමානුපාතික ඡන්ද ක්‍රමයේ ගැටලුවක් ලෙස හඳුනා ගැනීමේ ප්‍රවණතාවක් පවතී. ඒ නිසා ම මෙය ගෝලීය ත්‍රස්තවාදයේ මෙන් ම ජාත්‍යන්තර දේශපාලන උපාය උපක්‍රමවල ද සහසම්බන්ධතාවකින් යුතු සංසිද්ධියක් බවත්, එය මෙරට පුපුරා යන මොහොත යනු ලාංකේය හු දේශපාලනයේ ගතිකයන් විසින් නොදැනුවත් ව හෝ ඉල්ලා සිටි තත්ත්වයක් බවත්, මෙමගින් යම්තාක් දුරට හෝ තහවුරු කෙරෙනු ඇත.

## පර්යේෂණ ක්‍රමවේදය

ත්‍රස්තවාදය හෝ ප්‍රචණ්ඩත්වයේ දේශපාලනය පිළිබඳ ලියැවී ඇති පොත පත හා පර්යේෂණ ග්‍රන්ථ බොහෝ තිබිය හැකි ය. එහෙත් මෙහි දී මූලික වශයෙන් ග්‍රන්ථ හා මූලාශ්‍රය කිහිපයක් පමණක් උපයෝගි කරගනිමින් ප්‍රායෝගික දේශපාලන ගතිකයන් විශ්ලේෂණය කර ගැනීම කෙරෙහි වැඩි නැඹුරුවක් පෙන්නුම් කර තිබේ. ඒ අනුව පුවත්පත් අන්තර්ගතයන්, සම්මුඛ සාකච්ඡාවන්, ප්‍රසිද්ධ දේශන, ආදී ලෙස ප්‍රාථමික හා ද්විතීයික දත්ත දෙවර්ගය ම උපයෝගිතාව අනුව පෙළගස්වා ගැනීමට කටයුතු කර තිබේ. අත්‍යවශ්‍ය ම අවස්ථාවන්හි දී න්‍යායාත්මක කරුණු ලෙස සාමාන්‍යකරණයෙහි ලා මාක්ස්වාදී හෝ පශ්චාත් මාක්ස්වාදී න්‍යායාත්මක හා දාර්ශනික ව්‍යවහාරය උපයෝගි කරගනු ලබයි. එසේ වුව ද පවත්නා කාලීනභාවයෙහි මෙන් ම තීරණාත්මක සංසිද්ධියක් ලෙස පවත්නා සංසිද්ධිමය වටිනාකම කෙරෙහි වැඩි අවධානයක් යොමුකරමින්, ප්‍රායෝගික හු දේශපාලනයේ ගතිකයන් දේශපාලන විද්‍යාත්මක නැඹුරුවකින් විශ්ලේෂණය කිරීමට පියවර ගෙන තිබේ. ඒ නිසා ම ගුණාත්මක පර්යේෂණයකට සහසම්බන්ධැති විශ්ලේෂණාත්මක කියැවීමක් ලෙස මෙම ලිපිය ලියැවී තිබේ. දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය කිරීම විස්තරාත්මක ප්‍රවේශය ඔස්සේ සිදුවිය.

## සාකච්ඡාව

2019 අප්‍රේල් 21 වන දින කොළඹ නගරයේ හා තදාසන්න ප්‍රදේශ කිහිපයකත්, මඩකළපුව සියොන් දේවස්ථානයේත් පුපුරා ගිය බෝම්බ හුදු දේශපාලන ප්‍රචණ්ඩත්වය කියැපෑමේ හෝ ආගමික අන්තවාදය ප්‍රදර්ශනය කිරීමෙහි ලා වැයමක් පමණක් නොවේ. අද්‍යතන ලාංකේය දේශපාලන ව්‍යවහාරයේ මුහුණුවර සංකේතාත්මකව දැක්වීමකි. එබැවින් එකී සංසිද්ධිය ගෝලීය දේශපාලන න්‍යාය පත්‍රයෙහි ම දිගුවක් ලෙස මෙන් ම දේශීය දේශපාලනික උපාය උපක්‍රම හා ගතිකයන්හි සුවිශේෂත්වයේ මොහොත හා සමපාත වන අයුරු මෙම සාකච්ඡාවට බඳුන්වෙයි. එහි දී මූලික වශයෙන් සමස්ත ක්‍රියාවලිය තල ත්‍රිත්වයක අර්ථ දක්වා ගැනීම මෙහි දී සිදුවෙයි.

1. **ජාත්‍යන්තර දේශපාලනයෙහි ගෝලීය ත්‍රස්තවාදය සිතියම්ගත කිරීමේ උත්සාහයක් ලෙස**

2014 වසරින් පසු ආසියානු කලාපයේ (විශේෂයෙන් ද.ආසියානු) හු දේශපාලනයේ මුහුණුවර කෙටි කාල පරාසයන්හි දැඩි විචල්‍යයන්ට ලක්වනු දැකිය හැකි ය. ඒ මේවන විට ලෝකයේ ආර්ථික වශයෙන් බලවත් ම රාජ්‍යයන් දෙක වන එක්සත් ජනපදය හා චීනයේ ක්‍රියාකාරිත්වයන් හා බලපෑම් තීව්‍ර කිරීම නිසා ය. 2013 වසරේ දී චීන ජනාධිපති ෂී ජින් පින් විසින් The Belt and Road Initiative (BRI) වැඩපිළිවෙළ හඳුන්වාදෙන විට 2014 වසරේ දී එක්සත් ජනපදයේ ඔබාමා පාලනය විසින් The Rebalance to Asia or Regaining Asia වැඩසටහන ක්‍රියාවට නංවයි.

චීන වැඩපිළිවෙළ මගින් අන්තර් මහද්වීපික පරිමාණයේ කලාපීය සහයෝගීතාවයක් හා සම්බන්ධතා ජාලයක් ස්ථාපිත කෙරෙන අතර ආසියාව-දකුණු ආසියාව, අප්‍රිකාව මෙන් ම යුරෝපීය රටවල් ද යා කෙරෙන මීට සහසම්බන්ධ වන රටවල් ප්‍රමාණය 65කි. වෙළෙඳාම, යටිතල පහසුකම් හා ආයෝජන ක්ෂේත්‍රවල දැඩි කලාපීයකරණයක් නිර්මාණය වෙමින් පවතින අතර ඊට මගපෙන්වීම හා මූල්‍ය ශක්තිය මෙන් ම විශේෂඥ සේවාවන් ද චීනය විසින් සපයනු ලබයි.

''මෙම නිර්මාණය වෙමින් පවත්නා දැවැන්තම කලාපීයකරණය තුළ ලෝකයේ සමස්ත ජනගහණයෙන් 62% ක් නියෝජනය වන අතර ලෝකයේ සමස්ත දළ දේශීය නිෂ්පාදනයෙන් 30%ක් ද, මේවන විට ලෝකයේ හඳුනාගෙන තිබෙන බලශක්ති ආකරවලින් 75%ක් ද, මෙම BRI ව්‍යාපෘතියට අයත් ය. ඒ අනුව නව ආකාරයක ගෝලීයකරණයක් වෙත ආසියාව, අප්‍රිකාව හා යුරෝපය ගමන් කරමින් සිටින තත්ත්වයක් දැකිය හැකියි'' (බණ්ඩාර, 2019).

මීට ප්‍රතිපක්ෂ ව චීනයේ උපක්‍රමික සැලසුමට එරෙහි ව ක්‍රියාත්මක වන එක්සත් ජනපද වැඩසටහන මගින් ඉන්දියාව, ජාතික අභිලාෂයන්ට සමාන්තරව තබා ගනිමින් චීනයට එරෙහි ව සීතල යුද්ධයක් දියත් කර තිබේ. ද. ආසියානු කලාපයේ ඉන්දියාව මෙන් ම ආසියානු කලාපයේ ජපානය හා ද.කොරියාව ද චීනයට එරෙහි ව තබා ගනිමින්


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

එක්සත් ජනපදය සිය මූලෝපායික සැලසුම් දියත් කර ඇත. ඉන්දියාව හැරුණු විට දකුණු ආසියාවේ බොහෝ රටවල චීනය විසින් දැවැන්ත ආයෝජන සිදුකර ඒ තුළ තම ආධිපත්‍යය පිහිටුවා අවසන් ය. ශ්‍රී ලංකාවේ හම්බන්තොට වරාය, මෙන් ම පකිස්ථානයේ ග්වාඩාර් වරාය, ඇතුළු ව BRI ව්‍යාපෘතියට අයත් කලාපයේ වරායන් 42ක පමණ චීනය විසින් මේවන විටත් ආයෝජන සිදුකර අවසන් ය. මෙම ව්‍යාපෘතියේ මුහුදු සේද මාවතේ උපක්‍රමික වශයෙන් ඉතා වැදගත් සංධිස්ථානයක ශ්‍රී ලංකාව පිහිටා තිබේ. ආසියාව-අප්‍රිකාව හා යුරෝපය යා කරන මුහුදු මාවත ශ්‍රී ලංකාව හරහා වැටී ඇති අතර චීනය විසින් මෑත වසර කිහිපයක සිට දකුණු ආසියාවෙහි විශාල ආයෝජන සිදුකරමින් සිටින බැව් අමතක නොකළ යුතු ය. ශ්‍රී ලංකාව, පකිස්ථානය, බංග්ලාදේශය ඒ අතර කැපී පෙනෙයි. ශ්‍රී ලංකාවේ චීන ආයෝජන අතර හම්බන්තොට වරාය, දකුණු කොළඹ වරාය, නෙළුම් කුලුන, පෝර්ට් සිටි, අධිවේගී මාර්ග, හම්බන්තොට ප්‍රදේශයේ මේවන විටත් කල් බදු ක්‍රමය යටතේ චීනය විසින් අක්කර 15,000ක පමණ භූමි ප්‍රමාණයක ආයෝජන සිදුකර තිබේ. ශ්‍රී ලංකාව ජාත්‍යන්තරයෙන් ලබාගෙන ඇති ණය ප්‍රමාණයෙන් 20%ක් පමණ චීන ණය වන අතර ගෙවුණු වසර 10ක පමණ කාලයක් තුළ එකී ණය ලබාගෙන ඇති බව කිව යුතු ය. ලෝක බල දේශපාලනය හරි හැටි නොහඳුනා ශ්‍රී ලංකාව වඩ වඩාත් චීනය මත යැපෙන ප්‍රවණතාවක් පෙන්නුම් කිරීම ඉන්දියාව හා බටහිර ලෝකයේ රටවල අප්‍රසාදයට හේතු වූ බවත්, පාස්කු ඉරිදා ප්‍රහාරයට මෙම තත්ත්වයත් හේතු වූ බවත් පාර්ලිමේන්තු මන්ත්‍රී රතන හිමි ද පෙන්වා දුන්නේ ය. ''තවදුරටත් ඉන්දියානු හා බටහිර සාධක අමතක කර ඉදිරියට යාමෙන් ශ්‍රී ලංකාව තවත් වරක් අඳුරු ආගාධයකට වැටීම නොවැළැක්විය හැකි ය'' (රතන, 2019).

මෙවන් පසුබිමක එක්සත් ජනපදය කුමක් කරනු ඇත්දැයි අනුමාන කිරීමට ගෝලීය ත්‍රස්තවාදය බිහිකරවීමෙහි ලා සහ ව්‍යාප්ත කරවීමෙහි ලා ඔවුන් විසින් කළ කාර්යභාර්ය අමතක නොකළ යුතු ය. ලෝකයේ කොතැනකින් හෝ තමාට තර්ජනයක් මතුවන ඕනෑ ම අවස්ථාවක ඍජු ව හා වක්‍රව මැදිහත්වීම එක්සත් ජනපදයේ ස්වභාවය යි. රහසිගත මෙහෙයුම්, ආණ්ඩු වෙනස් කිරීම්, රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ, රාජ්‍ය නායකයින් ඝාතනය කිරීම හෝ පළවා හැරීම, මාරු කිරීම, සන්නද්ධ ව්‍යාපාර බිහි කිරීම ආදිය ඊට නිදසුන් ය. 1999 වසරේ දී ඉතා කුඩා කණ්ඩායමක් ලෙස ක්‍රියාත්මක වූ ෂීෂී සංවිධානය නවීන අවි ආයුධවලින් සන්නද්ධ කරමින් වඩාත් සක්‍රීය කරනු ලබන්නේ එක්සත් ජනපද බුද්ධි අංශ විසිනි. සිරියානු යුද්ධය ආරම්භවූ අවස්ථාවේ දී අමෙරිකානු හිතවාදී නොවුණු සිරියානු ජනාධිපති බෂාර් අල් අසාද්ට එරෙහි ව අමෙරිකාව, ප්‍රංශය සහ බ්‍රිතාන්‍ය සහයෙන් සිරියානු විපක්ෂ දේශපාලන කණ්ඩායම් ශක්තිමත් කරනු ලැබිණි. එහි ම දිගුවක් ලෙස අසල්වැසි ඉරාකයේ සිටි ෂීෂී ත්‍රස්තයන් බුද්ධි අංශවල මැදිහත්වීමෙන් සිරියාවට ගෙන්වනු ලැබිණි. ඉරාකයේ ග්‍රාමීය ප්‍රදේශවල ක්‍රියාත්මක වෙමින් සිටි අල්කයිඩා සංවිධානය ද, ජිහාඩ් කණ්ඩායම් ද සිරියානු යුද්ධයට එක්විය. ඉරාකයේ සුන්නි මුස්ලිම් ජන කණ්ඩායම නියෝජනය කළ වත්මන් ISIS නායකත්වය ලෙස ක්‍රියා කරන Abu Bakr al-Baghdadi ද එවක සිරියාවේ නිදහස් සටන්කාමීන්ට එකතු වූයේ 2013 වසරේ දී අමෙරිකානු රහසිගත මෙහෙයුවම්ල නිරත ව සිටි බුද්ධි අංශවල මැදිහත්වීමෙනි. එහෙත් තත්ත්වය වෙනස් අතකට හැරිණි. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගත් ෂීෂී නායකයා ''ඉරාකය තුළ පමණක් ප්‍රකාශයට පත් කර තිබූ 'ඉස්ලාමීය රාජ්‍ය' සිරියාව දක්වා ද ව්‍යාප්ත කිරීමට එකවර ම කටයුතු කිරීමයි. ඔහු 2013 දී Islamic State Of Iraq and the Levent-(ISIL) නමින් ඉස්ලාම් රාජ්‍යයක් (Islamic State Of Iraq and Siriya-ISIS නමින් ද හඳුන්වයි) ප්‍රකාශයට පත්කරමින් සිරියාවේ සිවිල් යුද්ධය සංකීර්ණ තත්ත්වයට පත් කළේ ය. එමෙන් ම 1.5ක් වන ලොව පුරා මුස්ලිම් ජනතාවට තමන් සමග එක්වන ලෙස දන්වන ලදී. ඒවන විටත් අසාද් පාලනයට එරෙහි ව සටන් කරමින් සිටි විවිධ සන්නද්ධ කණ්ඩායම්වලට අමෙරිකාව විසින් අවි ආයුධ හා මුදල් සපයමින් ශක්තිමත් කර තිබුණු අතර මෙම ISIL සටන් කරුවන් ද අමෙරිකානු ආධාර ලැයිස්තුවට ඇතුළත් විය. මොවුහු සිරියාවේ Raqqah නගරය අත්පත් කරගනිමින් ඉස්ලාම් රාජ්‍යයේ අග නගරය බවට ප්‍රකාශයට පත් කොට සමස්ත අරාබිකරයත්, එයින් පිටතත් සිතියම් ගත කොට ඉස්ලාම් රාජ්‍යය ප්‍රකාශයට පත් කළහ'' (බණ්ඩාර, 2019).

2012 වසරේ දී අමෙරිකා එක්සත් ජනපදයේ ආරක්ෂක බුද්ධි ඒජන්සිය (Defence Inteligent Agency-DIA) මැදපෙරදිග සිය මෙහෙයුම් කටයුතු සිදුකරන සිය ආරක්ෂක අංශ වෙත නිකුත් කරන ලද රහසිගත මෙමෝවක මෙසේ දැක්වෙයි.

If the situation unravels there is the possibility of establishing a declared or undeclared Salafist Principality in eastern Syiriya (Hasaka and Der zor), and this is exactly what the supporting powers to the opposition want, in order to isolate the Syriyan regime, which is considered the strategic depth of the Shia expansion (Iraq and Iran).

මෙම කොටසින් අවධාරණය කර ඇත්තේ පවතින තත්ත්වය නිසි ලෙස විසඳුණහොත් ප්‍රකාශිත හෝ අප්‍රකාශිත මුස්ලිම් රාජ්‍යයක් නැගෙනහිර ඇති විය හැකි බව යි. එමෙන් ම එය නියත ලෙස ම සිරියාවේ පවතින පාලන තන්ත්‍රය බිඳදැමීමට කටයුතු කරන විපක්ෂ බලවේගවල අවශ්‍යතාව ද වේ. එසේ ම සිරියානු පාලන තන්ත්‍රය හුදකලා කිරීම සඳහා මෙම පියවර නියත ලෙස ම රුකුලක් වනු ඇත. මෙම මෙමෝවේ Salafist Principality ලෙස හඳුන්වන්නේ පැහැදිලි ලෙස ම මුස්ලිම් රාජ්‍ය යි. මෙම උපක්‍රමය හරහා අමෙරිකාවට ඍජු හමුදා මැදිහත්වීමක් සිරියාව තුළ සිදුකිරීමට අවශ්‍ය පසුබිම සකස් කළ හැකි බව කියැවෙයි. අදාළ රහසිගත වාර්තාව මගින් පෙන්වා දී තිබෙන්නේ කැරලිකරුවන් වන සුන්නි මුස්ලිම්වරුන් සිරියාව තුළ බලවත් කිරීමෙන් අවට රටවල ෂියා මුස්ලිම්වරුන්ට තර්ජනයක් වන බව යි. මෙම තත්ත්වය උපක්‍රමික ලෙස යොදාගෙන සිරියාව තුළට භෞතික හමුදා මැදිහත් කිරීම අමෙරිකාවේ හා නේටෝවේ අරමුණ වීම ය.


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

එය ඉටුවිය. 2013 වසරේ දී සැලසුම් කළ පරිදි ම මුස්ලිම් රාජ්‍ය ප්‍රකාශයට පත්විය.

1970 දශකය මැදභාගය සහ අග වනවිට රුසියානු බලපෑම ඉරානය, ඉරාකය, සිරියාව, ඊජිප්තුව, ඇෆ්ගනිස්ථානය ඇතුළු මුස්ලිම් රටවල් කරා යොමුකර තිබුණු අතර මෙම රටවල ඒ වනවිටත් රුසියානු හිතැති ආණ්ඩු නිර්මාණය කර තිබුණි. මේ නිසා තත්ත්වය පාලනය කිරීම සඳහා අමෙරිකාව විසින් සිදුකරන ලද්දේ සෞදි අරාබිය යොදාගෙන අදාළ මුස්ලිම් රටවල වියවුල් ඇති කිරීම යි. මේ සඳහා 'වහබ්වාදය'(wahabism) යොදාගත් අතර 'මුස්ලිම් සහෝදරත්වය' (Muslim Brotherhood) එහි ක්‍රියාකාරී බලවේගය බවට පත්විය. 1991 දී රුසියානු සමූහාණ්ඩුව බිඳවැටෙන තුරු ම අමෙරිකා-සෞදි-නේටෝ රහසිගත මෙහෙයුම් මුස්ලිම් රටවල් කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක විය.

අනෙක් පසින් රුසියානු සහය ලැබූ ඇෆ්ගනිස්ථාන ප්‍රජාතාන්ත්‍රික ජනරජය අස්ථාවර කිරීමට මුජිහිදීන් කැරලිකරුවන් නිර්මාණය කරමින් ඒ හරහා කටයුතු කළේ ද, මෙම අමෙරිකානු-සෞදි නිර්මාණයක් වන Muslim Brotherhood සංවිධානය යි. ජිහාඩ් සංවිධාන සියල්ල නිර්මාණය වන්නේ මෙම Muslim Brotherhood සංවිධානයේ ම දිගුවක් ලෙස යි. එසේ ම 'තලේබාන්', අල්කයිඩා' වැනි සංවිධානවල මූල බීජ සැකසෙන්නේ ද මෙම උපාය මාර්ගය තුළ ම ය. එසේ ම ඉස්ලාම් මූලධර්මය ව්‍යාප්ත කිරීම සඳහා ජිහාඩ් මුස්ලිම් පල්ලි, සහ මද්රසා මූලධර්මවාදී පාසල් ඇති කරන ලද්දේ ද මෙම අමෙරිකා-සෞදි රහසිගත මෙහෙයුම්වල න්‍යාය පත්‍රයට යි. මේ සඳහා විශාල වශයෙන් අමෙරිකාව සෞදියේ ආයෝජනය කළ අතර අද ද කරමින් සිටියි. මේ ආකාරයට අමෙරිකාව ඒකීය ගෝලීය ආර්ථික පද්ධතියක් (Uni Polar world Order) නිර්මාණය කිරීම සඳහා අන්තවාදය සහ ආගම්වාදය ඉතා සූක්ෂම භූ දේශපාලනික උපකරණයක් ලෙස භාවිත කර තිබේ. අන්තවාදී ආගමික ඉගැන්වීම් මෙම ව්‍යාපෘතියේ දෘෂ්ටිවාදී පදනම ලෙස භාවිත කර තිබේ.

දීර්ඝ යුදකාලයේ පවා අවසර ඇති ව ඍජු ව ලංකාවට පය නොතැබූ අමෙරිකානු බුද්ධි අංශ එෆ්.බී.අයි. නිලධාරීහු ක්ෂණික ව රටට ළඟා වූහ. ෂයික් හිල්ටන් හෝටලයේ ලැගුම්ගෙන සිටි අමෙරිකානු ඔත්තුකරුවන් අත බෝම්බ නිෂ්ක්‍රීය යන්ත්‍ර පවා පැවති බවට මෙරට ආරක්ෂක අංශවලට අනාවරණය විය. කිසිදු ත්‍රස්ත ප්‍රහාරයකට එම හෝටලය ඉලක්ක නොවුණි. මෙම සිදුවීමට ටික කලකට ඉහතදී C-2A Greyhound යුද්ධෝපකරණ ප්‍රවාහන කාගෝ ගුවන් යානය මේ වසරේ ජනවාරි 24 මෙරටට ගෙනවිත් තිබිණි. මෙරට බුද්ධි අංශ තොරතුරු හුවමාරු කරගැනීමට මෙරට බුද්ධි අංශ තුළට ඇතුළුවීමට අවසර ලබාදෙමින් ප්‍රතිත්‍රස්ත පනත සම්පාදනය කිරීමට රජය විසින් කටයුතු සැලසුම් කර තිබුණේ ද කලකට පෙර සිට ය. ප්‍රහාරයත් සමග ම මිලියන ගණනක ආධාරයක් ලබාදීමට ද අමෙරිකාව විසින් කටයුතු කර තිබුණි. ප්‍රහාරයෙන් ඉක්බිති ව අත්අඩංගුවට ගැනුණු සැකකරුවන් රඳවා සිටි වැලිසර නාවික හමුදා කඳවුරට අමෙරිකානු තානාපති, එරට එෆ්.බී.අයි. නිලධාරීන් තිදෙනකු ගොස් එකී සැකකරුවන් හමුවී පැය 3ට ආසන්න කාලයක් ඔවුන් හා සාකච්ඡා කළ බව පාර්ලිමේන්තුවේදී අනාවරණය විය (වීරවංශ, 2019). පසු ව එය ජාතික පුවත්පත්වල වාර්තා විය (ලංකාදීප, 2019-07-24). උක්ත කරුණු දැක්වීමෙන් මෙම ප්‍රහාරය පිටුපස අමෙරිකානු ගෝලීය දේශපාලන හා ආර්ථික උපාය උපක්‍රමයන්හි යම් සබඳතාවක් පවතින බැව් පෙනී යයි.

## 2. දේශීය අව-වර්ධිත දේශපාලන සංස්කෘතියේ හා ඌන සංවර්ධන ජාතිකවාදයේ ප්‍රතිඵලයක් ලෙස

''ඉස්ලාම් මූලධර්මවාදය බටහිර නූතනත්වයෙන් සම්පූර්ණයෙන් ම වෙනස් වේ. ඒ නිසා සිංහල ජාතිකවාදී චින්තකයන් කියන හැටියට මුස්ලිම් මූලධර්මවාදය සහ බටහිර අධිරාජ්‍යවාදය යනු එකක් නොවේ. ඇමරිකාව වැනි බලවත් රටවල් කලින් කල තම දේශපාලන අවශ්‍යතා පිණිස ඉස්ලාම් මූලධර්මවාදී කණ්ඩායම් පෝෂණය කර ඇති බව ඇත්ත ය. බටහිර නූතනත්වය සහ ඉස්ලාම් අන්තවාදය එකක් යැයි ඉන් අදහස් නොවේ'' (අමරකීර්ති, 2019).

අප විසින් මූලාරම්භයේ දී පෙන්වාදුන් අමෙරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර බලවේග විසින් මෙම ඉස්ලාම් අන්තවාදී කණ්ඩායම් පෝෂණය කරමින් ලොව පුරා ප්‍රචණ්ඩ ක්‍රියා ඇති කිරීම වෙනුවෙන් ක්‍රියා කර ඇති බව සත්‍යයකි. එහෙත් පවත්නේ එකී හේතුව පමණක් නොවේ.

''නූතනත්වයට සම්පූර්ණයෙන් විකල්ප ශුද්ධ වූ අද්විතීය දෙයක් අපට ඇතැයි කියන ඕනෑ ම ප්‍රජාවක් කවදා හෝ නිර්මාණය කරන්නේ ඉස්ලාම් මූලධර්මාවාදියාට සමාන කෙනෙකි. ජාතික චින්තනයට පවා ප්‍රමාණවත් පිරිසකගේ මොළ සෝදා ගත හැකි නම් එවන් මූලධර්මවාදියෙකු නිර්මාණය කර ගත හැකි ය. මා නම් ඉස්ලාම් මූලධර්මවාදයට විරුද්ධ වන්නේ ඒ අර්ථයෙනි'' (අමරකීර්ති, 2019).

මෙහි වඩාත් වැදගත් වන්නේ ''ජාතික චින්තනයට පවා'' එවන් මූලධර්මවාදියෙකු බිහිකර ගැනීමට ඉඩකඩක් පවත්නා බවට කෙරෙන අනතුරු ඇඟවීම යි. අප්‍රේල් 21 වන දින ප්‍රහාරයෙන් දින 23ට පසු එනම් මැයි මස 13 වන දින වයඹ පළාතේ නගර කිහිපයක මුස්ලිම් ජාතික කඩසාප්පුවලට, නිවෙස්වලට ප්‍රහාර එල්ල කිරීම සිදුවන්නේ සිංහල වාර්ගික අන්තවාදී පිරිසක් විසිනි. මෙය අන්තවාදයට එරෙහි නව අන්තවාදයක් ලෙස හඳුනා ගැනීමට ඇතැමුන් උත්සාහ කළ ද, එය ක්ෂණික ප්‍රතිචාරයකට වඩා තරමක දිගු කාලයක් තිස්සේ වර්ධනය වෙමින් පැවති දේශීය අව-වර්ධිත දේශපාලන සංස්කෘතියේ හා ඌන සංවර්ධන ජාතිකවාදයේ ම දිගුවක් ලෙස සැලකිය හැකි ය. එය වඩාත් පැහැදිලි කර ගැනීමට මේ මොහොතේ ලාංකේය දෘෂ්ටිවාදය පිළිබඳ අධ්‍යයනයන් කෙරෙහි අවධානය යොමු කරනු වටී. එහි දී ග්‍රාම්ස්චියානු දෘෂ්ටිවාදය පිළිබඳ අර්ථගැන්වීම් වඩාත් වැදගත් ය.

සාම්ප්‍රදායික මාක්ස්වාදී ඉගැන්වීම් තුළ වූ ''දෘෂ්ටිවාදය යනු ව්‍යාජ විඥානයකි'' යන්නට වෙනස් ව ග්‍රාම්ස්චිගේ දෘෂ්ටිවාදය පිළිබඳ න්‍යාය වටහා ගැනීමේ යතුර ඇත්තේ



© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දෘෂ්ටිවාදය හා අදහස් එකිනෙකින් වෙන්කිරීම මත බව හෙතෙම පෙන්වා දෙයි. ශාන්තාල් මූෆ් පෙන්වා දෙන පරිදි ''දෘෂ්ටිවාදය වනාහී ව්‍යාජ විඥානයක් නොවන බවත්, එය මායාවක් හෝ රැවටීමක් නොවන බවත්, කෙටියෙන් ම කිවහොත් ග්‍රාම්ස්චි විසින් දෘෂ්ටිවාදය යයි සලකන ලද්දේ මිනිසුන් සිතන පතන හා කතා කරන ආකාරය නොව ඔවුන්ගේ ඇත්ත ජීවිතය බැව් මෙහි දී පැහැදිලි කරන ලදී'' (Mouffe,1979). ග්‍රාම්ස්චිට වෙනස් සංදර්භයක දෘෂ්ටිවාදය ව්‍යාජ විඥානයක් ලෙස සැලකීම යළි පිහිටුවන්නට සිදුවීම පිළිබඳ මූෆ්ගේ අදහස උපුටා දක්වමින් චාමින්ද මෙසේ සටහන් කර තිබේ.

''ව්‍යාජ විඥානය යයි කියන විට ම යම් තැනක අව්‍යාජ විඥානයක් තිබෙන බව පිළිගන්නට සිදුවේ (එනම් දෙවන ජාත්‍යන්තරයේ මාක්ස්වාදීන් විශ්වාස කළ පරිදි කම්කරුවාට කම්කරු පංති විඥානයක් තිබීම). නමුත්, ග්‍රාම්ස්චිගේ කාලයේ සමාජවාදීන් මෙසේ ව්‍යාජ විඥානයක් යයි හඳුනාගත් ජර්මානු සහ ඉතාලි ජාතිවාදය ග්‍රාම්ස්චි ඉදිරියේ පෙනී සිටියේ ව්‍යාජයක් ලෙස නොවේ. සමාජ විප්ලවය සිදුවේ යයි ලෙනින් පවා අවසාන මොහොතේ දී විශ්වාස කළ ජර්මනිය නාසිවාදයේ ග්‍රහණයට ලක්විය. ඉතාලි සමාජවාදයේ බලාපොරොත්තුව ෆැසිස්ට් ව්‍යාපාරය විසින් විනාශ කර දමන ලදී. 'අවන්ත' පුවත්පතේ හිටපු කතුවරයා ග්‍රාම්ස්චි ෆැසිස්ට් සිරගෙයක සිර කළේ ය (මෙම භෞතික අත්දැකීම්වලින් වෙන්කරගන්නා ග්‍රාම්ස්චි වනාහී නිකම් සාහිත්‍ය කතාවක වීරයෙක් පමණි). එහෙයින්, ඉතාලි/ජර්මානු ජාතිවාදය හුදු අදහසක්, ව්‍යාජ-මනසක් හෝ මායාවක් යයි කිව නොහැකි ය. එය භෞතික බලවේගයකි. ''ඉතිහාසයේ නීතීන්'' වලට විරුද්ධ ව යමින් ඉතාලි කම්කරුවා, කම්කරුවෙකු නොවී ඉතාලි ජාතිකයෙකු බවට පත්විය. මෙම ඉතාලි ජාතිකයා පැවති කම්කරු ව්‍යාපාරයට එරෙහි ව ආයුධ අතට ගත්තේ ය. මේ අනුව ''ඉතාලි ජාතිය''නම් අදහස දැන් හුදෙක් අදහසක් පමණක් නොවේ. එය දෘෂ්ටිවාදයකි'' (චාමින්ද, 2003).

මේ අනුව ග්‍රාම්ස්චිට අනුව අදහස් සංකල්පීය වුවත්, දෘෂ්ටිවාදය භෞතිකවීම ලාංකික සුවිශේෂත්වයන්ට ද එකසේ අදාළ කර ගත හැකි ය. එනම් අපගේ අවධානය යොමුවිය යුත්තේ කම්කරුවා වීම පසෙකලා ජාතික රාජ්‍යයක් ලෙස නිදහස ලබන විට වුව ''ලාංකික ජාතිය''නොවී හුදු ''සිංහල''වීම, එතැනිනුදු නොනැවතී ''බෞද්ධාගම'' ආගමක් හෝ දර්ශනයක් නොවී ''සිංහල-බෞද්ධ''සාරයක් බිහිවීම කෙරෙහි ය. පශ්චාත් යුද ශ්‍රී ලංකාව තුළ මාධ්‍ය හැසිරීම පිළිබඳ විමසීමේ දී ජර්මනියේ කම්කරුවා, කම්කරුවෙකු නොවී ''නාසිවාදියෙකු'' වී යුදෙව්වන් සමූල ඝාතනය කිරීමට පෙළඹීම, ඉතාලියේදී කම්කරුවා, කම්කරුවෙකු නොවී ඉතාලි ජාතිකයෙකු බවට පත්වී කම්කරුවන්ට එරෙහි ව අවි අතට ගැනීමට පෙළඹීම මෙන් ම ලාංකිකයා, කම්කරුවෙකු හෝ ලාංකිකයෙකු නොවී සිංහල-බෞද්ධයෙකු වී දෙමළ ජනයාට එරෙහි ව අවි අමෝරා ගැනීම සංදර්භ වෙනස් වූ එක ම ක්‍රියාදාමයකි. යුද කාලීන ව මෙන් ම ඊට පෙරාතුව ද කාලාන්තරයක් තිස්සේ මෙම සතුරා නිර්මාණය කළ බවත්, යුද කාලයේ දී එකී සතුරා මුහුණට මුහුණ හමුවූ බවත් පැහැදිලි ය. එහෙත් යුද්ධ කාල වකවානුවේ මෙන් ම ඊට පෙර සිට ''ද්‍රවිඩ ජාතිකයා'' සතුරාවීම යන කාරණය වඩාත් අර්ථ ගැන්වීමට හැකි පරිදි පසු කලෙක 'මුස්ලිම් ජාතිකයා'' සතුරා බවට පත්වීම පශ්චාත් යුද ශ්‍රී ලංකාව තුළ අත්දැකිය හැකිවිය. ඒ අනුව ද්‍රවිඩ ජාතිකයා සතුරා කළ ස්වරූපය ම වෙනස් නවීන උපාය උපක්‍රම හෝ තාක්ෂණය ඔස්සේ ''මුස්ලිම් ජාතිකයා'' කෙරෙහි ආදේශවීම දැකිය හැකි ය. මෙම දෘෂ්ටිවාදය ගොඩනැඟීමට ජනමාධ්‍යය විසින් ඉටුකරනු ලැබූ මෙහෙවර තීරණාත්මක ය.

සිංහල-බෞද්ධ අධිපතිවාදී දෘෂ්ටිවාදය විසින් ලාංකේය සමාජය තුළ ඇති කර ඇති ගැඹුරු ව්‍යුහාත්මක ගැටලු පිළිබඳ ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන විසින් පර්යේෂණයක් සිදුකර තිබේ. එහි දී ඔහු ආගම, සම්ප්‍රදායන්, සංස්කෘතික ගතිලක්ෂණ විසින් හිංසාව මෙන් ම කලා විරෝධය ව්‍යුහගත කර ඇති අයුරු මැනවින් පෙන්වා දී තිබේ. ඔහුගේ පර්යේෂණය පිළිබඳ වැඩි කතා බහක් නිර්මාණය නොවීමෙන් සාකච්ඡාවට ගත යුතු ව පැවති ගැඹුරු න්‍යායාත්මක හා ප්‍රායෝගික කරුණු රාශියක් මගහැරී ගොස් තිබේ. හෙතෙම මෙසේ ලියයි. ''පශ්චාත් විජිතවාදී සිංහල දේශපාලන බලවේග බුද්ධාගම රැකීම, යනුවෙන් දක්වන අර්ථකථන තුළ තහවුරු කෙරෙන්නේ ''රටේ බහුතරයක් සිංහල බෞද්ධයන් නිසා රජය බුද්ධාගමට විශේෂ අනුග්‍රයක් දැක්විය යුතු ය. සිංහල බෞද්ධයන් රටේ ප්‍රධාන ප්‍රතිපත්ති තීරකයන් විය යුතු ය'' යනාදී වශයෙන් වූ දේශපාලන අදහස් මාලාවකි. සරල ව කිවහොත් මින් ප්‍රායෝගික ව තහවුරු කිරීමට යත්න දැරෙන්නේ 'බහුතරයට සුළුතරයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමට අයිතියක් ඇතිය' යන මතය යි. ඉන් පැහැදිලි ව ප්‍රකාශයට පත්වෙන්නේ සිංහල ප්‍රභූත්වයේ දේශපාලන වුවමනාවකි'' (විජේසිරිවර්ධන, 2010).

පශ්චාත් මාක්ස්වාදී විෂය ක්ෂේත්‍රය තුළ ''පසමිතුරුතාවය'' (Antagonism) යන්නෙන් සාකච්ඡාවට බඳුන් කරන තේමාවක් වේ. එහි අර්ථය වනුයේ සතුරු-මිතුරු සම්බන්ධයක් සහිත ව සමාජය ව්‍යුහගත වීම ය. සුමිත් චාමින්ද වරෙක මෙසේ ලිවී ය.

''ලංකාවේ අධිපති සිංහල-බෞද්ධ වාර්ගික ජාතිකවාදී කතිකාව නිදසුනක් ලෙස සලකමු. එය තුළ අපගේ ජීවිත සම්බන්ධයෙන්, ලෝකය සම්බන්ධයෙන් විධිමත් අර්ථ ගොඩනංවයි. කරුණාව, මෛත්‍රීය, යහපත් රාජ්‍ය පාලනය යනා දී ආචාර ධාර්මික අංගයන් පවා සිංහල-බෞද්ධ භාෂා සමස්තය තුළ පවතී. නමුත් මෙම සමස්තය තුළ ''ද්‍රවිඩ විමුක්ති සටන්කාමියාට ද මෛත්‍රීය කළ යුතුය'' යන අර්ථය නොමැත. එක් අතකින් ද්‍රවිඩ සටන්කාමියා මෙම සමස්තයෙහි 'පිටත' යයි අපට පැවසිය හැකි ය. අනෙක් අතට එම සමස්තය තැනී ඇත්තේ ම ද්‍රවිඩයා බහිෂ්කරණය (externalization) කිරීමෙන් යයි ද පැවසිය හැකි ය. භාෂාව මගින් මෙම මූලික පසමිතුරුතා සම්බන්ධය වසන්නට කෙතරම් ප්‍රයත්න දැරුව ද එය අසමත් වේ. පසමිතුරුතාව යනු දෙන ලද අර්ථ පර්යායක නිෂේධනය නැත්නම් සීමාව වනවා යන්නෙහි තේරුම නම්, එක ම අර්ථ


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පර්යායක් තුළ පසමිතුරු අන්ත දෙක ම නියෝජනය විය නොහැකි බවයි'' (චාමින්ද:2005).

පසමිතුරුතා සම්බන්ධයකින් තොර ව දේශපාලනයක් පිළබඳ කතා කිරීම පවා අසීරු ය. ටෝෆින් පෙන්වාදෙන පරිදි ග්‍රීසියේ පෞර නාගරික රාජ්‍යයන් සහ මධ්‍යතන යුගයේ ගොවි ජන සමාජයන් යුද්ධ මගින් හෝ ආක්‍රමණ මගින් තර්ජනයට ලක්වූ විට පරම සාම්‍යත්වයක් නිර්මාණය විය (Torfin:1999). මේ අනුව සතුරෙකු ලෙස බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය පෙනී සිටි වකවානුව වන විට එය මහා සතුරා ලෙස සලකා සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් ආදී සියලු ජනකොටස් සාපේක්ෂ ලෙස සාම්‍යත්වයෙන් යුතු ව ඊට මුහුණ දුන්හ. එහෙත් අධිරාජ්‍යවාදයෙන් ශ්‍රී ලංකාව නිදහස ලබන විට ම ද්‍රවිඩයා බැහැර කර ''ජාතික රාජ්‍යය'' ස්ථාපිත කර ගැනීම තුළ සතුරෙකු බවට ඌණනය විය.

යුද්ධය පැවති වකවානුව වන විට නැගෙනහිරින් මුස්ලිම් ජනයා පළවා හැරීම ආදී අතුරු කාරණාවන් ද හේතුවෙන් ''ද්‍රවිඩ ජාතික සටන්කරුවා'' යනු සිංහල-මුස්ලිම් දකුණේ ජනයාගේ සතුරා-මිතුරා සම්බන්ධයේ ප්‍රකාශනය විය. එබැවින් යුද්ධය අවසන්වීම යනු ද්‍රවිඩ සටන්කරුවාට එරෙහි දෘෂ්ටිවාදය තුළ ගොඩනගා ගෙන සිටි සාම්‍යත්වය අභියෝගයට ලක්වීම ය. ඒ නිසා ම තමන් අසල සිටින මුස්ලිම් ජාතිකයා සතුරා ලෙස ආදේශවීමත් ඊට එරෙහි ව අවි අමෝරා ගනිමින් අර්බුදයට ගිය තම අනන්‍යතාව යළි ගොඩනගා ගැනීමත් සිදුකරයි. එහි දී සිංහල-බෞද්ධ දෘෂ්ටිවාදයට පසමිතුරුතා දේශපාලනය තුළ ස්වකීය සතුරා නිර්මාණය කර ගැනීම සඳහා අධිපතිවාදී ජනමාධ්‍යය විසින් සහය ලබාදීමක් සිදුවේ. වෙනත් අයුරකින් කිවහොත් දෘෂ්ටිවාදය නඩත්තු කර ගැනීම උදෙසා ''සතුරෙකු'' නිර්මාණය කර ගැනීම සිදුකරනු ලබන්නේ ජනමාධ්‍යය විසිනි. මුස්ලිම් ජාතිකයෙකුට අයත් කළුතර ව්‍යාපාරික ස්ථානවලට ප්‍රහාර එල්ල කිරීමට බොදු බල සේනා සංවිධානය විසින් සැලසුම් කරන විට ඒ පිළිබඳ තොරතුර දැනගන්නා ස්වර්ණවාහිනී ආයතනය එය වැළැක්වීම සඳහා වගකිව යුතු උදවියට දැනුම් දී ඒ සඳහා සහය වෙනවා වෙනුවට තම කැමරා ආම්පන්න සමග පිරිසක් ඔවුන් සමග යැවීමටත්, සිද්ධිය සජීවීව විකාශය කිරීමටත් කටයුතු කරන්නේ ඒ නිසා ම ය. 2010-15 දක්වා කාලය තුළ මෙලෙස හලාල් විරෝධය සමග මුස්ලිම් ප්‍රජාවට එරෙහි වෛරීය මාධ්‍ය භාවිතයත්, මුස්ලිම් ව්‍යාපාරික ස්ථානවලට පහරදීම ඇතුළු බොහෝ අකටයුතුකම් දිගින් දිගටම අභ්‍යාසවීම දැකිය හැකි ය.

පශ්චාත් යුද ශ්‍රී ලංකාව තුළ බොදු බල සේනා, සිහළ රාවය, රාවණා බලකාය වැනි අන්තවාදී හා ආගම්වාදී සංවිධාන මෙන් ම ජාතික හෙළ උරුමය වැනි ජාතිවාදී දේශපාන පක්ෂ විසින් ''හලාල් විරෝධය'' දැවැන්ත මාතෘකාවක් බවට පත්කරනු ලබන්නේ යුද්ධය නිමාවීමෙන් පසු අභියෝගයට ලක්වූ දෘෂ්ටිවාදය යළි ගොඩනැංවීම පිණිස බැව් මින් පැහැදිලි ය. මෙම ප්‍රවෘත්තිවලට දැවැන්ත ප්‍රචාරයක් ලබාදෙමින් හා පීඩාවට පත්වන මුස්ලිම් ජනයාට එහි සාධාරණ ඉඩක් ලබා නොදෙමින් ජනමාධ්‍යය විසින් එකී කාර්යය නොපිරිහෙළා ඉටුකරනු ලැබීය (විජේබණ්ඩාර, 2015).

මුස්ලිම් පාර්ශවය නියෝජනය කළ මෙම පුවත් සියල්ල එක සේ වැදගත්කමකින් යුතු වුව ද, (ගැටුම්කාරී තත්ත්වයකට තුඩුදුන් මූලාශ්‍ර බැවින්) මෙම කිසිදු පුවතකට පුවත්පතේ පාඨක අවධානයට නිතැතින් හිමිවන ඉඩක, තැනක මුස්ලිම් සමාජයේ මතය පළ කිරීමට පුවත් බලධාරීන් විසින් කටයුතු කර නොතිබිණි. සිංහල අධිපතිවාදී අන්තවාදී ස්ථාවරයක පැවති මෙම පුවත්පත් ඒකාධිකාරය තුළ මුස්ලිම් පාර්ශවයේ විද්වතෙකුට වුව ද සාධාරණ කරුණු දැක්වීම් කිරීමට උත්සාහ කළ ද ඒ සඳහා අවස්ථාව දීමට මෙලෙස අන්තවාදයකට තල්ලුවී ගිය පුවත්පත් බලාධිකාරිය කටයුතු කර නැත.

''මාසයකට පමණ පෙර ජාතික හෙළ උරුමය, බොදුබල සේනා සහ සිංහල රාවය බඳු සිංහල අන්තවාදීන් මතුකරන මුස්ලිම් වෛරී ව්‍යාපාරය පිළිබඳ ව ලිපියක් රටේ ඉංග්‍රීසි පුවත්පත්වලට යවන ලදී. එය රටේ දෘෂ්ටිකෝණයෙන් ලියැවුණක් වන අතර මුස්ලිම් දෘෂ්ටිකෝණයෙන් ලියැවුණක් නොවේ. කිසි ම පුවත්පතක් එම ලිපිය පළ කළේ නැත. පසුගිය මාස කිහිපය තුළ සිංහල අන්තවාදීන් ඉතා භයානක, විෂකුරු වාර්ගික ෆැසිස්ට් භීෂණයක් රටේ මුස්ලිම්වරුන්ට එරෙහි ව දියත් කළ බව අපි සියලුදෙනා දනිමු. මේ කාලය තුළ සිංහල මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මේ ෆැසිස්ට්වාදීන්ගේ මුස්ලිම් විරෝධයට එක්වන ලෙස කළ විවෘත ඉල්ලීමට විශාල ප්‍රසිද්ධියක් ලබාදුන්හ. සිංහල මාධ්‍ය පුවත්පත් බොදුබල සේනා සහ අනෙකුත් ජාතිවාදී සංවිධානවල ප්‍රකාශන මාධ්‍ය බවට පත්විය. මුස්ලිම්වරුන්ගේ පැත්තෙන් කිසි ම අදහසක් පළ නොවූ අතර සියලු ම ප්‍රජාවන්ට විය හැකි හානිය නොතකා දිගින් දිගට ම මුස්ලිම්වරුන්ට එරෙහි ව සිංහලයන් ඇවිස්සූහ. මෙය අලුත් දෙයක් නොවේ. 1968 අගමැති ඩඩ්ලි සේනානායක දිස්ත්‍රික් සභා පිළිබඳ ධවල පත්‍රය ඉදිරිපත් කළ විට ද, මෙසේ ම සිදුවිය. දැනට නොමැති නිදහස් සාමකාමී කණ්ඩායම්, දෙමළ විරෝධී ව්‍යාපාරයන් හා දෙමළ ජනයාට එරෙහි ව සිංහලයන් ඇවිස්සූහ. පසුව සිදුවූයේ කුමක්දැයි කවුරුත් දන්නා කරුණකි. පසුගිය සිදුවීම්වලින් පාඩම් ඉගෙන නොගන්නා රටේ මාධ්‍ය මුස්ලිම්වරුන්ට එරෙහි ව ජාතිවාදය අවුස්සති. මේ ජාතිවාදී උසිගැන්වීම්වල ඵලවිපාකවලට වැඩිකල් නොගොස් රටට ම මුහුණදීමට සිදුවනු ඇත'' (ෆාරුක්, 2013).

සිංහල පුවත්පත් පිළිබඳ එවක සතියේ මාධ්‍ය විශ්ලේෂණය ප්‍රකාශයට පත්කරමින් VERITE RESEARCH ආයතනය හලාල් සංසිද්ධි රැගත් වාර්තා සම්පිණ්ඩණයකට පසු ව මෙසේ දැක්වී ය.

සිංහල පුවත්පත්වල විශ්ලේෂණාත්මක දුබලතා අඩු තරමින් පාර්ශවීය හෝ වර්ගවාදී ප්‍රචාරයක් ඉහළට එසවීමටත්, දන් එම ප්‍රචාරයන්ට ''තෝරා ගැනීමේ නිදහස'' පිළිබඳ සළුපිළි පොරවා ගන්නට ඉඩ දීමටත් උදව්වක් වී තිබේ. වර්ගවාදී ප්‍රචාරක ව්‍යාපාරය සිංහල බෞද්ධ ජන මනසේ ගැඹුරු අනාරක්ෂිත හැඟීමෙන් පමණක් නොව ආණ්ඩුවේ අප්‍රකාශිත සහයෝගයෙන් ද පෝෂණය විය. දන් ආණ්ඩුව තමන් විසින් ම ව්‍යාප්ත වන්නට ඉඩ දුන් දෙය පාලනය කරන බවක් සංඥා


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කරයි (2013.පෙබ 17).

මේ අයුරින් 2010-15 දක්වා වූ කාලය තුළ ලාංකේය සමාජය තුළ උත්කර්ෂයට නැංවුණු නූතන මුස්ලිම් විරෝධී සිංහල බෞද්ධ මතවාදයේ නිර්මාතෘවරයා ගංගොඩවිල සෝම හිමි බැව් දේවසිරිගේ අදහස ය (Dewasiri, 2016).

පැවති රාජපක්ෂ පාලනය විසින් මෙම මුස්ලිම් විරෝධයට සුජාතභාවයක් ලබාදීම කෙරෙහි කන්නන්ගරගේ අවධානය යොමුවී තිබේ. ''සිංහල බෞද්ධ ජාතික වාර්ගික දෘෂ්ටිවාදය එහි තීව්‍ර ප්‍රචණ්ඩත්වය තුළ නඩත්තු කිරීමත්, එය මිලිටරි යාන්ත්‍රණය හා සම්බන්ධ කෙරෙන පාලන උපාය මාර්ග පරීක්ෂා කර බැලීමත් ගෝඨාභය සාධකයේ මෙහෙයුම වන බව පෙනෙයි. සිවිල් සමාජය හා එහි ප්‍රධාන ආයතන වඩ වඩාත් මිලිටරිකරණයකට ලක් කිරීමට සමගාමීව බොදු බල සේනා වැනි පාදඩ හිංසක අන්තවාදී සංවිධාන පෝෂණය කරමින් හා සමාජය දෙසට ලිහා දමමින් මේ සිදු කරන්නේ එම පරීක්ෂාවයි. වැලිවේරිය-රතුපස්වල මිලිටරි පිළිතුරක් දුන් අතර අලුත්ගම දී සිංහල බෞද්ධ වර්ගවාදී පිළිතුරක් සැපයිණි. මේ එක ම කාසියේ දෙපැත්තකි. ගර්භිත කරන ලද මුසල්මානුවා තුළින් නව සතුරෙකු සොයා ගැනීමේ මානය අප සිතනවාටත් වඩා පුළුල් සූක්ෂම දේශපාලන උපාය මාර්ගයක් ය''(කන්නන්ගර, 2014). එකී උපාය උපක්‍රමයන් වුව අවසාන අර්ථයෙන් ශ්‍රී ලාංකේය ජාතිකවාදයේ ඌනතාවන් විසින් තවදුරටත් තහවුරු කරන බැව් කිව හැකි ය. ''ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජන ප්‍රජාව හා එම සංස්කෘතික ජීවිතය ඉලක්ක කරගනිමින් ආසන්න කාලය තුළ එල්ල වූ වෛරී කුමන්ත්‍රණ ප්‍රලාප හා බිහිසුණු හිංසනයන් යනු රාජපක්ෂ පාලන බලාධිකාරය හා එහි හෙජමොනික සැකැස්ම විසින් අනු දුටු නව රණකාමී සිංහල බෞද්ධ ජාතිකවාදයේ/වර්ගවාදයේ ම අලුත් ම සළුපිළි වන බව නොකියා බැරි ය'' (කන්නන්ගර, 2014).

එක් පසෙකින් මෙලෙස මුස්ලිම් ජන විරෝධී දෘෂ්ටිවාදයක් පෝෂණය කරමින් ඔවුන්ට එරෙහි වෛරීය ප්‍රකාශන හා ක්‍රියාකාරකම් සාමාන්‍යකරණය වෙද්දී මාවනැල්ල, අලුත්ගම-බේරුවල, ගිංතොට, දිගන-තෙල්දෙණිය, ආදී ප්‍රදේශවල එම තත්ත්වය වාර්ගික ගැටුමක් දක්වා වර්ධනය විය. එහි අවසාන ප්‍රතිඵලය වූයේ ඊට ප්‍රතිචාර දැක්විය යුතු බවට මුස්ලිම් ප්‍රජාව තුළින් ම තරුණ කොටස් සංවිධානය වීමයි. අයි. එස් ත්‍රස්තවාදී මතවාදය සමග අන්තවාදී පිරිස් සංවිධාන වෙද්දී මෙතුවක් කාලයක් සාම්ප්‍රදායික මුස්ලිම් සමාජය තුළ ඊට නොලැබුණු සුජාතභාවයක් උක්ත සමාජ කොන්දේසි හේතුවෙන් නිර්මාණය විය. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු අත්අඩංගුවට පත්වූ අන්තවාදීන් විසින් ලබාදුන් ප්‍රකාශ පරීක්ෂා කිරීමේ දී මුල් අදියරේ දී තමාට මුස්ලිම් සමාජයෙන් නොලැබුණු සහයෝගයක් මෙම ගැටුම්කාරී සංසිද්ධිවලින් ඉක්බිති ව ලැබුණු බැව් තහවුරු කෙරිණි. ''2018 වසරේ පෙබරවාරි මාසයේ දී දිගන මුස්ලිම් වැසියන් ඉලක්ක කරගනිමින් එල්ලවූ ප්‍රහාරයෙන් පසු මාවනැල්ලේ පිරිසක් ද, සහරාන්ලාගේ කණ්ඩායමට එක්වූහ. ඒ අතර පෙරමුණ ගත්තේ මාවනැල්ලේ මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල් හක් සහ මොහොමඩ් ඊබ්‍රහිම් සාහිඩ් අබ්දුල් හක් යන සහෝදරයින් දෙදෙනා ය'' (2019-07-01 ලංකාදීප). තෙල්දෙණිය ප්‍රහාරයෙන් පසු තමාට විශාල පිරිසක් එකතු වූ බවට සහරාන්ගේ කණ්ඩායමේ අයෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබාදුන් ප්‍රකාශයක සටහන්වීම (2019-05-05 ලංකාදීප) ද ඊට නිදසුනකි.

ඒ අනුව සිංහල-ද්‍රවිඩ-මුස්ලිම් ආදී සියලු ජනවර්ග ඒකරාශි කර ගත් පොදු කුලකයක් ලෙස 'ලාංකේය ජාතිය' නිර්මාණය කරගැනීමට නොහැකිවීමේ ගැටලුව විසින් දිගු කාලයක් තිස්සේ බහුතර සිංහල-බෞද්ධ ජාතිකවාදීන් මුස්ලිම් ජනයාට එරෙහි ව දෘෂ්ටිවාදයක් පෝෂණය කිරීම හා නඩත්තු කිරීම ද, එහි ප්‍රතිවාදීත්වය වර්ධනය කිරීමට අනියමින් දායක වී ඇති බව කිව හැකි ය.

### 3. එදිනෙදා දේශපාලනයේ ගණන් තැබීම් හා මැතිවරණ දේශපාලනයේ දිශානතිය

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දුට සහ පොලිස්පති පූජිත ජයසුන්දරට එහි වගකීම ගෙන ඉල්ලා අස්වන්නැයි ජනාධිපතිවරයා විසින් බලකරනු ලැබූ අතර ප්‍රනාන්දු මහතා ඉල්ලා අස්වුව ද, පොලිස්පතිවරයා විසින් එසේ නොකරන ලදී. එහෙයින් ජනාධිපතිවරයාට පවත්නා බලතල ප්‍රකාරව පොලිස්පති පූජිත ජයසුන්දර මහතා අනිවාර්ය නිවාඩු යවා වැඩබලන පොලිස්පතිවරයෙකු පත්කිරීමට කටයුතු කෙරිණි. ඊට අදාළ නීතිමය කටයුතු මෙම ලිපිය ලියැවෙන මොහොත වනවිටත් සිදුවෙමින් පවතියි. එහෙත් ආරක්ෂක අමාත්‍යවරයා මෙන් ම සේනා විධායක ලෙස ජනධිපතිවරයාට ඊට අදාළ ව පවත්නා වගකීම සුළුපටු නොවුව ද, විධායකගේ බලපරාක්‍රමයේ අනුහසින් හෙතෙම සියලු වගකීම සෙස්සවුන් පිට පටවා තමා ඈගබේරාගැනීමට කටයුතු කර තිබේ. බුද්ධි අංශ විසින් මෙවන් ප්‍රහාරයක් පිළිබඳ අනතුරු අඟවා තිබිය දී ඊට අදාළ ව නිසි පියවර නොගැනීම එදිනෙදා දේශපාලනයේ ගණන් තැබීම් මත සමපාත වන බැව් පෙනෙන්නට තිබේ. හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මේ ගැන පවසා තිබුණේ 'ප්‍රහාරයක් පිළිබඳ තොරතුරු වාර්තා වී තිබුණත්, එය මේ සා බරපතළ වේ යයි අපේක්ෂා නොකළ බවයි' (2019-04-23 Sunday Times). ඔහුගේ ප්‍රකාශය ආරක්ෂක ලේකම්වරයෙකුට තරම් නොවුව ද, එය සත්‍යයක් බැව් පාර්ලිමේන්තු තේරීම්කාරක සභාව හමුවේ තහවුරු වී තිබේ.

''ප්‍රචණ්ඩත්වය වළක්වා ගත හැකි පරිද්දෙන්, කල් තියා ලැබී තිබුණු සුවිශේෂ වූත්, විස්තරාත්මක වූත් තොරතුරු සහ අනතුරු ඇඟවීම්, රාජ්‍ය බුද්ධි අංශ මගින් අවශ්‍ය තැන්වලට යොමු නොකරන ලද්දේ මන්ද යන්න ජනාධිපතිවරයා, අගමැතිවරයා, ආරක්ෂක ලේකම්වරයා සහ පොලිස්පතිවරයා රටට පැහැදිලි කර දිය යුතු ව තිබේ. ඉහළ නිලධාරීන් මේ අතිශය වැදගත් තොරතුර ජනාධිපතිවරයාගේ (ප්‍රධාන අණදෙන නිලධාරී සහ ආරක්ෂක ඇමතිගේ), රටේ අගමැතිවරයාගේ සහ 'ජාතික ආරක්ෂක මණ්ඩලයේ' අවධානයට යොමු නොකළේ මන්ද? මාස ගණනක් තිස්සේ එකී 'ජාතික ආරක්ෂක මණ්ඩලයට' අගමැතිවරයා සහභාගී නොවුණේ මන්ද? මේ විනාශය ඇති වූ මොහොතේ දී පවා,



© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අගමැතිවරයා විසින් හදිසියේ කැඳවන ලද රැස්වීමක් 'ජාතික ආරක්ෂක මණ්ඩලයේ' සාමාජිකයන් නොතකා හැරියේ මන්ද? වැඩ බලන ආරක්ෂක ඇමතිවරයෙකු පත්කිරීමකින් හෝ ජාතික ආරක්ෂාවට අදාළ වැදගත් කාරණා ගැන අගමැතිවරයා සමග සාකච්ඡා කිරීමකින් හෝ තොර ව ජනාධිපතිවරයා රටින් බැහැර ව ගියේ මන් ද? සිදුවිය හැකි ත්‍රස්තවාදී ප්‍රහාරයක් පිළිබඳ ලැබී තිබුණු වැදගත් තොරතුරු, ආගමික නායකයන් සහ සාමාන්‍ය ජනතාවට තමන්ගේ ආරක්ෂාව සලසා ගැනීම සඳහා ප්‍රයෝජනවත් විය හැකි ව තිබිය දී, රාජ්‍ය නිලධාරීන් ඒ තොරතුරු එම පිරිස් සමග බෙදා නොගත්තේ මන් ද?'' (ගුණසේකර සහ විකේරා, 2019). මේ සා බොහෝ ගැටලු හමුවේ තහවුරු වෙමින් පවතින්නේ සංසිද්ධිය සිදුවිය හැකි ව තිබූ බැව් දැන දැනත්, එදිනෙදා දේශපාලන වාසි ලබාගැනීමේ අරමුණෙන් ඔවුන් ක්‍රියාත්මක වූ බව ය.

මෙම සංසිද්ධියට අදාළ ව පරීක්ෂණ පවත්වමින් සිටින පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව හමුවේ අනාවරණය වූ එක් කාරණයක් වූයේ 2017 වසරේ දී මෙම ප්‍රහාරයේ මහ මොළකරු ලෙස ප්‍රකට සහරාන්ට එරෙහි ව පරීක්ෂණ පැවැත්වීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ඉල්ලා ඇති බව ය. කුමක් හෝ හේතුවකට එකී ඉල්ලීම් සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිචාර ලැබී නොතිබිණි. මෙවන් ප්‍රහාරයකින් රටේ පැවති තිස් වසරක යුද්ධය, දකුණේ බෝම්බ පිපිරීම් යළි සිහිගන්වනු ලබයි. යළි එවැනි බියකරු, ත්‍රාසජනක අත්දැකීමකට මුහුණ දීමට කිසිසේත් ම කැමැත්තක් නොදක්වන ලාංකේය සමාජය 'ජාතික ආරක්ෂාව' ප්‍රමුඛ කොට සලකන නායකත්වයකට සිය කැමැත්ත පළකරයි. ඒ අනුව 2020 ජනාධිපතිවරණයේ තීරණාත්මක සාධකය පාස්කු ඉරිදා ප්‍රහාරය හා සමපාත ව පවතින අයුරු මෙයින් විද්‍යමාන වේ.

## නිගමනය

2019 අප්‍රේල් 21 වන දින සිදු වූ බෝම්බ ප්‍රහාරය ලාංකේය ජන සමාජය තුළ මෙන් ම දේශපාලන සිතියම තුළ ද, නව තීරණාත්මක මොහොතක් සනිටුහන් කර තිබේ. එය පළමු ව ගෝලීය ත්‍රස්තවාදයේ අභිමතාර්ථයන් සාක්ෂාත් කරගනු පිණිස කතෝලික ප්‍රජාව ඉලක්ක කරගත් අයි. එස් ප්‍රහාරයක් මතුපිටින් කියවා ගත හැකි වුව ද, එයට ගෝලීය දේශපාලනයේ, ආර්ථික කොන්දේසි ගණනාවක සහසම්බන්ධයක් පවතින බැව් නිරීක්ෂණය කළ හැකි ය. දෙවනුව එකී ගෝලීය දේශපාලන න්‍යාය පත්‍රයේ කොටසක් ලෙස මැදිහත්වීමට සුදුසු දේශපාලන-සමාජ වාතාවරණයක් අවස්ථාවාදී දේශපාලඥයින් හා ජනමාධ්‍ය විසින් උසිගන්වන ලදුව මුස්ලිම් ප්‍රජාවට එරෙහි ව ප්‍රහාරයක් දියත් කළ සිංහල අන්තවාදී ප්‍රහාරයන් කෙරෙන් සකස් කර තිබුණු බැව් පිළිගන්නට සිදුවේ. තෙවනුව ශ්‍රීලනිප නියෝජනය කරන ජනාධිපතිවරයෙකු, එජාපය නියෝජනය කරන අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක් කෙරෙන් පවත්නා විධායකය හා ව්‍යවස්ථාදායකය අතර පවත්නා මත ගැටුම්, ඉදිරි මැතිවරණ දේශපාලනය කෙරෙහි කරන ගණන් තැබීම් සමග දෛනික මහේක්ෂ දේශපාලනය ගැටගැසී තිබීම ය. මේ හේතුව නිසා ම පහසුවෙන් එකිනෙකා කෙරෙහි වගකීම ලිස්සා යැවීමේත්, දේශපාලන මැතිවරණ ප්‍රචාරණය සඳහා ලාංකේය සමාජයේ සංවේදී තත්ත්වයන් දඩමීමා කර ගැනීමටත් මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව ඉහළ මට්ටමක පවතී. මේ අනුව තල ත්‍රිත්වය ම එකිනෙකට බහිෂ්කාරකවීමකින් තොර ව එකිනෙක සහසම්බන්ධයකින් යුතු ව ක්‍රියාත්මක වූ බවත්, එකිනෙකෙහි අන්තර් සම්බන්ධතාව තුළින් මෙවන් ප්‍රහාරයක් හා බෙදවාචකයක් අනිවාර්යතාවක් ව පැවති බවත් නිගමනය කළ හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය


Chandra, Kanchan (2003), Why Ethnic Parties Succeed: Patronage and Ethnic Headcounts in India,California Digital Library, University of California.

Dewasiri Nirmal (2016), New Buddhist Extremism and the Challenge to Ethno-Religious Coexistence in Sri Lanka, ICES, Colombo 08.

Edward, S. Herman and Chomsky, Noam (1988). Manufacturing Consent: The Political Economy of the Mass Media, New York City : Pantheon Books.

Gramsci, Antonio (2007). Prison notes, London: Elec Book.

Gunasinghe Niwton (1990), CAPITALIST DEVELOPMENT IN SRI LANKA-A periodization, ECONOMIC REVIEW NOVEMBER, Colombo.

Kannangara vidharsana (2014), Rajapakshawadaya; hegomoniyaka sita dadabimata nohoth dada ballange budu pissuwa(Rajapaksasism;from Hegomny to hunting land nor hunting dog.s creasy on Buddha) http://www.boondi.lk/article.php?ArtID=4302.

Laclau, Ernesto (1977). Politics and Idelogy in Marxist Theory, London: VERSO.

Mouffe, Chantal (1979). Hegemony and Ideology In Gramsci In Gramsci and Marxist Theory (ed) Moufee, Routledge and Kegan Poul.

Munasinghe Prabath and Ariyarathne Kaushalya (2019),Islamic Extremism:Clash of Civilization



© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

or Clash within Civilization?,Law & Society Trust, Colombo 08.

Hoffman Bimber (1998) Inside Terrorism. 1 Hoffman, Bruce, Inside Terrorism, (New York: Orion Publishing Co. 1998) p. 205.

Hornby A.S (2005) Oxford Advanced Learner's Dictionary Of current English (seventh edition) Oxford University press.

Schmid Alex (2004) Terrorism-The Definitional Problem, Case Western Reserve Journal Of international Law, Volume 36,issue 2.

Stern,Jessica, Berger J.M (2016) ISIS- State-Terror, ecco (HarperCollins Publishers) Manhattan.

http://www.sundaytimes.lk/article/1085154/govt-didnt-expect-an-attack-of-this-magnitude-defence-secretary-23-04-2019

VERITE RESEARCH (2012 නොවැ.12-2012 නොවැ.18). පුවත්පත් මාධ්‍ය විශ්ලේෂණය: VOL 02,#41.

අමරකීර්ති ලියනගේ (2019) ඉස්ලාම් මූලධර්මවාදය හා බටහිර නූතනත්වය, https://www.colombotelegraph.com/index.php/liyanage-amarakeerthi-3-may-2019/

ඉරිදා ලංකා 2019-05-05 බණ්ඩාර අනුහස් 4/21 ගැන වෙනස් කියැවීමක්, ලංකා ෆස්ට් රේට් පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්, නුගේගොඩ.

ඉරිදා ලංකාදීප 2019-05-05 ජයසූරිය ප්‍රසන්න ශ්‍රීනාත්, තෙල්දෙණිය ප්‍රහාරයෙන් පසු විශාල පිරිසක් අපට එකතුවුණා-සහරාන්ගෙ පිරිස් සී.අයි.ඩීයට කියති, විජය පුවත්පත් සමාගම, කොළඹ 08.

ගුණසේකර සාවිත්‍රී සහ වික්ටර් දුලිප් ද (2019) ජනපතිට වගකීමෙන් මිදිය හැකි ද? https://www.colombotelegraph.com/index.php/friday-forum-28-april-2019/

රතන අතුරලියේ 2019 මැයි 16 ශ්‍රී ලංකා පදනම් ආයතනය, කොළඹ.

ලංකාදීප 2019-07-01 ජයවර්ධන තරිඳු ගමගේ බිගුන් සහරාන්ලා හැදුණු වැඩුණු රහස් කතාව- විජය පුවත්පත් සමාගම- කොළඹ 08.

චාමින්ද, සුමිත් (2003). පශ්චාත් මාක්ස්වාදයට හැඳින්වීමක්- දෘෂ්ටිවාදය හා කතිකා විශ්ලේෂණය, එක්ස් කණ්ඩායමේ අභ්‍යන්තර අධ්‍යයන කවයට ඉදිරිපත් කළ පත්‍රිකාව, පිටු 24 (අමුද්‍රිතයි).

විජේසිරිවර්ධන, සුනිල්. (2010). පුරවැසි මංපෙත් , කොළඹ: ෆ්ලික්ට් ආයතනය.

වික්‍රමාරච්චි, සමන්. (2011). කළු වළසාගේ සම්ප්‍රාප්තිය, නුගේගොඩ: සංහිඳ ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්.

විජේබණ්ඩාර ප්‍රියාන් (2015). හෙජමොනිය හා දෘෂ්ටිවාදය ගොඩනැංවීමෙහිලා මාධ්‍ය භාවිතය, කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ජනමාධ්‍යවේදී පශ්චාත් උපාධිය වෙනුවෙන් සම්පාදනය කළ නිබන්ධනය, ශ්‍රීපාලි මණ්ඩපය, වැවල, හොරණ.

විජේවර්ධන ඩබ්.ඒ (2019) ප්‍රජාතන්ත්‍රවාදයට වින කටින ගෝලීය ත්‍රස්තවාදය සමග පොරබැදිය යුත්තේ ගෝලීය මට්ටමිනි, https://www.colombotelegraph.com/index.php/w-a-wijewardena-1-may-2019/

විදානගේ හරීන්ද්‍ර 2019, අප්‍රේල් 27 වන දින මොරටුව සර්වෝදය මූලස්ථානයේදී සිදු කළ දේශනය

ෆාරුක් ලතීෆ්: මුස්ලිමුන්ට එරෙහිව මාධ්‍ය පරි.හේමන්ත රණවීර, රාවය 17 වෙනි කාණ්ඩය,14 වෙනි කලාපය, රාවය පබ්ලිෂර්ස් ඇන්ඩ් ගරන්ට් සමාගම,


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
එකොළොස්වන කලාපය 2020 දෙසැම්බර්
පිටු 12-20
ISSN 1800-1459 eISSN 2386-2041
© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාව පිළිබඳ ආර්ථික භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයක්: මාතර දිස්ත්‍රික්කයේ පස්ගොඩ ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරිනි

(An Economic and Geographical Study of the Disparities of Sinhala and Tamil Plantation Workers: With Reference to Pasgoda Division of Matara District)

කේ. පී. කේ. සඳමාලි

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, ගම්පහ
sandamalikrishna88@gmail.com

**සාරසංක්ෂේපය**

කම්කරුවා යනු සම්භාව්‍ය ආර්ථික විද්‍යා න්‍යායට අනුව නිෂ්පාදන ක්‍රියාවලියට සක්‍රිය දායකත්වයක් සපයන පුද්ගලයෙකි. බටහිර ජාතීන් මෙරටට පැමිණීමත් සමග මෙරට තේ, කෝපි, රබර්, වගාවන් ආශ්‍රිත ව සේවය සැපයීමට පැමිණි පිරිස් වතු කම්කරුවන් වශයෙන් හඳුන්වනු ලැබේ. මෙලසින් සේවය කරන කම්කරු පිරිස සිංහල හා දෙමළ වශයෙන් විවිධ ජාතීන්ගෙන් යුක්ත අතර ඒ අනුව ඔවුන්ගේ ආර්ථිකයෙහි බොහෝ වෙනස්කම් හඳුනාගත හැක. එනම් ඔවුන්ගේ ආදායම, වියදම, පහසුකම්, ව්‍යාප්තිය, ඉඩම් හිමිවීම යනාදී වශයෙන් බොහෝ වෙනස්කම් පැවතීමය, ඔවුන්ගේ ජීවන රටාවත් පාදක කරගනිමින් මෙසේ වෙනස්කම් සිදු වී ඇත. ඒ අනුව මෙලෙසින් විෂමතාවන් හඳුනා ගැනීමත්, එම විෂමතාවන්ට පාදක වූ හේතූන් විමර්ශනය කිරීමත් මෙම අධ්‍යයනය මගින් සිදුකර ඇති අතර ඒ අනුව මෙලෙසින් පවතින විෂමතාවන් අවම කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ගයන් ඉදිරිපත් කිරීම තුළින් පීඩිත පංති දෙමළ කම්කරු පිරිස්වලට ඉන් විශේෂ අවස්ථාවන් හිමිකර ගත හැකි අතර, පොදුවේ සියලු ම කම්කරුවන්හට සිය අපේක්ෂාවන් ඉටු කර ගැනීමට මෙමගින් අවස්ථාව සැලසේ. එබැවින් සිංහල හා දෙමළ කම්කරු ආර්ථික විෂමතාවන් පිළිබඳ ව මින් විමර්ශනය කෙරේ.

කේන්ද්‍රීය වචන: වතුකම්කරුවා, ආර්ථික විෂමතාව, විවිධ ජාතීන්, සමාජ අවකාශය, කම්කරු ආර්ථිකය

According to classical theory, the worker is a person who contributes to the manufacturing process. With the arrival of westerners, the laborers who came to Sri Lanka to work in tea, rubber, and coffee estates and related work are known as plantation workers. This employment class consists of different ethnicities, Sinhala and Tamil, and accordingly, many differences can be distinguished among them in terms of their income, expenditures, distribution, land acquisition, etc. In this study, the differences were identified and the underlying causes of these recurrences were examined. Accordingly, by presenting suitable measures to reduce the existing disparities, the oppressed class will be given special opportunities, especially for the Tamil workers, and in general to meet its aspirations for all workers. Therefore this review will be carried out to examine their economic anomalies.

Key words: State labour, Economic disperaties, Different ethnicity, Social space, Labour economy

## හැඳින්වීම

සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාව පිළිබඳ විමසා බැලීමේ දී වතු කම්කරුවා යන්න කවුරුන් දැයි හඳුනාගත යුතු ය. එනම් තේ, රබර්, කෝපි ආශ්‍රිත වගාවන්හි තම ශ්‍රමය කැප කරමින්, ඒ ආශ්‍රිත ව ජීවත් වන පිරිස් වතු කම්කරුවන් වශයෙන් හඳුන්වා දිය හැකි ය. ශ්‍රී ලංකාවේ ද මෙම වතු භෝග ආශ්‍රිත ව සේවය කරන මෙරට සිංහල ජනයා සහ දකුණු ඉන්දියාවෙන් පැමිණි ද්‍රවිඩ ජනයා ශ්‍රී ලංකාවේ වතු කම්කරුවන් වශයෙන් හඳූන්වා දිය හැකි ය. මේ අනුව ශ්‍රී ලංකාවේ වතුකරයේ ජීවත් වන්නන්ගෙන් 99% දෙනෙක් ම වතු කම්කරුවන් වේ (ඊරියගම 2006). රටේ නේවාසික කම්කරුවන් වශයෙන් වතු කම්කරුවන් හඳුනාගත හැකි ය. ශ්‍රී ලංකාව තුළ සිංහලයින් වතු ආශ්‍රිත ශ්‍රමිකයින් වීමට මුල්කාලීන ව අකමැති වූ හෙයින් බ්‍රිතාන්‍යන් විසින් 1833 දී කෝල්බෲක් ප්‍රතිසංස්කරන මගින් රාජකාරි ක්‍රමය අහෝසි කිරීම හේතු කොට ගෙන සිංහල ජනතාව තම පාරම්පරික වාස භූමි අතහැර සංක්‍රමණය වීමට පටන් ගැණුණි. මෙම ප්‍රතිසංස්කරණ නිසා සිංහල ගැමියන්ට තම ඉඩම් විකුණා දමන්නට හැකියාව උදාවිය. සෑම ගැමියෙක් ම තම පාරම්පරික උරුමයන් ආරක්ෂා කළ බැවින් මෙම ක්‍රම දෙක ම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් බ්‍රිතාන්‍යය වැවිලිකරුවන්ගේ අපේක්ෂාවන් ඉටු නොවිණි. ඉන්පසු ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයෙන් ජීවත් වන සිංහල ගැමියන්ට නොයෙකුත් බදු ක්‍රම හදුන්වා දෙමින් වතු කම්කරු ශ්‍රමිකයන් ලෙස බඳවා ගැනීමට උත්සාහ දැරීය. ඒ අනුව බදු ගෙවීමට සිදුවිය. මෙය ඔවුන්ගේ කෘෂි ආර්ථිකය බිඳහෙලිමට කළ කටයුත්තක් ලෙසින් හඳුනාගත හැක (පියරත්න 2009). එහිලා බ්‍රිතාන්‍යයන්ට ප්‍රමාණවත් සිංහල ශ්‍රමික පිරිසක් මෙමගින් ඇති නොවිණි. මේනිසා 1825 සිට දකුණු ඉන්දියාවෙන් දෙමළ පීඩිත පන්ති ශ්‍රමිකයන් ගෙන්වා ගන්නා ලදි. මේ අනුව 1891 දී 2,35000 ක පිරිසක් ද , 1921 දී 500000 ක පිරිසක් ද , 1931 දී 700000 පමණ පිරිසක් දක්වා ශ්‍රමික වර්ධනය ඉහළ ගියේ ය (ජයවර්ධන 1978). මෙලෙස මුලින් ම කම්කරුවන් වශයෙන් බඳවාගෙන ඇත්තේ කින්නවේලි, මදුර , තන්ජෝර්, යන ප්‍රදේශවලිනි.

මොවුන් මෙරටට පැමිණ ඉතා දුෂ්කර ජීවිතයක් ගතකර ඇත. මෙසේ කම්කරුවන් වශයෙන් බඳවාගනු ලබන්නේ අවුරුදු 15-70 අතර පිරිස් ය. එසේ ම මෙම ශ්‍රමිකයන්ගේ පදිංචිය සිදුවූයේ වතු ආශ්‍රිත ලැයිම් නමින් හඳුන්වන කුඩා කාමරවල ය. මුල් කාලීන ව මෙම කාමරයක් තුළ පුද්ගලයින් දස දෙනෙක් පමණ සිට ඇත. මොවුන් ඉතාමත් දුෂ්කර ජීවිතයක් ගතකර ඇත. ශ්‍රී ලංකාවේ වසර 200 ක පමණ ඉතිහාසයක් මොවුන්ට ඇත. ඒ අනුව උඩරට සිංහල ශ්‍රමිකයින් වතුවල ශ්‍රමිකයින් ලෙසින් මීට අනුගත නොවූ අතර ඔවුන් වතුවල සේවයට නොපැමිණියේ ය. නමුත් පහතරට ගැමියන් වතු ආශ්‍රිත කම්කරුවන් විය. මේ අනුව 1930 වන විට සිංහල ගැමි කම්කරුවන් 10000 පමණ නියැලි සිට ඇත. ඒ අනුව 1931-3.9% දෙමළ ජනයා වතුවලින් අඩු වීමටත්, සිංහල කම්කරුවන් 5.9% වැඩි වූ බවත් හඳුනාගෙන ඇත (Hollup 1994). වතු කම්කරු ආර්ථිකය දෙස විමසිලිමත් වීමේ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය දෙවදෑරුම් ලෙසින් හඳුනාගත හැකි ය. එනම්, යැපුම් අංශය හා නූතන අංශය ලෙසිනි. බ්‍රිතාන්‍යයන් මෙරටට පැමිණ වතු වගාව ආරම්භ කිරීමත් සමඟ නූතන අංශය ඇරඹුණි (ඊරියගම 2006). ඒ අනුව කෘෂි ආර්ථිකය මත පදනම් වූ මෙරට ජනතාවගේ ආර්ථිකය නූතන අංශය වර්ධනය වීමත් සමග වෙනස් මුහුණුවරක් ගනු ලැබී ය. වතු වගාව ආශ්‍රිත ව කම්කරු පිරිසක් වර්ධනය වීමත් සමග ඔවුන්ගේ ජාතිකත්වය මත ආර්ථිකයේ වෙනස්කම් හඳුනාගත හැකි ය. ඒ අනුව ඔවුන්ගේ පවුල් තත්ත්වය, නිවාස ව්‍යුහය, ඉඩම් අයිතිය, රැකියාව, යනාදී විවිධ අංශයන්හි මෙසේ වෙනස්කම් හඳුනාගත හැකි ය (විජයචන්ද්‍රන් 2006). මෙසේ ආර්ථිකය තුළ විෂමතා හඳුනා ගත හැකි අතර ඒ අනුව කම්කරු ආර්ථිකයේ මෙන් ම වෙනත් ආර්ථිකයන් තුළ ද විෂමතා හඳුනාගත හැකි ය. වතු කම්කරු ආර්ථිකය ස්ථාවරත්වයක් නොමැත. මෙම ආර්ථිකය හිමි බොහෝ පිරිස් වගාවන් කර ගැනිමට තමන්ට ම අයිති ඉඩම් නොමැති ජනතාවක් වේ (Hollup 1994). මේ අනුව වෙනස්වන ආර්ථිකය තුළ ඔවුනට දෛනික අවශ්‍යතාවන් ඉටුකර ගැනිමට ප්‍රමාණවත් ඉපයීමක් නොමැත. විශේෂයෙන් කාන්තාවන් දලු කැඩිමේ දී දිනට නියමිත ප්‍රමාණය ලබා ගැණීමට නොහැකි වීම තුළ ඔවුන්ගේ දෛනික වැටුප අර්ධ වේ. එසේ ම ඔවුන් සේවයට නොපැමිණිය විට එහි දීමනාවන් නොමැති වේ. තව ද නියමිත වෙලාවට පැමිණ තමන්ට දිනයේ නියම කරන ලද වැඩ කොටස නිමකිරීම ද මොවුන් කළ යුතු අතර මෙහිලා වැටුප් ලබා දෙනුයේ ශ්‍රමය ලබා ගැනිමෙන් ඊට සාපේක්ෂව ය. මේ අනුව වෙනත් නිසි ආදායමක් නොලබන මෙම කම්කරුවන් පවුලේ කටයුතු සිදුකිරිමේ දී දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දේ. මේ අනුව මොවුන්ගේ ආර්ථික ස්ථාවර බවක් නොමැතිවීමට බොහෝ හේතුවල බලපෑමක් ඇතැයි හඳුනාගත හැකි ය. එනම් ඔවුන්ගේ වැටුප් ප්‍රමාණවත් නොවීම, වෙනත් ආදායම් මාර්ග නොමැති වීම, පහසුකම්වල පවතින ව්‍යාප්තිය, අධ්‍යාපන කටයුතුවල නියැලීමට ඇති ඉඩප්‍රස්ථා අවම වීම. ප්‍රමාණවත් ඉතිරිකිරීම් නොමැති වීම. යනාදි අංශ සැලකිය හැකි ය. එසේ ම දෙමළ ජනයාගේ අධික උත්සව පැවැත්වීම ද ආර්ථික අස්ථාවර බව නිසා වියදම් අධික වීමට හේතු වී ඇත. තව ද මෙයට ප්‍රභූ පැලැන්තියේ ක්‍රියාකාරීත්වය ද හේතු වේ. එනම් ප්‍රභූ පැලැන්තිය අඩු මුදලට කම්කරු ශ්‍රමය සූරා කමින් කෙටි කාලසීමාවක් තුළ තමන්ට උපරිම ලාභයක් ලබා ගැනිමට ඔවුන් තලා පෙළා කටයුතු කිරීම හඳුනාගත හැකි ය. ඒ අනුව වතු කම්කරු ආර්ථිකය වැසුණු ආර්ථිකයක් ලෙසින් හඳුනාගත හැකි ය (Hollup1994). වතු කම්කරු ශ්‍රමය බොහෝ අතින් අර්ධ වැටුප් කම්කරු ක්‍රමයක් වූයේ ය. ඉන්දියාවෙන් ලංකාවට කම්කරුවන් ආගමනය කළ මුල් කාලයේ දී ආණ්ඩුව කම්කරුවන් කෙරෙහි අනුගමනය කළේ සම්පූර්ණයෙන් ම නිර්බාධ ප්‍රතිපත්තියකි. නමුත් පසුකාලීන ව කම්කරුවන්ගේ ඇතිවූ හිගයත් සමග වතු කම්කරුවන්ගේ සේවා නියුක්ති ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් බොහෝ සහන සලසා දුණි. මේ අනුව වතු කම්කරුවන් පීඩාවට පත් කරමින් මුල්කාලයේ තිබූ ආර්ථික ක්‍රමය වෙනස් කිරීමට වතු ජනසතුකරණය, ඉඩම් ප්‍රතිසංස්කරණය මෙන් ම 1977 හඳුන්වාදුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ද හේතු විය. තව ද 1889 දී පනවන ලද වතු කම්කරු අඥා පනතින් සේවා ගිවිසුම් වැටුප් ගෙවීම් හා ඒ සම්බන්ධ වෙනත් කරුණු සම්බන්ධයෙන් ආගාමික කම්කරුවන්ගේ සේවා නියුක්තිය විධිමත් කෙරුණි. පසුකාලින ව වෘත්තිය සමිති ව්‍යාපාර ද මේ හරහා ව්‍යාප්ත විය. වර්තමානය වන විට මෙම වතු භෝග ආශ්‍රිත කම්කරු ශ්‍රමය බොහෝ සෙයින් අඩු වී ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රදේශිය වැවිලි සමාගම් 23 න් 17 කම ශ්‍රමය සම්බන්ධ හිගයක් පැවතුණු බව වාර්තා වේ (සිවරාම් 2001). මෙලෙසින් කම්කරුවන් බොහෝ සෙයින් ආර්ථිකමය වශයෙන් පීඩාවට පත් ව ඇති බව හඳුනාගත හැකි ය. මෙලෙසින් කම්කරු ආර්ථික ස්ථාවර බවක් නොමැති වීමත්, ආර්ථික විෂමතාව ඇතිවීමටත් බොහෝ කරුණුවල බලපෑමක් ඇත. ඒ අනුව ආර්ථික විෂමතාවට පහසුකම්වල ව්‍යාප්තිය, ඉතිරිකිරීම්, ඉඩම්වල අයිතිය, සෞඛ්‍යය හා සනීපාරක්ෂක බව, නූගත් බව, ආදී බොහෝ කරුණුවල බලපෑමක් ඇතැයි අපේක්ෂා කළ හැකි ය. මෙලෙසින් සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථිකමය විෂමතාවන් හඳුනාගත හැකි ය.

## සාහිත්‍ය විමර්ශනය

"ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ උපත හා විකාශනය" ග්‍රන්ථයේ සඳහන්වන පරිදි රටේ ආර්ථික හා සමාජ ව්‍යුහය සමඟ සම්බන්ධ වී ඇති අයුරු පෙන්වීම සහ එමගින් 1933 දක්වා වූ කාලය තුළ පැන නැගුණු ආගමික හා දේශපාලන ව්‍යාපාර පසුබිම් කරගෙන මෙරට කම්කරු පංති ඉතිහාසය ඉදිරිපත් කිරීම සිදුකර ඇත. ඒ අනුව මෙම ග්‍රන්ථයේ පළමු පරිච්ඡේදයේ කම්කරු ව්‍යාපාරයේ උපත, ආර්ථික පසුබිම, නාගරික නිර්ධන පංතිය, ලිපිකාර සේවකයන් මෙන් ම වතු කම්කරුවන් පිළිබඳ විස්තර කර ඇත. මේ අනුව ද්විධ වතු කම්කරුවන්ගේ ආගමනය පිළිබඳ ව හා ඔවුන්ගේ වැටුප් විෂමතා, සංස්කෘතිය, වතු කම්කරුවන් සූරා කෑම පිළිබඳ ව මෙන් ම කම්කරුවන් මෙරටදී මුහුණදුන් ගැටලු පිළිබඳ ව විස්තර කර ඇත (ජයවර්ධන, 1978:54). "ශ්‍රී ලංකාවේ යටත් විජිතවාදය" පිළිබඳ රචිත ග්‍රන්ථයේ වතු ව්‍යාපාර හා ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම පිළිබඳ විග්‍රහ කර ඇත. මේ අනුව වතු ආශ්‍රිත සිංහල ශ්‍රම බලකායක් නිර්මාණය කර ගැණිමට යටත් විජිත පාලකයන් දැරූ


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

උත්සාහය විග්‍රහ කර ඇත. ඒ අනුව සිංහල ශ්‍රමිකයන් වතු කම්කරුවන් ලෙසින් බඳවා ගන්නේ කෙසේ ද? ඔවුන්ගේ ශ්‍රමය උපයෝගී කර ගත්තේ කෙසේ ද? යන්න විග්‍රහ කර ඇත. තව ද මෙම ග්‍රන්ථයේ සිංහල කම්කරුවන්ගේ ඇති අලසකම පිළිබඳ විග්‍රහ කර ඇත. ඒ අනුව කෝපි වගාව තුළ ශ්‍රම සැපයුම සිදුවී ඇති ආකාරයත්, පසු කාලීන ව තේ වගාව ආශ්‍රිත ව ශ්‍රමික පිරිස වර්ධනය වූ ආකාරයත් මින් විග්‍රහ කර ඇත. මෙසේ ශ්‍රමික පිරිස් වැඩි වශයෙන් අවශ්‍යය වූ කල සිංහල ශ්‍රමිකයන්ගේ උදාසීනත්වය නිසා ශ්‍රමයේ හිඟ තත්ත්වයන් ඇති වූ අයුරු මෙමගින් විස්තර කර ඇත. එසේ ම පසුකාලීන ව දකුණු ඉන්දියාවෙන් ශ්‍රමික පිරිස් ගෙන්වා ගත් ආකාරයත්, ඔවුන් මුහුණ දුන් ගැටලු හා දුක්ඛිත ජීවිතය පිළිබඳ විග්‍රහ කර ඇත. තව ද එම කම්කරුවන්ගේ ශ්‍රමය ලබාගත් අයුරු මෙමගින් විස්තර කර ඇත. එසේ ම වතු ශ්‍රමිකයින් බඳවා ගැනීමත්, ඔවුන් එම වතු ආශ්‍රිත ව ජීවත් වූ ආකාරයත් මින් විග්‍රහ කර ඇත (අශෝකා ,2005:87). ශ්‍රී ලංකාවේ යටත් විජිත වාදය" මෙම ග්‍රන්ථයේ පිළිබිඹු කරනුයේ වතුකරයේ කාන්තා ශ්‍රමය සූරාකෑම පිළිබඳව යි. ඒ අනුව මින් කම්කරු කාන්තාව පිළිබඳ විමර්ශනය කර ඇත. මෙහි දී කම්කරුවන්ගේ විකාශනය සිදු වූ අයුරු ඔවුන්ගේ සමාජ ආර්ථික තොරතුරු පිළිබඳ විග්‍රහ කර ඇත. එසේ ම මෙම කාන්තාවන් වතුවල වැඩ කරන අන්දම, ඔවුනට ලැබෙන වැටුප් විෂමතා ඔවුන් සිය ජීවිතයේ ඉටුකළ යුතු මෙහෙවර හා පවුල තුළ ඔවුනුට පැවරී ඇති වගකීම් පිළිබඳ මින් විමර්ශනය කර ඇත. එසේ ම කාන්තාවන් පුරුෂ ආධිපත්‍යය හමුවේ මුහුණදෙන ගැටලු වතු ආශ්‍රිත ඔවුන්ට සිදුවන හිංසා පීඩා, ලිංගික අපචාර පිළිබඳ විග්‍රහ කර ඇත. මෙම ගැටලු අවම කිරීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරමින් පුළුල් විග්‍රහයක් කර ඇත (කූරියන් සහ ජයවර්ධන, 1984:44). "වතුකරයේ කාන්තා ශ්‍රමය සූරාකෑම" මෙම ග්‍රන්ථයෙන් ශ්‍රී ලංකාවේ වතු දෙමළ කම්කරුවන් පිළිබඳ සිදුකරන ලද පර්යේෂණය ඇසුරින් බන්ධිත කම්කරුවන්ගේ කුල ක්‍රමයේ වෙනස්කම් හා එහි පැවැත්ම පිළිබඳ ව කරුණු ඉදිරිපත් කර ඇත. එසේ ම ශ්‍රී ලංකාවේ දෙමළ වතු කම්කරුවන් පිළිබඳ මින් බොහෝ කරුණු විග්‍රහ වී ඇත. ඒ අනුව ජාතීන්ගේ පදනම, මානව සංස්කෘතිය, දේශපාලන සංවර්ධනය, වතු අංශයේ ආර්ථික සංවර්ධනය, වතු කම්කරුවන්ගේ ස්ත්‍රී පුරුෂ බව අනුව ශ්‍රමය වෙනස්වන අයුරු හා වැටුප් විෂමතාව එමෙන් ම කම්කරු ආදායම, වතු ආර්ථික විෂමතාව, වතු කම්කරුවන්ගේ දිළිඳු බව, වතු කම්කරු සමාජ සංවිධානය, වතු කම්කරු සංකල්ප මෙන් ම වතු කම්කරු ආර්ථික ප්‍රපංචයන් මෙහි දී විග්‍රහ කර ඇත. මේ අනුව වතු කම්කරු සමාජ සංවිධානය පිළිබඳ පුළුල් විග්‍රහයක් මෙමඟින් සිදුකර ඇත (Hollup, 2004:75). පියරත්න විසින් වතු කම්කරුවන් පිළිබඳ රචිත ග්‍රන්ථයේ සඳහන් වන පරිදි ද්‍රවිඩ වතු කම්කරුවන් මෙරටට පැමිණි ආකාරයත්, ඔවුන්ගේ ජීවිතවල දුක්ඛිත තත්ත්වයත් එමෙන් ම සිංහල ශ්‍රමිකයින් වතු කම්කරු සේවයට යොමු වු ආකාරයත් ඔවුන්ගේ ජීවන රටාවන්හි වෙනස්වීමත්, අතීතයේ සිට වර්තමානය තෙක් කම්කරු විකාශනය සිදුවූ ආකාරයත් මෙමගින් විග්‍රහ කර ඇත. එසේ ම වර්තමානයේ කම්කරුවන් වෙනුවෙන් ඇතිවී තිබෙන සුභසාධන කටයුතු හා ඔවුන් වෙනුවෙන් ඇතිකරනු ලැබූ අණපනත් ආදිය පිළිබඳ මෙම ග්‍රන්ථය තුළින් ඉදිරිපත් කර ඇත. කරුණානන්ද (1999) විසින් රචිත ග්‍රන්ථයේ සඳහන් වනුයේ ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාසයයි. ඒ අනුව මෙහි පළමු පරිච්ඡේදය තුළ 1833 දක්වා බ්‍රිතාන්‍ය පාලනය යටතේ මෙරට ආර්ථිකය පිළිබඳ විස්තර කිරීමේ දී ශ්‍රමය සම්බන්ධයෙන් විස්තර කිරීම සිදුකර ඇත. මේ අනුව වතු කම්කරු ආගමනය සිදු වූ අයුරු බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු වතු කම්කරුවන් සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරය, එහි දී කම්කරුවන් කටයුතු කළ ආකාරයත් මෙමඟින් විස්තර කර ඇත (කරුණානන්ද, 1999:72). සිවරාම් සිය ලිපිය මඟින් විස්තර කරනු ලබන්නේ ද වතු කම්කරුවන්ගේ හීන වී යන ශ්‍රම බලය හා ඊට යෙදිය යුතු පිළියම් මෙන් ම ඉඩම් හා ශ්‍රමික සම්බන්ධතා මෙන් ම ශ්‍රම ඵලදාව, ශ්‍රම පිරිවැය හා වැටුප් ප්‍රවණතා, අනාගත ශ්‍රම පසුතලය පිළිබඳ ව මින් විස්තර කර ඇත. තේ කර්මාන්ත කම්කරුවන්ගේ වැටුප් ප්‍රමාණ මේ ආදී වශයෙන් තේ කර්මාන්ත කම්කරුවන්ගේ ශ්‍රමය පිළිබඳ විස්තරයක් මෙමගින් විග්‍රහ කර ඇත (සිවරාම්, 2001:86).

සියල්ල විමසා බැලීමේ දී මෙම ග්‍රන්ථ මඟින් විස්තර කරනු ලබන කරුණු අතර වතු කම්කරු වැටුප් විෂමතාව, ද්‍රවිඩ කම්කරුවන්ගේ පැමිණීම, වතු කම්කරු ශ්‍රම සූරා කෑම, ශ්‍රමිකයන්ගේ දුක්ඛිත තත්ත්වය, වතු කම්කරුවන් මුහුණපාන ගැටලු, ඔවුන් සේවයට බඳවා ගැනීමෙ දී හා සේවය කිරීමෙ දී අත්විඳින තත්ත්වයන්, ඔවුන්ගේ පෝෂණය, ආර්ථික දිවි පැවැත්ම, ණය ගැති බව, ඉතිරිකිරීම් ආදිය පිළිබඳ විස්තර කර ඇත. තව ද වතුකරයේ ශ්‍රම වෙළඳපොළ, වතුකරයේ ජනගහන වර්ධනය වූ අයුරු, තව ද වැටුප් විෂමතාව, ශ්‍රමයේ පවතින ගැටලු, සේවා නියුක්තිය සම්බන්ධයෙන් මෙහි දී සාකච්ඡා කර ඇත. එසේ ම මෙම ග්‍රන්ථ හා ලිපි මඟින් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාවරුන් කම්කරුවන් සම්බන්ධයෙන් ක්‍රියා කළ අයුරු ආදිය විස්තර කර ඇත. කම්කරු ජනතාව අතීතයේ සිට වර්තමානය තෙක් ක්‍රියා කළ අයුරු මෙන් ම ඔවුන්ට වර්තමානයේ ඇතිවී තිබෙන සුභසාධන කටයුතු මෙන් ම ඔවුන් වෙනුවෙන් ඇති අණපනත් පිළිබඳ මෙම ග්‍රන්ථ මඟින් කරුණු ඉදිරිපත් කර ඇත. වතු කම්කරු හීන වීම, ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ බව අනුව ක්‍රියාකාරකම් වෙනස්වීම, වතු කම්කරු ආර්ථික ප්‍රපංචයන් හා ජාතීන්ගේ පදනම පිළිබඳ ව මෙම ග්‍රන්ථ කතුවරුන් විසින් විග්‍රහ කර ඇත. තව ද වතු කම්කරු කාන්තාවගේ තත්ත්වය ඔවුන්ට මුහුණ දීමට සිදුවන ගැටලුකාරී තත්ත්වයන් මෙහි දී පෙන්නුම් කර ඇත. මේ අනුව මෙම පර්යේෂණය තුළින් සිදුකරනු ලබන්නේ සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථිකමය විෂමතාවන් පිළිබඳ මාවරල ග්‍රාමය ඇසුරින් විග්‍රහයකි. ඒ අනුව උක්ත ග්‍රන්ථ හා ලිපි මඟින් එබඳු අධ්‍යයනයක් සිදුකර නොමැති අතර මෙම අධ්‍යයන ප්‍රදේශය ඇසුරින් මෙවන් අධ්‍යයනයක් කිසිවෙකුත් විසින් සිදුකර නොමැති බැවින් ඒ අනුව එම ලිපි, ග්‍රන්ථ හා පර්යේෂණවලින් මෙම පර්යේෂණය වෙනස් මුහුණුවරක් ගන්නා බව හඳුනාගත හැකි ය.


ⓒ 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## පර්යේෂණ ගැටලුව

වතු කම්කරු ආර්ථික විෂමතාව පිළිබඳ විමසා බැලීමෙ දී මෙයට ජාතිකත්වයේ බලපෑමක් ඇතැයි හඳුනාගත හැකි ය. මේ අනුව මෙම පර්යේෂණයේ අධ්‍යයනයට යොමුවන ප්‍රදේශය වනුයේ මාතර දිස්ත්‍රික්කයේ පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාවරල, කුඩාපාන, ගොම්බද්දල යන කම්කරු ශ්‍රමික පිරිස් ජීවත් වන පෙදෙසකි. මෙම ප්‍රදේශවල සිංහල හා දෙමළ වශයෙන් ජන වර්ග දෙපිරිසක් හඳුනාගත හැකි ය. එසේ ම මොවුන් තුළ ඉතා ඉහළ ආර්ථිකමය විෂමතාවක් පවතින බව පෙනෙන්නට තිබේ. මේ අනුව ප්‍රදේශය ඇසුරින් මෙසේ ආර්ථිකමය විෂමතාවට බලපාන හේතු වශයෙන් කම්කරු ඉතිරිකිරීම්වල, නිවාස පහසුකම්වල, ඔවුන්ගේ සෞඛ්‍යය හා සනීපාරක්ෂක බවෙහි මෙන් ම කම්කරු ඉඩම් අයිතියේ පවතින විෂමතා ආදි හේතූන් හඳුනා ගන්නා ලදී. මේ අනුව මෙම හේතූන් මෙම ප්‍රදේශයේ ගම්මානවල වෙසෙන සිංහල කම්කරුවන් හා වතු ලැයිම්වල වෙසෙන දෙමළ කම්කරුවන් මගින් පෙන්නුම් කෙරේ. එනම් තනි නිවාස වශයෙන් පවතින සිංහල කම්කරුවා සිය ජීවන රටාව හුදෙකලාව තමන්ට රිසිසේ තම භූමියෙන් උපරිම ප්‍රයෝජන ගනිමින් තමාගේ උරුමකම්වලට හිමිකම් කියන නමුත් දෙමළ කම්කරුවන් වතු ලැයිම්වල පොකුරු වශයෙන් සීමිත භූමි ප්‍රදේශයක තම අසීමිත අවශ්‍යතාවන් ඉටුකර ගනිමින් අවම පහසුකම් යටතේ අන්‍යයන් විසින් ලබාදුන් භූමියක ජීවත් වීම පෙන්නුම් කරයි. මේ අනුව සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාවක් පවතින්නේ ඇයි? යන්න මෙම අධ්‍යයනය සඳහා පාදක වූ පර්යේෂණ ගැටලුව වේ.

## අධ්‍යයනයේ අරමුණු

### ප්‍රධාන අරමුණ

සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථිකයේ විෂමතා හඳුනාගෙන, එම විෂමතා අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම.

### සුවිශේෂ අරමුණු

- සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ සමාජ, ආර්ථික පසුබිම හඳුනා ගැනීම.
- සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතා හඳුනා ගැනීම.
- ආර්ථික විෂමතා ඇතිවීමට බලපාන ලද හේතු විමර්ශනය කිරීම.
- වතු කම්කරු ආර්ථික විෂමතා අවම කිරීම සම්බන්ධයෙන් නිගමන හා යෝජනාවලට එළඹීම.

## පර්යේෂණ වැදගත්කම


මෙම පර්යේෂණයෙන් සිදුකරනු ලබන්නේ සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථිකමය විෂමතා සොයා බැලීමයි. මෙහි දී ජාතිකත්වය මත ආර්ථිකයේ විෂමතා පවතී නම් ඒවා අවම කිරීමට ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවක් පවතී. ඒ අනුව වතු කම්කරුවන්ගේ පහසුකම්වල අසම ව්‍යාප්තිය අවම කිරීමට, ශ්‍රම දායකත්වයේ පවතින විෂමතා අවම කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම තුළින් පවත්නා විෂමතා අවම කළ හැකි ය. එසේ ම සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතා අවම කිරීමට ඔවුන්ගේ ඉතුරුම් අංශය මෙන් ම ජීවන රටාවේ ද වෙනස්කම් හඳුනාගෙන, එම ඉතුරුම් ශක්තිමත් කිරීමටත්, ජීවන රටාව වෙනස් කිරීමටත්, ඔවුන්ගේ සෞඛ්‍යය ඉහළ නැංවීමටත්, ක්‍රියාමාර්ග ගැනීමට මෙම පර්යේෂණය තුළින් හැකි වේ. මෙමගින් වතු කම්කරුවන් කෙරේ රාජ්‍යය හා රාජ්‍ය නොවන අංශයන්ගේ අවධානය යොමුකරවීමේ හැකියාව ලැබෙනු ඇත. එසේ ම මේ පිළිබඳ වැඩිදුර අධ්‍යයනය කරන්නෙකුට මෙම පර්යේෂණය මගින් ආලෝකයක් ලබා ගත හැකි ය. සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාව පිළිබඳ සිදුකරන අධ්‍යයනයේ භූගෝල විද්‍යාත්මක වැදගත්කම විමසීමේ දී මෙම පර්යේෂණය ආර්ථික භූගෝල විද්‍යාව සමග සම්බන්ධ වේ. මේ අනුව සිංහල හා දෙමළ වශයෙන් සිදුවන ආර්ථිකයේ වෙනස්වීම පිළිබඳ අධ්‍යයනය, මෙහිලා ආර්ථික භූගෝල විද්‍යානුකූල වැදගත්කම පිළිබිඹු කරන්නකි. තව ද මෙම පර්යේෂණය වැදගත් වන විෂය ක්ෂේත්‍රයක් වන සමාජ භූගෝල විද්‍යාව යනුවෙන් හඳුන්වන්නේ සමාජ අවකාශය හා ස්ථානය පිළිබඳ ව අධ්‍යයනය කරනු ලබන විෂයකි. සමාජ අවකාශය යනු ජන සමාජයක් ජීවත්වන ස්ථානය ඔවුන් ඔවුන්ට අවශ්‍ය ආකාරයට එහි ඇති සුවිශේෂ තත්ත්වය හඳුනාගැනීමටයි. ''අවකාශය මගින් ප්‍රතිදර්ශනය කරනු ලබන සමාජ සිද්ධි විශ්ලේෂණය කිරීම'' (Ahmed de 1999) මෙලෙසින් සමාජ භූගෝල විද්‍යාව නිර්වචනය කර ඇත. මෙම පර්යේෂණයේ පරිදි සිංහල ජනයා ගම්මානවලත්, දෙමළ ජනයා ලැයිම්වලත් වාසය කිරීම හඳුනාගත හැකි ය. මේ අනුව මොවුන්ගේ ආර්ථික විෂමතාවක් පවතින්නේ ඇයි? යන්න විමසීමේ දී ඔවුන්ගේ සමාජ සංසිද්ධිවල බලපෑමක් හඳුනාගත හැකි ය. මේ අනුව මෙහි දී මෙම පර්යේෂණය මගින් සමාජ භූගෝල විද්‍යාත්මක වශයෙන් පවතින වැදගත්කම හඳුනාගත හැකි ය. කම්කරු ජනතාව හා ධනවාදය තුළ මාක්ස්වාදී බලවේග ක්‍රියාත්මක වන අතර ඒ අනුව මාක්ස්වාදී ප්‍රවේශය පසුකාලීන ව රැඩිකල්වාදී භූගෝල විද්‍යාව බිහිවීමට බලපා ඇත. මේ අනුව රැඩිකල්වාදී ප්‍රවේශයෙන් මිනිසාගේ බඩගින්න, සෞඛ්‍ය, වැනි අවශ්‍යතා ගැන අවධානය යොමුකරයි. මෙහි දී භූගෝල විද්‍යාඥයාගේ අපේක්ෂාව කුමක්ද සිදුවන්නේ යන්න ප්‍රකාශ කිරීම පමණක් නොව, අත්‍යවශයෙන් ම සමාජ පරිවර්තනයක් සිදුවිය යුතුයි යන කරුණු සම්බන්ධ ව සලකා බලයි. මේ අනුව සිංහල හා දෙමළ කම්කරු ආර්ථික විෂමතා පිළිබඳ අධ්‍යයනයේ දී රැඩිකල්වාදී භූගෝල විද්‍යාත්මක ප්‍රවේශයේ වැදගත්කම හඳුනාගත හැකි ය. මෙසේ සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථිකමය විෂමතා පිළිබඳ සිදුකරන මෙම පර්යේෂණයේ වැදත්කම මෙමගින් හඳුනාගත හැකි ය.

## පර්යේෂණ ක්‍රමවේදය

### කල්පිත රාමුව

සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාව පිළිබඳ සිදුකරනු ලබන පර්යේෂණයක දී ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය හා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය




**රූපසටහන් අංක 1**

මූලාශ්‍රය - කර්තෘ විසින් සම්පාදිතය

යොදාගනු ලැබේ. මේ අනුව මූලික වශයෙන් ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය හෙවත් විද්‍යාත්මක ක්‍රමවේදයට අනුව පර්යේෂණයට අදාළ ගැටලු විචල්‍යය හෙවත් පරායත්ත විචල්‍යය (Y) හඳුනාගත යුතු අතර ඒ කෙරේ බලපානු ලබන ස්වායත්ත විචල්‍යයන් (X) ගොඩනගා ගැනීමෙන් ස්වායත්ත විචල්‍යය හා පරායත්ත විචල්‍යය අතර සම්බන්ධතාව දැක්වෙන කල්පිත රාමුව ගොඩනගා ගත යුතු ය.

පරායත්ත විචල්‍යය (Y)

සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාව

ස්වායත්ත විචල්‍යය (X)

$x_1$ - කම්කරුවන්ගේ ආදායමෙහි පවතින විෂමතාව

$x_2$ - කම්කරුවන්ගේ වියදමෙහි පවතින විෂමතාව

$x_3$ - කම්කරුවන්ගේ ඉතිරිකිරීම්වල පවතින විෂමතාව

$x_5$ - කම්කරු නිවාසවල පහසුකම් ව්‍යාප්තියේ පවතින විෂමතාව.

$x_4$ - කම්කරු ඉඩම් අයිතියෙහි පවතින විෂමතාව

$H_0$ - වතු කම්කරුවන්ගේ ආර්ථිකයේ විෂමතා කෙරෙහි ජාතිකත්වයේ බලපෑමක් නැත.

$H_1$ - වතු කම්කරුවන්ගේ ආර්ථිකයේ විෂමතා කෙරෙහි ජාතිකත්වයේ බලපෑමක් ඇත.

$H_0$ - සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාව කෙරෙහි ආදායමෙහි වියදමෙහි, ඉතිරිකිරීම්වල, නිවාසවල පහසුකම් ව්‍යාප්තියෙහි, ඉඩම්වල භුක්තියෙහි බලපෑමක් ඇත.

$H_1$ - සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාව කෙරෙහි, ආදායමෙහි, වියදමෙහි, ඉතිරිකිරීම්වල, නිවාසවල පහසුකම් ව්‍යාප්තියෙහි, ඉඩම්වල භුක්තියෙහි බලපෑමක් නැත.

**උපකල්පන පරීක්ෂාව**

**අධ්‍යයන ප්‍රදේශය හැඳින්වීම**

සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථිකමය විෂමතා යන මාතෘකාව පිළිබඳ සිදුකළ මෙම අධ්‍යයනයට තෝරාගත් අධ්‍යයන ප්‍රදේශය වූයේ මාතර දිස්ත්‍රික්කයේ පස්ගොඩ ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ මාවරල, කුඩාපාන, ගොම්බද්දල, යන කම්කරු ශ්‍රමික පිරිස් ජීවත් වන ග්‍රාමයන් වේ. මෙම ප්‍රදේශයේ සමාජ, සංස්කෘතික හා ආර්ථිකමය තත්ත්වය පිළිබඳ විග්‍රහ කිරීමේ දී මූලික වශයෙන් ප්‍රදේශයේ සමස්ත ජනගහනය 2050 ක් වශයෙන් හඳුනාගත හැකි ය. මේ අනුව මෙම ප්‍රදේශයේ ජනගහනයේ බොහෝ පිරිසක් වතු ආශ්‍රිත සේවයේ නිරත වීම හඳුනාගත හැකි ය. තව ද රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශයන්හි සේවය නියුතු පිරිස් ද සුළු වශයෙන් ප්‍රදේශය තුළ හඳුනාගත හැකි ය. ප්‍රදේශයේ බෞද්ධ, ඉස්ලාම්, කතෝලික යන විවිධ ආගම් අදහන පිරිස් හඳුනාගත හැකි ය. ඉන් වැඩි ප්‍රතිශතයක් බෞද්ධ ය.

ප්‍රදේශයේ ආර්ථික තත්ත්වය විමසීමේ දී ප්‍රධාන වශයෙන් තේ, රබර්, කුරුඳු, ගම්මිරිස්, කරාබුනැටි වැනි අපනයන භෝග බොහෝ සෙයින් ව්‍යාප්ත ව පවතින ප්‍රදේශයක් වේ. තව ද ගෘහස්ථ මට්ටමින් සත්ත්ව පාලනය සිදුකිරීමේ දී ප්‍රදේශයේ ආර්ථික තතත්වයට දායකත්වයක් සපයයි. මෙම ග්‍රාමයේ වතු ආශ්‍රිත පේළි ගෙවල් හෙවත් ලැයිම් කාමර බොහෝ පවතී. එසේ ම ප්‍රදේශයේ සමෘද්ධි ලාභී පවුල් 297 ක් හඳුනාගත හැකි අතර ගොවිතැන වශයෙන් වී වගා කිරීම පාරම්පරික උරුමයන්ගෙන් ලැබුණු පිරිස් යැපුම් මට්ටමින් කුඩා වශයෙන් සිදුකරන අතර සෙසු පිරිස් තම පාරම්පරික ඉඩම් භුක්තිය යටතේ හිමි ඉඩම්වල වතු භෝග වගාකිරීම මෙම ප්‍රදේශයේ හඳුනාගත හැකි ලක්ෂණයකි.

මෙම ප්‍රදේශයේ භූගෝලීය තත්ත්වය පිළිබඳ විමසීමේ දී අඩි 1500-2000 පමණ උස සහිත ප්‍රදේශයක් ලෙසින් හඳුනාගත හැකි ය. 90% ක් ම තෙත් කලාපයට අයත් වේ. මෙහි වාර්ෂික උෂ්ණත්වය $78^0$F ක් ද වර්ෂාපතනය


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වගුව 1

| ජනවර්ගය | පහසුකම් ව්‍යාප්තිය | | | | එකතුව ($n_r$) |
|---|---|---|---|---|---|
| | ඉහළ | මධ්‍යස්ථ | පහළ | නැත | |
| සිංහල | xx | xx | xx | xx | xx |
| දෙමළ | xx | xx | xx | xx | xx |
| එකතුව ($n_c$) | xx | xx | xx | xx | N |

මූලාශ්‍රය - කර්තෘ විසින් සම්පාදිතය

25000mm ක් පමණ වේ. මෙම ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන් ව්‍යාප්ත ව ඇත්තේ රතු දුඹුරු පසයි. මෙලෙසින් සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථිකමය විෂමතා පිළිබඳ සිදුකළ අධ්‍යයනයේ දී අධ්‍යයන ප්‍රදේශයේ පිහිටීම සමාජ, සංස්කෘතික, ආර්ථික හා භෞතික තත්ත්වය මෙලෙසින් විග්‍රහ කිරීම තුළින් අධ්‍යයන ප්‍රදේශයේ ස්වභාවය හඳුනාගත හැකි ය.

**සංගහනය හා නියැදිය**

1. සංගහනය (N)

පස්ගොඩ ප්‍රදේශය ආශ්‍රිත කම්කරු පවුල් 204

2. නියැදිය (n)

සමස්ත සංගහනය ම අධ්‍යයනය සඳහා යොදාගත නොහැකි බැවින් නියදියක් තෝරාගත යුතු ය. මේ නියැදිය සඳහා 204 කින් යුත් පවුල් සංඛ්‍යාවෙන් 60 ක නියැදියක් තෝරා ගනු ලැබේ. ඒ අනුව මෙම නියැදිය සිදුකරනු ලබන්නේ සමානුපාතික ස්තරීභූත නියැදිය අනුව ය. මෙහි දී එක් එක් ස්තරයේ සාමාජිකයින් හෝ අයිතමයන් අතර පවතින වෙනස හෙවත් විචලනය නැති වීම හෝ අවම වීම සිදුවිය යුතු යි. මේ අනුව පර්යේෂණයෙන් සිදුකිරීමට අපේක්ෂා කරනුයේ සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථිකයේ විෂමතාවන් පවතින්නේ ඇයි ද? යන්න සොයා බැලීම යි. ඒ අනුව සිංහල හා දෙමළ වශයෙන් විෂමතාවක් පවතින්නේද යන්න අධ්‍යයනය කළ හැකි ය.

මෙහි දී සමස්ත සංගහනය කම්කරු පවුල් 204 කි. ඉන් පවුල් 50 කින් යුත් නියැදියක් තෝරා ගනු ලබයි. එහි දී සිංහල පවුල් 112 ක් ද, දෙමළ පවුල් 92 බැගින් ද, සංගහනය සමන්විත වේ. මෙම සංගහනය යටතේ එක් එක් නියැදියකට තෝරා ගනු ලබන පවුල් සංඛ්‍යාව වනුයේ,

$$60/204 = 0.29$$
$$n_1 = 112 \times 0.29 = 33$$
$$n_2 = 92 \times 0.29 = 27$$

මෙසේ සිංහල කම්කරු පවුල් 33 ක් හා දෙමළ කම්කරු පවුල් 27 ක් තේරීම සසම්භාවී වගු භාවිතයෙන් සිදුකරනු ලැබේ. ඒ අනුව මෙම නියැදි ක්‍රමය සමානුපාතික සසම්භාවී ස්තරීභූත නියැදිම ලෙසින් හඳුන්වාදිය හැකි ය.

**සංගහනය හා නියැදිය**

සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතා පිළිබඳ සිදුකරන පර්යේෂණයේ දත්ත විශ්ලේෂණ ක්‍රම වශයෙන් ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය හා ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය යොදා ගැනේ. මෙම පර්යේෂණයේ ගුණාත්මක දත්ත විශ්ලේෂණයේ දී එය ප්‍රමාණාත්මක ලෙසින් විශ්ලේෂණය කිරීමට පර්යේෂණය නාමික හා පටිපාටිගත පරිමානය හා බැඳි පවතින්නක් බැවින් එයට අපරාමිතික සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රමයක් වශයෙන් කයි වර්ග පරීක්ෂණය යොදාගත හැකි ය. එසේ ම ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණයේ දී එක් අත් විචලතා විශ්ලේෂණය යොදා ගනු ලැබේ. මෙම විශ්ලේෂණයන් ඇසුරින් සාධකවල වැදගත්කම පෙන්නුම් කර, තවදුරටත් ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ සාධකවල වැදගත්කම මෙහි දී පෙන්නුම් කරනු ලැබේ.

මේ අනුව ප්‍රමාණාත්මක විශ්ලේෂණය මගින් දත්ත විශ්ලේෂණය සිදුකිරීමේ දී මූලික වශයෙන් කල්පිත ගොඩනැගීමට ගැටලු විචල්‍යය (Y) හා ඊට භාජනය වන ස්වායත්ත විචල්‍යය (X) හඳුනාගැනීම කළ යුතු ය.

(Y) - සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාව

($X_1$) - ආදායම

($X_2$) - වියදම්

($X_3$) - ඉතිරිකිරීම

($X_5$) - නිවාසවල පහසුකම්

($X_4$) - ඉඩම් භුක්තිය

පර්යේෂණයේ කල්පිතය වශයෙන්:

($H_0$) - වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාවට ජාතිකත්වයේ බලපෑමක් නැත.

($H_1$) - වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාවට ජාතිකත්වයේ බලපෑමක් ඇත.

($H_0$) - සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාවට ආදායමෙහි, වියදමෙහි, ඉතිරිකිරීම් වල, නිවාස පහසුකම් ව්‍යාප්තියෙහි, ඉඩම්වල අයිතියෙහි බලපෑමක් නැත.

($H_1$) - සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාවට ආදායමෙහි, වියදමෙහි, ඉතිරිකිරීම්වල, නිවාස පහසුකම් ව්‍යාප්තියෙහි ඉඩම්වල අයිතියෙහි බලපෑමක් ඇත.

මෙලෙසින් ප්‍රධාන කල්පිතය හා වෛකල්පිතය ගොඩනගාගත හැකි ය. අනතුරු ව මෙම පර්යේෂණය සිදුකිරිම සඳහා වෙසෙසියා මට්ටටමක් තිරණය කළ යුතු ය. මෙම පර්යේෂණයේදී 0.05 හා 0.01 වෙසෙසියා


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මට්ටමක් යටතේ පර්යේෂණය සිදුකෙරෙන අකර ඒ අනුව කයි වර්ගයට අදාළ නියැදි ව්‍යාප්තිය වැදගත් වේ. ඒ අනුව නියැදි ව්‍යාප්තියේ හැසිරීම වගු ආශ්‍රිත දත්ත මගින් පෙන්නුම් කරනු ලබන අතර එය හඳුනා ගැනිමට සුවලන අගයන් අවශ්‍යය වේ. පරීක්ෂණයට අදාළ දත්ත න්‍යාසය වගුව 1හි ඇති නිදසුන් (නිවාසවල පහසුකම් හා සම්බන්ධ) මගින් දැක්විය හැකි ය.

මේ අනුව මෙලෙසින් සෙසු විචල්‍යයන් වන කම්කරු ඉඩම්වල අයිතිය, ආදිය සඳහා මෙසේ ගොනු කිරීම් දැක්විය හැක.

මේ අනුව ලබාගත් දත්ත අනුව කයි වර්ගයේ අගය ආගනනය කළ යුතු ය. එසේ ආගනනය කිරිම පහත සූත්‍රය මගින් සිදුකරයි.

$$\chi^2 = \sum \frac{(fe - fo)^2}{fe}$$

මෙසේ ආගනනය කළ කයි ව්‍යාප්තියේ අගය 0.05 හා 0.01 වෙසෙසියා මට්ටමේ දී අපේක්ෂා කරන වගුවේ අගයට වඩා වැඩි වන්නේ නම් එය අදාළ කල්පිතය ප්‍රතික්ෂේප කරනු ලබයි. එම අගය අඩු වන්නේ නම් අදාළ කල්පිතය ප්‍රතික්ෂේප නොවේයැයි නිගමනය කළ හැකි ය. කයි වර්ග අගය ලබාගැනිමෙන් පසු තිරණවලට එළඹිමේ දී සුවලන අගය ලබාගත යුතු ය. මෙම පර්යේෂණයේ ඉහත උදාහරණයට අනුව සුවලන අගය ගණනය කරනුයේ,

$$\begin{aligned} &(r-1)\ (c-1) \\ &= (4-1)\ (2-1) \\ &= 2 \end{aligned}$$

මෙම අගයට අදාළ අගය සසම්භාවි වගුවෙන් ගනු ලැබේ. මේ අනුව මෙසේ ලබාගත් කයි අගයට අනුව වගුවේ අගය අඩුවන්නේ නම් එය ප්‍රතික්ෂේප වන අතර ඒ අනුව අප්‍රතිෂ්ඨේය කල්පිතය වන $H_0$ ප්‍රතික්ෂේප වේ. එසේ කයි අගය වගුවේ අගයට අඩුවන්නේ නම් එය ප්‍රතික්ෂේප නොවන බව තීරණය කළ හැකි අතර මෙය දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරු ව තීරණය කළ හැකි ය. එසේ ම මෙම විචල්‍යය අතර සම්බන්ධතාව ආපතිකතා සංගුණකය මගින් සොයා බැලේ. මිට අමතර ව විස්තර කිරීම් ද භාවිත කෙරේ.

සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතා පිළිබඳ අධ්‍යයනයේ දී ගුණාත්මක දත්ත මෙලෙසින් ප්‍රමාණාත්මක ලෙසින් විශ්ලේෂණය කිරීම හඳුනාගත හැක. ඊට අමතර ව ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ වශයෙන් වගු, ප්‍රස්තාර, සිතියම්, හා සංඛ්‍යාන ක්‍රම වශයෙන් එක්-අත් විචලතාව ද භාවිත කරයි.

ඒ අනුව ගැටලුව ප්‍රාන්තර හා අනුපාත පරිමාණයන් මෙන් ම නාමික හෝ පටිපාටිගත පරිමාණයන් සමග සම්බන්ධවන ක්‍රමයක් වශයෙන් එක් අත් විචලතා විශ්ලේෂණය හඳුන්වා දිය හැකි ය. ඒ අනුව මෙහි මූලික සංකල්ප තුනකි. එනම් මුළු විචලනය, අතරතුර විශ්ලේෂණය, හා ඇතුළ තුළ විශ්ලේෂණයයි. මේ අනුව මුළු විචලනය යනු ප්‍රායෝගික ගැටලුවයි. අතරතුර විශ්ලේෂණය හා සම්බන්ධ වනුයේ ප්‍රායෝගික ගැටලුව පැහැදිලි කිරීමට ගෙන එනු ලැබූ විචල්‍යයකි. ඇතුළ තුළ විචලනයට සම්බන්ධ වනුයේ ගෙනෙන ලද විචල්‍යයේ විචලනයයි. මෙහි දී ජාතිකත්වය පදනම් කරගෙන කම්කරු ආර්ථික විෂමතා සෙවිමේ දී කම්කරු ආදායමේ විෂමතාවක් පවතී ද යන විචල්‍යයට පහත පරිදි දත්ත ගොනුකර දැක්විය හැකි ය. මෙසේ දත්ත ගොනු කිරිමෙන් අනතුරු ව මුළු විචලනය සෙවිමට පෙර කල්පිත ගොඩනගා ගත යුතු ය.

$H_0$ - සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාවට ආදායමෙහි බලපෑමක් නැත.

$H_1$ - සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාවට ආදායමෙහි බලපෑමක් ඇත.

**වගුව 2: පවුලේ මාසික ආදායම**

| සිංහල | දෙමළ |
|---|---|
| xx | xx |
| xx | xx |
| xx | xx |
| n=29 | n=21 |

මූලාශ්‍රය - කර්තෘ විසින් සම්පාදිතය

මෙහි දී මුලින් ම මුළු විචලනය ගණනය කිරීම සිදුකළ යුතුය. ඒ අනුව පහත සූත්‍රයෙන් එය ආගනනය කරනු ලබයි.

$$\sum\sum \chi_{ij}^2 - \frac{(\sum\sum \chi_{ij})^2}{N}$$

එසේ ම අනතුරු ව වෙසෙසියා මට්ටම් තීරණය කළ යුතු අතර එහි දී 0.05 හා 0.01 වෙසෙසියා මට්ටම් උපයෝගී කර ගනු ලබයි. මෙහි දී විචලතා විශ්ලේෂණය සඳහා පදනම් කර ගනුයේ වගුවේ සංඛ්‍යාතයන් ය. මෙහි දෙවන පියවර මගින් විස්තර වූ විචලනය විශ්ලේෂණය කෙරේ. එහි දී පහත සූත්‍රය උපයෝගී කරගනු ලැබේ.

$$\sum j \frac{(\sum\sum \chi_{ij})^2}{n_j} - \frac{(\sum\sum \chi_{ij})^2}{N}$$

එසේ ම විස්තර නොවූ හෙවත් ඇතුළ තුළ විශ්ලේෂණයේ දී මුළු විචලනයෙන් විස්තර නොවූ විචලනය අඩුකළ යුතු ය. අවසානයේ මෙසේ විචලතා විශ්ලේෂණය වගුව 3 මගින් දැක්විය හැකි ය.

මෙහි දී ආගනනිත f අගය පරිගණනිත වගුවේ අගයට වඩා අඩු වේ නම් අප්‍රතයිශ්ඨේය කල්පිතය ප්‍රතික්ෂේප කළ නොහැකි ය. ඒ අනුව සිංහල හා දෙමළ වතු කම්කරු ආර්ථික විෂමතාවට ආදායමේ බලපෑමක් නැතැයි යන්න තීරණය කළ හැකි ය. නමුත් ආගනනිත අගය පරිගණනිත වගුවේ අගයට වඩා වැඩිවුවහොත් වතු කම්කරු ආර්ථික විෂමතාවට ආදායමේ බලපෑමක් ඇතැයි යන්න තීරණය කළ හැකි ය. මෙලෙසින් ලබාගත් දත්ත පාදක කරගනිමින්


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වගුව 3: විචලතා විශ්ලේෂණය

| මූලාශ්‍රය | වර්ගිත එකතුව | සුවලන අගය | ඇස්තමේන්තු විචලනය | F අගය |
|---|---|---|---|---|
| මුළු විචලනය TSS | xx | N-1 | $\frac{BSS}{WSS}$ | xx |
| අතරතුර විශ්ලේෂණය BSS | xx | k-1 | xx | xx |
| ඇතුළ තුළ විශ්ලේෂණය WSS | xx | N-k | xx | xx |

මූලාශ්‍රය - කර්තෘ විසින් සම්පාදිතය

විශ්ලේෂණවලට එළඹීම මෙහි දී සිදු කෙරේ. එසේ ම එම සාධකවල වැදගත් බව ප්‍රමාණාත්මක විශ්ලේෂණ ඔස්සේ මෙසේ විග්‍රහ කිරීමත්, එය තවදුරටත් ගුණාත්මක දත්ත එනම් සම්මුඛ සාකච්ඡා, සිද්ධි අධ්‍යයන, ඡායාරූප ඇසුරින් විශ්ලේෂණය කිරීමත් මෙහි දී සිදුකෙරේ.

## නිගමනය

සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථිකමය විෂමතා පිළිබඳ සිදු කළ අධ්‍යයනය සඳහා යොදාගත් සාධක වන ආදායම, වියදම, ඉතිරිකිරීම්, නිවාසවල පහසුකම් ව්‍යාප්තිය, ඉඩම් භුක්තිය යන සාධකයන් මෙකී ආර්ථික විෂමතාව කෙරේ බලපෑමක් සිදුකරන අතර එමගින් එළඹිය හැකි නිගමනයන් පහත පරිද්දෙන් විග්‍රහ කළ හැකි ය.

සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථිකමය විෂමතා පිළිබඳ සිදු කළ අධ්‍යයනයේ දී ආදායම යන විචල්‍යය මෙම පර්යේෂණය තුළ ආර්ථික විෂමතාව පිළිබිඹු කිරීමට වැදගත් සාධකයක් වූ බව නිගමනය කළ හැකි ය. ඒ අනුව මෙම ආදායම යන සාධකය සංඛ්‍යානමය වශයෙන් වැදගත්කමක් ඇති මෙන් ම ප්‍රබල සම්බන්ධතාවයක් ඇති සාධකයක් වශයෙන් ද මෙහි දී නිගමනය කළ හැකි ය. එසේ ම ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය තුළ මෙන් ම ගුණාත්මක දත්ත විශ්ලේෂණ එනම් සම්මුඛ සාකච්ඡා, සිද්ධි අධ්‍යයන, නිරීක්ෂණ තුළින් ද එය තහවුරු කරගත හැකි ය. මේ අනුව සිංහල වතු කම්කරුවන්ගේ ආදායම ඉහළ මට්ටමක පවතින බවත්, දෙමළ වතු කම්කරුවන්ගේ ආදායම පහළ මට්ටමක පවතින බවටත් මෙමගින් නිගමනයකට එළඹිය හැකි ය. ඒ අනුව සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථිකමය විෂමතාවක් පවතින බව හඳුනාගත හැකි ය. මේ සඳහා ආදායම යන සාධකය වැදගත් සාධකයක් බව මින් පැහැදිලි නිගමනයකට එළඹිය හැක.

සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථිකමය විෂමතා කෙරේ වියදම් යන සාධකය ප්‍රබල වශයෙන් වැදගත් සාධකයක් ලෙස නිගමනය කළ හැකි ය. එය ප්‍රමාණාත්මක විශ්ලේෂණය තුළ මෙන් ම ගුණාත්මක විශ්ලේෂණය තුළ ද වැදගත් සාධකයක් බව නිගමනය කළ හැකි ය. මේ අනුව සිංහල වතු කම්කරුවන්ගේ වියදම් ඉහළ බවත්, දෙමළ වතු කම්කරුවන්ගේ වියදම් පහළ අගයක් ගන්නා බවත්, මෙමගින් තහවුරු වේ. මේ අනුව ඔවුන් දෙපිරිස අතර ආර්ථිකයේ විෂමතාවක් පවතින බව හඳුනාගත හැකි ය. ඒ අනුව මෙකී විෂමතාව කෙරේ වියදම් යන සාධකය වැදගත් සාධකයක් බව මෙමගින් නිගමනයනට එළඹිය හැකි ය. මෙම අධ්‍යයනය මගින් සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථිකමය විෂමතා කෙරේ ඉතිරිකිරීම් යන සාධකය බොහෝ වැදගත් සාධකයක් ලෙසින් හඳුනාගත හැකි අතර එය ප්‍රමාණාත්මක වශයෙන් මෙන් ම ගුණාත්මක වශයෙන් ද වැදගත් සාධකයක් බව මෙමගින් නිගමනයකට එළඹිය හැකි ය. ඒ අනුව සිංහල වතු කම්කරුවන්ගේ ඉතිරිකිරීම් වැඩි අතර දෙමළ වතු කම්කරුවන්ගේ ඉතිරිකිරීම් ප්‍රතිශතයෙහි අඩු බවක් හඳුනාගත හැක. මේ අනුව මෙකී විෂමතාව කෙරේ ඉතිරිකිරීම් යන සාධකය වැදගත් සාධකයක් බවට මෙමගින් නිගමනය කළ හැක. මෙම අධ්‍යයනයෙන් සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථිකමය විෂමතා කෙරේ නිවාසවල පහසුකම් ව්‍යාප්ති වෙනස යන සාධකය බොහෝ වැදගත් සාධකයක් ලෙසින් හඳුනාගත හැකි අතර එය ප්‍රමාණාත්මක වශයෙන් මෙන් ම ගුණාත්මක වශයෙන් ද වැදගත් සාධකයක් බව මෙමගින් නිගමනයකට එළඹිය හැකි ය. ඒ අනුව සිංහල වතු කම්කරුවන්ගේ නිවාසවල පහසුකම් ව්‍යාප්තිය ඉහළ අතර දෙමළ වතු කම්කරුවන්ගේ නිවාසවල පහසුකම් ව්‍යාප්තිය අඩු බවක් හඳුනාගත හැක. මේ අනුව මෙකී විෂමතාව කෙරේ නිවාසවල පහසුකම් ව්‍යාප්තිය යන සාධකය වැදගත් සාධකයක් බවට මෙමගින් නිගමනය කළ හැක. සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථිකමය විෂමතා කෙරෙහි ඉඩම් භුක්තිය යන සාධකය ප්‍රබල වශයෙන් වැදගත් සාධකයක් ලෙස නිගමනය කළ හැකි ය. එය ප්‍රමාණාත්මක විශ්ලේෂණය තුළ මෙන් ම ගුණාත්මක විශ්ලේෂණය තුළ ද වැදගත් සාධකයක් බව නිගමනය කළ හැකි ය. මේ අනුව සිංහල වතු කම්කරුවන්ගේ ඉඩම් භුක්තිය ඉහළ ප්‍රතිශතයකින් යුක්ත වේ. එසේ ම දෙමළ වතු කම්කරුවන්ගේ ඉඩම් භුක්තිය පහළ ප්‍රතිශතයකින් යුක්ත වේ. මේ අනුව ඔවුන් දෙපිරිස අතර ආර්ථිකයේ විෂමතාවක් පවතින බව හඳුනාගත හැක. ඒ අනුව මෙකී විෂමතාව කෙරේ ඉඩම් භුක්තිය යන සාධකය වැදගත් සාධකයක් බව මෙමගින් පැහැදිලි නිගමනයනට එළඹිය හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය

ඊරියගම, ටී. (2006), ව්‍යවහාරික ආර්ථික විමර්ශනය, කොළඹ, සරසවි ප්‍රකාශන.

උයන්ගොඩ, ජේ. (දි.නො.),කිරිකට්ටියේ ගෙවෙන ජීවිත,



© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කොළඹ, කාන්තා හා පර්යේෂණ කේන්ද්‍රය.

කරුණානන්ද, ඩී. (1999).ශ්‍රී ලංකාවේ ආර්ථීක ඉතිහාසය, කොළඹ, කර්තෘ ප්‍රකාශන.

කාරියවසම්, යූ . (2000),කම්කරු නීති රීති හා ක්‍රියාවිධි සංග්‍රහය, කොළඹ, චන්ද්‍රකාන්ති ප්‍රකාශන.

කුරියන්, ආර් සහ ජයවර්ධන කේ. (1984), වතුකරයේ කාන්තා ශ්‍රමය සූරාකෑම, කොළඹ, කාන්තා අධ්‍යාපන ආයතනය.

ඥානමුත්තු, ජී. ඒ. (1980), වතු කම්කරුවෝ ආ ගිය හැටි, ආර්ථික විමසුම,16 වෙළුම, කොළඹ, මහජන බැංකු පර්යේෂණ අංශය.

චන්ද්‍රබොස්, ඒ. එස්. (2006), කුඩා තේ වතු කර්මාන්තයේ ශ්‍රම සහභාගිත්වය, ආර්ථික විමසුම,27 වෙළුම, කොළඹ ,මහජන බැංකු පර්යේෂණ අංශය.

ජයවර්ධන, කේ. (1978), ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැගීම, මහරගම, සංජීව ප්‍රකාශන.

ජයසුමන, සී. එස්. (2009), දෙමළ ජනතාවගේ සංක්ෂිප්ත ඉතිහාසය, කොළඹ ,විසිදුනු ප්‍රකාශන.

දිසානායක, එම්. (2009), ශ්‍රී ලංකාවේ දෙමළ සංස්කෘතිය, කොළඹ, ඇස් ගොඩගේ ප්‍රකාශන.

බණ්ඩාර, ඒ. එන්. එම්. (2007), බ්‍රිතාන්‍යය යටත් විජිත යුගයේ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය, කොළඹ, ෆාස්ට් ප්‍රකාශන.

බණ්ඩාරගේ, ඒ. (2005), ශ්‍රී ලංකාවේ යටත් විජිත වාදය, පන්නෙපිටිය, ස්ටැම් ලේක් ප්‍රකාශන.

විජයචන්ද්‍රන්,එස්. (2006), වතු ජන යහපතට කාර්මික විප්ලවයක්, මොරටුව, සංදේශ ප්‍රකාශන.

වීරසිංහ,ටී. (දි.නො), වතු කම්කරුවන්ගේ දිළිඳු බවෙහි ස්වරූපය, පිළිමතලාව, ග්‍රාම සංවර්ධන හා පර්යේෂණ ආයතනය.


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
එකොළොස්වන කලාපය 2020 දෙසැම්බර්
පිටු 21-30
ISSN 1800-1459 eISSN 2386-2041
© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ආයතනයක කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව පාරිභෝගික තෘප්තියට ඇති කරන බලපෑම: ශ්‍රී ලංකාවේ මුල්‍ය සමාගමක සේවාලාභී පාරිභෝගිකයින් ඇසුරෙනි

(The effect of administrative ability of staff on customer satisfaction: with special reference to the customer's feedbacks of a financial Company in Sri Lanka)

එම්. ටී. එස්. ඩී. කුරේ, එච් එම් එස් ප්‍රියනාත්*

ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
*priya@ssl.sab.ac.lk

**සාරසංක්ෂේපය**

වර්තමාන තරගකාරී ව්‍යාපාර ලෝකය තුළ පාරිභෝගික තෘප්තිය ඉහළ නංවා ගැනීම කේන්ද්‍රීය පරමාර්ථයක් බවට පත් ව ඇති අතර එම පරමාර්ථය ඉටු කර ගැනීමේ කාර්යයේ දී ආයතනයක කාර්ය මණ්ඩලය සතු පරිපාලන හැකියාව තීරණාත්මක සාධකයක් බවට පත් ව ඇත. ආයතනයක කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව පාරිභෝගික තෘප්තියට ඇති කරන බලපෑම කෙබඳු ද යන්න පිළිබඳ ව ප්‍රායෝගික ව අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන මුල්‍ය සමාගමක සේවාලාභී පාරිභෝගිකයින් 73 දෙනෙකු තෝරා ගෙන, ඔවුන්ගෙන් ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය සඳහා දත්ත රැස් කෙරිණි. අර්ධ අඩුතම වර්ගක්‍රම ව්‍යුහාත්මක සමීකරණ ආකෘතිය (PLS-SEM) භාවිත කරමින් සංඛ්‍යානමය වශයෙන් දත්ත විශ්ලේෂණය කරන ලදී. මෙම අධ්‍යයනයේ දී කල්පිත හතරක් පරීක්ෂා කළ අතර දත්ත විශ්ලේෂණ ප්‍රතිඵලවලට අනුව සේවකයින්ගේ වැඩ දැනුම, ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව සහ සන්නිවේදන හැකියාව යන සාධක පාරිභෝගික තෘප්තිය සමඟ ධණාත්මක සම්බන්ධතාවක් පවතින බව සංඛ්‍යානමය වශයෙන් තහවුරු විය. එහි දී එකී සාධක අතුරින් සේවකයින්ගේ සන්නිවේදන හැකියාව පාරිභෝගික තෘප්තිය කෙරෙහි ප්‍රබල ම ධණාත්මක බලපෑමක් ඇති කරන සාධකය විය. පාරිභෝගික තෘප්තිය කෙරෙහි අවම බලපෑමක් ඇති කරන සාධකය වූයේ සේවකයින්ගේ කාර්යක්ෂමතා හැකියාව වූ අතර එම සාධකය වෙසසියාත්මක නොවිණි. ඒ අනුව ආයතන විසින් පාරිභෝගික තෘප්තිය ඉහළ නංවා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ආයතනය තුළ සේවකයින්ගේ පරිපාලන හැකියාවන් ඉහළ අගයක් ගන්නා බව තහවුරු වේ.

කේන්ද්‍රීය වචන: පරිපාලන හැකියාව, පාරිභෝගික තෘප්තිය, වැඩ දැනුම, ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව, සන්නිවේදන හැකියාව

Improving customer satisfaction has become a prime objective in the current competitive business world. To achieve this aim, business firms encourage their employees and train them to improve the service quality. The service quality reflects through the administration capability of employees. However, there are no recent empirical evidences to understand how administration capabilities of employees affect the customer satisfaction. Therefore, the study attempted to explore the effect of the administrative capability of employees on customer satisfaction. The data was collected from systematically selected 73 customers who obtained the services of a leading finance cooperation in Sri Lanka. Data were collected for a structural questionnaire. The Partial Least Squares Structural Equation Model (PLS-SEM) was used to analyze the data. The study tested four hypotheses. The results revealed that factors which reflected administration capability of employees such as work knowledge, efficiency, goal attainability, and communication ability of employees have significant positive impact on customer satisfaction. Communication efficiency has the strongest impact on customer satisfaction while the effectiveness has the lowest positive impact on customer satisfaction but it was not statistically significant. Thus, the study concludes that administration capabilities of employees positively affect the customer satisfaction. Therefore, business firms should focus on enhancing the administrative capabilities of the employees in order to enhance customer satisfaction.

Key words: Administrative Capability, Customer Satisfaction, Work Knowladge, Goal Attainability, Communication Ability

## හැඳින්වීම

තරගකාරී ලෝකයේ ව්‍යාපාර ආයතනයක පැවැත්ම රඳා පවතින්නේ පාරිභෝගික ආකර්ෂණය මත වන අතර විවිධ උපායමාර්ග භාවිත කරමින් පාරිභෝගික ආකර්ෂණය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට ව්‍යාපාර ආයතනය උත්සහ දරයි (Kotlerv and Keller, 2007). පාරිභෝගිකයාට උසස් ගුණාත්මක සේවාවක් ලබාදීම මගින් පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීමට ක්‍රියා කරමින් තම ව්‍යාපාර අරමුණු ඉටු කර ගැනිමට ව්‍යාපාර ආයතන ප්‍රයත්න දරයි (Richardson, 1972). පාරිභෝගිගයින් ව්‍යාපාරය ආයතනයක් සමග අඛණ්ඩ ව සම්බන්ධ වීම තීරණය

වන්නේ පාරිභෝගිකයින්ගේ තෘප්තිමත්භාවය මත ය (Sim, Mak, and Jones, 2006). වර්තමානයේ පවතින ඉතා සංකීර්ණ හා තරගකාරී ව්‍යාපාර පරිසරය තුළ පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීමේ දී ව්‍යාපාර ආයතනයක කාර්ය මණ්ඩලයේ හැසිරීම සහ ඔවුන් පාරිභෝගිකයින්ට සපයන සේවාවේ කාර්යක්ෂමතාව හා ගුණාත්මකතාව ඉතා වැදගත් වේ (Oliver and DeSarbo, 1998). මන්ද ව්‍යාපාරයට සම්බන්ධ වන පාරිභෝගිකයින් මෙහෙයවීමේ වගකීම පැවරෙන්නේ ආයතනයක කාර්ය මණ්ඩලය වෙත වීම ඊට හේතුව යි. ව්‍යාපාරය වෙත පැමිණෙන පාරිභෝගිකයින් සමග කටයුතු කිරීමේ දී සහ ඔවුන්ගේ අවශ්‍යතාවන් ඉටු කිරීමේ දී ව්‍යාපාර ආයතනයේ කාර්ය මණ්ඩල සතුව පවතින පරිපාලන හැකියාව සහ දක්ෂතාව ඉතා වැදගත් වේ (Espino, 2017).

ව්‍යාපාර ආයතනයට සම්බන්ධ වන ගනුදෙනුකරුවන්ගේ සේවා තෘප්ති මට්ටම විවිධ ය. සියලු ම ගනුදෙනුකරුවන් ඒකාකාරී රටාවක සේවය ලබා ගැනිමට කැමැත්තක් නොදක්වන අතර එලෙස ඒකාකාරී වූ සේවා සැපයිම පාරිභෝගිකයා වෙනත් ආයතනයන් වෙත යොමු වීමට ද හේතු වේ (Espino, 2017). එකිනෙකට වෙනස් වූ ගණුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවන් ඉතා කෙටි කාලයකදී ඔවුන් අපහසුතාවයට පත් නොවන අයුරින් ඉටු කිරිමට ආයතනයට ඇති හැකියාව ආයතනයේ පරිපාලන දක්ෂතාව ලෙස හැඳින්වේ (Rai, 2013). ගනුදෙනුකරුවකු ව්‍යාපාර ආයතනයකින් සේවාවක් ලබා ගත් පසු නැවත එම ව්‍යාපාරය වෙත යොමු වන්නේ ඔහු අපේක්ෂා කළ සේවා මට්ටම එම ආයතනයෙන් ලැබුණහොත් පමණි. ව්‍යාපාර ආයතනයකින් සේවය ලබා දිමේ දි නැවත පාරිභෝගිකයා තම ආයතනය වෙත ආකර්ෂණය කර ගැනීමේ හැකියාව ව්‍යාපාරය ආයතනය සතු විය යුතු අතර ඒ සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව වැදගත් වේ (Lucas, 2012). එබැවින් ව්‍යාපාර ආයතනයක කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව පාරිභෝගික තෘප්තිය වැඩි වීමට බලපායි (Espino, 2017). ව්‍යාපාර ආයතනයක කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව පාරිභෝගික තෘප්තිය කෙරෙහි ඇති කරන බලපෑම කෙබඳු ද යන්න පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට ප්‍රමාණවත් අධ්‍යයන ශ්‍රී ලංකාව තුළ සිදු වී නොමැත. එබැවින් ව්‍යාපාර ආයතනයක කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව පාරිභෝගික තෘප්තියට ඇති කරන බලපෑම ප්‍රායෝගික ව අධ්‍යයන කිරීම මගින් පවත්නා සාහිත්‍යයට නව ප්‍රත්‍යමූල දැනුමක් එක් කිරීමට මෙන් ම ව්‍යාපාර දියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනයට ද මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල ප්‍රයෝජනවත් වනු ඇත.

## සාහිත්‍ය විමර්ශනය

වර්තමාන තරගකාරී ව්‍යාපාර ලෝකයේ පාරිභොගිකයින්ගේ තෘප්තිමත්භාවය ව්‍යාපාර ආයතනයක පරිපාලන කුසලතාවයේ මිනුමක් නැතහොත් ප්‍රධාන මානයක් ලෙස හැඳින් වේ (Alanazi and Bach, 2016). ව්‍යාපාර ආයතනයක් තරගකාරීත්වයට මුහුණ දීමට නම් සාර්ථක ගුණාත්මක කළමනාකරණ ව්‍යුහයක් ව්‍යාපාරය සතු ව පැවතීම අත්‍යවශ්‍ය වේ (Carman, 1990). ව්‍යාපාර ආයතනයක පරිපාලනය යනු එම ව්‍යාපාර ආයතනයට පැමිණෙන පාරිභෝගිකයා හැසිරවීම සඳහා ව්‍යාපාර ව්‍යුහය නිර්මාණය වී ඇත්තේ කෙසේ ද යන්නය (Buttle, 2009; Sahni, and Vayunandan, 2010). ව්‍යාපාරයක් තුළ ක්‍රියාත්මක වන පරිපාලන හැකියාවෙහි ඇති වැදගත්කම පැහැදිලි කරමින් Tether, Mina, Consoli and Galiardi (2005) විසින් ප්‍රකාශ කර ඇත්තේ ව්‍යාපාරය සාර්ථක ව්‍යාපාරයක් ද නැතහොත් එය අසාර්ථක ව්‍යාපාරයක් ද යන්න තීරණය වන්නේ ව්‍යාපාරය තුළ පවතින පරිපාලන හා කළමනාකරණ දක්ෂතා සහ හැකියාවන් මත බවයි. තව දුරටත් ව්‍යාපාරයක් තුළ පවතින පරිපාලන හැකියාවන්ගේ ඇති වැදගත්කම පැහැදිලි කරමින් Campo (2014) විසින් ප්‍රකාශ කර ඇත්තේ පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත් වන නිෂ්පාදන බිහි කිරීමට සහ සේවා සැපයීමට, නව සේවා ලාභීන් ව්‍යාපාර වෙත ළඟා කර ගැනීමට, වෙළඳපොළ තරගකාරිත්වයට මුහුණ දීමට ඇතුළු සමස්ත සංවිධානයේ යහපත උදෙසා ආයතනයක පරිපාලන හැකියාවන් වැදගත් වන බවයි.

Peter Drucker (1973) විසින් සිදු කරන ලද පර්යේෂණයක ප්‍රතිඵලයක් ලෙස ඉදිරිපත් කරන ලද දැනුම සහ සේවක ඵලදායීතා න්‍යාය මඟින් ආයතනයක කාර්ය මණ්ඩලයේ පරිපාලනමය හැකියාව මිනුම් කළ හැකි සාධක 04 ක් ඉදිරිපත් කර ඇත (Wong, 2012). එම සාධක වන්නේ වැඩ දනුම, කාර්යක්ෂමතාව, ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව සහ සන්නිවේදන හැකියාවයි. මෙම පර්යේෂණයේ ස්වායත්ත විචල්‍ය වන ආයතනයේ සේවකයින්ගේ පරිපාලනමය හැකියාව Peter Drucker (1973) විසින් ඉදිරිපත් කරන ලද සේවක ඵලදායිතා න්‍යාය මත පදනම් වේ.

පාරිභෝගික තෘප්තිය සම්බන්ධයෙන් මීට පෙර සිදු කර ඇති බොහෝ අධ්‍යයනයන්හි නිගමනය වී ඇත්තේ ව්‍යාපාර වර්ධනය කෙරෙහි පාරිභෝගික තෘප්තිය සැලකිය යුතු ධණාත්මක බලපෑමක් ඇති කරන බවයි. තව ද පාරිභෝගික තෘප්තිය යන සාධකය ගනුදෙනුකරුවන් ව්‍යාපාරය කෙරෙහි දක්වන පක්ෂපාතීත්වය ඉහළ නැංවීමට සහ නැවත නැවත ව්‍යාපාරය සමග ගනුදෙනු කිරීම සඳහා පාරිභෝගිකයා පෙළඹවීමට සැලකිය යුතු ධණාත්මක බලපෑමක් ඇති කරයි (Sim Mak Consoli and Galiardi, 2005). පාරිභෝගික තෘප්තිය යනු පාරිභෝගිකයා විසින් ඔහුට ලද සේවාව හෝ නිෂ්පාදනය පිළිබඳ ව පාරිභෝගිකයා විසින් කරනු ලබන තක්සේරු කිරීමයි (Anderson, 1973). ව්‍යාපාර ආයතනයක් විසින් පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීමට නම් ව්‍යාපාරිකයා විසින් සැමවිට ම නිෂ්පාදනය කිරීමට සහ සැපයීමට කටයුතු කළ යුත්තේ පාරිභෝගිකයා අපේක්ෂා කරනු ලබන නිෂ්පාදනයන් හා සේවාවන් ය. එනම් නිෂ්පාදකයා විසින් නිෂ්පාදනය කළ යුත්තේ නිෂ්පාදකයාට නිපදවිය හැකි නිෂ්පාදනයන් නොව පාරිභෝගිකයා විසින් ඉල්ලුම් කරනු ලබන නිෂ්පාදනය වේ (Almsalam, 2014). පාරිභෝගික තෘප්තිය යනු පාරිභෝගිකයා විසින් ඔහු ලද සේවාව පිළිබඳ ව ඔහු විසින් කරනු ලබන තක්සේරු


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කිරීමක් වන අතර වර්තමානය වන විට පාරිභෝගික තෘප්තිය යනු ව්‍යාපාර තරගකාරීත්වය තුළ ඉදිරියෙන් ම රැඳෙන සාධකය බවට පත් ව ඇත (Buttle, 2009). පාරිභෝගික අපේක්ෂාවන් පුළුල් පරාසයක් තුළ පැතිරී ඇති අතර සමහර අවස්ථාවල දී එය ඉතා අධික හෝ සීමිත ව තක්සේරු කළ හැකි ය (Sim Mak and Jones 2006). පාරිභෝගිකයා සතු ව සීමිත වූ සම්පත් ප්‍රමාණයක් පවතින නිසාත්, පාරිභෝගිකයා සෑම විට ම ගෙවන මුදලට සරිලන උපරිම තෘප්තියක් අපේක්ෂා කරනු ලබන නිසාත් ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා පාරිභෝගික තෘප්තිය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට ව්‍යාපාර ආයතන උත්සාහය කරයි (Espino, 2017; Waber, 1897).

**කාර්ය මණ්ඩලයේ වැඩ දැනුම සහ පාරිභෝගික තෘප්තිය:**

Al-Hadrewi (1995) විසින් සේවකයින්ගේ වැඩ දැනුම කළමනාකරණය සහ පාරිභෝගික තෘප්තිය අතර පවතින සම්බන්ධතාව පිළිබඳ සිදුකර ඇති පර්යේෂණයේ ප්‍රතිඵලවලින් පැහැදිලි වී ඇත්තේ සේවකයින්ගේ වැඩ දැනුම කළමනාකරණය සහ පාරිභෝගික තෘප්තිය අතර අනුලෝම සංඛ්‍යාත්මක ව වෙසසියාත්මක වූ සම්බන්ධතාවක් පවතින බවයි. තව ද Zephan (2018) විසින් තහවුරු කර ඇත්තේ වැඩ දැනුම සහිත සේවකයින් සිටීම ආයතනයකට ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් නිවැරදි ව හඳුනා ගැනීමටත්, එලෙස ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් නිවැරදි ව හඳුනා ගැනීම පාරිභෝගික තෘප්තිය ඇති කිරීමෙහි පළමු පියවරත් වන බවයි. ඒ අනුව පැහැදිලි වන්නේ ආයතනයක කාර්ය මණ්ඩලයේ වැඩ දැනුම සහ පාරිභෝගික තෘප්තිය අතර අනුලෝම සම්බන්ධතාවක් පවතින බවයි. මෙම අධ්‍යයනයේ දී ශ්‍රී ලංකාවේ මූල්‍ය සමාගම්වල කාර්ය මණ්ඩලයේ වැඩ දැනුම සහ පාරිභෝගික තෘප්තිය අතර ඇති සබඳතාව කෙබඳු ද යන්න අධ්‍යයනය කිරීම සඳහා පහත කල්පිතය යෝජනා කෙරේ.

H1 - **ව්‍යාපාර ආයතනයක කාර්ය මණ්ඩලයේ වැඩ දැනුම සහ පාරිභෝගික තෘප්තිය අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී.**

**කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව සහ පාරිභෝගික තෘප්තිය:**

කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව සහ ගනුදෙනුකරුවන්ගේ තෘප්තිය අතර සම්බන්ධතාව පිළිබඳ ව Zeithaml, Parasuraman, and Berry (1988) සිදු කළ අධ්‍යයනයේ නිගමනවලට අනුව භාණ්ඩ සපයන ව්‍යාපාර ආයතන සහ සේවා සපයන ව්‍යාපාර ආයතන යන දෙඅංශයට ම අදාළ ව කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව සහ පාරිභෝගික තෘප්තිය අතර ධන සම්බන්ධතාවක් පවතින බවයි. එමෙන් ම (Chuang, Maojen and You-Shyan, 2014) යන පර්යේෂකයන් විසින් ආයතන ලාභදායිත්වය සඳහා මානව සම්පත් හැකියාවන් සහ පාරිභෝගික තෘප්තියෙහි බලපෑම පිළිබඳ ව සිදු කරන ලද පර්යේෂණයහි නිගමනය වූයේ ද ආයතන කාර්යක්ෂමතාව පාරිභෝගික තෘප්තිය සඳහා අනුලෝම බලපෑමක් ඇති කරන බවයි. එකී නිගමනවලට පදනම් ව මෙම අධ්‍යයනෙය් දී කාර්යක්ෂමතාව සහ පාරිභෝගික තෘප්තිය අතර සම්බන්ධතාව ශ්‍රී ලංකාවේ මූල්‍ය සමාගමක සේවාලාභී පාරිභෝගිකයින් ආශ්‍රයෙන් හඳුනා ගැනීමට පහත කල්පිතය යෝජනා කෙරේ.

H2 - **ආයතනයේ කාර්ය මණ්ඩලයේ කර්යක්ෂමතාව සහ පාරිභෝගික තෘප්තිය අතර අනුලෝම සම්බන්ධතාවක් ඇත.**

**කාර්ය මණ්ඩලයේ ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව සහ පාරිභෝගික තෘප්තිය:**

Yen (2005) විසින් විකුණුම්කරුවකුගේ ඉලක්ක සාක්ශාත් කර ගැනීමට හේතු වන්නේ කුමන කරුණු ද යන්න අධ්‍යයනය කර ඇත. එහි දී එම පර්යේෂණයේ විශ්ලේෂණ ප්‍රතිඵල වූයේ ශ්‍රමිකයන් සතු ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව පාරිභෝගික තෘප්තිය කෙරෙහි ප්‍රතිලෝම වූ බලපෑමක් ඇති කරන බවයි. එම නිසා මෙම පර්යේෂණයේ දී ආයතනයක කාර්ය මණ්ඩලයේ ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව පාරිභෝගික තෘප්තිය කෙරෙහි අනුලෝම ලෙස බලපාන බව උපකල්පනය කෙරේ.

H3 - **ආයතනයේ කාර්ය මණ්ඩලයේ ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව සහ පාරිභෝගික තෘප්තිය අතර අනුලෝම සම්බන්ධතාවක් ඇත.**

**කාර්ය මණ්ඩලයේ සන්නිවේදන හැකියාව සහ පාරිභෝගික තෘප්තිය:**

පර්යේෂණයෙහි පාරිභෝගික තෘප්තිය තීරණය කිරීමේ සිව්වන සහ අවසාන විස්තරාත්මක විචල්‍යය වන්නේ සන්නිවේදන හැකියාවයි. එම විචල්‍යයන්ට අදාළ සාහිත්‍ය විමර්ශනයන් පිළිබඳ ව සලකා බැලීමෙ දී Hosseinr and Allahyari (2016) විසින් ඉරානය තුළ Eghtesadnoin බැංකුවෙහි සේවකයින්ගේ සන්නිවේදන කුසලතා සහ පාරිභෝගික තෘප්තිය අතර සමබන්ධතාව අධ්‍යයනය කිරීම සඳහා පර්යේෂණයක් සිදු කර ඇත. මෙම පර්යේෂණයේ ප්‍රතිඵලවලට අනුව ශ්‍රමිකයන්ගේ සන්නිවේදන හැකියාවට අදාළ සියලු ම සාධකයන් පාරිභෝගික තෘප්තිය සමඟ අනුලෝම වශයෙන් සම්බන්ධතාවක් දක්වන බවට තහවුරු වී ඇත. මීට අමතර ව Ardebil පළාත් අධ්‍යාපන සංවිධානයේ පරිපාලන කාර්ය මණ්ඩලයේ සන්නිවේදන කුසලතා සහ පාරිභෝගික තෘප්තිය අතර පවත්නා සම්බන්ධතාව පිළිබඳ ව විමර්ශනය කිරීම සඳහා Yunikewaty (2017) විසින් පර්යේෂණයක් සිදු කර ඇති අතර එහි දී නිගමනය කර ඇත්තේ සන්නිවේදන හැකියාව සහ පාරිභෝගික තෘප්තිය අතර අනුලෝම සම්බන්ධතාවක් පවතින බවයි. ඒ අනුව මෙම පර්යේෂණයට අදාළ ව පහත කල්පිතය ගොඩනගා ඇත.

H4 - **ආයතනයේ සේවකයින්ගේ සන්නිවේදන හැකියාව සහ පාරිභෝගික තෘප්තිය අතර අනුලෝම සම්බන්ධතාවක් ඇත.**

## පර්යේෂණ ගැටලුව

ඉහත සාහිත්‍ය විමර්ශනයට අනුව ව්‍යාපාර ආයතනවල කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව පාරිභෝගික තෘප්තිය වැඩි වීම කෙරෙහි බලපාන බව විදේශ රටවල කරන ලද විවිධ අධ්‍යයනවලින් තහවුරු වේ. නමුත්


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ආයතනවල විශේෂයෙන් කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව පාරිභෝගික තෘප්තිය කෙරෙහි බලපානනේ කෙසේ ද යන්න පිළිබඳ ව ප්‍රමාණවත් දැණුමක් ශ්‍රී ලංකාවේ සාහිත්‍ය තුළ ඇත්තේ අල්ප වශයෙනි. මෙම අධ්‍යයනයේ ගැටලුව වන්නේ ශ්‍රී ලංකාවේ මූල්‍ය සමාගමක කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව පාරිභෝගික තෘප්තිය කෙරෙහි ඇති කරන බලපෑම කෙබඳු ද? යන්න සේවා ලාභී පාරිභෝගිකයින් ආශ්‍රයෙන් ප්‍රායෝගික ව ගවේෂණය කිරීම වේ.

## පර්යේෂණ අරමුණ

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ ව්‍යාපාර ආයතනයක කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව පාරිභෝගික තෘප්තිය කෙරෙහි ඇති කරන බලපෑම ප්‍රායෝගික ව ගවේෂණය කිරීම වේ.

## පර්යේෂණයේ වැදගත්කම

ව්‍යාපාර ආයතනවල කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව පාරිභෝගික තෘප්තිය කෙරෙහි බලපාන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව ප්‍රමාණවත් ආනුභාවික පර්යේෂණ (empirical research) ප්‍රතිඵල ශ්‍රී ලංකාවේ පර්යේෂණ සාහිත්‍ය තුළ විරල ය. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල මගින් ශ්‍රී ලංකාවේ මූල්‍ය සමාගමක කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව පාරිභෝගික තෘප්තියට කරන බලපෑමේ ස්වරූපය ප්‍රායෝගික ව අධ්‍යයනය කිරීම මගින් ශ්‍රී ලංකාවේ පර්යේෂණ සාහිත්‍ය තුළ පවතින හිඩැසට දායක වීම වැදගත් වේ. මෙම පර්යේෂණයේ ප්‍රතිඵල තරඟකාරී ව්‍යාපාර අයතනවල කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්ති සැකසීමට ප්‍රයෝජනවත් වේ. මක්නිසාද ව්‍යාපාර ආයතනවල මානව සම්පත් සංවර්ධනයේ දී වැඩි අවධානයකට පාත්‍රවන කරුණු බොහොමයක් මෙම අධ්‍යයනයෙන් සාකච්ඡා කරන බැවිනි.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයෙහි අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණාත්මක ප්‍රවේශය ඔස්සේ ප්‍රාථමික දත්ත රැස් කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රධාන මූල්‍ය සමාගමක එක් ශාඛාවක් තෝරාගෙන 2019 වර්ෂයේ පළමු මාස 06 තුළ දී මොටර් බයිසිකල් මිලදී ගැනීමට ලීසින් පහසුකම් ලබාගෙන ඇති සේවාලාභී පාරිභෝගිකයින් 145 ක් අතුරින් ක්‍රමික නියැදීම් ක්‍රමය භාවිත කරමින් ඉන් අඩක් එනම් පාරිභෝගිකයින් 73 ක් පර්යේෂණ නියැදිය ලෙස තෝරා ගනු ලැබිණ. අනතුරු ව නියාමක පරීක්ෂණය හරහා වෙනස්කම් සිදු කර අවසානයේ සකස් කර ගත් අවෘත සංවාද ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් සේවාලාභී පාරිභෝගිකයින්ගේ සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කරගනු ලැබී ය.

මෙම අධ්‍යයනයේ ස්වායත්ත විචල්‍යය වන සේවකයින්ගේ පරිපාලන හැකියාව සේවක ඵලදායීතා න්‍යාය ආශ්‍රයෙන් ගොඩ නැගූ සාධක 04 ක් භාවිත කර මනිනු ලැබිණ. එම සාධක වන්නේ වැඩ දැනුම, කාර්යක්ෂමතාව, ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව සහ සන්නිවේදන හැකියාවයි (Campo, 2014; Wong, 2012). පාරිභෝගික තෘප්තියෙහි ඇති වැදගත්කම හඳුනා ගනිමින් විවිධ පර්යේෂකයින් විසින් පාරිභෝගික තෘප්තිය තීරණය කරනු ලබන සාධකයන් ගණනාවක් ඉදිරිපත් කර ඇති අතර එම සාධක අතුරින් මෙම පර්යේෂණයේ දී පාරිභෝගික තෘප්තිය මිණුම් කිරීම සඳහා ළඟාවීමට ඇති හැකියාව, ආරක්ෂාව, නම්‍යශීලීභාවය, තොරතුරු ලබා ගත හැකි බව සහ විශ්වසනීයත්වය යන සාධකයන් යොදා ගන්නා ලදී (Almsalam, 2014; Buttle, 2009; Djajantoet al., 2014; Sim Mak and Jones 2006).

අනුමිතික සංඛ්‍යාන (inferential statistics) ආශ්‍රයෙන් ව්‍යාපාර ආයතනයක සේවකයින්ගේ පරිපාලන හැකියාව පාරිභෝගික තෘප්තියට ඇති කරන බලපෑම විශ්ලේෂණය කළ අතර ඒ සඳහා අර්ධ අවම අඩුතම වර්ග ක්‍රමය (Partial Least Squire – Structural Equation Modeling) භාවිත කරනු ලැබී ය. Smart PLS version3 මෘදුකාංගය භාවිත කර දත්ත විශ්ලේෂණය කරන ලදී. එහිදී බාහිර ආකෘතිය සහ ව්‍යුහාත්මක ආකෘතිය ලෙස කොටස් දෙකක් යටතේ සමස්ත පර්යේෂණ ආකෘතිය විශ්ලේෂණය කළ අතර, එහිදී බාහිර ආකාතිය නැවත පළමු පියවර මිණුම් ආකෘතිය සහ දෙවන පියවර මිණුම් ආකෘතිය ලෙස කොටස් දෙකකට වෙන් කර විශ්ලේෂණය කෙරිණ. ඒ අනුව සමස්ත පර්යේෂණ ආකෘතිය මගින් පළමු ව බාහිර ආකෘතිය මිණුම් කරනු ලැබූ අතර එහිදී බාහිර ආකෘතිය තුළ කොටස් දෙකට ම අදාළ ව වෙන් වෙන් වශයෙන් අයිතමයන්ගේ විශ්වසනීයත්වය සහ වලංගුභාවය පරීක්ෂා කරන ලදී. අනතුරුව ව්‍යුහාත්මක ආකෘතිය මිනුම් කිරිම සිදු කළ අතර එහි දී පර්යේෂණ ආකෘතියේ ස්වායත්ත විචල්‍යයන් අතර සහසම්බන්ධතා තත්ත්වයන් මිනුම් කිරීම, විචල්‍යයන් අතර සම්බන්ධතාව සහ වෙසසියාත්මකභාවය තක්සේරු කිරීම, නිර්ණන සංගුණකය ($R^2$) තක්සේරු කිරීම, බලපෑම් ප්‍රමාණය ($F^2$) තක්සේරු කිරීම සහ පුරෝකථන අදාළත්වතාව තක්සේරු කිරීම යන පර්යේෂණයන් සිදු කරන ලදී.

## දත්ත විශ්ලේෂණය

පර්යේෂණ ආකෘතිය තුළ ගුප්ත විචල්‍යයන් (Latent Variables) මිනුම් කිරීමට යොදාගනු ලැබූ අයිතමයන් අතර පවතින සම්බන්ධතාව සහ අනුකූලතාව පරීක්ෂා කිරීම මිනුම් ආකෘතිය (Measurement Model) මගින් සිදුකරනු ලැබිණ. මිනුම් ආකෘතිය තුළ සිදුකරනු ලබන පර්යේෂණයන් මගින් තෝරාගත් නිරවද්‍ය ලෙස මිනුම් කළ ගුප්ත විචල්‍යයන් අතර පවතින සම්බන්ධතාවයන් හඳුනා ගැනීම ඇතුළු ඉදිරි පියවරයන් ව්‍යුහාත්මක ආකෘතිය (Structural Model) හෙවත් රේඛීය ආකෘතිය මගින් සිදු කරනු ලබන අතර ප්‍රථමයෙන් ම මිනුම් ආකෘතිය මිනුම් කිරීම සිදුකර ඇත.

පර්යේෂණයේ පරායත්ත විචල්‍යයන් වන පාරිභෝගික තෘප්තිය ළඟා විය හැකි බව, තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව, විශ්වසනීයත්වය, නම්‍යශීලීභාවය සහ ආරක්ෂාව යන විචල්‍යය මගින් මිනුම් කරන ලදී. එහිදී එම විචල්‍යයන් ගොඩනැගීම සඳහා වඩාත් විශ්වසනීය වූ අයිතමයන් යොදාගෙන ඇත්ද යන්න පරීක්ෂා කිරීමට දර්ශක


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වගුව 1: පළමු පියවර මිනුම් ආකෘතිය තුළ දර්ශකවල විශ්වසනීයත්වය සහ වලංගුභාවය

| | විචල්‍යය | දර්ශක විශ්වසනීයත්වය | | අභ්‍යන්තර අනුකූලතා විශ්වසනීයත්වය | | අභිසාරි වලංගුභාවය |
|---|---|---|---|---|---|---|
| | | Loading | T statistics | CR | $\alpha^*$ | AVE |
| 1 | ප්‍රවේශ විය හැකි බව | | | **0.899** | **0.832** | **0.749** |
| | Acces 1 | 0.88 | 31.459 | | | |
| | Acces 2 | 0.883 | 31.863 | | | |
| | Acces 3 | 0.833 | 21.637 | | | |
| 2 | තොරතුරු ලබා ගත හැකි බව | | | **0.896** | **0.825** | **0.741** |
| | Informa 1 | 0.892 | 41.12 | | | |
| | Informa 2 | 0.832 | 26.939 | | | |
| | Informa 3 | 0.857 | 29.763 | | | |
| 3 | විශ්වසනීයත්වය | | | **0.921** | **0.872** | **0.795** |
| | Trust 1 | 0.909 | 63.231 | | | |
| | Trust 2 | 0.892 | 41.333 | | | |
| | Trust 3 | 0.874 | 23.694 | | | |
| 4 | නම්‍යශීලීභාවය | | | **0.884** | **0.737** | **0.791** |
| | Flexi 1 | 0.897 | 43.844 | | | |
| | Flexi 2 | 0.882 | 33.198 | | | |
| 5 | ආරක්ෂාව | | | **0.878** | **0.722** | **0.782** |
| | Prot 1 | 0.873 | 21.906 | | | |
| | Prot 2 | 0.896 | 41.644 | | | |

*Conbranchi's Alpha

මූලාශ්‍රය - නියැදිය සමීක්ෂණය, 2019

වගුව 2: පළමු මිනුම් ආකෘතිය තුළ වෙන් කොට සැලකීමේ වලංගුභාවය

| | AVE | ප්‍රවේශ විය හැකි බව | පාරිභෝගික තෘප්තිය | නම්‍යශීලීභාවය | තොරතුරු ලබා ගත හැකි බව | ආරක්ෂාව | විශ්වසනීය-ත්වය |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රවේශ විය හැකි බව | **0.749** | **0.865** | | | | | |
| පාරිභෝගික තෘප්තිය | **0.585** | 0.764 | **0.765** | | | | |
| නම්‍යශීලීභාවය | **0.791** | 0.804 | 0.761 | **0.890** | | | |
| තොරතුරු ලබා ගත හැකි බව | **0.741** | 0.805 | 0.710 | 0.720 | **0.861** | | |
| ආරක්ෂාව | **0.782** | 0.655 | 0.508 | 0.691 | 0.675 | **0.885** | |
| විශ්වසනීයත්වය | **0.795** | 0.639 | 0.644 | 0.671 | 0.710 | 0.609 | **0.892** |

මූලාශ්‍රය - නියැදිය සමීක්ෂණය, 2019

විශ්වසනීයත්වය (Indicator Reliability) සහ අභ්‍යන්තර අනුකූලතා විශ්වසනීයත්වය (Internal Consistancy Reliability) යන නිර්ණායක භාවිත කෙරිණ. එකී නිර්ණායක මගින් ප්‍රමාණවත් ලෙස අදාළ විචල්‍යයන් නිරූපණය කරනවාද යන්න හඳුනා ගැනීමට අභිසාරි වලංගුභාවය (Convergent Validity) සහ වෙන් කොට සැලකීමේ වලංගුභාවය (Discriminate Validity) යන නිර්ණායක භාවිත කරන ලදී.

වගුව 1ට අනුව එක් එක් විචල්‍යයන් ගොඩනැගීමට යොදාගත් එක් එක් අයිතමයන්ට අදාළ පිටත පැටවුම් (Outer Loading) අගයන් 0.7 වඩා වැඩි අගයක් ගනු ලබන බව සහ ඊට අදාළ ඔ අගයන් 2.58 ට වඩා ඉහළ අගයන් බව හඳුනාගත හැකි ය. එම නිසා විචල්‍යයන් ගොඩනැගීම සඳහා වඩා විශ්වසනීය වූ අයිතමයන් යොදාගෙන ඇති බව 99% ක සංඛ්‍යානමය විශ්වසනීයත්වක් ඇත. ඊට අමතර ව අයිතමයන්ගේ විශ්වසනීයත්වය තහවුරු කරනු ලබන


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වගුව 3: දෙවන පියවර මිනුම් ආකෘතිය තුළ අයිතමයන්ගේ විශ්වසනීයත්වය සහ වලංගුභාවය

| විචල්‍යය | දර්ශක විශ්වසනීයත්වය | | අභ්‍යන්තර අනුකූලතා විශ්වසනීයත්වය | | අභිසාරි වලංගුභාවය |
|---|---|---|---|---|---|
| | Loading | T statistics | CR | $\alpha^*$ | Loading |
| 1. පාරිභෝගික තෘප්තිය | | | **0.940** | **0.920** | **0.759** |
| ප්‍රවේශ විය හැකි බව | 0.902 | 39.322 | | | |
| නම්‍යශීලීභාවය | 0.894 | 23.901 | | | |
| තොරතුරු ලබා ගත හැකි බව | 0.900 | 34.960 | | | |
| ආරක්ෂාව | 0.827 | 26.260 | | | |
| විශ්වසනීයත්වය | 0.832 | 13.943 | | | |
| 2. සන්නිවේදන හැකියාව | | | **0.867** | **0.793** | **0.621** |
| Comm1 | 0.752 | 10.133 | | | |
| Comm2 | 0.886 | 31.525 | | | |
| Comm3 | 0.781 | 15.113 | | | |
| Comm4 | 0.723 | 12.795 | | | |
| 3. කාර්යක්ෂමතාව | | | **0.872** | **0.803** | **0.631** |
| Efficiency1 | 0.802 | 14.030 | | | |
| Efficiency2 | 0.700 | 9.060 | | | |
| Efficiency3 | 0.806 | 21.511 | | | |
| Efficiency4 | 0.861 | 25.267 | | | |
| 4. ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව | | | **0.856** | **0.775** | **0.598** |
| Goal-A1 | 0.768 | 13.918 | | | |
| Goal-A2 | 0.806 | 19.506 | | | |
| Goal-A3 | 0.742 | 13.297 | | | |
| Goal-A4 | 0.775 | 13.015 | | | |
| 5. වැඩ දැනුම | | | **0.916** | **0.877** | **0.732** |
| Work Kno.1 | 0.881 | 32.698 | | | |
| Work Kno.2 | 0.804 | 22.139 | | | |
| Work Kno.3 | 0.914 | 53.789 | | | |
| Work Kno.4 | 0.817 | 22.220 | | | |

මූලාශ්‍රය - නියැදිය සමීක්ෂණය, 2019

වගුව 4: දෙවන පියවර මිනුම් ආකෘතිය තුළ වෙන් කොට සැලකීමේ වලංගුභාවය

| | AVE | සන්නිවේදන හැකියාව | පාරිභෝගික තෘප්තිය | කාර්යක්ෂමතාව | ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව | වැඩ දැනුම |
|---|---|---|---|---|---|---|
| සන්නිවේදන හැකියාව | **0.621** | **0.873** | | | | |
| පාරිභෝගික තෘප්තිය | **0.759** | 0.852 | **0.871** | | | |
| කාර්යක්ෂමතාව | **0.631** | 0.721 | 0.78 | **0.794** | | |
| ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව | **0.598** | 0.766 | 0.838 | 0.762 | **0.873** | |
| වැඩ දැනුම | **0.732** | 0.739 | 0.808 | 0.760 | 0.808 | **0.855** |

මූලාශ්‍රය - නියැදිය සමීක්ෂණය, 2019


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අභ්‍යන්තර අනුකූලතා විශ්වසනීයත්වය පිළිබඳ ව සලකන විට එක් එක් විචල්‍යයන්ට අදාළ Conbranchi's Alpha අගය සහ Composit Reliability අගයන් 0.7 ට වඩා ඉහළ අගයන් බව 01 වන වගුව අධ්‍යයනය කිරීම මගින් පැහැදිලි වේ. එම නිසා පළමු පියවර මිනුම් ආකෘතිය තුළ විචල්‍යයන් ගොඩනැගීමට යොදා ගෙන ඇති අයිතමයන් වඩාත් විශ්වසනීයවන්ත වූ අයිතමයන් බව තහවුරු වේ. 01 වන වගුවට අනුව එක් එක් විචල්‍යයන්ට අදාළ උපුටාගත් සාමාන්‍ය විචලන අගයන් (AVE අගයන්) 0.5 වඩා ඉහළ අගයක් ගෙන ඇත. එම නිසා පළමු මිනුම් ආකෘතිය තුළ අභිසාරී වලංගුභාවය පවතින බව තහවුරු වේ.

ආකෘතියෙහි විචල්‍යයන්ගේ වලංගුභාවය තීරණය කිරීමට යොදා ගත හැකි අනෙක් සාධකය වන්නේ වෙන් කොට සැලකීමේ වලංගුභාවය යි. මෙහි දී වගුව 2හි තද කළු (Bold) කර දක්වා ඇති $\sqrt{\text{AVE}}$ අගයන්ට වඩා ඊට පහළින් සටහන් වූ අගයන් අඩු අගයන් නිසා මින් අදහස් කරනු ලබන්නේ පළමු මිනුම් ආකෘතිය තුළ වෙන් කොට සැලකීමේ වලංගුභාවය පවතින බවයි.

**මිනුම් ආකෘතියේ දෙවන පියවර**

මෙහිදී ද පළමු පියවර මිනුම් ආකෘතිය තුළ විචල්‍යයන්ගේ සහ අයිතමයන්ගේ විශ්වසනීයත්වය සහ වලංගුභාවය හඳුනා ගැනීම සඳහා සිදු කරන ලද පර්යේෂණයන් නැවත වරක් දෙවන පියවර මිනුම් ආකෘතියට අදාළ ව සිදු කර ඇත. ඒ අනුව පරිපාලන හැකියාව මිනුම් කිරීමට යොදා ගත් විචල්‍යයන්හි විශ්වසනීයත්වය හඳුනා ගැනීම සඳහා දර්ශක විශ්වසනීයත්වය සහ අභ්‍යන්තර අනුකූලතා විශ්වසනීයත්වය යන සාධකයන් ද විචල්‍යය ගොඩනැගීමට යොදාගත් අයිතමයන්ගේ වලංගුභාවය නිගමනය කිරීම සඳහා අභිසාරී වලංගුභාවය සහ බෙදා වෙන් කරන ලද වලංගුභාවය යන සාධකයන් ද යොදා ගන්නා ලදී. ඒ අනුව දෙවන පියවර මිනුම් ආකෘතියට අදාළ ප්‍රතිඵලයන් වගුව 3 සහ වගුව 4 මගින් ඉදිරිපත් කර ඇත.

ගුප්ත විචල්‍යයන් මිනුම් කිරීම සඳහා යොදා ගත් අයිතමයන්ගේ විශ්වසනීයත්වය මිනුම් කිරීම සඳහා දර්ශක විශ්වසනීයත්වය යටතේ එක් එක් අයිතමය සඳහා වූ පිටත පැටවුම් අගයන් 0.7 ට වඩා ඉහළ අගයන් වන අතර එම අගයන් 2.58 ට වඩා ඉහළ අගයන් වනු ඇත. එම නිසා ආකෘතිය තුළ ගුප්ත විචල්‍යයන් ගොඩනැගීමට යොදාගෙන ඇති සියලු ම අයිතමයන් විශ්වසනීය වූ අයිතමයන් බව 99% සංඛ්‍යානමය වෙසසියා මට්ටමක් යටතේ තහවුරු කළ හැකි ය. විචල්‍යයන් මිනුම් කිරීමට යොදා ගත් අයිතමයන්ගේ විශ්වසනීයත්වය පරීක්ෂා කිරීමට යොදා ගත හැකි අනෙක් සාධකය වන අභ්‍යන්තර අනුකූලතා විශ්වසනීයත්වයට අනුව ආකෘතිය තුළ ඇතුළත් ස්වායත්ත විචල්‍යයන් සතර සහ පරායත්ත විචල්‍යයට අදාළ Composit Reliability සහ Combranchi's Alpha සාධකයන්ට අදාළ අගයන් 0.7 ට වඩා වැඩි අගයන් බව වගුව 3 අධ්‍යයනය කිරීමෙන් හඳුනාගත හැකි ය. ඒ අනුව පැහැදිලි වන්නේ සියලු ම විචල්‍යයන්ට අදාළ අයිතමයන් එම විචල්‍යයන් මිනුම් කිරීම සඳහා වඩාත් විශ්වසනීයවන්ත වූ අයිතමයන් පමණක් යොදා ගෙන ඇති බව යි. වගුව 3හි ඇති ආකාරයට ආකෘතිය තුළ ස්වායත්ත විචල්‍යයන් සහ පරායත්ත විචල්‍යයට අදාළ AVE සාධක අගය 0.5 ට වඩා ඉහළ අගයන් වන නිසා ආකෘතිය තුළ අභිසාරී වලංගුභාවය සහිත බව හඳුනාගත හැකි ය.

ආකෘතිය තුළ විචල්‍යයන්ගේ වලංගුභාවය හඳුනා ගැනීම සඳහා යොදා ගනු ලබන දෙවැනි සාධකය වන්නේ වෙන් කොට සැලකීමේ වලංගුභාවය යි. එහි දී වගුව 4ට අනුව ආකෘතිය තුළ විචල්‍යයන්ගේ AVE වර්ගමූල ($\sqrt{\text{AVE}}$) අගයන්ට වඩා පහළින් සටහන් වූ අගයන් $\sqrt{\text{AVE}}$ අගයන්ට වඩා අඩු අගයන් නිසා ආකෘතියෙහි ඇතුළත් සෑම විචල්‍යයක ම බෙදා වෙන් කර සැලකීමේ වලංගුභාවය පවතින බව හඳුනාගත හැකි ය.

ව්‍යුහාත්මක ආකෘතිය (Structural Model) මිනුම් කිරීම: මිනුම් ආකෘතිය යටතේ වඩාත් විශ්වසනීය ව සහ වලංගුභාවයෙන් යුතු ව ගොඩනඟා ගන්නා ලද විචල්‍යයන් අතර පවතින අන්තර් සම්බන්ධතාව Hair (2014) විසින් හඳුන්වා දුන් පියවර 05 යටතේ විශ්ලේෂණය කරන ලදී. ආකෘතික තුළ විචල්‍යයන් අතර බහුඒකරේඛීයතා (Multi-collinierity) තත්ත්වයක් පවතිනවාද යන්න හඳුනා ගැනීම වැදගත් වනු ඇත. ඒ අනුව මෙම පර්යේෂණයේ දී විචල්‍යයන් අතර පවතින සම්බන්ධතා මට්ටම හඳුනා ගැනීම සඳහා විචලතා උද්ධමන සාධකය (VIF) සහ Tolerance අගය යන සාධක දෙක යොදා ගන්නා ලදී.

වගුව 5: VIF අගයන් සහ Tolerance අගයන්

| විචල්‍යය | VIF | Tolerance |
|---|---|---|
| සන්නිවේදන හැකියාව | 2.996 | 0.334 |
| කාර්යක්ෂමතාව | 2.930 | 0.341 |
| ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව | 3.987 | 0.251 |
| වැඩ දැනුම | 3.491 | 0.286 |

මූලාශ්‍රය - නියැදිය සමීක්ෂණය, 2019

ඒ අනුව ආකෘතිය තුළ සෑම ස්වායත්ත විචල්‍යයකට ම අදාළ VIF අගය 05 ට වඩා පහළ අගයක පවතින බව වගුව 5 මගින් පෙන්නුම් කර ඇත. තව ද සෑම විචල්‍යයක් සඳහා ම අදාළ Tolerance අගය 0.2 කට වඩා වැඩි අගයක් ගනු ලබන අතර ඒ මගින් පැහැදිලි වන්නේ ආකෘතියෙහි ඇතුළත් කිසිදු විචල්‍යයක් තුළ බහුඒකරේඛීයතා තත්ත්වයක් නොමැති බව යි. පර්යේෂණයේ ප්‍රධාන අරමුණ ඉටුකර ගැනීම සඳහා ආකෘතියෙන් ඇතුළත් පරායත්ත විචල්‍යය සහ ස්වායත්ත විචල්‍යයන් අතර පවත්නා සම්බන්ධතාවයේ සහ එම සම්බන්ධතාවන්ගේ වෙසසියාත්මක භාවය වගුව 6 ආශ්‍රයෙන් පෙන්නුම් කර ඇත.

ඒ අනුව වගුව 6න් පෙන්නුම් කරන ආකාරයට පාරිභෝගික තෘප්තිය මිනුම් කරනු ලබන විචල්‍යයන් 04 අතුරින් කාර්යක්ෂමතාව හැර සෙසු විචල්‍යයන් පාරිභෝගික තෘප්තිය සමග සංඛ්‍යානමය වශයෙන් වෙසසියාත්මක වූ අනුලෝම සම්බන්ධතාවයක් පවතින බව 95% විශවාස මට්ටමකින් යුතු ව හඳුනා ගත හැකි ය. තව ද කාර්යක්ෂමතාව සහ පාරිභෝගික තෘප්තිය අතර පවතින සම්බන්ධතාව


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වගුව 6: විචල්‍යය සංගුණක අගයන් සහ සංගුණකයන්ගේ වෙසසියාත්මකභාවය

| විචල්‍යය | ß අගයන් | t අගයන් | ප්‍රතිඵලය |
|---|---|---|---|
| වැඩ දැනුම- පාරිභෝගික තෘප්තිය | 0.192 | 2.084 | වෙසසියාත්මක වේ |
| කාර්යක්ෂමතාවය- පාරිභෝගික තෘප්තිය | 0.154 | 1.897 | වෙසසියාත්මක නොවේ |
| ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව- පාරිභෝගික තෘප්තිය | 0.248 | 2.749 | වෙසසියාත්මක වේ |
| සන්නිවේදන හැකියාව- පාරිභෝගික තෘප්තිය | 0.404 | 4.307 | වෙසසියාත්මක වේ |

මූලාශ්‍රය - නියැදිය සමීක්ෂණය, 2019

95% වෙසසියා මට්ටමක් යටතේ සංඛ්‍යානමය වශයෙන් වෙසසියාත්මක නොවුව ද 90% විශ්වාස මට්ටමක් යටතේ සංඛ්‍යානමය වශයෙන් වෙසසියාත්මක වනු ඇත.

මෙම අධ්‍යයනයට අනුව පාරිභෝගික තෘප්තිය තීරණය වීමට බලපාන සාධක අතුරින් වැඩ දැනුම හැර අනෙකුත් සාධක ස්ථාවර ව පවතින අවස්ථාවක සේවකයන්ගේ වැඩ දැනුම ඒකකයකින් වෙනස් වීමක් සිදු වුවහොත්, පාරිභෝගික තෘප්තිය ද ඊට අනුලෝම ලෙස 0.192 කින් වෙනස් වන බව තහවුරු වේ. ඒ අනුව මෙම අධ්‍යයනයේ පළමු කල්පිතය එනම් ව්‍යාපාර ආයතනක කාර්ය මණ්ඩලයේ වැඩ දැනුම සහ පාරිභෝගික තෘප්තිය අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී යන්න සංඛ්‍යානමය වශයෙන් තහවුරු වේ. මෙම ප්‍රතිඵලය Mehmood and Abedin (2017) සහ Tseng (2016) යන පර්යේෂකයින්ගේ පර්යේෂණ ප්‍රතිඵලවලට බොහෝ දුරට සමාන වේ.

එමෙන් ම කාර්යක්ෂමතාව හැර පාරිභෝගික තෘප්තිය තීරණය වීමට බලපානු ලබන අනෙකුත් සාධක ස්ථාවර ව පවතින විටක දී සේවකයන්ගේ කාර්යක්ෂමතාව ඒකකයකින් ඉහළ ගියහොත් පාරිභෝගික තෘප්තිය 0.154 කින් ඉහළ යන බව වගුව 6න් පෙන්නුම් කෙරේ. ඒ අනුව මෙම අධ්‍යයනයේ දෙවන කල්පිතය එනම් ආයතනයේ කාර්ය මණ්ඩලයේ කර්යක්ෂමතාව සහ පාරිභෝගික තෘප්තිය අතර අනුලෝම සම්බන්ධතාවක් ඇත යන්න සංඛ්‍යානමය වශයෙන් සනාථ වේ. Kurdi., Alshurideh and Alnaser (2020) යන පර්යේෂකයින්ගේ පර්යේෂණ ප්‍රතිඵලවලට අනුව සේවක කාර්යක්ෂමතාව ය පාරිභෝගික තෘප්තිය කෙරෙහි දැඩි ලෙස බලපාන අතර මෙම පර්යේෂණයේ ප්‍රතිඵල මගින් එවැනි දැඩි බලපෑමක් දැකිය නොහැක.

තව ද දත්ත විශ්ලේෂණ ප්‍රතිඵලවලට අනුව පාරිභෝගික තෘප්තිය සඳහා බලපානු ලබන සාධක අතුරින් සන්නිවේදන හැකියාව හැර අනෙකුත් සාධක ස්ථාවර ව පවතින විට සේවකයන්ගේ සන්නිවේදන හැකියාව ඒකකයකින් ඉහළ යන විට පාරිභෝගික තෘප්තිය ද 0.404 කින් ඉහළ බව වගුව 6ට අනුව පැහැදිලි වේ. ආයතනයේ කාර්ය මණ්ඩලයේ ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව සහ පාරිභෝගික තෘප්තිය අතර අනුලෝම සම්බන්ධතාවක් ඇත යන කල්පිතය සංඛ්‍යානමය වශයෙන් තහවුරු වේ. මෙම පර්යේෂණයේ ප්‍රතිඵලවලට අනුව සේවකයන්ගේ සන්නිවේදන හැකියාව පාරිභෝගික තෘප්තිය කෙරෙහි දැඩි ලෙස බලපාන අතර Muhammad, et al. (2018) යන පර්යේෂකයින්ගේ පර්යේෂණ ප්‍රතිඵලවලට අනුව සේවකයන්ගේ සන්නිවේදන හැකියාව පාරිභෝගික තෘප්තිය කෙරෙහි දැඩි බලපෑමක් දැකිය නොහැක.

තව ද විශ්ලේෂණ ප්‍රතිඵලයන්ට අනුව පාරිභෝගික තෘප්තිය තීරණය වීමට හේතු වන සාධක අතුරින් ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව හැර අනෙකුත් සාධකයන් ස්ථාවර ව පවතින විට දී සේවකයන්ගේ ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව ඒකකයකින් වෙනස් වන විට ඊට අනුලෝම ලෙස පාරිභෝගික තෘප්තිය ද 0.248 කින් වෙනස් වන බව වගුව 6න් පෙන්නුම් කෙරේ. ඒ අනුව මෙම අධ්‍යයනයේ හතරවන කල්පිතය එනම් ආයතනයේ කාර්ය මණ්ඩලයේ සන්නිවේදන හැකියාව සහ පාරිභෝගික තෘප්තිය අතර අනුලෝම සම්බන්ධතාවක් ඇත යන්න සංඛ්‍යානමය වශයෙන් සනාථ වේ. මෙම ප්‍රතිඵලය Metz, Ilie and Nistor (2020) සහ Tseng (2016) යන පර්යේෂකයින්ගේ පර්යේෂණ ප්‍රතිඵලවලට බොහෝ දුරට සමාන වේ.

මෙම පර්යේෂණ ආකෘතියට අදාළ නිර්ණන සංගුණක අගය 0.628 ක් ය. එනම් පාරිභෝගික තෘප්තියෙහි සිදු වන මුළු විචලනයෙන් 83% ක ප්‍රතිශතයක් ආකෘතිය තුළ ස්වායත්ත විචල්‍යයන් වන වැඩ දැනුම, කාර්යක්ෂමතාව, ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව සහ සන්නිවේදන හැකියාව යන විචල්‍යයන් මගින් පැහැදිලි කරනු ඇත. $F^2$ අගය මගින් ආකෘතියෙහි ඇතුළත් එක් එක් විචල්‍යයන් අතර පවත්නා වූ සම්බන්ධතාවයන්ගේ ප්‍රමාණයේ බලපෑම පැහැදිලි කරනු ඇත. ආකෘතිය තුළ $R^2$ අගය සඳහා වැඩි ම බලපෑමක් ඇති කරනු ලබන විචල්‍යය බවට පත් වන්නේ සන්නිවේදන හැකියාවයි. ඒ අනුව ආකෘතියෙහි වඩා ප්‍රබල ම ස්වායත්ත විචල්‍යය ලෙස සන්නිවේදන හැකියාව හඳුනාගත හැකි ය. මෙම පර්යේෂණ ආකෘතිය තුළ පුරෝකථන අදාළත්වය පරීක්ෂා කිරීම සඳහා $Q^2$ සංගුණක අගය භාවිත කරන ලදී. මෙම පර්යේෂණයෙහි $Q^2$ අගය 0.563 ය. එම නිසා මෙම පර්යේෂණ ආකෘතියෙහි පුරෝකථන අදාළත්වයක් පවතින


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

බව හඳුනා ගත හැකි ය.

## නිගමන

ආයතනයක කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව පාරිභෝගික තෘප්තියට ඇති කරන බලපෑම කෙබඳු ද යන්න පිළිබඳ ව ප්‍රායෝගිකව කරන ලද අධ්‍යයනයේ ප්‍රතිඵලවලට අනුව පහත සඳහන් නිගමනවලට එළඹීමට හැකි ය. මෙම අධ්‍යයනයේ දී කල්පිත 04 ක් පරීක්ෂා කළ අතර දත්ත විශ්ලේෂණ ප්‍රතිඵලවලට අනුව ඉන් කල්පිත 03 ක් සංඛ්‍යානමය වශයෙන් තහවුරු ව්‍යාපාර ආයතනයක කාර්ය මණ්ඩලයේ වැඩ දැනුම පාරිභෝගික තෘප්තිය කෙරෙහි ධනාත්මක ලෙසින් බලපාන අතර කාර්ය මණ්ඩලයේ කර්යක්ෂමතාව පාරිභෝගික තෘප්තිය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළත්, එය සංඛ්‍යානමය වශයෙන් සනාථ නොවේ. තව ද දත්ත විශ්ලේෂණට අනුව ආයතනයේ කාර්ය මණ්ඩලයේ ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව සහ පාරිභෝගික තෘප්තිය අතර අනුලෝම සම්බන්ධතාවක් පවතින බව තහවුරු විය. එසේ ම ආයතනයක කාර්ය මණ්ඩලයේ සන්නිවේදන හැකියාව සහ පාරිභෝගික තෘප්තිය අතර ද අනුලෝම සම්බන්ධතාවක් පවතින බව සනාථ වේ. එහි දී එකී සාධක අතුරින් සේවකයින්ගේ සන්නිවේදන හැකියාව පාරිභෝගික තෘප්තිය කෙරෙහි ප්‍රබල ම ධනාත්මක බලපෑමක් ඇති කරන සාධකය වේ. ඒ අනුව ආයතන විසින් පාරිභෝගික තෘප්තිය ඉහළ නංවා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ආයතනයෙහි සේවකයින්ගේ පරිපාලන හැකියාවන් ප්‍රමුඛ ලෙස බලපාන බව තහවුරු වේ.

ව්‍යාපාර ආයතනයක කාර්ය මණ්ඩලයේ වැඩ දැනුම තීරණය වීම සඳහා කාර්ය මණ්ඩලයට අදාළ ව ආයතනය තුළ පැවරී ඇති කාර්ය භාරයන්ට අදාළ ව පවතින දැනුම, කාර්ය මණ්ඩලයේ නායකත්ව ගුණාංග, කාර්යයන්ගේ පවතින ගුණාත්මකභාව සහ තීරණ ගැනීමේ හැකියාව යන සාධකයන් හේතු වේ. කාර්ය මණ්ඩලය සතු කාර්යක්ෂමතාව ඔහු විසින් ආයතනය තුළ සිදු කරන වැඩ ප්‍රමාණය, කිසියම් කාර්යයක් සිදු කිරීමට ගත වන කාලය, ශ්‍රමිකයන් අතර වගකීම් පැවරීමේ හැකියාව සහ ආයතනයෙහි වැඩ කටයුතු සංවිධානය කිරීමේ හැකියාව යන සාධක පාරිභෝගික තෘප්තිය වෙනස් වීම කෙරෙහි බලපාන සාධක වේ. පර්යේෂණ ප්‍රතිඵලයන්ට අනුව පරිපාලන හැකියාව මිනුම් කරනු ලබන සාධකයන් අතුරින් පාරිභෝගික තෘප්තිය සඳහා ඉහළ ම බලපෑමක් ඇති කරනු ලබන විචල්‍යය බවට පත් වන්නේ සේවකයන් සතු සන්නිවේදන හැකියාව යි. ආයතනයේ කාර්ය මණ්ඩලයේ වාචික හා ලිඛිත ප්‍රකාශන හැකියාව, සේවකයන් අතර පවතින අන්තර් සම්බන්ධතාව, ශ්‍රමිකයන් අතර තොරතුරු හුවමාරු කර ගැනීමෙ හැකියාව යන සාධකයන් මත ආයතනයක කාර්ය මණ්ඩලයේ සන්නිවේදන හැකියාව තීරණය වන බව මෙම පර්යේෂණයේ ප්‍රතිඵලවලින් පෙන්නුම් කෙරේ. කෙසේ වෙතත් පාරිභෝගික තෘප්තියට අවම බලපෑමක් ඇති කරනු ලබන විචල්‍යය වන්නේ සේවක කාර්යක්ෂමතාවයි. කාර්ය මණ්ඩලයේ ඉලක්ක ළඟා කර ගැනිමේ හැකියාව, සේවකයන් සතු කාල කළමනාකරණ හැකියාව, නායකත්ව ගුණාංග, ආයතනය තුළ වැඩ කටයුතු සැලසුම් කිරීමේ හැකියාව සහ ඔවුන් වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමට සේවකයන් සතු යෝග්‍යතාව යන සාධකයන් මත තීරණය වනු ඇත. මෙසේ පාරිභෝගික තෘප්තිය තීරණය වීම කෙරෙහි ආයතනයක සේවකයන්ගේ පවතින පරිපාලන හැකියාව ඉතා දැඩි ලෙස බලපාන බව හඳුනාගත හැකි විය.

කෙසේ වෙතත් ව්‍යාපාර ආයතනවල කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව පාරිභෝගික තෘප්තිය කෙරෙහි බලපාන ආකාරය පිළබඳ ව ප්‍රත්‍යමූල ප්‍රතිඵල මෙම අධ්‍යයනය මගින් හෙළිදරව් වේ. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල මගින් ශ්‍රී ලංකාවේ මුල්‍ය සමාගමක කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව, පාරිභෝගික තෘප්තියට කරන බලපෑමේ ස්වරූපය හඳුනා ගැනීමට හැකිවිය. ව්‍යාපාර ආයතනවල මානව සම්පත් සංවර්ධනයේ දී ආයතනයක සේවකයන්ගේ සන්නිවේදන හැකියාව, කාර්යක්ෂමතාව, ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව සහ වැඩ දැනුම වැනි අංශ තව දුරටත් වර්ධනය කිරීමට පියවර ගැනීමෙන් ව්‍යාපාර ආයතනවල කාර්යසාධනය තවදුරටත් දියුණු කර ගත හැකි බවට නිර්දේශ කළ හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය


Alanazi, A., and Bach, C. (2016). Factors that affect and enhance customer satisfaction. Journal of Research in Business and Management, 4(9), 80-88.

Almsalam, S. (2014). The effects of customer expectation and perceived service quality on customer satisfaction. International Journal of Business management and invention, 3(8), 79-84.

Anderson, A. E. (1973). Consumer dissatisfaction: The effect of disconfirmed expectancy on perceived product performance. Journal of Marketing Research, 10(1), 38-44. doi:10.2307/3149407.

Buttle, F. (2009). Customer Relationship Management (2nd ed.). Elsevier Publishing.

Campo, M. (2014). Leadership and research administration. Research Management Review, 12(4), 76 – 92.

Carman, J. M. (1990). Consumer perceptions of service quality: An assessment of the service quality dimensions,. Journal of Retailing 66(4), 5-33.



© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

Djajanto, L., Nimran, U., Kumadji, S., and Kertahadi. (2014). The effect of self-service technology, service quality and relationship marketing on customer satisfaction and loyalty. IOSR Journal of Business and Management, 16(1), 39-50, doi: 10.9790/487X-16163950.

Espino, A. G. (2017). Operational efficiency and customer satisfaction of restaurants: Basis For business operation enhancement. Asia Pacific Journal of Multidisciplinary Research, (9(2), 122-132.

Rai, A. K. (2013). Customer Relationship Management: Concepts And Cases, Delhi: PHI Learning.

Kotler, P. and Keller, K.L. (2007). Marketing Management, (14th Ed.), Prentice-Hall of India Private Ltd. New Dilhi. ISBN: 978-1-4082-5273-4. Retrieved from `http://trove.net.gov.au/version`.

Kurdi, B., Alshurideh, M & Alnaser, A. (2020). The impact of employee satisfaction on customer satisfaction: Theoretical and empirical underpinning. Management Science Letters , 10(15), 3561-3570.

Lucas, R. L. (2012). Customer service skills for success, McGraw-Hill, New York.

Mehmood, A. and Abedin, M.Y.Z.U. (2017). Does knowledge management influence the customer's satisfaction and intention to quit? Mediating role of customer relationship management. International Journal of Engineering and Information Systems (IJEAIS), 1, 88 - 94.

Metz, D., Ilie , L. and Nistor, R.L. (2020). The Impact of Organizational Culture on Customer Service Effectiveness from a Sustainability Perspective. Sustainability. 12(15):6240. `http://doi.org/10.3390/su12156240`

Muhammad Ali; Khalid M. Iraqi; Amna Sohail Rawat; Shoaib Mohammad. (2018). Role of Customer Service Skills on Customer Satisfaction and Its Effects on Customer Loyalty in Pakistan Banking Industry. South Asian Journal of Management Sciences (SAJMS), 12(2), 210-223

Oliver, L. R. and DeSarbo, W. S. (1998). Response determinants in satisfaction judgements. Journal of Consumer Research, 14(4), 495-507. Doi:10.1086/209131.

Richardson, G. (1972). The organisation of industry'. The Economic Journal, 82(327), 883-896. Retrieved September 29, 2015, from `http://www.jstor.org/stable/2230256`.

Sahni, P., and Vayunandan, E. (2010). Administrative theory. New Delhi, India: PHI Learning.

Sim , J., Mak, B., and Jones, D. (2006). A Model of Customer Satisfaction and Retention for Hotels. Journal of Quality Assurance in Hospitality & Tourism, 1-23.

Tether, B., Mina, A., Consoli, D., and Galiardi, D. (2005). A Literature Review on Skills and Innovation. How Does Successful Innovation Impact on the Demand for Skills and How Do Skills Drive Innovation? UK Department of Trade and Industry.

Tseng, S.-M. (2016). Knowledge management capability, customer relationship management, and service quality. Journal of Enterprise Information Management, 29(2), 202-221. `http://doi.org/10.1108/JEIM-04-2014-0042`

Waber, M. (1897). The Theory of Social and Economic Organization. (T. Parsons, Ed.) New Foreword Martino Publishing.

Wong , P. S. (2012). Drucker's Knowledge-worker Productivity Theory:A Practitioner's Approach to Integrating Organisational, Vol. 11, No. 4, Retrieved from `http://www.rmci.ase.ro/`

Yen, H. R. (2005). An attribute-based model of quality satisfaction for internet self-service technology. Service Industries Journal, 25(5), 641-659. doi: 10.1080=02642060500100 -833.

Yunikewaty . (2017). The effect of training and ability on the performance of employee at disaster. Mediterranean Journal of Social Sciences, 10(2), 87 -103.

Zeithaml, V., Parasuraman, A., & Berry, L. (1988). A multiple item scale for measuring consumer perception of service quality. Journal of Retailing, 12-39.

Zephan, N. (2018). Relationship between customer satisfaction and customer loyalty. Elsevier Publishing.


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
එකොළොස්වන කලාපය 2020 දෙසැම්බර්
පිටු 31-39
ISSN 1800-1459 eISSN 2386-2041
© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# මිරිදිය වගුරු වනාන්තර පරිසර පද්ධති හායනය කෙරෙහි මානව ක්‍රියාකාරකම්වල බලපෑම: වලව්වේවත්ත වතුරාන වගුරු වනාන්තරය ආශ්‍රිත ජෛව භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයක්

(Impact of anthropogenic activities on the degradation of freshwater swamp forest ecosystem in Sri Lanka: A Biogeographical study about Walauwewaththa Wathurana freshwater swamp forest)

එස්.එච්.එස්.එම්. සිරිවර්ධන* සහ ආචාර්ය පූජ්‍ය පින්නවල සංඝසුමන හිමි

අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා යුධ හමුදා විද්‍යාපීඨය, දියතලාව
*s.h.s.m.siriwardana@gmail.com

**සාරසංක්ෂේපය**

නිවර්තන කලාපික මිරිදිය වගුරු බිම් පරිසර පද්ධතියේ අවසාන අවධියේ පසුවන වර්ධනීය තත්ත්වයක් වශයෙන් මිරිදිය වගුරු වනාන්තර පරිසර පද්ධතිය හැඳින්විය හැකි ය. කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි වලව්වේවත්ත වතුරාන මිරිදිය වගුරු වනාන්තරය වූ කලි ජෛව විවිධත්වයෙන් පොහොසත්, පරිසර පද්ධතියක් මෙන්ම ඉතා දුර්ලභ ඉහළ උපයෝගීතාවයක් සහිත වූ තෙත් බිම් කාණ්ඩයකි. ශ්‍රී ලංකාවේ පවත්නා ගතික පරිසර පද්ධතියක් වූ මෙය විවිධ මානව මූලික ක්‍රියාකාරකම් හේතුවෙන් පසු ගිය දශක කිහිපය පුරා දැඩි හායනයකට ලක් වෙමින් පවතී. එබැවින් එකී හායනයේ ප්‍රමාණය කෙතෙක්දැයි තක්සේරු කිරීමත්, ගැටලුව වඩාත් තීව්‍ර කිරීමෙහිලා මානව ක්‍රියාකාරකම් බලපා ඇති ආකාරය විශ්ලේෂණය කිරීමත් මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරේ. පර්යේෂණයේ නියැදිය වශයෙන් වතුරාන වනාන්තරය හා ඒ ආශ්‍රිත ජනාවාස කලාපය තෝරා ගන්නා ලදී. පරිසර පද්ධතියේ කාලීන වෙනස්වීම් සිතියම්ගත කිරීමට අමතර ව ව්‍යුහාත්මක ප්‍රශ්නාවලියක් ඔස්සේ කුටුම්භ ආශ්‍රිත සමීක්ෂණයක් සිදු කරන ලදී. ඒ සඳහා ඉලක්කගත සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේදය භාවිත කරන ලදී. මෙම පර්යේෂණයේ සොයාගැනීම් මගින් තහවුරු කෙරෙන වැදගත් කරුණක් වන්නේ ගතවූ වසර විස්සක පමණ කාලය තුළ වනාන්තරය අවට පදිංචිකරුවන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් වගුරු වනාන්තරය හායනයට ලක් වීමේ ශීඝ්‍රතාව දෙගුණ වී ඇති බවයි. ජීවනෝපාය මාර්ග සඳහා ඇති අවස්ථාව හිඟකම සහ දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට වනාන්තරය පරිහරණය කිරීම මීට බලපා ඇති හේතු අතර ප්‍රධාන වේ. අවිධිමත් ක්‍රම මගින් මසුන් ඇල්ලීම, කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය, රබර් කර්මාන්ත ආශ්‍රිත ද්‍රව අපද්‍රව්‍ය ජලයට මුදා හැරීම, වැලි ගොඩ දැමීම හා උණ බට හා වේවැල් කර්මාන්තය ආදී මානව ක්‍රියාකාරකම් ජීවීන් විශේෂ වඳ වී යාම කෙරෙහි බලපා ඇත. මෙම වටිනා පරිසර පද්ධතිය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති මානව කටයුතු අවම කිරීමෙහිලා විවිධ ක්‍රමෝපායන් මෙම පත්‍රිකාවෙන් යෝජනා කර ඇති අතර එම ප්‍රවේශයන් වනාන්තරයේ තිරසාර පැවැත්ම තහවුරු වීම උදෙසා ඉතා වැදගත් වනු ඇත.

කේන්ද්‍රීය වචන: මානව ක්‍රියාකාරකම්, හායනය, පරිසර පද්ධතිය, මිරිදිය වගුරු වනාන්තර, බලපෑම

Swamp forests are late succession stage of a freshwater marsh ecosystem and it is the rarest wetland type in Sri Lanka, enriching in biodiversity and thus providing number of ecosystem services. The Walauwewatta Wathurana has been identified as the most dynamic fresh water ecosystem in Sri Lanka. These rare forest ecosystems have been subjected to degradation over the past decades due to various reasons especially anthropogenic activities. A study was conducted to explore the magnitude of the impacts caused by anthropogenic activities. A household survey was conducted using a structured questioner, Participatory Rural Appraisals (PRA) and discussions were made to gather information from adjacent people in the swamp. Data analysis based on both quantitative and qualitatec techniques. It was revealed that, a large number of activities carried out surrounding the forest by the adjoining communities are directly or indirectly related to their livelihoods as well as for their daily household needs. Species richness and abundance have been decreased over the past two decades due the unsustainable fishing activities, contamination of agro-chemicals as well as chemical effluents of rubber based industries, sand mining, bamboo and rattan industries located around the forest area. This paper concludes that the Wathurana fresh water swamp forest has been subjected to degradation due to anthropogenic activities. Conservation strategies should be strengthened in order to maintain the sustainability of the ecosystem services provided by this freshwater swamp forest.

Key words: Anthropogenic Activities, Degradation, Ecosystem, Fresh Water Swamp Forest

## හැඳින්වීම

ලොව අතිශය දුර්ලභ පරිසර පද්ධතියක් ලෙස අර්ථ දැක්විය හැකි ''මිරිදිය වගුරු වනාන්තර'' ලෝකයේ තෙත් දේශගුණයක් පවතින, විශේෂයෙන් ම නිවර්තන කලාපයේ පහත් ගංගා නිම්නවල පිටාර තැනි ඇසුරේ නිර්මාණය වී තිබෙනු දැකගත හැකි ය. මිරිදිය වගුරු වනාන්තර හැඳින්වීම සඳහා දේශිය භාවිතයක් වන්නේ ''වතුරාන'' යන යෙදුම යි. ''වතුරාන'' යන යෙදුමෙන් ම මෙම වනාන්තරය ආශ්‍රිත

ක්‍රියාවලිය ''ජලය'' සමග ඍජු ව සම්බන්ධ වන බව හැඟේ. වතුරාන වනාන්තරය තම වාසස්ථානය බවට පත් කරගත් ශාක, සත්ත්ව ප්‍රජාව හා ජලය අතර පවතින්නේ වැදගත් අන්තර් සම්බන්ධතාවකි. මෙම සුවිශේෂ අන්තර් සම්බන්ධය හා වතුරාන වනාන්තරවල දක්නට ලැබෙන අනෙකුත් ගතිගුණ මුල්කොට ගෙන මේවා අනෙකුත් වගුරු බිම් පරිසර පද්ධතිවලින් ස්ථිර ව ම වෙනස් වේ. එසේ ම මෙම වනාන්තර මගින් මිනිසාට ද ඉමහත් සේවාවන් රැසක් ඉටු වන අතර විශාල ජල ප්‍රමාණයක් දරා සිටීමේ හැකියාව, පහළ නිම්නයක් ඇසුරේ පිහිටන මෙම වනාන්තරය සතු බැවින් අතිරික්ත ජලය ගබඩා කර ගන්නා ජල ගබඩාවක් ලෙස ක්‍රියා කර අවට ප්‍රදේශවලට ඇති විය හැකි ගංවතුර තත්ත්වය පාලනය කිරීමට මහඟු පිටිවහලක් සපයයි. තව ද ජලයේ පවතින දූෂක ද්‍රව්‍ය වනාන්තරය මගින් උරාගෙන පිරිසිදු ජලය පරිසරයට මුදා හැරීම මගින් පානීය ජලයේ සෞඛ්‍යාරක්ෂිත බව සුරැකීමට දායක වෙයි. එහෙත් වර්තමානය වන විට ජනාවාසකරණය, නාගරීකරණය හා කාර්මීකරණය වැනි ක්‍රියාවලීන්හි අනිසි ප්‍රතිඵලයක් ලෙස ලෝකය පුරා මෙවැනි බිම් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. දිවයිනේ තෙත් දේශගුණයක් පවතින ප්‍රදේශවල පිටාර තැනි ඇසුරේ අතීතයේදී මෙවැනි වතුරාන වනාන්තර ගණනාවක් ම තිබී ඇති බවට සාක්ෂි තිබේ. නමුත් ජන සංඛ්‍යාවේ ශීඝ්‍ර වර්ධනයත් සමග වනාන්තර ප්‍රදේශ එළි කිරීම, වගුරු බිම් ගොඩ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ පිහිටි මෙවැනි වතුරාන බිම් බොහෝමයක් විනාශ වී ඇති බව පැහැදිලි ය. ඒබැවින් අද වන විට දිවයිනේ ඉතිරි වී පවතින මිරිදිය වගුරු වනාන්තර කිහිපය අතුරින් කුඩා ගංගා මිටියාවතක පිහිටා ඇති වලව්වේවත්ත වතුරාන මිරිදිය වගුරු වනාන්තරය ඉතා වැදගත් පරිසර පද්ධතියක් බවට පත් වී තිබේ.

## සාහිත්‍ය විමර්ශනය

තෙත් බිම් පරිසර පද්ධතිය, පෘථිවි ජෛව ගෝලයේ පවතින ප්‍රධාන උප පද්ධතියක් වශයෙන් හඳුනා ගත හැකි ය. එසේ ම ලොව පවතින ඉතා ම ඵලදායි මෙන් ම සාරවත් ම භූමි භාග වශයෙන් තෙත් බිම් අර්ථ දැක්වීමට පිළිවන (මධ්‍යම පරිසර අධිකාරිය 1994 අ: 27). අන්තර්ජාතික තෙත්බිම් වර්ගීකරණයේ මිරිදිය තෙත් බිම්/අභ්‍යන්තර ස්වාභාවික තෙත්බිම් යටතේ ප්‍රධාන උප කාණ්ඩයක් වශයෙන් වගුරු වනාන්තර දක්වයි (මධ්‍යම පරිසර අධිකාරිය 1994 අ: 147). වගුරු බිම් පිළිබඳ ව අසන්නට ලැබුණ ද ''වගුරු වනාන්තර'' යන වදන ඒතරම් හුරුපුරුදු වචනයක් නොවේ. වගුරු වනාන්තර යනු, ''වගුරු භූමියකට වඩා ඉදිරියට ගිය එයට ම ආවේණික වූ පරිසර පද්ධතියක් නිර්මාණය කොටගත් විශිෂ්ට වර්ධනීය තත්ත්වයකි'' (ප්‍රනාන්දු 2013: 142). ඒවායේ නිර්මාණය විම, අඩංගු කාබනික ද්‍රව්‍ය, ජලයේ ගුණාත්මක බව, ශාක වැස්ම ආදී ලක්ෂණ අනුව වගුරු වනාන්තර ප්‍රධාන කාණ්ඩ 4 කි. එනම්,

1. මිරිදිය වගුරු වනාන්තර
2. පීට් වගුරු වනාන්තර
3. කිවුල්දිය වගුරු වනාන්තර (කඩොලාන වගුරු වනාන්තර)
4. පැළෑටිවලින් සමන්විත වගුරු වනාන්තර

යනුවෙනි (Gupta 2005: 241).

ගෝලීය පරිසර පද්ධතීන් අතර ඉතා සුවිශේෂ පරිසර පද්ධතියක් ලෙස මිරිදිය වගුරු වනාන්තර හැඳින්විය හැකි ය. මේවා පිරිසිදු ජලය නොහොත් මිරිදිය පදනම් කරගෙන නිර්මිත ලොව අතිශය දුර්ලභ පරිසර පද්ධති වේ (විජේසිංහ 1988: 147). මිරිදිය වගුරු වනාන්තර, ''මිරිදිය වගුරු බිම් පරිසර පද්ධතියේ අවසාන භාගයේ පසුවන වර්ධනීය අවධියක් වශයෙන් ද අර්ථ දැක්විය හැක'' (මධ්‍යම පරිසර අධිකාරිය 1994: 56). මෝසම් ක්‍රියාවලිය හෝ ගංවතුරේ බලපෑම මත ජලය වාර්ෂික ව තැන්පත් වන හෝ වාර්ෂික ව ජලයෙන් යටවන නිශ්චල පහත් භූමි ප්‍රදේශ ඇසුරේ කාබනික ද්‍රව්‍ය, දියළු පස මත තැන්පත් වී පීට් ස්තර නිර්මාණය වෙයි. එම ක්‍රියාවලිය නොකඩවා දිගු කාලීන ව සිදුවීමේ ප්‍රතිඵලයක් ලෙස මිරිදිය වගුරු වනාන්තර නිර්මාණය වී තිබේ (විජේසිංහ 1988: 152). මේවා ලොව පවතින ඉතාමත් දර්ශනීයතම හා පාරිසරික වශයෙන් අතිශය වැදගත් වූ පරිසර පද්ධති ලෙස සැලකේ.

සමකයේ සිට උතුරු අක්ෂාංශ $80^0$ දක්වාත්, සමකයේ සිට දකුණු අක්ෂාංශ $35^0$ දක්වාත් වූ භූගෝලීය සීමාව තුළ මිරිදිය වගුරු වනාන්තර දැකගත හැකි මුත් එම ප්‍රදේශ ඇසුරේත් මිරිදිය වගුරු වනාන්තර ව්‍යාප්ත වී ඇත්තේ මුහුදු මට්ටමේ සිට උස මීටර 1200 ට අඩු නිවර්තන හා උප නිවර්තන භූමිභාග ඇසුරේ ය. වගුරු වනාන්තරයක වෘක්ෂලතා පස සමග සම්බන්ධ වේ. එසේ ම පාංශු තත්ත්වයන්ට, ගංවතුර තත්ත්වයන්ට හා නොගැඹුරු නිශ්චල ජලයේ අවහිරයකින් තොර ව වැඩීමට අනුවර්තනය වූ බහුවාර්ෂික කාෂ්ටිය ශාක ප්‍රජාවක් මේවායේ දැකගත හැකි ය. මිරිදිය වගුරු වනාන්තර ලොව ජෛව විවිධත්වය අතින් පොහොසත් ම අතිශය සංවේදී පරිසර පද්ධතියක් වන අතර මේවා මගින් පරිසරයේ මනා සමතුලිතතාවක් පවත්වා ගැනීමට ලබා දෙන මෙහෙය අතිමහත් ය. එසේ ම මේවා මගින් මිනිසාට ද සේවාවන් රැසක් සැළසේ. එසේ ම නවීකරණය, ජනාවාසකරණය හා කාර්මීකරණය සමග ජල භාවිතය අධික වීම, වන ආවරණය අඩු විම හා ඉහළ පෝෂක ප්‍රදේශවල වනාන්තර අඩුවීම නිසා මේවාට ලැබෙන ජලය සීමා සහිත වීමත්, ජලවහනයට විවිධ බාධා ඇතිවීමත් හේතුවෙන් මේවායේ පැවත්මට විශාල තර්ජන එල්ල වී පවතී (මධ්‍යම පරිසර අධිකාරිය 1996 : 45).

ශ්‍රී ලංකාවේ වලව්වේවත්ත වතුරාන මිරිදිය වගුරු වනාන්තරය ලොව පිහිටි සුන්දර ම වගුරු වනාන්තර අතුරින් එකකි. ''වතුරාන'' යන සිංහල යෙදුමේ අර්ථය වන්නේ ''විටින් විට ජලයෙන් යටවන භූමිය'' යන්නයි (මධ්‍යම පරිසර අධිකාරිය 1994 ආ: 74). ශ්‍රී ලංකාවේ නිරිත දිග පහත් භූමි භාගය ආශ්‍රිත ව, කළුතර නගරයෙන් 25km ක් රට තුළට වන්නට කළු ගං මිටියාවත ආශ්‍රිත ව බුලත්සිංහල, දම්පරාදුගොඩ ග්‍රාම නිලධාරි වසම තුළ වනාන්තරය පිහිටා ඇත. වනාන්තරය හෙක්ටයාර් 6.2045 ක කුඩා වපසරියක් පුරා ව්‍යාප්ත ව තිබේ (1398/21 ගැසට් පත්‍රය, 2001.04.24).


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වගුව 1: වතුරාන මිරිදිය වගුරු වනාන්තරයේ දක්නට ලැබෙන ශාක විශේෂ

| සිංහල නාමය | විද්‍යාත්මක නාමය | ප්‍රවර්ගය |
|---|---|---|
| ලේන්තැරි | Areca concinna | E, R, T |
| කටමෝදා | Cullenia rosayroana | E, T |
| නා | Mesua pulchella | E, T, VR |
| සුවඳ | Mesua stylosa | E, T, VR |
| දිය නා | Mesua thwaitesii | E, T, UR |
| ගොඩපර | Dillenia retusa | |
| කැකිරිවරා | Schumacheria castaneifolia | |
| දියපර | Wormia burbigi | E |
| හොර | Dipterocarpus zeylanicus | E, R |
| හොරවැල් (බොරුමන්දාරා) | Stemnoporus mooni | E, T, VR |
| හල් | Vateria copailifera | E |
| කළුමැදිරිය | Diospyros quaesita | T, VR |
| මස්මොර | Adenanthera bicolor | R, T |
| මුරුත | Largerstoemia speciosa | |
| බැදි දෙල් | Artocarpus nobilis | E |

**ප්‍රවර්ග සලකුණු තොරතුරු:**

E - ඒකදේශික විශේෂයකි.

R - දුර්ලභ විශේෂයකි.

T - වඳවී යන විශේෂයකි.

VR - ඉතා දුර්ලභ විශේෂයකි.

මුලාශ්‍රය - මධ්‍යම පරිසර අධිකාරිය, 1994

ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාප අතුරින් අභ්‍යන්තර තැනිතලාවට අයත් කළු ගංගාවේ පහළ නිම්නයේ පිටාර තැන්න ආශ්‍රිත ව නිර්මාණය වී ඇති වනාන්තරය ප්‍රදේශයේ උපරිම උස මුහුදු මට්ටමේ සිට මීටර් 100-150 වේ. වතුරානේ ප්‍රධාන ජල මුලාශ්‍ර 2කි. ඒ කුකුළු ඇළ හා බටපොත ඇළයි. වනාන්තරය කළු ගංගාවේ ප්‍රධාන අතු ගංගාව වන කුඩා ගඟේ, අතු ගංගාවක් වන බටපොත ඇළේ වම් ඉවුරට මායිම් ව පවතී (මධ්‍යම පරිසර අධිකාරිය 1994 අ: 117). රතු කහ පොඩ්සොලික් පස හා දියළු පසත් මෙහි ප්‍රමුඛ පාංශු ඝන වන අතර මෙම පාංශු ඝන දෙකට ම ඉහළින් දිරාපත් වෙමින් පවතින ඝනකමැති කාබනික ද්‍රව්‍ය තට්ටුවක් පවතී (ප්‍රනාන්දු 2013: 214). වතුරාන වනාන්තරය පිහිටා ඇත්තේ පහතරට තෙත් කලාපය ආශ්‍රිත ව බැවින් තෙත් කලාපයට අවේණික වූ දේශගුණික තත්ත්වයන් මෙම ප්‍රදේශය ඇසුරේ දක්නට ලැබේ. වනාන්තරය ආශ්‍රිත ප්‍රදේශයේ මධ්‍ය මාසික උෂ්ණත්වයේ සාමාන්‍යය 27.3 $^{0}$C ක් පමණ වේ. වාර්ෂික වර්ෂාපතනය 4000-5000 පමණය (අයි.යූ.සී.එන් 2007: 184). වගුරු වනාන්තරයට වර්ෂාපතනය ලැබෙන ප්‍රධාන ආකාරය වන්නේ නිරිත දිග මෝසම යි.

වගුරු භූමියක් වුවත් වතුරාන ''වගුරු වනාන්තරයක්'' බවට පත් වන්නේ එහි වෘක්ෂලතා පද්ධතියේ සුවිශේෂ සැකැස්ම නිසා ය. ඒ මන්දයත්, වතුරාන වගුරු වනාන්තරයේ දැකගත හැකි වන්නේ ශ්‍රී ලංකාවේ පහතරට වර්ෂා වනාන්තර තුළ දක්නට ලැබෙන වෘක්ෂලතා ප්‍රභේද වේ. වතුරාන වගුරු වනාන්තරය තුළ, එම වනාන්තරයට ම අනන්‍ය වූ සුවිශේෂ ශාක වර්ග 2ක් දැකගත හැකි ය (අයි.යූ.සී.එන් 2007: 184). එනම්, හොරවැල් (stemnoporus mooni), හා සුවඳ (Mesua stylosa) ය. වතුරාන වනාන්තරයේ වෙසෙන ජීවී ප්‍රජාව ඉතා ඉහළ විවිධත්වයකින් යුක්ත අතර පහතරට වර්ෂා වනාන්තරවලට ආවේණික වූ දුර්ලභ, ඒකදේශික, වඳ වී යාමේ තර්ජනයට මුහුණපා ඇති අධික විවිධත්වයකින් යුතු සතත්ව ප්‍රජාවක් මෙම වනාන්තරය ඇසුරේ හඳුනාගත හැකි ය.

විජේසේකර නම් පවුලට අයත් වලව්වේවත්ත වතු සමාගමට හිමිකම් කියන පෞද්ගලික ඉඩමක වනාන්තරය පිහිටා තිබීම විශේෂත්වයකි. 2009 වසරේදී 1980 අංක 47 දරණ ජාතික පරිසරික පනතේ විධිවිධානවලට අනුව වලව්වේවත්ත වතු යායේ පිහිටි වතුරාන වගුරු වනාන්තරය 2009.4.29 දින ප්‍රකාශයට පත් කරන ලද 1398/21 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ''පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක්'' ලෙස නම් කරන ලදි. ගැසට් පත්‍රය මගින් මෙම පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ සීමාව ඇතුළත බලතල ක්‍රියාත්මක කිරීම හෝ යම් කර්තව්‍යයක් ඉටු කිරීමේ බලතල මධ්‍යම පරිසර අධිකාරියට පමණක් හිමි වී ඇත (1398/21, ගැසට් පත්‍රය, 2009/04/29).

## පර්යේෂණ ගැටලුව

මිරිදිය වගුරු වනාන්තර, ජෛව විවිධත්වයෙන් අධික වූ භූමි ප්‍රදේශයන් වීමේ ප්‍රතිඵලයක් ලෙස මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ඇති වන අයහපත් බලපෑම ද ඉහළ මට්ටමක පවතී. එකී තත්ත්වය වනාන්තර පරිසර පද්ධතියේ අඛණ්ඩ පැවැත්ම හා ක්‍රියාකාරීත්වය කෙරෙහි විවිධාකාර වූ බලපෑම් ඇති කරයි. වලව්වේවත්ත වතුරාන මිරිදිය වගුරු

වනාන්තරයේ වපසරිය 1980 පමණ වන විට හෙක්ටයාර 11 පමණ විය. දශක තුනකට පසු එහි වපසරිය හෙක්ටයාර 6.2045 දක්වා අඩු වී ඇත. ක්‍රමානුකූල ව ව්‍යාප්ත වී ඇති මානව ජනාවාස මගින් වනාන්තරයේ සීමාව ආක්‍රමණය කර ඇත. මෙම පසුබිමෙහි වනාන්තරයේ ජෛව පද්ධතියට සිදු වී ඇති මානව බලපෑම කොපමණදැයි තවමත් නිර්ණය කර නොමැත. එසේ ම මෙම පරිසර පද්ධතියේ ජෛව විවිධත්වය හායනය වීම කෙරෙහි සෘජු ලෙස හේතු වී ඇති මානව ක්‍රියාකාරකම් හඳුනා ගැනීමත්, ඒ ඔස්සේ ඒවාට පිළියම් යෝජනා කිරීමත් අත්‍යවශ්‍ය වේ. එබැවින් වලව්වේවත්ත වතුරාන මිරිදිය පරිසර පද්ධතිය හායනයට ලක් වීමේ ස්වභාවය කෙබඳු ද? ඔයට බලපා ඇති මානව ක්‍රියාකාරකම් කවරේ ද? මෙකී ජෛව පරිසර පද්ධතියේ කවර අංග දැඩි තර්ජනයකට ලක් වී තිබේ ද? ආදී කේන්ද්‍රීය ප්‍රශ්න සහිත ව මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව ගොඩ නගා තිබේ.

## පර්යේෂණ අරමුණු

**ප්‍රධාන අරමුණ**

වලව්වේවත්ත වතුරාන මිරිදිය වගුරු වනාන්තර පරිසර පද්ධතියේ හායනය කෙරෙහි මානව කටයුතු බලපා ඇති ආකාරය අධ්‍යයනය කිරීම හා එය අවම කිරීමේ ක්‍රමෝපායන් යෝජනා කිරීම.

**සෙසු අරමුණු**

- වනාන්තරය අවට ජනාවාසකරණය, එහි භූමි සීමාව කෙරෙහි බලපා ඇති ආකාරය විමර්ශනය කිරීම.
- වනාන්තරය ආශ්‍රිත ජෛව පරිසර පද්ධතියේ තර්ජනයට ලක් වී ඇති ප්‍රධාන අංග හඳුනා ගැනීම.

## පර්යේෂණ වැදගත්කම

මෙම පර්යේෂණයේ ප්‍රධාන වැදගත්කම නම්, පර්යේෂණය සිදු කිරීම හේතුවෙන් පර්යේෂණයට ලක් කරන පරිසර පද්ධතිය හඳුනා ගැනීම, එහි පවතින විවිධ ගැටලු හඳුනා ගැනීම, ඒවාට විසඳුම් සෙවීම හා ඒ මගින් විවිධ අහිතකර තත්ත්ව මග හරවා ගැනීමට එම විසඳුම් දායක කර ගත හැකි වීමත් ය. ඒ හැරුණු විට වතුරානේ ජෛව විවිධත්වය පිළිබඳ මෙයට ප්‍රථම පර්යේෂණ කිහිපයක් ම සිදු කරන ලදි. ප්‍රථමයෙන් ම වනාන්තරය පිළිබඳ පර්යේෂණයක් සිදු කරනු ලැබුවේ 1979 දි කොස්ටමාන්ඩ් හා නිමල් ගුණතිලක යන අය විසිනි. පසු ව මධ්‍යම පරිසර අධිකාරිය විසින් 1996 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලැබූ තෙත් බිම් ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපෘතිය යටතේ වලව්වේවත්ත වතුරාන මිරිදිය වගුරු වනාන්තරය පිළිබඳ ව පර්යේෂණය කරන ලදි. එසේ ම සෙනෙවිරත්න විසින් 1988, 1989, 1993 යන වර්ෂවල වනාන්තරය පිළිබඳ ව වාර්තා ඉදිරිපත් කර තිබේ. නමුත් ඒ සෑම අවස්ථාවකදී ම පර්යේෂණයට භාජනය කර ඇත්තේ වනාන්තරයේ ජෛව විවිධත්වය පිළිබඳ ව යි. කිසිඳු වාර්තාවක මානව ක්‍රියා හේතුවෙන් එම පරිසර පද්ධතියට ඇති වන තර්ජන පිළිබඳ ව පැහැදිලි ව ග්‍රහණය වීමක් සිදු වී නොමැත. එනම් මානව ක්‍රියා හේතුවෙන් මෙම පරිසර පද්ධතියට සිදුවන බලපෑම හා එම බලපෑම් මැඩ පැවැත්වීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ ව සවිස්තරාත්මක පර්යේෂණ වාර්තාවක් මෙතුවක් ඉදිරිපත් වී නොමැති බැවින් මෙම පර්යේෂණය ඉතා කාලෝචිත යැයි සැලකිය හැකි ය.

## පර්යේෂණ ක්‍රමවේදය

**නියැදි ප්‍රදේශය**

වලව්වේවත්ත වතුරාන මිරිදිය වගුරු වනාන්තරයේ නිරපේක්ෂ පිහිටීම සැලකීමේ දි ප්‍රදේශයේ මධ්‍යය ලක්ෂය උතුරු අක්ෂාංශ $6^0$ 38‘ 25’’ ත් නැගෙනහිර දේශාංශ $80^0$ 11’ 15’’ ත් තුළ පිහිටයි. (මූලාශ්‍රයඃ 1989 L17/ 18/ 22/ 23 ගුවන් ඡායාරූප) (මධ්‍යම පරිසර අධිකාරිය, 1994) වනාන්තරයේ පිහිටීම රූප සටහන 1 මගින් තවදුරටත් පැහැදිලි වේ.

අධ්‍යයන ප්‍රදේශය පිහිටා ඇති දම්පරාදුගොඩ ග්‍රාම නිලධාරී වසමේ ජීවත් වන පවුල් සංඛ්‍යාව 176 කි. එම පවුල් සංඛ්‍යාවෙන් 20% ක නියැදියක් එනම් පවුල් 40 ක් නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදී. එසේ තෝරා ගැනීමේ දී සෑම පවුලකට ම නියැදියට තේරීමේ සමාන අවස්ථාව සලසා දෙමින් සරල සසම්භාවී නියැදි ක්‍රමය මෙහි දී භාවිතයට ගන්නා ලදී.

**දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය**


ද්විතියික දත්ත මෙන් ම ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, සෘජු නිරීක්ෂණ හා නිවැරදිතා විමසුම් ලේඛන මගින් මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත එක් රැස් කර ගනු ලැබූ අතර එම දත්ත ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව විශ්ලේෂණයට බඳුන් කොට තිබේ. නිවැරදිතා විමසුම් ලේඛන සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා මූලාශ්‍රය වශයෙන් භාවිත කරනු ලැබුවේ 2011 මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ වතුරාන සම්බන්ධ තෙත් බිම් ස්ථානීය වාර්තාව යි.




**රූපසටහන් අංක 1:** අධ්‍යයන ප්‍රදේශයේ නිරපේක්ෂ පිහිටීම


මූලාශ්‍රය - (IUCN, 2007)


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය




**රූපසටහන් අංක 2:** රැකියා තත්ත්වය

මූලාශ්‍රය - සම්පත් පැතිකඩ, බුලත්සිංහල ප්‍රා.ලේ.කා 2017




**රූපසටහන් අංක 3:** අධ්‍යයන ප්‍රදේශයේ අමතර රැකියාවල නියුතු පවුල් සංඛ්‍යාව

මූලාශ්‍රය - සම්පත් පැතිකඩ, බුලත්සිංහල ප්‍රා.ලේ.කා 2017

**දත්ත විශ්ලේෂණය**

**ජීවිකා වෘත්තීන් මගින් වනාන්තරයට සිදු වන අහිතකර බලපෑම්:**

වලව්වේවත්ත වතුරාන වගුරු වනාන්තරය පිහිටා ඇති දම්පරාදුගොඩ ග්‍රාම නිලධාරි වසමේ වාසය කරන පවුල් 176 ට අයත් පුද්ගලයන් සංඛ්‍යාව 630 ක් වේ. ප්‍රදේශයේ ඉඩම් අයිතිය පිළිබඳ ව සැලකීමේ දී ගම්වාසීන්ගෙන් 67.5% ක් සින්නක්කර ඉඩම්වලත් 15% ක් වතු නිවාසවලත්, 12.5%ක් රජයේ ඉඩම්වලත්, වාසය කරති. දම්පරාදුගොඩ ග්‍රාම නිලධාරි වසමේ රැකියා නියුක්තිය රූප සටහන 2 පරිදි හඳුනාගත හැකි ය.

ප්‍රදේශයේ රැකියා තත්ත්වය පිළිබඳ ව සැලකීමේ දී සෑම පවුලක ම පාහේ එක් අයෙකු හෝ අවම වශයෙන් රැකියා නියුක්තියක් සහිත අතර කුටුම්භ 32.5% ක එක් සාමාජිකයෙකු පමණක් බැගින් ද, කුටුම්භ 57.5% ක සාමාජිකයන් දෙදෙනෙකු බැගින් ද, කුටුම්භ 10% ක් සාමාජිකයන් තිදෙනෙකු බැගින් ද රැකියාවල යෙදේ. පෞද්ගලික අංශයේ රැකියා නියුක්තිය සැලකීමේ දී ගම්වාසීන් බොහෝමයකගේ ම ප්‍රධාන ජීවනෝපාය වන්නේ වතු වැඩ යි. ඒ යටතේ රබර් කිරි කැපීම, වතු සුද්ද කිරීම, තේ දලු නෙළීම, කප්පාදු කිරීම, පිරිසිදු කිරීම වැනි කටයුතුවලත් නියැළේ. ගම්මානයේ 47.5% ක ප්‍රතිශතයක් තම ප්‍රධාන ජීවනෝපාය බවට පත් කොට ගෙන ඇත්තේ වතුරාන වටා වතු ඉඩම්වල වතු වැඩ කිරීම ය. වතු වැඩ හැරුණු විට පුද්ගලික අංශයේ රැකියා නියුක්තිකයින්ගෙන් 27.7% ක ප්‍රතිශතයක් මේසන් වැඩවලට අත් උදව්කරුවන්, වෙනත් වතු සුද්ද කිරීම වැනි කුලී වැඩවලත් 17.5% ක ප්‍රතිශතයක්, ලී මෝල්, ගරාජ්, රියදුරු, කම්හල්, ගාමන්ට්, රබර් ආශ්‍රිත ද්‍රව්‍ය නිපදවන කර්මාන්තශාලා ආශ්‍රිතවත් රැකියාවේ නියැළේ. මෙවැනි පෞද්ගලික අංශයේ රැකියාවල නිරතවන බොහෝමයකගේ විශේෂයෙන් වතු වැඩ, කුලී වැඩ ආදියේ යෙදෙන ජනතාවගේ මාසික ආදායම් මට්ටම සාපේක්ෂ ව පහළ අගයක් ගනු ලබන අතර එය බොහෝ


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය



**රූපසටහන් අංක 4:** මසුන් ඇල්ලීමට ඇළ මාර්ගය හරස් කිරීම

මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණය 2014



**රූපසටහන් අංක 5:** මසුන් ඇල්ලීමට ඇළ මාර්ගය හරස් කිරීම

මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණය 2014

අවස්ථාවන්හි දී ඔවුන්ගේ මාසික වියදමට වඩා අඩු ය. මේ හේතුවෙන් රැකියා නියුක්තිකයන්ගෙන් වැඩි දෙනා අමතර ආදායම් මාර්ග කෙරෙහි නැඹුරු ව සිටිති. එම රැකියා යටතේ ඔවුහු මසුන් මැරීම, උණබට කර්මාන්තය, වේවැල් කර්මාන්තය, දඩයම, පැළෑටි වර්ග ගැලවීම, වැලි ගොඩදැමීම, ශීට් රබර් නිපදවීම, අඟුරු නිෂ්පාදනය ආදිය සිදු කරති.

රූප සටහන 3 හි දැක්වෙන පරිදි නියැදියෙන් වැඩි ම ප්‍රමාණයක් එනම් 26.09% ක ප්‍රතිශතයක් අමතර රැකියාව ලෙස වැලි ගොඩදැමීම සිදු කරන අතර 18.39% ක ප්‍රතිශතයක් වේවැල් කර්මාන්තයේ නියැළේ. තව ද 16.39% ක ප්‍රතිශතයක් මිරිදිය ධීවර කර්මාන්තයේත් 13.06% ක ප්‍රතිශතයක් උණබට කර්මාන්තයේත් 8.69% බැගින් පැළෑටි ගැලවීම, ශීට් රබර්, අඟුරු සෑදීම වැනි රැකියා ක්ෂේත්‍රවලට යොමු වී තිබේ. මෙම වෘත්තිකයින්ගෙන් බොහෝ දෙනා තම අමතර රැකියා සඳහා අවශ්‍ය නිෂ්පාදන අමුද්‍රව්‍ය අසල වනාන්තරයෙන් හෝ වනාන්තරය අවට භූමි භාගයෙන් ලබා ගැනීමට පෙළඹී සිටිති.

- **මිරිදිය ධීවර කර්මාන්තය**

වතුරානේ ජල මූලාශ්‍ර ආශ්‍රිත ව මසුන් මැරීම සිදු වන අතර මේ සඳහා මිනිසුන් ක්‍රම දෙකක් භාවිත කරන අතර ඒ බිලීපිති භාවිතය හා මසුන් කොටු කිරීම යි. බිලීපිති භාවිතය එතරම් ප්‍රචලිත නොවුණ ද මසුන් කොටු කිරීම වතුරානේ ජල මාර්ග ආශ්‍රිත ව බහුල ව ම සිදු වන ක්‍රියාවලියකි. වතුරාන වගුරු වනාන්තරයට වර්ෂාවත් සමග ඇති වන ගංවතුර තත්ත්වය ක්‍රමයෙන් පාලනය වීමත් සමග ම ගම්වාසීහු මෙම ක්‍රියාවලියේ නිරත වෙති. එනම්, මෙම ක්‍රියාවලියේ දී ප්‍රථමයෙන් ම වතුරානේ ගංවතුර පහවී යාමත් සමග ම ඇළ මාර්ගයේ ගැඹුරු ස්ථාන හරස් කොට වැලි කොට්ට, ලී කැබලි, ගස්වල අතු දමා වළක් ලෙසට සාදයි. (රූප සටහන 4) වනාන්තරයේ ඇළ පහරවල් ආශ්‍රිත ව ජීවත් වන මසුන්ගේ කැදලි සඳහා ඔවුන් තෝරා ගන්නේ ඇළ ඉවුරේ ඇති ශාක මුල්වලින් සමන්විත ප්‍රදේශයයි. ඒවායේ ගුල් හාරා දණ්ඩි, මඟුරා, තලකොස්සා, කනයා, පොත්තයා, වැලිගොව්වා වැනි මසුන් බිත්තර දැමීම සිදු කරයි (රූප සටහන 5). එබැවින් කණ්ඩි ආශ්‍රිත ව බිත්තර දමන මසුන් ද සිටීම නිසා එවැනි ස්ථාන ද වට කර වැලි කොට්ට, ලී කැබලි, කොළ අතු යොදා වැටි බැඳීම සිදු වේ.

අනතුරු ව මසුන්ගේ කැදලි පිහිටා ඇති ඇළ කණ්ඩිය උදලු භාවිතයෙන්, අවහිර කළ ඇළ මාර්ගයට කපා දැමීම සිදු කරයි. අනතුරු ව වටකොට සකස් කරගත් වළේ ජලය ඉසිනු ලැබේ. ජලය අඩුවීමත් සමග මසුන් අඩියේ ඉතිරි වන අතර ඉන් පසු මසුන් අල්ලා ගැනීම සිදු කරයි. මෙලෙස මසුන් ජීවත් වන ගුල් සහිත කණ්ඩි කපා දැමීම නිසා මාළු බිත්තර පවා විනාශ වීමත්, වළවල් ඉසීම නිසා කුඩා මත්ස්‍ය පැටවුන් විනාශ වීමත් මගින් වතුරානේ මත්ස්‍ය ගහනය වේගයෙන් අඩු වීමට මෙම ක්‍රියාවලිය ප්‍රබල ව හේතු වී ඇති බව පැහැදිලි වේ.

- **උණබට කර්මාන්තය හා වේවැල් කර්මාන්තය**

ගම්වාසීන්ගෙන් 13.06% ක ප්‍රමාණයක් උණබට කර්මාන්තයේ නියුතු අතර මේ සඳහා නිෂ්පාදන අමුද්‍රව්‍ය වශයෙන් භාවිත කරන්නේ උණබට (Ochilandra stridula) ශාකයේ කඳ කොටස යි. එසේ ම දම්පරාදූගොඩ ගම්වාසීන්ගේ අමතර ආදායම් මාර්ග අතුරින් ප්‍රධාන ස්ථානයක් හිමිකර ගත් අංශයක වනනේ වේවැල් ආශ්‍රිත නිෂ්පාදන යි. අධ්‍යයන ප්‍රදේශයේ 18.39% ක ප්‍රතිශතයක් වේවැල් කර්මාන්තයේ නියුතු ය.

- **ශීට් රබර් කර්මාන්තය**

වතුරාන වගුරු වනාන්තරය අවට වැඩි වශයෙන් ම පවතින්නේ රබර් වතු වන අතර ප්‍රදේශයේ බොහෝ දෙනා ශීට් රබර් සෑදීමේ නියුතු අතර ඔවුන් තම නිවසේ ඇසිඩ් දමා ඝන කරගත් රබර්, රැගෙන ගොස් රබර් රෝල නම් උපකරණය යොදාගෙන එහි ඇති අතිරික්ත ජලය ඉවත් කරගනී. රබර් රෝල් මගින් ශීට්වල ඇති ඇසිඩ් මුසු වූ අතිරික්ත ජලය ඉවත් වන අතර මේවා කුකුළු ඇළට හා බටපොත ඇළට මිශ්‍ර වේ. ඇළ මාර්ගයන්හි ජලයේ



© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය


ආම්ලිකතාව ඉහළ යෑම මසුන්ගේ දෛනික පරිවෘත්තීය ක්‍රියා අඩාල වීම කෙරෙහි බලපාන අතර එහි අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ මත්ස්‍ය ගහනයේ අඩු වීම යි.

**වන ද්‍රව්‍ය රැස් කිරීම මගින් වනාන්තර පරිසර පද්ධතියට සිදුවන බලපෑම:**

තවමත් ගම්වාසීන් වැඩි දෙනෙකුගේ ප්‍රධාන බලශක්ති ප්‍රභවය වන්නේ "දර'' වන අතර ඔවුන් තම දර අවශ්‍යතා සපුරා ගන්නේ වනාන්තරය හා ඒ අවට ස්වාරක්ෂක කලාපයෙනි. එසේ ම ඔවුහු තම ඉදිකිරීම් සඳහා අවශ්‍ය වැලි වනාන්තරය අවට ජල මාර්ගවලින් ලබා ගැනීමට හුරු ව සිටිති. තව ද වතුරාන අතිඋඩියන්, එක් වැල්, හාතවාරිය, හීං බෝවිටියා, ඉරමුසු, සමදරා, ඉරටමැඩිය, ගොනිකා, බේදුරු, බාඳුරා බොකු හා මුස්වැන්ද වැනි ඖෂධ වර්ග බොහෝමයකින් පොහොසත් වූ වනපෙතක් බැවින් ගම්වාසීන් තම ඖෂධ අවශ්‍යතා සපුරා ගැනීම උදෙසා වනාන්තරය පරිහරණය කරන අවස්ථා බොහෝ ය. වැඩි පාරිසරික වටිනාකමකින් යුත් ආවේණික හා දුර්ලභ ශාක වර්ග ඖෂධ වශයෙන් ගැලවීම මගින් එම ශාක ක්‍රමයෙන් වනාන්තරයෙන් වඳ වී යාමට පටන්ගෙන තිබේ.

**කෘෂිකාර්මික කටයුතු හේතුවෙන් වනාන්තරයට සිදු වන අහිතකර බලපෑම:**

වතුරාන වගුරු වනාන්තරය පිහිටා ඇති ග්‍රාම නිලධාරි වසමේ වගා කොට ඇති මුළු භූමි ප්‍රමාණය අක්කර 38 ක් වන අතර වගා නොකළ බිම් ප්‍රමාණය අක්කර 59 ක් වේ. ගම්වාසීහු තේ, රබර්, පොල්, එළවළු, වී වැනි වගාවන්හි නියැළෙන අතර 60% ක ප්‍රතිශතයක් වෙනත් ස්ථිර ජීවනෝපාය මාර්ගයක නියැලෙන අතර ම කෘෂිකර්මාන්තයේත් නිරත වෙති. තව ද ප්‍රදේශයේ පුද්ගලයන්ගෙන් කෘෂි කටයුතුවල පමණක් නිරත ව සිටින ප්‍රමාණය 30% කි. වතුරාන වගුරු වනාන්තරය බටහිර කොටසේ ''හොනක'' නම් වනතිරය හැරුනු විට ඒ වටා ඇති අනෙක් සෑම ප්‍රදේශයක් ම ජනාවාස හා පොල්, තේ, රබර් වගාවෙන් යුක්ත ය. දම්පරාදූගොඩ කෘෂිකර්මාන්තයේ යෙදෙන පවුල් සංඛ්‍යාව හා කෘෂිකාර්මික භූමි පරිභෝගය රූප සටහන 6 මගින් පැහැදිලි වන අතර ප්‍රදේශයේ ප්‍රමුඛ භෝග පිළිවෙලින් රබර්, තේ හා වී වේ.





**රූපසටහන් අංක 6**: විවිධ භෝග වගා කර ඇති පවුල් සංඛ්‍යාව හා ඉඩම් ප්‍රමාණය

මූලාශ්‍රය - සම්පත් පැතිකඩ, බුලත්සිංහල ප්‍රා.ලේ.කා 2017

ප්‍රදේශයේ වී ගොවීහු වර්තමානය වන විට විවිධ රසායනික යෙදවුම් යෙදීමට හුරු ව සිටිති. ප්‍රදේශයේ වී වගාවේ නියුතු පවුල්වලින් 26.67% ක ප්‍රමාණයක් වසර 1-5 ක කාලයක සිටත්, පවුල් 33.33% ක් වසර 5-20 ක කාලයක සිටත් 60% ක් වසර 20 කට වැඩි කාලයක සිටත් වී වගාවේ නියුතු ය. වී වගා කර ඇති බිම්වලින් 53.3% ක් පිහිටා ඇත්තේ වනාන්තරය පිහිටා ඇති නිම්න පතුල් ප්‍රදේශය ආසන්නයේ ය. මෙම වී වගා බිම්වල කෘමි උවදුරු හා වල් පැළෑටි මර්දනයට ද අතීතයේදී ගොවීන් සාම්ප්‍රදායික ව පැවත එන ජෛවීය හා යාන්ත්‍රික ක්‍රම භාවිත කරනු ලැබුව ද රසායනික කෘෂි රසායනික ද්‍රව්‍ය ප්‍රචලිත වීමේ ප්‍රතිඵලයක් ලෙස වර්තමානය වන විට ගොවීහු යූරියා, ත්‍රිත්ව සුපර් පොස්පේට්, මියුරේට් ඔෆ් පොටෑෂ් වැනි පොහොර වර්ග භාවිතයට නැඹුරු වී සිටිති. අතීතයේ දී පළිබෝධ උවදුරු මැඩලීමට හා වල් පැළෑටි මර්දනයට පරිසරහිතකාමී තිරසරබවකින් යුතු ජෛවීය හා යාන්ත්‍රික ක්‍රම අනුගමනය කරනු ලැබුව ද වර්තමානය වන විට එම ක්‍රම අනුගමනය කරනු ලබන්නේ ගොවීන්ගෙන් 13% ක පිරිසක් පමණි. රසායනික පළිබෝධනාශක හා වල් නාශක යෙදීමේ පහසුව හා ඒවායේ වේගවත් ක්‍රියාකාරී බව මුල් කොටගෙන ගොවීහු 86.67% ක් අද වන විට රසායනික පළිබෝධනාශක භාවිත කරති. ගොවීන්ගෙන් බොහොමයක් දැනට වසර දහයකට වඩා වැඩි කාලයක සිට තම ගොවිබිම්වලට කෘෂි රසායනිනක ද්‍රව්‍ය යොදන අතර මෙම කුඹුරු ඉඩම්වලින් 93% ක් පිහිටා ඇත්තේ ජල පහරක් ආශ්‍රිත ව ය. මේවා සෘජු ව ම වනාන්තරය හරහා ගලා බසින කුකුළු ඇළට හා බටපොත ඇළට සම්බන්ධ වේ. වසර ගණනාවක් තිස්සේ කෘෂි රසායනික ද්‍රව්‍ය වතුරාන අවට ඇති කුඹුරු බිම්වලට යෙදීමත්, ඒවා ජල පහරවල් ඔස්සේ වනාන්තරයට ගසාගෙන යාමේත් ප්‍රතිඵලයක් ලෙස එම ජලයේ ඇති විෂ බව වනාන්තරයේ ඇළ මාර්ග ඇසුරේ ජීවත් වන මිරිදිය මත්ස්‍ය ප්‍රජාව කෙරෙහි අහිතකර ලෙස බලපා තිබේ. වී වගාවට අමතර ව රබර් හා තේ වගාවන් ද වනාන්තරය ආශ්‍රිත ප්‍රදේශයේ වැඩි වශයෙන් සිදු වන කෘෂිකාර්මික කටයුතු වන අතර වන සීමාව දක්වා ම ව්‍යාප්ත වූ රබර් වගාව ප්‍රදේශය ඇසුරේ දැකගත හැකි ය. මේ සියල්ලක් ම වතු සමාගම්වල හිමිකාරීත්වය සහිත භූමි ප්‍රදේශ වන අතර නියැදියෙන් 58.3% ක ප්‍රතිශතයක් වසර 20 කට වැඩි කාලයක සිට මෙම වගාවන්හි නිරත වේ. වතුරානට වඩා උන්නතාංශයෙන් වැඩි ප්‍රදේශ ඇසුරේ මෙම වගා බිම් ව්‍යාප්ත වී තිබීම හේතුවෙන් වගාවන්ට යොදන පොහොර හා දිලීර නාශක වැනි කෘෂි රසායනික ද්‍රව්‍ය වර්ෂාවත් සමග ඉතා පහසුවෙන් වනාන්තරය තුළට ගලා යයි. එහි ප්‍රතිඵලයක් ලෙස වතුරානේ භෞමික හා ජලජ පරිසර පද්ධතියේ ජීවීන්ට විවිධ බලපෑම් ඇති වේ. ප්‍රධාන වශයෙන් ම ජල පහරවල් ආශ්‍රිත මත්ස්‍ය ගහනයේ අඩු වීම කෙරෙහි මෙම තත්ත්වය හේතු වී තිබේ.


මීට අමතර ව වතුරාන වන සීමාවේ ජීවත්වන්නන් වනයේ සීමාවට විවිධ අපද්‍රව්‍ය බැහැර කිරීම දැකිය හැකි ය. තව ද වලව්වේවත්ත වතුරානේ, සුවිශේෂ ජෛව විවිධත්වයකින් යුතු පරිසර පද්ධතියක් දක්නට ලැබෙන බැවින් අද වන විට සංචාරකයින් විශාල වශයෙන් වනාන්තරය නැරඹීමට


ⓒ 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය




**රූපසටහන් අංක 7:** වසර 20-25 කට පෙර වන ද්‍රව්‍ය රැස් කිරීම සඳහා වතුරාන භාවිත කළ පවුල් සංඛ්‍යාව

මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණය 2014




**රූපසටහන් අංක 8:** වර්තමානය වන විට වන ද්‍රව්‍ය රැස් කිරීම සඳහා වතුරාන භාවිත කරන පවුල් සංඛ්‍යාව

මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණය 2014

පැමිණේ. ඒ අතරට පාසල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන් හා අනෙකුත් සංචාරකයින් ඇතුළත් ය. මෙය අධ්‍යයන කටයුතු සඳහා පර්යේෂණාගාරයක් වුව ද වනාන්තරය සාපේක්ෂ ව කුඩා බිම් කඩක් වීම හා ඉතා සංවේදී පරිසර පද්ධතියක් වීම හේතුවෙන් අසීමිත ව පැමිණෙන සංචාරකයින් පිරිසක් වනාන්තරයට දරා ගැනීම අපහසු වේ. වනාන්තරය අභ්‍යන්තරයේ එකවර විශාල පිරිසක් ඇවිදීම නිසා කුඩා ශාක පොඩි වීම සිදු වන අතර වැඩි ම බලපෑමක් ඇති වන්නේ වනාන්තරයට ආවේණික හොරවැල් (Stemnopours mooni) ශාකයට ය. එසේ ම අද වන විට වතුරානේ සීමා කණුව දක්වා ම මානව ජනාවාස ස්ථාපිත වී තිබෙන සේ ම වනාන්තරය වටා ම ජනාවාස හා වගා බිම් ව්‍යාප්ත වීමේ ප්‍රතිඵලය වන්නේ වතුරාන ඍජු ව ම බාහිර පරිසරයට නිරාවරණය වීම යි. නව ඉදිකිරීම් සඳහා වනාන්තරය අවට කලාපය එළි කිරීම හා වගුරු සහිත ප්‍රදේශ ගොඩ කිරීම කැපී පෙනේ. රූප සටහන 7 හා 8 ට අනුව අතීතයට සාපේක්ෂ ව වර්මානය වන විට ගම්වාසීන්ගේ වන ද්‍රව්‍ය භාවිත කිරීමේ සම්භාවිතාව අඩු වී ඇතත්, මෙය කුඩා වනාන්තර ප්‍රදේශයක් වීම නිසා මිනිසුන් වනාන්තරය පරිහරණය කිරීමෙන් එයට සිදු වන අහිතකර බලපෑම ඉහළ ය.

## නිගමනය

වතුරාන වගුරු වනාන්තරය ශ්‍රී ලංකාවට ආවේණික මෙන් ම ඉතා දුර්ලභ මිරිදිය මසුන් රැසකගේ ම වාසභූමියකි. කොටු කිරීමේ ක්‍රමයට ගම්වාසීන් විසින් වනයේ ඇළ මාර්ගවල වළවල් සෑදීම, ඇළ කණ්ඩි කැපීම හා කෘත්‍රිම ලෙස සකසන ලද වළවල් ඉසීමේ ප්‍රතිඵලයක් ලෙස වනාන්තරයේ ඇළ මාර්ග ඇසුරේ වෙසෙන මිරිදිය මත්ස්‍ය ගහනය වේගයෙන් අඩු වෙමින් පවතී. එසේ ම ඇළ මාර්ගවල මසුන් ඇල්ලීමට ඉවුරු කැපීමේ අතුරු ඵලය වී ඇත්තේ ඇළ මාර්ග පුළුල් වීම ය. ඒ සමග ම ඇළ ඉවුරු වර්ෂාවත් සමග ම නොකඩවා සෝදාපාලුවට ලක් වීමෙන් ඇළ කණ්ඩි ආශ්‍රිත ව පිහිටා තිබෙන ගස් ඇළ වෙත කඩා වැටීම සිදු වේ. අමතර රැකියා හා ඉදිකිරීම් සඳහා උණ බට, වේ වැල්, වැලි, ලී දඬු, දර, මැටි, බට පතුරු, ලී ඉණි ආදියත් විවිධ ආහාර ද්‍රව්‍ය රැස් කිරීම සඳහාත් ගම්වාසී ඇතැම් පිරිස් බොහෝ අවස්ථාවල දී වතුරාන පරිහරණය කරනු ලබති. එම ද්‍රව්‍ය සපයා ගැනීමට වැඩි වශයෙන් ම වනාන්තරය භාවිත කිරීමට දායක වන්නේ වන සීමාව ආශ්‍රිත ව ම වෙසෙන්නන් ය. මෙලෙස වන ද්‍රව්‍ය එක් රැස් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වතුරානේ ඇතැම් ශාක හා සත්ත්ව විශේෂවල කැපී පෙනෙන අඩුවීමක් සිදු ව ඇති බව නිවැරදිතා විමසුම් ලේඛන මගින් සනාථ වෙයි. වනාන්තරය ආසන්නයේ පිහිටා ඇති ෂීට් රබර් නිපදවන ස්ථාන, රබර් කර්මාන්තශාලා හා අනෙකුත් කර්මාන්තවලින් බැහැරලන අපජලය වතුරානේ ජල ප්‍රභවවලට මුසු වේ. වනයේ ශාක ප්‍රජාවන්ගේ හා සත්ත්ව ප්‍රජාවන්ගේ පැවැත්මට ඍජු වශයෙන් ම මෙමගින් බාධා ගෙනදේ. වනාන්තරය වටා පිහිටා තිබෙන තේ, රබර් වී වැනි කෘෂිකාර්මික බිම් සඳහා දනට වසර 15-20 ක පමණ කාලයක සිට රසායනික වල් නාශක, පොහොර හා පළිබෝධ නාශක යෙදීමට සිදු වේ. එම කෘෂි රසායනික ද්‍රව්‍ය වනාන්තරයේ ජල මූලාශ්‍රවලට එකතු වී වනාන්තරය වෙත ගලා ඒමේ ප්‍රතිඵලයක් ලෙස වතුරානේ ජලජ ශාක හා සත්ත්ව ප්‍රජාව කෙරෙහි මෙම තත්ත්වය ඍජු ව ම අහිතකර ලෙස බලපා ඇත. එසේ ම වන සීමාවේ ජීවත් වන පුද්ගලයන් විසින් වන සීමාවට දිරාපත් නොවන අපද්‍රව්‍ය බැහැර කිරීම මගින් ද වතුරානේ ජීවීන්ට විවිධ බලපෑම් ගෙන දී තිබේ.

වනාන්තරය වටා ම රබර් වගාව ව්‍යාප්ත ව පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස වතුරානට බලපෑමක් ගෙනදෙන ආක්‍රමණික ශාකයක් බවට “රබර්” අද වන විට පත්ව ඇත. රබර් ශාකය සඳහා වැඩි ඉඩක් අවශ්‍ය බැවින් අනෙකුත් වැදගත් ශාකවලට වැඩීමට අවශ්‍ය අවකාශයන් ඇහිරේ.

### සමාලෝචනය

මෙම වනාන්තරය පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස මධ්‍යම පරිසර අධිකාරිය මගින් නම් කොට තිබුණත් මෙය පාරිසරික වශයෙන් වැදගත් භූමිභාගයක් යැයි, යන හැඟීම අවට ජීවත් වන පැරණි පුද්ගලයන් තුළ බොහෝවිට දක්නට නොලැබෙන නමුත් පැරැන්නන්ට සාපේක්ෂ ව අවට ගම්වාසී ඇතැම් තරුණ පිරිස වතුරාන සංරක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳ අවබෝධයක් පවතී. එසේ ම ගම්වාසීන් වනාන්තරය පිළිබඳ ව දරන ආකල්ප ද අහිතකර මානව බලපෑම් එල්ලවීම කෙරෙහි බලපා ඇත. වනාන්තරයෙන්


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මිනිසුන් වන ද්‍රව්‍ය ලබා ගැනීමේ දී කාලීන ව කිසියම් වෙනසක් සිදු වී ඇති බව හඳුනාගත් නමුත් තවමත් බොහෝ පිරිස් තම අවශ්‍යතා සඳහා වතුරාන නිබඳ ව පරිහරණය කර යි. වතුරාන යනු සාපේක්ෂ ව කුඩා වන බිමකි. එබැවින් මෙයට මිනිසුන් විසින් කුඩා බලපෑමක් සිදු කළ ද එය වනාන්තරයේ ශාක හා සත්ත්වයින්ගේ පැවැත්මට විශාල ලෙස හානි ගෙන දෙයි. වතුරාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස මධ්‍යම පරිසර අධිකාරිය විසින් නම් කොට තිබුණත්, වනාන්තරය රැක ගැනීම සඳහා රාජ්‍ය මැදිහත් වීම අඩු බව එයට මානව ක්‍රියා මගින් එල්ල වන බලපෑම වැඩි වීම කෙරෙහි බලපා තිබේ. එබැවින් වනාන්තරයට මානව ක්‍රියා හේතුවෙන් සිදු වන බලපෑම අවම කිරීම සඳහා මනා කළමනාකරණයකින් යුතු ක්‍රියාමාර්ග අනුගමනය කිරීමේ අවශ්‍යතාව පවතී. ඒ අතර මානව භාවිතයන් සඳහා වනාන්තරය වටා පර්යන්ත කලාපයක් සකස් කිරීම, ගම්වාසීන් දැනුවත් කිරීම, නීතිමය හා ආයතනිකමය ක්‍රියාමාර්ග කාර්යක්ෂම ව සිදු කිරීම හා වනාන්තරය ආශ්‍රිත පර්යේෂණ කටයුතු දියුණු කිරීම වැනි ක්‍රියාමාර්ග වැදගත් වේ.

## පරිශීලිත මූලාශ්‍රය


මනෝ ප්‍රනාන්දු, (2013), කළුතර (ගවේෂණාත්මක කෘතියකි), කළුතර, තේජානි මුද්‍රණාලය.

මධ්‍යම පරිසර අධිකාරිය (1996), තෙත් බිම් ස්ථානිය වාර්තා, පළමු වෙළුම, ශ්‍රී ලංකාව, මධ්‍යම පරිසර අධිකාරිය.

කොතලාවල. ඒ. බී. (2002), මිනිසා සහ පරිසරය, වැල්ලම්පිටිය, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය.

රණසිංහ, පුෂ්පකුමාර (2006), නිරිතදිග වැසි වනාන්තර, රාජගිරිය, මිහිර පොත් ප්‍රකාශකයෝ.

සුරතිස්ස. ඩී. ඇම්. (2011), මිනිසා සහ පරිසරය, කොළඹ 10, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, (2011), බුලත්සිංහල, සම්පත් පැතිකඩ.

CEA, (1994), Walauwawathta waturana swamp forest, wetland site report, Colombo, Print shop.

CEA, (1994), Walauwawathta waturana swamp forest, Summary of wetland site report, wetland conservation project, central, Colombo, environment authority.

CEA, (1992), An Environmental Profile of the Kaluthara District Central Environment Authority, Colombo, MEAP.

IUCN, (2007), wetland directory, International union for conservation of Nature ) Natural Resources, Colombo, Country Office.

Wijesinghe. A.S., (1988), The unique swamp forest of Bulathsinhala is Still alive, Loris.

Gupta. A., (2005) The physical Geography of South East Asia, oxfird, U.K, Oxford university press.




© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
එකොළොස්වන කලාපය 2020 දෙසැම්බර්
පිටු 40-53
ISSN 1800-1459 eISSN 2386-2041
© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ අවකාශීය වෙනස කෙරෙහි බලපානු ලබන සාධක සහ සංරක්ෂණ අවශ්‍යතාව: ඉහළ කළු ගඟ ජල පෝෂක ප්‍රදේශයේ බලවනාව ඔය ආශ්‍රිත ව කරන ලද අධ්‍යයනය

(Factors Affecting to the Spatial Variation of Freshwater Fish Diversity and Conservation Requirement: A Case Study of Balawanawa Oya in Kalu Ganga Upper Watershed)

ජේ. පී. සී. ආර්. බී. නවරත්න* සහ එම්. එස්. එම්. එල්. කරුණාරත්න

භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යාපීඨය, රුහුණ විශ්වවිද්‍යාලය
*chapabandara143@gmail.com

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ ඉහළ ජන සංකේන්ද්‍රනය නිසා එම ප්‍රදේශයේ මිරිදිය මත්ස්‍ය සම්පත තර්ජනයට ලක්ව ඇත. මෙම ප්‍රදේශය විශාල වශයෙන් මිරිදිය මත්ස්‍ය සම්පත් පිහිටා තිබෙන කලාපයකි. මෙම ගවේෂණයේ දි අවධානය යොමු කරනු ලබන්නේ ඉහළ කළු ගඟ ජල පෝෂක ප්‍රදේශයේ බලවනාව ඔය ආශ්‍රිත මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ අවකාශීය ව්‍යාප්තිය සහ සංරක්ෂණ අවශ්‍යතාව පිළිබඳ ව යි. මෙම ගවේෂණයේ ප්‍රධානතම අරමුණ වනුයේ අවකාශීය වශයෙන් මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ සිදුවන වෙනස්කම් හඳුනා ගැනීම හා ඔවුන් ආරක්ෂා කරගැනීම සඳහා සංරක්ෂණයේ ඇති වැදගත්කම හඳුනාගැනීම යි. ස්වභාවික සම්පත් තිරසාරාත්මක ව භාවිතයට ගැනීම සංරක්ෂණය ලෙස හඳුනාගත හැකි වේ. එහෙයින්, සංවේදී හා පරික්ෂාකාරී මිරිදිය මත්ස්‍ය සම්පත් උපයෝජනය, මිරිදිය මත්ස්‍ය උපයෝජනය ලෙස හඳුනාගැනේ. මෙම අතු ගංගාවේ මිරිදිය මසුන් බහුවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට හා අවදානමට ලක් ව තිබේ. ඒ අතර ජල සම්පාදනය, ගෘහ අපද්‍රව්‍ය, මාර්ග හා ගොඩනැගිලි සංවර්ධන කටයුතු, කෘෂි අපද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය භාවිතය අන්තර්ගත වේ. භෞතික සාධක වශයෙන් ගත් කල උන්නතාංශය හා ආනතිය, ගං පත්ලේ ස්වභාවය, ලැබෙන හිරු කිරණ ප්‍රමාණය, වන ආවරණය සහ ගංගාවේ ගැඹුර මෙන් ම විශාලත්වය ද බලවනාව ඔයෙහි මත්ස්‍ය විවිධත්වයේ අවකාශීය වෙනසට බලපා ඇත. ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ පර්යේෂණ නියමුව, සහ අවිධිමත් සම්මුඛ සාකච්ඡා යන ආදි සමාජීය විද්‍යා ක්‍රමවේද යටතේ දත්ත රැස්කොට ඇත. මෙම අධ්‍යයනයේ දි මත්ස්‍යන් හා සම්බන්ධ තොරතුරු කිමිදීම සහ ඉවුරු ආශ්‍රිත ගණනය කිරීම් යන ස්වාභාවික විද්‍යා ක්‍රමවේද යටතේ දත්ත රැස්කොට ඇත. මානව සාධක සහ භෞතික සාධකයන් මත්සයන් හා පවත්නා සහසම්බන්ධතාව ගණනය කිරීමට SPSS මෘදුකාංගය මෙහි දී යොදාගෙන තිබේ. අධ්‍යයන ප්‍රදේශයේ මත්ස්‍ය වාසස්ථාන ව්‍යාප්තියට බලපාන හේතු හා මානව බලපෑමෙන් මත්ස්‍යන්ට සිදුවන හානිය අවම කිරීමට ගතහැකි විසඳුම් යෝජනා කිරීම මෙම පර්යේෂණයේ අනෙකුත් විශේෂිත අරමුණු ලෙස දැක්විය හැකි ය.

කේන්ද්‍රීය වචන:අවකාශීය ව්‍යාප්තිය, බලවනාව ඔය, මානුෂ ක්‍රියාකාරකම්, මිරිදිය මත්ස්‍යන්, සංරක්ෂණ ජෛව විවිධත්වය

Freshwater fish species in wet zone area in Sri Lanka are highly threatened due to high human population. Most of the endemic freshwater fish species habitat sites are located in this area. This research focuses on the spatial variations of freshwater fish diversity and conservation requirements of Balawanawa Oya in Kalu Ganga Upper Watershed. The main objective of this research is to identify the freshwater fish diversity changes. According to the spatial scale, conservation is essential to protect them. Sustainable usage of natural resources could be recognized as conservation. Therefore, the conservation of freshwater fish species could be identified as a sensible and careful use of the freshwater fish resource. Fishes in this tributary were impacted and threatened by multiple activities such as irrigation, domestic waste, waste from tea factories, constructions of roads and bridges, sedimentation from agriculture, some fertilizers and herbicides. Physical factors such as elevation, nature of the river bed, concentration of sunlight, forest cover and depth were affected in the spatial variation of freshwater fish species in Balawanawa Oya. Field observation, interview guide and informal interviews were used to collect information in line with the methods of the social sciences. Under this study snorkelling and bankside counts for collecting fish related information was used. Correlations between physical and anthropogenic factors with freshwater fishes were calculated using SPSS software. This research achieved its objectives to identify the habitat distribution factors and effects of freshwater fish species and further proposes solutions to minimize the human impacts on freshwater fish species in the study area.

Key words: Anthropogenic activities, Balawanawa Oya, Conservation Biodiversity, Freshwater fish, Spatial variation

## හැඳින්වීම

ලොව තාක්ෂණික දියුණුවත්, ජන සංඛ්‍යාවේ ඉහළ යාමත් සමග වර්තමානයේ පාරිසරික හානි පිළිබඳ ව මිනිසාගේ අවධානය යොමු වීමට හේතු වී ඇත. එහෙයින්, ජෛව විවිධත්වය වටහා ගැනීම සහ ජෛව විවිධත්ව සංරක්ෂණය වැදගත් වේ. ජෛව විවිධත්වය යනුවෙන් හැඳින්වෙන්නේ ජානමය වශයෙන්, විශේෂ වශයෙන් හා පරිසර පද්ධතිමය වශයෙන් පවත්නා විවිධත්වය යි. විද්‍යාත්මක වර්ග කිරීම් යටතේ මත්ස්‍යයන් අයත් වනුයේ Animalia රාජධානියට වන අතර මොවුන් Cambrian යුගයේ දි පහළ වූ බව වාර්තා වේ. මත්ස්‍යන්හට ජලයෙහි දි ශ්වසනය සඳහා කරමල් ද පිහිනීම සඳහා වරල් ද පිහිටා තිබේ. මත්ස්‍යන් සුවිශේෂ ශරීරාකාරවලින් යුක්ත වේ. ජීවීන් තම ජීවිතයේ කුමන හෝ අවධියක දි හෝ මුලු ජීවිත කාලය ම මිරිදියෙහි වාසය කරයි නම් ඔවුන් මිරිදිය මසුන් වශයෙන් හඳුන්වනු ලැබේ. 2005 වර්ෂයේ දි නිවර්තන කලාපයේ මිරිදිය මත්ස්‍ය විශේෂ 28,900ක් ලැයිස්තු ගතකොට තිබේ. මෙම කලාපයේ විශාල වශයෙන් මිරිදිය මත්ස්‍ය විශේෂ හා ගණ ව්‍යාප්තියක් හඳුනාගත හැකි වේ. මෙයට අනුව නිවර්තන අප්‍රිකා කලාපයේ 2,938ක්, විශේෂ පූර්ව ආර්ක්ටික් ප්‍රදේශයේ 1,844ක්, ප්‍රාචීන ප්‍රදේශයේ 2345ක්, ආසන්න ආර්ක්ටික් කලාපයේ 1,411ක් සහ විශේෂ ඔස්ට්‍රේලියානු කලාපයේ 261ක් මිරිදිය මත්ස්‍ය විශේෂ ලේඛන ගතකොට ඇත. ආසන්න වශයෙන් ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය විශේෂ 137ක් හඳුනාගන්නා ලදි. වසර දහස් ගණනකට පෙර ශ්‍රී ලංකාව ඉන්දියා උප මහද්වීපයෙන් වෙන් වීමත්, දේශගුණයේ පවතින ස්වාභාවික විවිධත්වයත්, භෞතික භූ දර්ශනයත් ශ්‍රී ලංකාවේ ආවේණික මිරිදිය මසුන් සහ උප විශේෂ ඇති වීමට හේතු විය (Silva et al, 2015). ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය ව්‍යාප්තිය එහි ප්‍රධාන දේශගුණික කලාප මත පදනම් වේ. වර්ෂාවේ ව්‍යාප්තියට අනුව ප්‍රධාන වශයෙන් දේශගුණික කලාප තුනකට බෙදා හඳුනාගත හැකි වේ. එනම්, වියළි කලාපය (වාර්ෂික වර්ෂාපතනය 1900 mm), තෙත් කලාපය (වාර්ෂික වර්ෂාපතනය 1900-2500 mm) , අතරමැදි කලාපය වශයෙනි (Gunathilaka, 2008). ශ්‍රී ලංකාවේ බොහෝමයක් ඒකදේශීය මිරිදිය මත්ස්‍ය විශේෂ කඳුකර වනාන්තර ආශ්‍රිත ගංගාවලින් හඳුනාගත හැකි වේ (Silva,et al, 2015).

බලවනාව ඔය සමනළ රක්ෂිතයේ ඊසානදිග මායිමෙන් ආරම්භ වී 5 km පමණ ගිණිකොණ දෙසට ගලා ගොස් කළු ගඟ සමග සම්බන්ධ වේ. එය මිරිදිය මත්ස්‍ය කොලනියක් ලෙසට හඳුනාගතහැකි වේ. විශේෂයෙන් ම බුලත්හපයා (Pethia nigrofascita) මඩකනයා (Channa marulius) දණ්ඩියා (Rasbora daniconius) ආදී බලපෑමට ලක් ඒකදේශීය මිරිදිය මත්ස්‍ය විශේෂ ද බලවනාව ඔයෙහි හඳුනාගත හැකි ය. මෙම අතු ගංගාව සංවේදී පාරිසරික කලාපයක් ලෙස නම්කළ හැකි ය. මෙම අතු ගංගාව අධික වශයෙන් මානව බලපෑමට ලක් ව තිබේ.

විශාල සංචාරක පිරිසක් ශ්‍රී පලාබද්දල මාර්ගය ශ්‍රී පාද වන්දනාව සඳහා යොදා ගන්නා අතර මෙම අතු ගංගාවේ ජලය විවිධ වූ ක්‍රියාකාරකම් නිසා බලපෑමට හා තර්ජනයට ලක් ව තිබේ. ඒ අතර කෘෂිකාර්මික කටයුතු ආශ්‍රිත අපද්‍රව්‍යය, තේ කර්මාන්තශාලා ආශ්‍රිත අපද්‍රව්‍ය මෙන් ම ජල සම්පාදන ක්‍රමවේද අන්තර්ගත වේ. එහෙයින් මෙම පර්යේෂණයේ දි අවධානය යොමු කරනුයේ සමනළ රක්ෂිතයේ මායිමේ සිට කළු ගඟ දක්වා වූ බලවනාව ඔයෙහි වූ මිරිදිය මත්ස්‍ය විවිධත්වය අතර පවත්නා සබඳතාව ගවේෂණය කිරීම මෙන් ම මිරිදිය මසුන් සංරක්ෂණය කිරීම සඳහා ඇති අවශ්‍යතාව හඳුනාගැනීම සඳහා ය.

**මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ අවකාශීය වෙනස සහ සංරක්ෂණ අවශ්‍යතාව - ශ්‍රී ලංකාවේ අත්දැකීම්:**

Pethiyagoda (1991) විසින් ෆ්රෙශ් වොටර් ෆිශස් ඔෆ් ශ්‍රී ලංකා (Freshwater Fishes of Sri Lanka) වශයෙන් පර්යේෂණයක් සිදුකරන ලදි. මෙම අධ්‍යයනයේදි ශ්‍රී ලංකාවේ ගංගා ආශ්‍රිත ව සහ මිරිදිය ජලතල ආශ්‍රිත ව ඔහු විසින් සොයාගන්නා ලද මත්ස්‍ය සමූහයන් පිළිබඳ ව විස්තරකොට තිබේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා 103 මෙන් ම කිවුල් දිය සහ කරදිය ජලතල ආශ්‍රිත මත්ස්‍ය විශේෂ පිළිබඳ ව මෙහි දී අවධානය යොමුකොට තිබේ.

## සාහිත්‍ය විමර්ශනය

ගෝලීය හා ශ්‍රී ලාංකික ජල විද්‍යාත්මක තොරතුරු මූලාශ්‍රය මත පදනම් ව මිරිදිය මසුන්ගේ අවකාශීය විවිධත්වය හා සංරක්ෂණ අවශ්‍යතාවන් මොනවා ද යන්න හඳුනා ගැනීමේ හැකියාව පවතී. එහෙයින් මිරිදිය මත්ස්‍ය විවිධත්වය ආශ්‍රිත ව ලියවුණු සාහිත්‍ය මූලාශ්‍රය මෙහිලා වැදගත් ස්ථානයක් හිමිකරගනී.

**සංරක්ෂණය හා ජෛව විවිධත්වය:**

World Wildlife Fund (2007) මගින් ක්ෂේත්‍ර සංරක්ෂණ වෘත්තිකයන් සඳහා විශාල සංරක්ෂණ වැඩසටහන් කළමනාකරණ තාක්ෂණය උදෙසා ක්ෂේත්‍ර නියමුවක් සපයා ඇත. එමගින් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ සංරක්ෂණ වැඩසටහන් සඳහා මාර්ගෝපදේශ මෙන් ම උපාංග ද සපයා දි තිබේ. Malcomet al. (2016) විසින් බයෝ ඩයිවර්සිටි ඇන්ඩ් ඉට්ස් ඉම්පෝර්ටන්ස් (Biodiversity and its Importance) වශයෙන් ගවේෂණය කරන ලදි. මෙහි දි පර්යේෂණය කරනු ලැබූයේ ලොව පරිහානියට හේතු වන බලවේග පිළිබඳව යි. ඒ අනුව මෙමගින් ලොව ආරක්ෂා කරනුයේ කෙසේ ද එය දියුණු, විචිත්‍රවත් ලොවක් කරා ගෙනයන්නේ කෙසේ ද යන්න පෙන්වා දි තිබේ.

**මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ අවකාශීය වෙනස සහ සංරක්ෂණ අවශ්‍යතාව - ගෝලීය අත්දැකීම් :**

Wallus & Simon (2006) විසින් රිප්‍රඩක්ටිව් බයෝලොජි ඇන්ඩ් අර්ලි ලයිෆ් හිස්ට්‍රි ඔෆ් ෆිශ් ඉන් ඔහියෝ රිවර් ඩ්‍රනේජ් (Reproductive Biology and Early Life History of Fish in the Ohio River Drainage) වශයෙන් පර්යේෂණයක් සිදුකර තිබේ. මොවුන් මෙහි දි මුල් යුගයට අයත් මිරිදිය මසුන් 285ක විවිධත්වය වර්ගීකරණය, සංකේතාත්මක සහ සංජනනාත්මක උපමාන ආධාර කර ගනිමින් හඳුනාගත් අතර විචක්ෂණ බුද්ධිය අවධි කිරීමෙන්


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය




අ)



ආ)

**රූපසටහන් අංක 1:** අ) බලවනාව ඔයෙහි සයවන නියැදි ස්ථානය; ආ) බලවනාව ඔයෙහි 12වන නියැදි ස්ථානය

මූලාශ්‍රය - නවරත්න, 2020




**සිතියම් අංකය 1:** අධ්‍යයන ප්‍රදේශයේ සිතියම

මූලාශ්‍රය - ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව, 2016



© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වගුව 1: වායුගෝලයේ ඔක්සිජන් වායුව ආශ්වාස කරනු ලබන මත්ස්‍ය විශේෂ

| විශේෂ | ශ්වසන ඉන්ද්‍රීන් | ව්‍යාප්තිය |
|---|---|---|
| Misgurnus | අන්ත්‍රය | උෂ්ණ. සහ නිවර්තන ආසියාව සහ යුරෝපය |
| Clarias | අපිජලක්ලෝමික ඉන්ද්‍රිය | නිවර්තන ආසියාව සහ අප්‍රිකාව |
| Heteropneustes | අපිජලක්ලෝමික ඉන්ද්‍රිය | නිවර්තන ආසියාව |
| Monopterus | අපිජලක්ලෝමික ඉන්ද්‍රිය | නිවර්තන ආසියාව |
| Amphipnous | අපිජලක්ලෝමික ඉන්ද්‍රිය | නිවර්තන ආසියාව |
| Anguilla | සම | යුරෝපය, ආසියාව සහ උතුරු ඇමරිකාව |
| Ophicephalus | අපිජලක්ලෝමික ඉන්ද්‍රිය | නිවර්තන ආසියාව |
| Anabas | අපිජලක්ලෝමික ඉන්ද්‍රිය | නිවර්තන ආසියාව |
| Osphronemus | අපිජලක්ලෝමික ඉන්ද්‍රිය | නිවර්තන ආසියාව |
| Betta | අපිජලක්ලෝමික ඉන්ද්‍රිය | නිවර්තන ආසියාව |
| Periophthalmus | සම | අප්‍රිකාව, ආසියාව සහ ඔස්ට්‍රේලියාව |

මූලාශ්‍රය - Nikolsky, 2008

මත්ස්‍ය බීජ සහ කීටයන් හඳුනාගන්නා ලදි.

මත්ස්‍යයන්ගේ ජීවන ඉතිහාස රටාවන් අතරවන ජීවීන්ගේ සුවිශේෂ වූ වර්ධනය, මර්ථතාව සහ ප්‍රජනන හැකියාව ආදිය ඔවුන් ජීවත්වන පරිසරයෙහි තෝරාගත් බලවේගවල සංකීර්ණ පෙළගැස්මත්, එම ජීවීන් මත අරුඪ වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ගේ පරිණාමය සිදුවූ බවට හඳුනාගනි (Breder and Rose, 1966; Wootton, 1998; King, 2007).

සූරාකෑමට ලක් වූ මත්ස්‍ය පරම්පරා සඳහා විවිධ ආනුභාවික සම්බන්ධතා සංවර්ධනය කොට ඇති අතර පරම්පරා තක්සේරු කිරීම සඳහා වැදගත් ගහන පරාමිතීන් පරිච්ඡේදනය කිරීම සිදු කෙරේ (Taylor, 1958; Jensen, 1996; Hart and Russ, 1996; Ault et al., 1998; Jennings et al., 2008).

**මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ අවකාශිය වෙනස සහ සංරක්ෂණ අවශ්‍යතාව - ආසියානු කලාපයේ අත්දැකීම්:**
Srivastava (2008) විසින් ෆිශ් බයෝලොජි (Fish Biology) ලෙස පර්යේෂණයක් කරන ලදි. මෙම ග්‍රන්ථයට අනුව මත්ස්‍ය විද්‍යාඥයන් විසින් තම මනස මූලික මත්ස්‍ය සංවිධානය, සැකැස්ම සහ ක්‍රියාවලීන් ඉතා හොඳින් සියලු ම අවස්ථාවනිහිදි පවත්වා ගතයුතු අතර ඒ සඳහා විශාල විවිධත්වයෙන් යුතු මත්ස්‍ය රූප විද්‍යාව, භෞතික විද්‍යාව සහ චර්යාවන් මෙන් ම අනෙකුත් දෑ තේරුම් ගත යුතු බව පෙන්වා දිය හැකි ය. නිවර්තන මත්ස්‍ය ප්‍රජාවන්ගේ ජීවන ඉතිහාස රටාවන් රූප විද්‍යාත්මක ව සහ පාරිසරික අංග අනුව පුළුල් ව හඳුනාගත හැකි ය (Kortmulder, 1987; Welcomme, 2001). විවිධ ජීවීන් විශෙෂයන්හි ගහනවල ජීවන ඉතිහාස රටාවන් ඔවුන් ජීවත්වන විවිධ අක්ෂාංශගත ප්‍රදේශ අනුව වෙනස් වේ (Jonsson and L'Abee Lund, 1993; Baker, 1994; Baker et al., 2015). Silva & Anderson (1995) විසින් ෆිෂ් නියුට්‍රිෂන් රිසර්ච් ඉන් ඇක්වාකල්චර් (Fish Nutrition Research in Aquaculture) වශයෙන් පර්යේෂණයක් කරන ලදි. මෙහි දී ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මත්ස්‍යයන්ට සහ මිරිදිය මත්ස්‍ය වගාවට බලපානු ලබන ගැටලු සාකච්ඡා කරන ලදි.

Nikolsky (2008) විසින් දි ඉකෝලොජි ඔෆ් ෆිෂස් (The Ecology of Fishes) නමින් පර්යේෂණයක් සිදුකොට තිබේ. එය මත්ස්‍ය ජීව විද්‍යාව පිළිබඳ විස්තරාත්මක රචනාවක් ලෙස ඉදිරිපත්කොට ඇත. මෙහි වායු ගෝලයේ ඔක්සිජන් ආශ්වාස කරනු ලබන මත්ස්‍යන් ද වගුගතකොට තිබේ. මේ සඳහා නිවර්තන ආසියාවේ මෙන් ම ලොව අනෙකුත් රටවලට අයත් විවිධ වර්ගයේ මත්ස්‍ය විශේෂ අධ්‍යයනය කොට තිබේ.

Munro (1982) විසින් මෙරීන් ඇන්ඩ් ෆ්‍රෙශ්වෝටර් ෆිශස් ඔෆ් සිලෝන් (Marine and Freshwater Fishes of Ceylon) වශයෙන් අධ්‍යයනයක් සිදුකර තිබේ. Lepidocephalicthys jonklaasi ඒකදේශීය මිරිදිය මත්ස්‍ය විශේෂ වර්තාවන එක ම ස්ථානය ලෙසට වලව්වත්ත වතුරාන වගුරුබිම හඳුනාගත හැකි වේ (මධ්‍යම පරිසර අධිකාරිය, 1999). පරිසර තත්ත්වයන් සහ මත්ස්‍යන්ගේ ජීවන ඉතිහාස රටාවන් අතර සබඳතාවක් පවතී (Southwood, 1988; Roff, 1992; Stearns, 1996; Charnov, 1993). බොහෝමයක් නිවර්තන ගංගා ආශ්‍රිත මත්ස්‍ය ප්‍රජාවන් ස්වාභාවික සහ මානව සාධක හේතුවෙන් බලපෑමට ලක්ව තිබේ (Dudgeon, 2003). බොහෝ නිවර්තන කලාපීය රටවල මිරිදිය මත්ස්‍ය සංරක්ෂණය සඳහා ක්‍රමවේද අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාව වැනි රටවල වැඩි වශයෙන් ගංගා ආශ්‍රිත ඒකදේශීය මිරිදිය මසුන්ගේ ජීවන ප්‍රදේශ අහිමි වීම සහ විසිතුරු මත්ස්‍ය වෙළඳාම සඳහා සූරාකෑම හේතුවෙන් තර්ජනයට ලක්ව තිබේ (Amarasinghe et al., 2006; MOE, 2012). Silvaet al. (2015) විසින් ශ්‍රී ලංකන් ෆ්‍රෙශ්වෝටර් ෆිශ් ස්පීශීස් (Sri Lankan Freshwater Fish Species) වශයෙන් අධ්‍යයනයක් සිදුකරන ලදි. මෙහිදි ශ්‍රී ලංකාවේ ඒකදේශීය මිරිදිය මත්ස්‍ය විශේෂ 90ක් විස්තරකොට තිබේ. වසර අටක දීර්ඝ අධ්‍යයනයෙන් පසු ව මොවුන් විසින් නව විශේෂ සතරක් සොයාගන්නා ලදි. වසර දහස් ගණනකට පෙර ශ්‍රී ලංකාව ඉන්දියා උප මහද්වීපයෙන් වෙන් වීමත්,

 © 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වගුව 2: ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප සහ ගංගා ආශ්‍රිත මිරිදිය මත්ස්‍ය විශේෂයන්ගේ උන්නතාංශය ආශ්‍රිත ව්‍යාප්තිය

| | තෙත් කලාපය | වියළි කලාපය | කැළණි ගඟ | කළු ගඟ | ගිං ගඟ | නිල්වලා ගඟ | මහවැලි ගඟ |
|---|---|---|---|---|---|---|---|
| එකතුව spp. | 63 | 37 | 52 | 49 | 49 | 47 | 43 |
| ඒකදේශීය spp. | 29 | 3 | 19 | 18 | 18 | 17 | 9 |
| එකතුව (0-100 m) | 47 | 37 | 45 | 43 | 43 | 40 | 39 |
| ඒකදේශීය (0-100 m) | 14 | 3 | 12 | 12 | 12 | 10 | 5 |
| එකතුව (100-600 m) | 47 | 21 | 37 | 36 | 36 | 35 | 27 |
| ඒකදේශීය (100-600 m) | 27 | 3 | 18 | 17 | 17 | 17 | 9 |
| එකතුව (600-1000 m) | 7 | - | 7 | 7 | 7 | 7 | 7 |
| ඒකදේශීය (600-1000m) | 5 | - | 5 | 5 | 5 | 5 | 5 |
| එකතුව (>1000 m) | 3 | - | 3 | 3 | 3 | 3 | 3 |
| ඒකදේශීය (1000 m >) | 3 | - | 3 | 3 | 3 | 3 | 3 |

මූලාශ්‍රය - පෙතියගොඩ, 1991


දේශගුණයේ පවතින ස්වාභාවික විවිධත්වයත්, භෞතික භූ දර්ශනයත් ශ්‍රී ලංකාවේ ආවේණික මිරිදිය මසුන් සහ උප විශේෂ ඇති වීමට හේතු විය (Silva et al., 2015). බොහෝමයක් ගණ සීමා වූ පරාසයක් තුළ ව්‍යාප්ත වීමත්, ඉහළ ඒකදේශීය විශේෂ සංඛ්‍යාවක් වාසය කිරීමත් කඳුකර තෙත් කලාපයේ ගංගා ආශ්‍රිත ව හඳුනාගතහැකි අතර සුවිශේෂ හඳුනාගත් කලාප සහ පරිසර විද්‍යාත්මක අනුවර්තන ද හඳුනාගනු ලැබ ඇත. ශ්‍රී ලංකාවේ විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සඳහා වනාන්තර ආශ්‍රිත අපනයනය උදෙසා 63,000ක් මත්ස්‍යන් අල්ලාගත් අතර එයින් 63%ක් ඒකදේශීය මිරිදිය මත්ස්‍ය විශේෂ විය (Fernando et al., 2013).

Ajanthaet al. (2007) විසින් බයෝ ඩයිවර්සිටි බේස්ලයින් සර්වේ ඔන් වස්ගමුව නැශනල් පාර්ක් (Biodiversity Baseline Survey on Wasgamuwa National Park) නමින් පදනම් සමීක්ෂණයක් සිදුකරන ලදි. ගණ 26ට අයත් කුල 15කට අයත් මත්ස්‍ය විශේෂ 40ක් වස්ගමුව ජාතික වන උද්‍යානයෙන් වාර්තා විය. වස්ගමුව ජාතික වන උද්‍යානය තුළ ශ්‍රී ලංකාවේ ඉතා වැදගත් ආදිවාසි මිරිදිය මත්ස්‍ය සමූහ 82න් 34ක් ම අන්තර්ගත වේ. ශ්‍රී ලංකාවේ සියලු ම ඒකදේශීය මිරිදිය මත්ස්‍ය විශේෂ 44 අතුරින් අටක් එනම්, 18%ක් මෙහි වාර්තා වේ. මෙහි විශේෂ හතරක් Belontia signata, Clarias brachysoma, Esomus thermoicos, Garra ceylonensis, Puntius martensis ජාතික වශයෙන් තර්ජනයට ලක් ව ඇති අතර එක් විශේෂයක් Puntius martenstyni ජාතික වශයෙන් මෙන් ම ගෝලීය වශයෙන් ද විශාල තර්ජනයට ලක් ව ඇත (Ajantha et al., 2007). කළු සහ අඹන් ගංගාවන්හි Puntius martenstyni මිරිදිය මත්ස්‍ය විශේෂය පෙර දි උන්නතාංශ 150 - 500 m අතර කලාපයෙන් පමණක් වාර්තා වූ අතර මෙහි දි එම ගංගාවන්හි අනෙක් කලාපයන් ආශ්‍රිත ව ද වාර්තා විය (Pethiyagoda, 1991). ගෝලීය වශයෙන් තර්ජනයට ලක් වූ විශේෂයන්ගෙන් සමන්විත වස්ගමුව ජාතික වන උද්‍යානයේ මෙම ගංගාවන් දෙකෙහි සීමාවන් පුළුල් කිරීම වැදගත් සංරක්ෂණ ක්‍රමවේදයක් වශයෙන් ගැනේ. මෙහි දි එක් පසෙකින් කළු ගඟ සහ අඹන් ගඟ අතර මිරිදිය මත්ස්‍ය සමූහයන්ගේ වෙනස්කම් සහ අනෙක් පසින් මහවැලි ගඟ සහ ජලාශ අතර මිරිදිය මත්ස්‍ය සමූහයන්ගේ වෙනස්කම් ද ලකුණුකොට තිබේ. මහවැලි ගංගාවේ නැගෙනහිර සහ කළු ගංගාවේ බටහිර ප්‍රදේශ අතර ද මත්ස්‍ය විශේෂයන්ගේ විවිධත්වයක් හඳුනාගත හැකි වේ (Ajantha et al., 2007).

මැණික් පතල් සහ වැලි කැණීම, මසුන් ඇල්ලීම සඳහා පුපුරන ද්‍රව්‍යය සහ වස භාවිතය, ගංගා ඉවුරු දෙපස ශාකාවරණය ඉවත් කිරීම සහ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම යනාදි මානුෂ ක්‍රියාකාරකම් මෙම ජාතික වන උද්‍යානයේ කඳුවුරු කලාපය ආශ්‍රිත ව හඳුනාගත් ගැටලු වශයෙන් ලේඛන ගතකොට තිබේ. මෙම ක්‍රියා මිරිදිය මත්ස්‍යන් කෙරෙහි ගැටලු මතුකර තිබේ (Ajantha et al., 2007). ශ්‍රී ලංකාවේ මෙතෙක් අධ්‍යයනය කරන ලද වර්ධනය වීමේ ඌනතාවයෙන් යුතු මිරිදිය මත්ස්‍ය විශේෂ නීතිමය වශයෙන් සංරක්ෂණයට පියවර ගෙන තිබේ (Shirantha et al., 2018). ශ්‍රී ලංකාව මගින් විසිතුරු මත්ස්‍ය වෙළඳාම සඳහා වාර්ෂික ව අපනයනය කරන ලද සියලු ම මසුන් ශ්‍රී ලංකාවට ආවේණික මිරිදිය මත්ස්‍ය විශේෂ වේ (Fernando et al., 2013).

Gunathilaka (2007) විසින් ෆ්‍රෙශ්වෝටර් ෆිශ් ඔෆ් ශ්‍රී ලංකා (Freshwater Fish of Sri Lanka) වශයෙන් පර්යේෂණයක් සිදුකරන ලදි. මෙම පර්යේෂණයේ දි මත්ස්‍යන්ගේ රූප විද්‍යාත්මක චරිත ලක්ෂණ අධ්‍යයනය කර තිබේ. මෙම අධ්‍යයනය සඳහා ප්‍රධාන වශයෙන් ganoid දර්ශකය cycloid දර්ශකය සහ adenoid දර්ශකය යොදාගෙන තිබේ. මත්ස්‍යන්ගේ ආහාර රටා අධ්‍යයන මගින් ප්‍රධාන වශයෙන් ඔවුන් ඛණ්ඩ සතරකට එනම්, ශාක භක්ෂක, මාංශ භක්ෂක, සර්ව භක්ෂක සහ කැටකැබිලිති භක්ෂක වශයෙන් වර්ගකොට තිබේ. එනම්, Earyphagous, Stenophagous, Monophogous වශයෙනි (Gunathilaka, 2007). මෙම මසුන්ගේ ප්‍රජනනය අනුව ද ප්‍රධාන කොටස් තුනකට වර්ග කළ හැකි වේ. එනම්, ද්වි ලිංගික, ඒක ලිංගික සහ ඕපපාතික වශයෙනි. මෙම


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය




**සිතියම් අංක 2:** ශ්‍රී ලංකාවේ මත්ස්‍ය විද්‍යාත්මක කලාප

මූලාශ්‍රය - ගුණතිලක සහ තවත් අය, 2007

පර්යේෂණය මගින් ලංකාවේ මත්ස්‍ය විද්‍යාත්මක කලාප ද සිතියම් ගතකොට තිබේ. මෙමගින් ශ්‍රී ලංකාවේ නිරිතදිග ප්‍රදේශ සහ මහවැලි කලාපය ප්‍රධාන මත්ස්‍ය විද්‍යාත්මක කලාප වශයෙන් නම් කරන ලදි (Gunathilaka, 2007).

**මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ අවකාශීය වෙනස සහ සංරක්ෂණ අවශ්‍යතාව - සබරගමුව පළාතේ අත්දැකීම්:**

Sanjeewani et al. (2009) විසින් ශ්‍රී ලංකාවේ බෙලිහුල් ඔය, සබරගමුව විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ප්‍රිලිමිනරි ස්ටඩි ඔන් ඇවිෆවුනල් ඩයිවර්සිටි (Preliminary Study on Avifaunal Diversity) වශයෙන් අධ්‍යයනයක් කරන ලද අතර Ajanthaet al. (2007) විසින් බයෝඩයිවර්සිටි බේස්ලයින් සර්වේ ඔන් පීක් වයිල්ඩර්නස් සැන්ක්චුවරි (Biodiversity Baseline Survey on Peak Wilderness Sanctuary) වශයෙන් පදනම් සමීක්ෂණයක් කරන ලදි. මෙය සංරක්ෂිත ප්‍රදේශ කළමනාකරණය සහ වන සත්ත්ව සංරක්ෂණ ව්‍යාපෘති ආශ්‍රිත ව වෙන් වෙන් ව පවත්නා අන්තර්ගතයක් සහිත පර්යේෂණයකි.

Shiranthaet al. (2018) විසින් ලයිෆ් හිස්ට්‍රි පැටර්න්ස් ඔෆ් සම් සිලෙක්ටඩ් එන්ඩෙමික් ෆ්‍රෙශ්වෝටර් ෆිශ් ස්පීශීස් ඉන්හැබිටින් ටූ මේජර් රිවර් බේසින්ස් ඔෆ් ශ්‍රී ලංකා (Life History Patterns of Some Selected Endemic Freshwater Fish Species Inhabiting Two Major


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වගුව 3: නියැදීමේ මුලපත්‍රවලට අනුව ගංගා ආශ්‍රිත මිරිදිය මත්ස්‍ය විවිධත්ව දර්ශකය

| | ජලතල ඒකක | නැගෙනහිර ජලතලය | බටහිර ජලතලය |
|---|---|---|---|
| | විශේෂ සංඛ්‍යාවේ එකතුව | 2 | 11 |
| | ඒකදේශීය විශේෂ සංඛ්‍යාව | 2 | 7 |
| ජෛව විවිධත්ව දර්ශකය | විශේෂවල පොහොසත් භාවය | 2 | 11 |
| | Shannon-Weinner දර්ශකය H | 0.41 | 1.71 |
| | Shannon-Weinner සුලබතාවය J | 0.59 | 0.71 |
| | Simpson විවිධත්වය 1/D | 1.33 | 3.59 |
| | Alpha of log series | 0.16 | 1.48 |

මූලාශ්‍රය - අජන්ත සහ තවත් අය, 2007

River Basins of Sri Lanka) වශයෙන් අධ්‍යයනයක් සිදු කරන ලදි. කළු ගංගාවේ සහ කැලණි ගංගාවේ මත්ස්‍යන්ගේ ස්ථිර වර්ධනය එම ගංගාවන්හි අනුක්‍රමණය අතර ධනාත්මක සහසම්බන්ධතාවයක් පෙන්නුම් කරනු ලබයි (Shirantha et al., 2018). ජල විදුලි නිෂ්පාදනයට ගංගා හරස්කොට බැම් බැඳීම සහ උපරිම ලෙස සූරාකෑමට ලක්වීමත්, ජීවීන්ගේ ජීවන ඉතිහාස පරාමිතීන් අතර ආනුභූතික සබඳතාවක් පෙන්වන නිසා බලවත් සංරක්ෂණ ක්‍රමවේද හඳුන්වා දියයුතු වේ (Silva and Silva, 2015). ජීවන ප්‍රදේශ අහිමිවීම හේතුවෙන් ගංගා ආශ්‍රිත ඒකදේශීය මිරිදිය මසුන් විශාල සංඛ්‍යාවක් හායනයට ලක්ව ඇත (Amarasinghe et al., 2006). කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘති සඳහා ගංගා මෙන් ම අතු ගංගාවන්හි බැම් බැඳීම හේතුවෙන් බොහෝ ඒකදේශීය මිරිදිය මත්ස්‍ය විශේෂ බලපෑමට ලක්ව තිබේ (Silva and Silva, 2015).

## පර්යේෂණ ගැටලුව

සමනළ රක්ෂිතයේ ඊසානදිග මායිමේ සිට කළු ගඟ දක්වා වූ කිලෝ මීටර් පහක ප්‍රදේශයෙහි බලවනාව ඔය ආශ්‍රිත මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ අවකාශීය වෙනස කෙරෙහි බලපානු ලබන මානුෂ සාධක සහ භෞතික සාධක මොනවාද යන්න අධ්‍යයනය සහ අධ්‍යයන ප්‍රදේශයේ මිරිදිය මත්ස්‍ය සංරක්ෂණයට ගතහැකි ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම.

## පර්යේෂණ අරමුණු

- බලවනාව ඔයෙහි අවකාශීය වශයෙන් මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ සිදුවන වෙනස්කම් හඳුනාගැනීම සහ ඔවුන් ආරක්ෂා කරගැනීම සඳහා සංරක්ෂණයේ ඇති වැදගත්කම හඳුනාගැනීම.
- බලවනාව ඔයෙහි මත්ස්‍ය වාසස්ථාන ව්‍යාප්තියට බලපාන හේතු සහ මානව බලපෑමෙන් මත්ස්‍යන්ට සිදුවන හානිය අවම කිරීමට ගතහැකි විසඳුම් යෝජනා කිරීම.

## පර්යේෂණයේ වැදගත්කම

ලොව විශාල විශේෂ සංඛ්‍යාවක් හිමි වැඩි ම ජෛව විවිධත්වයක් සහිත පෘෂ්ඨවංශීන් ලෙස මත්ස්‍යන් හඳුනාගත හැකි වේ. මෙයින් 58%ක් කරදිය මත්ස්‍යන් ද 42%ක් මිරිදිය මත්ස්‍යන් ද වන අතර 1%ක් මිරිදිය සහ කරදිය යන දෙකෙහි සංචරන මත්ස්‍යන් වේ. ලොව මුළු ජල පරිමාණයෙන් 97.22%ක් කරදිය ජලය වන අතර 2.78%ක් පමණ මිරිදිය ජලය වේ. මේ හේතුවෙන් මිරිදිය මත්ස්‍ය විශේෂ ඉතා කුඩා කලාපයක් තුළට සීමාව ඇති බව හඳුනාගත හැකි වේ. විශේෂයෙන් ම මිරිදිය ජලතල ආශ්‍රිත කලාපයෙහි ඉහළ මානුෂ ක්‍රියාකාරකම්හි බලපෑම් මිරිදිය මත්ස්‍ය විශේෂ මත එල්ල ව තිබේ. මෙම බලවනාව ඔයෙහි වඳවීයාමේ තර්ජනයට ලක් මිරිදිය මත්ස්‍ය විශේෂයන් වන බුලත්හපයා Pethia nigrofascita), මඩකනයා Channa marulius), දණ්ඩියා (Rasbora daniconius) වාර්තාවන අතර, මෙම අධ්‍යයනය මගින් මෙම මත්ස්‍යන්ගේ ඉදිරි සංරක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය වැදගත් තොරතුරු සපයා ගතහැකි වේ. මිරිදිය මත්ස්‍ය විශේෂ විවිධත්වයේ අවකාශීය වෙනස පිළිබඳ ව සහ මිරිදිය මත්ස්‍ය සංරක්ෂණයේ අවශ්‍යතාව පිළිබඳ ව ලොව බොහෝ අධ්‍යයන සිදුකර ඇතත්, ශ්‍රී ලංකාව තුළ ඒ පිළිබඳ ව අධ්‍යයනයන් හමුවන්නේ ඉතා අල්ප වශයෙනි. විවිධ ජීවීන් විශේෂ පිළිබඳ ව ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් අධ්‍යයන සිදුකර ඇති අතර මිරිදිය මත්ස්‍ය විශේෂ විවිධත්වයේ අවකාශීය වෙනස සහ එහි සංරක්ෂණයේ අවශ්‍යතාව පිළිබඳ ව කරන ලද අධ්‍යයන් ඉතා අල්ප වශයෙන් වාර්තා වේ. සමනළ රක්ෂිතය ඇතුළත ඉතා කුඩා අතු ගංගා දෙකක් පාදක කරගනිමින් මිරිදිය මත්ස්‍ය විශේෂ විවිධත්වයේ අවකාශීය වෙනස පිළිබඳ ව පදනම් අධ්‍යයනයක් සිදුකොට ඇති අතර සමනළ රක්ෂිතයෙන් පිටත ගංගා ආශ්‍රිත ව මිරිදිය මත්ස්‍ය විශේෂ විවිධත්වයේ අවකාශීය වෙනස පිළිබඳ ව අධ්‍යයනයක් හමු නොවන නිසා මෙම අධ්‍යයනය අනෙක් පර්යේෂණවලට වඩා වෙනස් සහ වැදගත් වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ප්‍රමාණාත්මක ගුණාත්මක ක්‍රමවේද එනම්, මිශ්‍ර ක්‍රමවේදය යොදාගෙන තිබේ. මෙහි දී ගුණාත්මක දත්ත, සමාජීය විද්‍යා ක්‍රමවේදය යටතේ ග්‍රහණය කරගත් අතර ප්‍රමාණාත්මක දත්ත ග්‍රහණය කරගැනීම සඳහා ස්වාභාවික විද්‍යා ක්‍රමවේදය යොදාගෙන තිබේ. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදය ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. එනම්, දත්ත රැස් කිරීම, දත්ත විශ්ලේෂණය, දත්ත සහ තොරතුරු ඉදිරිපත් කිරීම වශයෙනි.


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මේ සඳහා ප්‍රාථමික සහ ද්විතීයික දත්ත අදාළ ව පවතී. ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ පර්යේෂණ නියමුව මෙන් ම අවිධිමත් සම්මුඛ සාකච්ඡා බලවනාව ඔයෙහි මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ අවකාශීය වෙනස හඳුනා ගැනීමට භාවිත කළ ප්‍රාථමික දත්ත ලෙස සැලකේ. පූර්ව අධ්‍යයනය, ආයතනික තොරතුරු, පුවත්පත් ලිපි, අන්තර්ජාලය සහ නිවැරදි ව අර්ථ නිරූපණය කරන ලද ස්වාධීන පර්යේෂණ යන ආදිය ද්විතීයික දත්ත මූලාශ්‍රය වශයෙන් මෙහි දී භාවිත කරන ලදි.

**ප්‍රාථමික දත්ත**

- සමාජීය විද්‍යා ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දි සමනළ රක්ෂිත මායිමේ සිට කළු ගංගාව දක්වා වූ බලවනාව ගංගාව දෙපස වගා බිම්, මාර්ග, කර්මාන්තශාලා, ජනාවාස මෙන් ම හුදෙකලා ප්‍රදේශ නියැදි ස්ථාන වශයෙන් තෝරා ගන්නා ලදි.

- සම්මුඛ පර්යේෂණ නියමුව

මෙම පර්යේෂණයේ දී තොරතුරු ග්‍රහණය කරගැනීම සඳහා සසම්භාවී නියැදි ක්‍රමවේදය භාවිත කොට තිබේ. මෙම අධ්‍යයනය සඳහා බලවනාව ඔය දෙපස වගා භූමි හිමියන් 30 දෙනෙකු තෝරාගන්නා ලදි. මෙම සම්මුඛ පර්යේෂණ නියමුව සඳහා ඉඩම් හිමියන්ගේ පෞද්ගලික තොරතුරු ආශ්‍රිත ප්‍රශ්නයන්ට අමතර ව විස්තරාත්මක ප්‍රශ්න 15ක් අන්තර්ගත වේ. ප්‍රධානතම දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය ලෙසට ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය මෙහිලා සලකනු ලැබේ. භූමි පරිභෝගය අධ්‍යයනය කිරීම සඳහා 1:50000 භූ ලක්ෂණ සිතියම් පරිශීලනය කොට තිබේ. මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ ව්‍යාප්තිය අධ්‍යයනය සඳහා නිරීක්ෂණ ලක්ෂ්‍ය සිතියමක් ද නිර්මාණය කොට තිබේ.

- සම්මුඛ සාකච්ඡා

මෙහි ප්‍රධානතම සාකච්ඡා වශයෙන් ගොවි මහතුන්, තරුණ පිරිස්, ආයතනික නිලධාරීන්, බුද්ධිමතුන් සහ ජනතා නායකයින් අතර පැවති සාකච්ඡා වැදගත් වේ. මෙහි දී පර්යේෂණ ක්‍රමවේදය යනු මිරිදිය මසුන්ගේ අවකාශීය වෙනසට හේතුවන මානුෂ සාධක සහ භෞතික සාධක අධ්‍යයනයට යොදාගනු ලබන තාක්ෂණය වේ. මෙම අධ්‍යයනයේ දි ඉතා වැදගත් තොරතුරු රාශියක් 162 C සිරිපාගම ග්‍රාම නිලධාරී මහත්මියගෙන් ලබාගත් අතර උතුරු ගිලීමලේ ප්‍රදේශයේ වනජීවී නිලධාරීන් විසින් මෙම ප්‍රදේශයේ ශාක සහ සත්ත්ව විශේෂ ආශ්‍රිත තොරතුරු සපයන ලදී.

- ස්වාභාවික විද්‍යා ක්‍රමවේදය

මානුෂ සහ භෞතිකයන්හි බලපෑම් ආශ්‍රිත වැඩිදුර අධ්‍යයනය සඳහා දියයට මත්ස්‍ය ගවේෂණය සිදුකළ අතර ඒ උදෙසා ජලයේ ගැඹුර මත පදනම් වු දියයට කිමිදීමේ ක්‍රමවේදය යොදාගන්නා ලදි. නොගැඹුරු මෙන් ම ඉතා සෙමින් ගලායන ජලතලයන්හි ඉතා කුඩා මත්ස්‍යන් අධ්‍යයනය සඳහා මෙහි දී බිලී කොකු සහ අතංගු භාවිත කෙරුණු අතර ඉවුරු දෙපස අධ්‍යයනය ද මත්ස්‍යන් ආශ්‍රිත තොරතුරු ග්‍රහණය කිරීමෙහි ලා උපකාරී වේ.

**ද්විතීයික දත්ත**

- සිතියම් අධ්‍යයනය සහ මිරිදිය මත්ස්‍ය විවිධත්ව සිතියම්ගත කිරීම

මේ සඳහා 1:50000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් පරිශීලනය කරන ලදි. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් නිර්මාණය කරන ලද 1:25000 සංඛ්‍යාංක තේමා සිතියම් හා සම්බන්ධ 1:50000 සමෝච්ච රේඛා සිතියම් යොදාගෙන අධ්‍යයන ප්‍රදේශය සංඛ්‍යාංක ගතකොට ඇත. මේ සඳහා මෙන් ම ලක්ෂ්‍ය සිතියම් නිර්මාණය සඳහා 10.1 මෘදුකාංගය GIS තාක්ෂණය යටතේ යොදාගෙන ඇත.

- අන්තර්ජාලය

මෙම පර්යේෂණයේ ද්විතීයික මූලාශ්‍රය යටතේ මිරිදිය මසුන් පිළිබඳ ව හා ඒ ආශ්‍රිත තොරතුරු රැස් කිරීම උදෙසා අන්තර්ජාල මූලාශ්‍රය යොදාගන්නා ලදි.

**දත්ත විශ්ලේෂණය**

දත්ත විශ්ලේෂණය කිරීම සඳහා මෙහි දී ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය සහ ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය යන මිශ්‍ර දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය යොදාගෙන තිබේ.

- බලවනාව ඔයෙහි මිරිදිය මත්ස්‍ය විශේෂවල පොහොසත් භාවය විශ්ලේෂණය

විශේෂ පොහොසත් භාවය යනු ලොව ඕනෑ ම ස්ථානයක ජෛව විවිධත්වය මනිණු ලබන එක් දර්ශකයකි. මෙම පර්යේෂණය සඳහා බලවනාව ඔයෙහි කිලෝමීටර් පහක ප්‍රදේශය තුළ නියැදි ලබා ගැනිමට ස්ථාන 13ක් තෝරාගෙන ඇත. මෙම නියැදි කලාප 13න් බොහෝමයක් තෝරාගෙන ඇත්තේ කුඩා අතු ගංගා බලවනාව ඔය සමග සම්බන්ධ වන ස්ථානයන්හි මෙන් ම තේ වගා භූමි සහ හුදෙකලා ප්‍රදේශ ආශ්‍රිතව යි.

$$Species\ Richness = Number\ of\ different\ species\ within\ the\ site$$

- බලවනාව ඔයෙහි මිරිදිය මත්ස්‍ය විශේෂවල සුලබතාව

යම් ස්ථානයක මත්ස්‍යන්ගේ තනි විශේෂ සංඛ්‍යාව එම තනි විශේෂවලට අයත් සම්පූර්ණ මත්ස්‍ය සංඛ්‍යාවෙන් බෙදා 100න් ගුණ කිරීමෙන් බලවනාව ඔයෙහි මිරිදිය මත්ස්‍ය විශේෂවල සුලබතාව හඳුනාගත හැකි වේ.


$$Evenness = \frac{Number\ of\ individual\ species \times 100}{Total\ number\ of\ individual\ species}$$

- විශේෂ විවිධත්ව දර්ශක

Shannon – Weiner දර්ශකය

මෙම දර්ශකය ලිපිගොනු සහසම්බන්ධ න්‍යාය මත පදනම් වේ. මෙහි "H" මගින් අනපේක්ෂිතතාව මනිනු ලැබේ. මෙම නියමය මනිනු ලබනුයේ ප්‍රලය සංකල්පයට අනුව යි.


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය




**සිතියම් අංක 3**: බලවනාව ඔයෙහි මිරිදිය මත්ස්‍ය විවිධත්ව අධ්‍යයන පාදක සිතියම

මූලාශ්‍රය - ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව, 2016

$$H = -\sum_{n=1}^{n} \frac{n_i}{N} ln \frac{n_i}{N}$$

Simpson දර්ශකය

මෙම දර්ශකය විශාල වශයෙන් බලපවත්වන්නේ ප්‍රමුඛ විශේෂ මතයි. Simpson දර්ශකය නියැදි ස්ථාන 13හි සුලබ විශේෂවල විෂමතාවයන් අධ්‍යයනය සඳහා භාවිත කරන ලදි.

$$D = 1 - \frac{\sum_{i=1}^{S} n_i(n_i - 1)}{N(N-1)}$$

- මානව සහ භෞතික සාධක මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ අවකාශීය වෙනස අතර පවත්නා සබඳතා විශ්ලේෂණය

-ද්වි විචල්‍ය සහසම්බන්ධතා ක්‍රමවේදය-

මෙම ක්‍රමවේදයේ දී විචල්‍ය දෙකක් අතර සහසම්බන්ධතාව සොයනු ලබයි.


Pearson සහසම්බන්ධතා

මෙම සහසම්බන්ධතා ක්‍රමවේදය පරිමාණ දෙකකින් යුත් විචල්‍යන් අතර රේඛීය සංවිධානය මැනීම සඳහා භාවිත කරනු ලබයි. මෙහි වෙසෙසියා මට්ටම සොයාගනු ලබනුයේ $>0.05$ මගිනි. මෙම ක්‍රමවේදයේ දී සහසම්බන්ධතාව බිංදුව ලෙස සලකන අතර විසිරි තිත් සටහන් මගින් මෙය මනාව පිළිබිඹු වේ.

Spearman's සහසම්බන්ධතා

මෙම සහසම්බන්ධතා ක්‍රමවේදය පරිමාණ දෙකකින් යුත් විචල්‍යන් නැතහොත් ක්‍රමාංකිත අතර තරා පටිපාටික සංවිධානය මැනීම සඳහා භාවිත කරනු ලැබේ. ද්වි විචල්‍ය සහසම්බන්ධතා ක්‍රමවේදය විශේෂවල පොහොසත් භාවය සහ උන්නතාංශය අතර මෙන් ම විවිධ ජලතල ආශ්‍රිත ව ලද නොයෙකුත් තොරතුරු සහ ජල දූෂණය මෙන් ම ඒ ආශ්‍රිත ප්‍රමාණාත්මක දත්ත අතර පවත්නා සහසම්බන්ධතාව ගණනය කිරීම සඳහා යොදාගනු ලැබේ.


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය




**රූපසටහන් අංක 2:** බලවනාව ඔයෙහි නියැදි ස්ථාන 13 ආශ්‍රිත මිරිදිය මත්ස්‍ය විශේෂවල සමුච්චිත සංඛ්‍යාත වක්‍රය

මූලාශ්‍රය - නවරත්න, 2020

### ප්‍රතිඵල ඉදිරිපත් කිරීම

ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය භාවිතය මගින් ග්‍රහණය කරගන්නා ලද ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත අවසානයේ දී විශ්ලේෂණයෙන් පසු ව වගු, ප්‍රස්තාර, සිතියම් සහ ඡායාරූප මගින් ඉදිරිපත්කොට ඇත.

### දත්ත විශ්ලේෂණය


- විශ්ලේෂණයට අනුව බලවනාව ඔයෙහි නියැදි ස්ථාන 13 මගින් කළු ගංගාවේ අනෙකුත් අතු ගංගාවන්ට වඩා ඉහළ මිරිදිය මත්ස්‍ය පොහොසත් භාවයෙන් යුක්ත බව ගත හැකි ය.

බලවනාව ඔයෙහි මත්ස්‍ය විශේෂ 10ට අයත් මිරිදිය මත්ස්‍යන් 1140ක් හඳුනාගන්නා ලදි. නියැදි අංක අටෙහි අනෙකුත් නියැදි ස්ථාවලට වඩා ඉහළ මිරිදිය මත්ස්‍ය විශේෂවල පොහොසත් භාවයක් වාර්තා වූ අතර විශේෂ අටකට අයත් මිරිදිය මසුන් 239ක් මෙහි දී හඳුනාගන්නා ලදි.

බලවනාව ඔයෙහි නියැදි ස්ථාන 13 ආශ්‍රිත ව මිරිදිය මත්ස්‍ය විශේෂවල සුලබතාව විශ්ලේෂණයට අනුව ගල්පාඩි Garra ceylonesis මිරිදිය මත්ස්‍ය විශේෂය 29%ක සුලබතාවයක් පෙන්වයි.

- Shannon – Weiner දර්ශකය සහ Simpson දර්ශකය යන විශේෂ විවිධත්ව දර්ශකවලට අනුව බලවනාව ඔය ඉහළ මිරිදිය මත්ස්‍ය විශේෂවල විවිධත්වයක් පවතින බව පෙන්නුම් කරයි.

බලවනාව ඔයෙහි නියැදි ස්ථාන 13 ආශ්‍රිත Shannon – Weiner දර්ශක අගය 1.816 සහ Simpson දර්ශක අගය 0.8046ට අනුව ඉහළ මිරිදිය මත්ස්‍ය විවිධත්වයක් ඇති බව පෙන්නුම් කෙරේ. ඉහළ මිරිදිය මත්ස්‍ය විවිධත්වයක් නියැදි ස්ථාන 12න් වාර්තාවන අතර එහි මිරිදිය මත්ස්‍ය විශේෂ




**රූපසටහන් අංක 3:** බලවනාව ඔය ආශ්‍රිත ව මිරිදිය මත්ස්‍ය සුලබතාව

මූලාශ්‍රය - නවරත්න, 2020

හතක් හඳුනාගන්නා ලදි. මෙම Shannon – Weiner දර්ශක අගය 1.712 වන අතර Simpson දර්ශක අගය 0.7981ක් වේ.

- බලවනාව ඔයෙහි මිරිදිය මත්ස්‍ය විශේෂ විවිධත්වයේ අවකාශීය වෙනස උන්නතාංශය සහ ආනතිය මගින් පාලනය කරනු ලැබේ.

ඉහළ උන්නතාංශයක් සහ ආනතියක් සහිත නියැදි ස්ථානවල ඉතා අවම මිරිදිය මත්ස්‍ය ව්‍යාප්තියක් මෙන් ම අවම උන්නතාංශයක් සහ ආනතියක් සහිත නියැදි ස්ථානවල ඉහළ මිරිදිය මත්ස්‍ය ව්‍යාප්තියක් ද හඳුනාගතහැකි වේ. මෙහි දී මත්ස්‍ය ගහනය සහ උන්නතාංශය අතර ද්වි විචල්‍ය සහසම්බන්ධතාව ගණනයට Simpson ක්‍රමවේදය යොදාගෙන තිබේ. මෙම විචල්‍යන් දෙක අතර 99% වෙසෙසියා මට්ටම යටතේ 0.01 (2 tails) අගයෙන් ඉතා හොඳ සහසම්බන්ධතාවක් පවත්නා බව පෙන්නුම් කෙරේ.

- බලවනාව ඔයෙහි නියැදි ස්ථාන 13හි මිරිදිය මත්ස්‍ය විශේෂ විවිධත්වයේ අවකාශීය වෙනස සඳහා වන


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වැස්ම මගින් සිදු කරන බලපෑම එම නියැදි ස්ථානයට ලැබෙන හිරු කිරණ ප්‍රමාණය මගින් පාලනය කෙරේ.

බලවනාව ඔයෙහි මිරිදිය මත්ස්‍ය විශේෂ විවිධත්වයේ අවකාශීය වෙනස සහ වන ව්‍යාප්තිය අතර සහසම්බන්ධතාව ද්වී විචල්‍ය සහසම්බන්ධතාවයේ Simpson ක්‍රමවේදය මගින් අධ්‍යයනය කරන ලදි. මෙහි දී 95% (2 tails) වෙසෙසියා මට්ටම යටතේ මෙම විචල්‍යන් දෙක අතර සහසම්බන්ධතාවක් නොමැති බව හඳුනාගන්නා ලදි. මෙයට හේතු වශයෙන් ගංගාවේ නියැදි ස්ථාන 13හි මිරිදිය මත්ස්‍ය විශේෂවල අවකාශීය වෙනසට වන ව්‍යාප්තිය මගින් සිදු කරනු ලබන එම නියැදි ස්ථානයන්ට ලැබෙන හිරු කිරණ ප්‍රමාණය මගින් පාලනය කිරීම හේතුවෙන් සිදුවන බව සොයාගන්නා ලදි. එයට අනුව ඉහළ හිරු කිරණ ප්‍රමාණයක් ලැබෙන නියැදි ස්ථානවල ඉහළ මිරිදිය මත්ස්‍ය සංඛ්‍යාවක් සහ අවම හිරු කිරණ ප්‍රමාණයක් ලැබෙන නියැදි ස්ථානවල අවම මිරිදිය මත්ස්‍ය සංඛ්‍යාවක් ද හඳුනාගත හැකි වේ.

- බලවනාව ඔය අශ්‍රිත නියැදි ස්ථාන 13හි මිරිදිය මත්ස්‍ය විශේෂ විවිධත්වයේ අවකාශීය වෙනස සඳහා නියැදි ස්ථානයන්හි ගැඹුර මගින් සිදු කරන බලපෑම එම නියැදි ස්ථානයන්හි අනෙකුත් භෞතික සාධක මගින් පාලනය කරනු ලැබේ

ද්වී විචල්‍ය සහසම්බන්ධතාවයේ Simpson ක්‍රමවේදය යටතේ නියැදි ස්ථානයන්හි ගැඹුර සහ මිරිදිය මත්ස්‍ය ව්‍යාප්තිය අතර සහසම්බන්ධතාව ගණනය කරන ලද අතර 95% (2 tails) වෙසෙසියා මට්ටම යටතේ මෙම විචල්‍යන් දෙක අතර සහසම්බන්ධතාවක් නොමැති බව හඳුනාගන්නා ලදි. යම් යම් නියැදි ස්ථානයන්හි ගැඹුර අධික වුවත්, එහි මිරිදිය මත්ස්‍ය විශේෂවල ව්‍යාප්තිය අවම අගයක් ගත් අතර මෙයට හේතුව වශයෙන් එම නියැදි ස්ථානයන්ට ලැබෙන හිරු කිරණ ප්‍රමාණය, උන්නතාංශය සහ ආනතිය වන ආවරණය, නියැදි ස්ථානයන්හි විශාලත්වය සහ එහි පාෂාණවල විශාලත්වය, එම නියැදි ස්ථානයන්හි ගැඹුර මගින් සිදු කරන බලපෑම පාලනය කිරීමෙන් සිදු වනබව සොයාගන්නා ලදි.

- බලවනාව ඔයෙහි මිරිදිය මත්ස්‍ය විශේෂ විවිධත්වයේ අවකාශීය වෙනස නියැදි ස්ථාන 13හි විශාලත්වය මගින් පාලනය කර තිබේ.

ද්වී විචල්‍ය සහසම්බන්ධතාවයේ Pearson සහසම්බන්ධතා ක්‍රමවේදයට අනුව බලවනාව ඔයෙහි නියැදි ස්ථානවල මිරිදිය මත්ස්‍ය විශේෂ විවිධත්වයේ අවකාශීය වෙනස අතර ඉතා හොද සහසම්බන්ධතාවක් හඳූනාගතහැකි වේ. මෙයට අනුව 95% (2 tails) වෙසෙසියා මට්ටම යටතේ 0.05 අගයෙන් මෙම විචල්‍යන් අතර සහසම්බන්ධතාවයක් පවතින බව තහවුරු වේ. මේ අනුව විශාල නියැදි ස්ථානයන්හි ඉහළ මිරිදිය මත්ස්‍ය විවිධත්වයක් මෙන් ම කුඩා නියැදි ස්ථානයන්හි අවම මිරිදිය මත්ස්‍ය විවිධත්වයක් ද හඳුනාගත හැකි වේ.

- බලවනාව ඔයෙහි ආශ්‍රිත නියැදි ස්ථාන 13හි මිරිදිය මත්ස්‍ය විශේෂ විවිධත්වයේ අවකාශීය වෙනස එහි පවතින පාෂාණවල විශාලත්වය අනුව පාලනය කෙරේ.

බලවනාව ඔයෙහි ආශ්‍රිත නියැදි ස්ථාන 13හි මිරිදිය මත්ස්‍ය විශේෂ විවිධත්වය සහ පාෂාණවල විශාලත්වය අතර සිදු කළ ද්වී විචල්‍ය සහසම්බන්ධතාවයේ Pearson සහසම්බන්ධතා ක්‍රමවේදයට අනුව ඉතා හොද සහසම්බන්ධතාවක් හඳූනාගත හැකි වේ. මෙයට අනුව 95% (2 tails) වෙසෙසියා මට්ටම යටතේ 0.05 (2 tails) අගයෙන් මෙම විචල්‍යන් අතර සහසම්බන්ධතාක් පවතින බව තහවුරු වේ. මෙම විශ්ලේෂණයට අනුව විශාලත්වයයෙන් කුඩා පාෂාණ වන Granules (2mmට අඩු) සහ Pebbles (4mm - 64mm) වලින් සමන්විත නියැදි ස්ථානවල ඉහළ මිරිදිය මත්ස්‍ය ගහනයක් ද ප්‍රමාණයෙන් විශාල පාෂාණ වන Cobbles (64mm - 256mm) සහ Boulders (256mm ට වැඩි) සහිත නියැදි ස්ථානවල අවම මිරිදිය මත්ස්‍ය ගහනයක් ද හඳුනාගත හැකි වේ.

- බලවනාව ඔය ආශ්‍රිත කලාපයේ සිදු කෙරෙන තේ වගා කටයුතු නියැදි ස්ථාන 13හි මිරිදිය මත්ස්‍ය විශේෂ විවිධත්වයේ අවකාශීය වෙනසට බලපා ඇත.

අධ්‍යයන ප්‍රදේශයේ අවට භූමිය 86.7%ක් එනම්, අක්කර 62.25ක් තේ වගාව සඳහා භාවිතකොට ඇත. මොවුහු වාර්ෂික ව කිලෝ මීටර් 27475 ක් එනම්, 96%ක පොහොර සහ ලීටර් 136, වල් නාශක එනම්, 98%ක් තේ වගාව සඳහා පමණක් යොදාගනු ලබති. වර්ෂාවත් සමග මෙම රසායනික ද්‍රව්‍ය ජලය සමග මිශ්‍ර වී මිරිදිය මත්ස්‍ය ගහනයට තර්ජන එල්ල කරනු ලබන බව මෙහි දී හඳුනාගත හැකි ය.

- බලවනාව ඔයෙහි මිරිදිය මත්ස්‍ය විශේෂ විවිධත්වයේ අවකාශීය වෙනසට එම ප්‍රදේශයේ මාර්ග සහ අනෙකුත් සංවර්ධන කටයුතු බලපෑම් එල්ලකොට තිබේ.

අධ්‍යයන ප්‍රදේශයේ රත්නපුර ශ්‍රී පලාබද්දල මාර්ගය සහ ගුරුළුවාන පාලම ආශ්‍රිත සංවර්ධන කටයුතු හේතුවෙන් නියැදි ස්ථාන අංක 12 සහ 13 බලපෑමට ලක්ව තිබේ. මෙම කටයුතු අතරතුර දී තෙල්, මඩ, ග්‍රීස් සහ කොන්ක්‍රීට් ආදී දූෂක ද්‍රව්‍ය ජලයට මුසු වේ. මේ හේතුවෙන් මිරිදිය මත්ස්‍යන්ට පමණක් නොව අනෙකුත් ජලජ ජීවීන් ද වඳවීයාමේ තර්ජනයට ලක්ව ඇත. ගංගාවේ ජලය සමග මඩ මිශ්‍ර වීමෙන් ජලයෙහි අඩංගු ඔක්සිජන් ප්‍රමාණය අවම වීමෙන් නියැදි අංක 12 සහ 13හි මිරිදිය මත්ස්‍ය සංඛ්‍යාවේ අඩු වීමක් හඳූනාගත හැකි වේ.

- බලවනාව ඔය සහ ඒ අවට කලාපයේ සංචාරක කටයුතු හේතුවෙන් ඉහළ පරිසර සහ ජල දූෂණයක් සිදූ ව තිබේ.

මැයි සිට දෙසැම්බර් මස දක්වා කාලපරාසයේදීත්, සති අන්ත දිනවලදීත් ඉතා විශාල සංචාරක පිරිසක් ශ්‍රී පලාබද්දල ප්‍රදේශයට පැමිණෙති. මොවුන්ගෙන් බොහෝ පිරිසක් බලවනාව මෙන් ම අනෙකුත් ගංගා සහ ජලාශයන් වෙත ඒකරාශී වන අතර මොවුහු ස්නානය කිරිම මෙන් ම රථවාහන පිරිසිදු කිරීම ආදී කටයතුවල නියැළෙති.


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය



අ) ආ) ඇ)

**රූපසටහන් අංක 4:** බලවනාව ඔයට බලපානු ලබන මානුෂ සාධක; අ) නියැදි අංක අටෙහි වැලි ගොඩදැමීමේ ක්‍රියාවලිය; ආ) බලවනාව ඔය ආශ්‍රිත තේ වගාවන් සඳහා ඩොලමයිට් භාවිතය; ඇ) ගුරුළුවාන පාලම ආශ්‍රිත බලවනාව ඔයෙහි ඉවුරු ඛාදනය

මූලාශ්‍රය - නවරත්න, 2020

- සමනළ රක්ෂිතය සහ බලවනාව ඔය දෙපස වල්ලපට්ට ශාක විශේෂය ආශ්‍රිත ජෛව සම්පත් මංකොල්ලය සහ වන විනාශය.

පසුගිය වසර කිහිපය තුළ වල්ලපට්ට (Gyrinops walla) ශාක විශේෂයේ ජෛව සම්පත් මංකොල්ලය බලවනාව ඔය ආශ්‍රිත ව පමණක් නොව මුලු තෙත් කලාපය පුරා ම බලපැවැත්වෙන විශාල ගැටලුවකි. විශේෂයෙන් ම මෙම කලාපයේ පදිංචිකරුවන් විසින් වල්ලපට්ට ශාක සෙවීම සඳහා වනාන්තර හෙළි පෙහෙළි කිරීම සිදු කරනු ලැබේ. බොහෝ වල්ලපට්ට ශාකයන්හි මෙම කළු පැහැ දිළීරය නොමැති අතර එම ශාක ද නිරපරාදයේ කපා දමනු ලබයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රදේශයේ භූගත ජල මට්ටම පහළ බැස ඇති බව මෙන් ම මිරිදිය මත්ස්‍ය විශේෂයන්ගේ පැවැත්මට ද බලපෑම් එල්ල කර ඇති බව ක්ෂේත්‍ර අධ්‍යයනය මගින් පැහැදිලි විය.

## නිගමනය

මෙම පර්යේෂණයේ සියලු ම අරමුණු වන බලවනාව ඔයෙහි අවකාශීය වශයෙන් මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ සිදුවන වෙනස්කම් හඳුනාගැනීම සහ ඔවුන් ආරක්ෂා කරගැනීම සඳහා සංරක්ෂණයේ ඇති වැදගත්කම හඳුනා ගැනීම සිදුකරන ලදි. එමෙන් ම බලවනාව ඔයෙහි මත්ස්‍ය වාසස්ථාන ව්‍යාප්තියට බලපාන හේතු සහ මානව බලපෑමෙන් මත්ස්‍යන්ට සිදුවන හානිය අවම කිරීමට ගතහැකි විසඳුම් යෝජනා කිරීම මෙහි දී සිදු කෙරේ. මෙම අධ්‍යයනයට අනුව ගංගාවේ නියැදි ස්ථානයන්හි උන්නතාංශය, ආනතිය, ගැඹුර, විශාලත්වය, ශාකාවරණය සහ පාෂාණවල විශාලත්වය බලවනාව ඔයෙහි අවකාශීය වශයෙන් මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ සිදුවන වෙනස්කම් කෙරෙහි බලපානු ලබන භෞතික සාධක වශයෙන් සොයාගන්නා ලදි. තව ද බලවනාව ඔයෙහි අවකාශීය වශයෙන් මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ සිදුවන වෙනස්කම් කෙරෙහි බලපානු ලබන මානව සාධක වශයෙන් මාර්ග සංවර්ධන කටයුතු, සංචාරක කටයුතු, බලවනාව ඔයෙහි වැලි ගොඩදැමීමේ කටයුතු, තේ වගාව ආශ්‍රිත රසායනික පොහොර භාවිතය සහ වනාන්තර හෙළි පෙහෙළි කිරීම මෙන් ම වල්ලපට්ට ජාවාරම ආශ්‍රිත ගැටලු හඳුනා ගතහැකි වේ. අධ්‍යයන ප්‍රදේශයේ මානව සාධකයන්ට වඩා භෞතික සාධක අවකාශීය වශයෙන් මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ සිදුවන වෙනස්කම් කෙරෙහි බලපානු ලබන බවත්, මානුෂ සාධකයන්හි බලපෑම ක්‍රමයෙන් වර්ධනය වන බවත් මෙම අධ්‍යයනයේ අවසන් නිගමනය වශයෙන් ඉදිරිපත් කළ හැකි වේ. ගැටලු අවම කරගැනීම සඳහා යෝජනා වශයෙන් මිරිදිය මත්ස්‍ය විවිධත්වය සහ පරිසර පද්ධති රූපාන්තරණය ආදිය මෙහි දී තිරසාරාත්මක වේ. ගංගාවේ ඉහළ ජල පෝෂක ප්‍රදේශයේ සිටින ජලජ ජීවීන් ගංගාවේ පහළ ජල පෝෂක ප්‍රදේශය කරා ගමන් කිරීම පාලනයට ඔවුන්ගේ අවශ්‍යතාවයන් ආරක්ෂා කරගත යුතු වේ. ඒකදේශීය ශාක සහ පඳුරු ගංගා දෙපස වගා කළ යුතු අතර කැළි කසළ ක්‍රමානුකූල ව බැහැර කළ යුතු වේ. මිරිදිය මත්ස්‍ය විශේෂවල වෙනස්වීම වාර්තා කිරීම සහ අවධානයෙන් සිටීම සඳහා ගංගා නිරීක්ෂකයන් පත්කළ යුතු වේ. සංරක්ෂිත ප්‍රදේශ පිහිටුවීම සහ ගැටලු ලිහිල් කිරීමේ ප්‍රවේශ ක්‍රියාවට නැංවිය යුතු අතර, මත්ස්‍ය ජීවන ප්‍රදේශ ප්‍රතිස්ථාපනය මෙන් ම අවදානමට ලක් සහ විරල මිරිදිය මත්ස්‍ය විශේෂ කෘත්‍රිම ලෙස අභිජනනය කොට නිදහස් කළයුතු වේ. විනාශකාරී ධීවර කටයුතු නීතිමය වශයෙන් තහනම් කළයුතු අතර පරිසරයට හිතකර සේදුම්කාරක භාවිතයට හුරුවිය යුතු ය. මිරිදිය මත්ස්‍යන් ආශ්‍රිත ව සිදුකරන පර්යේෂණ බලාත්මක කළයුතු අතර ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීම, පාංශු ඛාදනය සහ අවසාධිත තැන්පත්වීම වැළැක්වීම යනා දි හිතකර කෘෂිකාර්මික කටයුතු සිදුකළ යුතු වේ. කර්මාන්තශාලාවන් විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගත යුතු අතර ජලතල


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ආශ්‍රිත ප්‍රදේශවලින් බැහැර ව ගොඩනැගිය යුතු වේ. රජය සහ ප්‍රදේශවාසීන් එක් ව මිරිදිය මත්ස්‍ය සංරක්ෂණය සඳහා සහභාගී වියයුතු වේ.

## පරිශීලිත මූලාශ්‍රය


Batuwita, S. (2016, June). A Taxonomic Study on the South Asian Cyprinid Genera Horadandia and Rasboroides ( Ostariophysi: Cyprinidae: Danioninae) and Evaluation of the Present Distribution Pattern of Rasboroides Vaterifloris Pallidus in Gin River. ResearchGate.

Fagner Junior M. Oliveira, Dilermando Lima, Luis Mauricio Bini. (2020, May). Current environmental conditions are weak predictors of fish community structure compared to community structure of the previous year. Aquatic Ecology.

Gunathilaka, S. D. (2007). Freshwater Fishes of Sri Lanka. Sri Lanka: Department of environmental and Natural Resources.

Hiranya Sudasinghe. (2015, January). Fish-off in the Attanagaluo-Oya River, Sri Lanka: a provisional checklist of icthyofauna.

Isabelle M.Cote,Martin R.Perrow. (2006). Ecological Census Techniques. Cambridge University Press. Retrieved 13 06, 2019, from `http://www.cambridge.org/core/books/ecological-census-techniques/0C0448C4F8B4125740354C74DC969E9`

Jan.S.R.Munro. (1982). The Marine And Fresh Water Fishes of Ceylon. Dilhi, India: Narendra Publishing House.

Kenth, D. C. (1987). Age and growth of Fish. (C. S. Robert & E. H. Gordon, Eds.) Lowa, United Sates of America: The Lowa State University Press.

Madura De Silva, R. Pethiyagods. (2015). Sri Lankan Freshwater Fishes. (D. Robeson, Ed.) Galle, Sri Lanka: Wildlife Concervation Socity.

Malcolm L. (2006). Fundamentals of Conservation Biology (Vol. 3). Chichester, United Kingdom: John Wiley and Sons Ltd.

Nikolsky, G. V. (2008). The Ecology of Fishes. (L. Birikett, Trans.) Jodhpur, NDIA: AGROBIOS.

Nimal Gunathilleke, Rohana Pethiyagoda, Savitri Gunathilleke. (2008). Biodiversity of Sri Lanka. Mt. Lavinia: J.Noin, Sci, Foundation Sri Lanka.

Peng Bun Ngor, Gael Grenouillet, Sea Phem. (2018, April). Saptial and temporal variation in fish community structure and diversity in the largest tropical flood-pulse system of South-East Asia. Ecology of Freshwater fish, 1-14.

Pethiyagoda, R. (1991). Freshwater Fishes of Sri Lanka. Colombo 8, Sri Lanka: Sarvodaya Vishva Lekha.

Puy Lim, Borin Chhouk. (1999, November). Diversity and spatial distribution of freshwatr fish in Great Lake and Tonle Sap river (Cambodia, Southeast Asia). Aquatic Living Resources, 379-386.

Robert C. Summerfelt, Gordon E. Hall. (1987). Age and Groth of fish. Lowa state: LOWA STATE UNIVERSITY PRESS/ AMES .

Robert Wallus,Thomas P.Simon. (2006). Reproductive Biology and Early Life History Of Fishes in the Ohio River Drainage (Vol. 5). Boca Raton, United State of America: CRC Press.

sampath De Alwis Goonatilake. (2020, February). The National Red List Of Sri Lanka: Assessement of the Threat Status of the (Freshwater Fishes of Sri Lanka) 2020. Colombo: International Union for Conservation of Nature.

Sanjeewani H.K.N,Sandun J. Parera. (2009). Preliminary Study on Avifounal Diversity in the Sabaragamuwa University Premises, Belihuloya, Sri Lanka. ResearchGate. Retrieved 01 06, 2019, from `http://www.researchgate.net/publication/311925052`

Sena S.De Silva,Trevo A.Anderson. (2009). Fish Nutrition in Aquaculture. Dilhi, India: Saurabh Printers Pvt.Ltd.




© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

Srivastava, C. B. (1999). Fish Biology. Delhi, India: Narendra Publishing House.

Sudesh Batuwita. (2019, December). A review of amphibian fauna of Sri Lanka: distribution, recent taxonomic changes and conservation.

Sudesh Batuwita, Huang Kairu. (n.d.). Herpetofauna of Nanjing in the Jiangsu province of China. ResearchGate.

Sudesh Batuwita, Rohana Pethiyagodaet al. . (n.d.). Assessement of Scincide and Gekkonid lizards of Sri Lanka. ReseachGate.

Sudesh Batuwita, Sampath Udugampala. (2012). Assessment of Brackish fish diversity on Sri Lanka. researchGate.

Sundarabarathy, De Zoysa. (October, 2014). Freshwater Fish Diversity, Abundance, Conservation and Effects of Aquatic Birds on Fish population in Kammalakkulama Tank at Mihintale, Sri Lanka. Retrieved from ReserchGate: http://www.researchgate.net/publication/267507

Thilina D. Surasinghe. (2020, January). Challenges in Biodiversity Conservation in a Highly Modified Tropical River Basin in Sri Lanka. Water, 1-25.

Wildlife Conservation Society Galle. (2015). Freshwater Fishes. Galle, Sri Lanka: Gunaratne Offset.



© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
එකොළොස්වන කලාපය 2020 දෙසැම්බර්
පිටු 54-63
ISSN 1800-1459 eISSN 2386-2041
© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් ව ශ්‍රී ලංකාවේ වැඩිහිටි ශ්‍රමිකයින්ගේ ඉපැයීම් සඳහා බලපාන සාධක පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනය

(A Comparative Study on the Factors Associated with Earning between Elderly Men & Women in Sri Lanka)

පී. ජී.එන්. නිල්මිණි* සහ ජී.ආර්.එස්.ආර්.සී. සමරවීර

ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය, සබරගමුව විශ්වවිද්‍යාලය
*pgnadeeshanilini@gmail.com

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ වැඩිහිටි පිරිස ශීඝ්‍රයෙන් ඉහළ යාමත් සමග සමාජ ආර්ථික ගැටලු රැසකට මුහුණ දීමට සිදු ව ඇත. මක්නිසාදයත් පවතින සුභසාධන වැඩසටහන් මගින් ප්‍රමාණවත් පරිදි වැඩිහිටි ජනගහනය ආවරණය නොවීමත්, ඔවුන් දිරිමත් කිරිම සඳහා විධිමත් යාන්ත්‍රණයක් නොවීමත් ය. නමුත් ඔවුන්ට ශ්‍රම වෙළෙඳපොළට පැමිණීමට සිදුවන අවස්ථාවන්හි ප්‍රමාණවත් පරිදි ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, රැකියා සුරක්ෂිතතාව හෝ වෘත්තීය සමිති සාමාජිකත්වය ඇති කිරීම වැදගත් වේ. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ ලෙස, ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් ව ශ්‍රී ලංකාවේ වැඩිහිටි ශ්‍රමිකයින්ගේ ඉපැයීම් සඳහා බලපාන සාධක පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කෙරේ. එම අධ්‍යයනය සඳහා 2018 වර්ෂයට අදාළ ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණය ද්වීතීයික දත්ත සැපයීමේ මුලාශ්‍රය ලෙස යොදා ගන්නා ලදී. අවුරුදු 60 ට වැඩි වැඩිහිටි සේවා නියුක්ත පුරුෂයින් 2775 සහ කාන්තාවන් 1136 ක් නියැදීන් ලෙස යොදා ගනිමින් Semi Log ප්‍රතිපායන ආකෘතිය විශ්ලේෂණයන් සිදු කිරිම සඳහා භාවිත කර ඇත. අධ්‍යාපනය හා රැකියාවේ ස්වභාවය වැඩිහිටි ස්ත්‍රී පුරුෂ ඉපැයීම් සඳහා බලපාන නිර්ණායකයන් වන අතර කළමනාකරණ හා නිෂ්පාදන අංශයේ රැකියාවක නිරත අයෙකු වීම පුරුෂ පැයක ඉපැයීම් සඳහා බලපෑමක් ඇති කරනු ලබයි. සේවා නියුක්ති ස්වභාවය වැඩිහිටි කාන්තා පැයක ඉපැයීම් සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. අවසාන වශයෙන් වැඩිහිටි ඉපැයීම් වර්ධනය කර ගැනීමට අදාළ ප්‍රතිපත්ති නිර්දේශයන් ඉදිරිපත් කිරීමක් සිදු කර ඇත.

කේන්ද්‍රීය වචන: ශ්‍රී ලංකාවේ 60 වැඩි වැඩිහිටි පිරිස, ඉපැයීම්වල වෙනස් වීම, ස්ත්‍රී පුරුෂභාවය මත සංසන්දනය

A host of social and economic issues are being faced with the rapid increase of the elderly group in Sri Lanka. This is due to the inadequate coverage of welfare programs and the absence of an appropriate mechanism for elderly people to enter the labour market or to encourage them. However, it is important to create the opportunities, namely adequate gender equality, job security or gaining trade union membership etc.for them to enter the labour market. While a comparative study on the factors associated with earning between elderly men & women in Sri Lanka has been carried out as the main objective of this study, the Sri Lanka Labour Force Survey 2018 has been used as the source for the secondary data. The study uses 2,775 over 60 year old elderly, employed men and 1,136 women as the sample and the Semi Log regression model has been used for the analysis. While education and nature of employment are the criteria that affect the earnings of elder men and women, being a person engaging in the management or production sector affects a male's hourly earnings, the nature of employment considerably affects the hourly earnings of elderly women. Finally, policy recommendations have been presented related to the development of the earnings of the elderly.

Key words: Over 60 years elderly group in Sri Lanka, change in earnings, comparison on gender

## හැඳින්වීම

දශක කිහිපයකින් පසු ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් $\frac{1}{4}$ පමණ වයස අවුරුදු 60 ට වැඩි වනු ඇති අතර අවුරුදු 80 සහ ඊට වැඩි පිරිසෙහි වේගවත් ඉහළ යාමක් පවතී. එය ශ්‍රී ලංකාවේ වැඩිහිටි ශ්‍රමිකයින් ආශ්‍රිත ව දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවකි. එසේ ම ජන හා සංඛ්‍යාලේඛන දේපාර්තුමේන්තුව (2018) අනුව 60ට වැඩි වැඩිහිටි පුද්ගලයින්ගේ ක්‍රියාකාරී නොවන පිරිස අතර කාන්තාවන් 74.1%ක් හා පුරුෂයින් 25.9%ක් වන බව පෙන්වා දී ඇත. එසේ ම ක්‍රියාකාරී වන ස්ත්‍රීන් 34.9% ක් ද පුරුෂයින් 65.1% ද වේ. ක්‍රියාකාරී වන වැඩිහිටි කාන්තා ප්‍රතිශතය පුරුෂයින්ට සාපේක්ෂ ව දෙගුණයකින් අඩු වී ඇති බව පෙන්වා දිය හැකි ය. ශ්‍රමය සඳහා දායක වන වැඩිහිටි පිරිසෙහි පමණක් ඉපැයීම් රඳා පැවතිය ද වැඩිහිටි කාන්තා ශ්‍රමිකයින්ගෙන් අතිමහත් බහුතරයක් අවිධිමත් අංශයේ රැකියාවන්හි නිරත වෙති. මෙය වැඩිහිටියන් ආශ්‍රිත ව බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල දක්නට ලැබෙන පොදු ලක්ෂණයක් වන අතර ශ්‍රම වෙළෙඳපොළ ද්විත්වභාවය මහලු විය දක්වා දිවෙන බව (Vodopivec and Arunatilake, 2008) යන පර්යේෂකයන් විසින් පෙන්වා දී ඇත. Masud et al. (2008) ට අනුව මාසික වැඩිහිටි ඉපැයීම් ආර්ථිකයට සෘජු ව බලපෑම් ඇති කරනු ලබන බවත්, ආර්ථික වශයෙන් අක්‍රීය පුද්ගලයින් සඳහා කිසිදු ඉපැයීමක් නොලැබෙන

බවයි. එයට ප්‍රධාන වශයෙන් හේතු වනුයේ, ශ්‍රමය සඳහා දායක වන වැඩිහිටියන් සඳහා වැටුපට අමතර ව ලැබෙන දීමනාවන් ලෙස සේවක අර්ථ සාධක අරමුදල (EPF), සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල (ETF) මොවුන් සඳහා වලංගු නොවීමයි. වැඩිහිටි කාන්තාවන්ට ඉතාමත් අවම වැටුපක් යටතේ සේවය කිරීමට සිදු වීම සහ වැඩ කරන පැය ගණන නිශ්චිත නොවීම වැනි හේතු මත ස්ත්‍රී හා පුරුෂ වශයෙන් ශ්‍රී ලංකාවේ වැඩිහිටි ඉපැයීම් ආශ්‍රිත ව විෂමතාවක් පවතී. මෙයින් පැහැදිලි වන්නේ ලොව පුරා සෑම රටක ම පාහේ ශීඝ්‍රයෙන් වැඩිහිටි පුරුෂයින්ට සාපේක්ෂ ව ස්ත්‍රීන්ගේ ඉහළ වර්ධනයක් පෙන්වන බවත් ය. කෙසේ නමුත් වැඩිහිටි කාන්තාවන්ගේ ඉපැයීම් පුරුෂයින්ට සාපේක්ෂ ව අවම අගයක පවතී.

## සාහිත්‍ය විමර්ශනය

අධ්‍යයනයේ න්‍යාත්මක පසුබිම සැලකීමේ දී ඉපැයීම් කෙරෙහි බලපාන විවිධ ප්‍රජා, සමාජ, භූගෝල හා ආර්ථික විද්‍යාත්මක සාධක හඳුනා ගෙන තිබේ. මෙහි දී ඉපයීම් ආකාරයන් 02 ක් පූර්ව අධ්‍යයනයන්හි යොදා ගෙන ඇති අතර Salem and Bensidoun (2012); Gunther and Launov (2012) යන අය සාමාන්‍ය ශ්‍රම බලකායෙහි විධිමත් හා අවිධිමත් අංශයන්හි මාසික ඉපැයීම් පැයක ඉපැයීම්වලට වඩා යෝග්‍ය බව තම පර්යේෂණය මගින් සොයා ගෙන ඇත. එසේ ම Qi and Dong (2016) පර්යේෂකයන්ට අනුව පෙන්වා දී ඇත්තේ මාසික වැටුප පදනම් කරගෙන නොව පැයක වැටුප පදනම් කරගෙන ඉපැයීම් සිදු කරන බවයි. ඉපැයීම් සම්බන්ධ ප්‍රධාන ශ්‍රිතයක් ලෙස Jacob Mincer ශ්‍රිතය තුළ ඉපැයීම් කෙරෙහි මානව ප්‍රාග්ධනය ප්‍රධාන සාධකයක් ලෙස හඳුනා ගෙන තිබේ. එහි දී අධ්‍යාපනය හා පළපුරුද්ද යන මානව ප්‍රාග්ධනය ආශ්‍රිත සාධකයන් ඉපැයීම් සඳහා ප්‍රධාන බලපෑමක් ඇති කරන බව (Mincer 1958) විසින් සොයා ගෙන ඇත. මෙයට සමාන අදහසක් ලෙස Turek and Perek-Bialas (2013) පර්යේෂකයන් විසින් මානව ප්‍රාග්ධන ප්‍රවේශයට අනුව ශ්‍රමිකයින්ගේ ඉපැයීම් පාසල් අධ්‍යාපනය හා අනෙකුත් මානව ප්‍රාග්ධන ආයෝජනයන් සඳහා ප්‍රතිචාරී වන අතර එය ජීවන චක්‍ර න්‍යාය සමග සෘජුව ම සම්බන්ධ බව පෙන්වා දී ඇත.

ඉපැයීම් සඳහා මෙතෙක් යොදා ගෙන ඇති ප්‍රජා විද්‍යාත්මක සාධකයන් ලෙස වයස, ස්ත්‍රී පුරුෂභාවය, දරුවන් සිටීම, විවාහක අවිවාහකභාවය යන සාධයන් බලපා ඇති බව පූර්ව අධ්‍යයනයන් මගින් හඳුනා ගෙන තිබේ. Ben-porath (1967) අනුව මානව ප්‍රාග්ධනය මගින් ආයෝජනය වයසට යාමත් සමග අඩු වන නමුත් මධ්‍යම වයස් කාණ්ඩයේ දී මානව ප්‍රාග්ධන සඳහා ආයෝජනය මෙන් ම ඉපැයීම් ද ඉහළ මට්ටමක පවතී. Kozel and Alderman (1990) යන පර්යේෂකයන්ට අනුව විධිමත් අංශයේ සේවකයින් අවුරුදු 44-55 ත් අතර කාලය තුළ උපරිම ඉපැයීම්වලට ළඟාවන අතර අවිධිමත් අංශයේ සේවකයින් වයස අවුරුදු 35 වන විට දී ශ්‍රම බලකායෙන් ඉවත්වන බවත් ය. Avram and Popova (2020) සිදු කරන ලද පර්යේෂණයකට අනුව වයස අවුරුදු 65 ට වැඩි වැඩිහිටියන්ගේ පුද්ගල ආදායම් පරතරය ඉහළ මට්ටමක පවතින බව සොයා ගන්නා ලදී. Nimoh et al. (2020) යන අය අවිධිමත් හා විධිමත් අංශයේ මාසික ඉපැයීම් සඳහා වයසේ වර්ගය තම පර්යේෂණයෙහි සංඛ්‍යාත්මක වශයෙන් වෙසෙසියාත්මක බව පෙන්වා දී ඇත. Heckman and etal (1985) අනුව පළපුරුද්දට වඩා වයස, වයසේ වර්ගය තුළින් ඉපැයීම් ශ්‍රිතය ඇස්තමේන්තුගත කිරීම යෝග්‍ය බව දැක්විය හැකි ය.

Nguyen et al. (2012) යන පර්යේෂකයන්ට අනුව වැඩිහිටි දරුවන්ගේ ඉපැයීම් වැඩිහිටි දෙමාපියන්ගේ ශ්‍රම සැපයුම කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරන බව සොයා ගන්නා ලදී. එයට වෙනස් වූ අදහසක් ලෙස Vodopivec and Arunatilake (2008) තම පර්යේෂණයට අනුව වැඩිහිටි දෙමාපියන්ගේ ශ්‍රම සැපයුම වැඩිහිටි දරුවන්ගේ ආදායම සමග පවතින සම්බන්ධය සෘණාත්මක බව පෙන්වාදී ඇත. ගෘහ කුටුම්භයේ වැඩිහිටි දරුවන් සිටින විට දී වැඩිහිටි කාන්තාවන්ගෙන් බහුතරයක් ඔවුන් මත යැපීම හේතුවෙන් වැඩිහිටි ඉපැයීම් සඳහා ඇති කරන බලපෑම සෘණාත්මක බව (Masud et al., 2008) යන අය විසින් සොයා ඇත. එසේ ම Avram and Popova (2020) කුඩා ළමුන් සිටින විට දී කාන්තා ඉපැයීම් පරතරයට සෘණාත්මක බලපෑමක් ඇති කළ හැකි බව ද දක්වා ඇත. එයට සමාන අදහසක් ලෙස කුඩා දරුවන් සිටින විට දී වැඩිහිටි ඉපැයීම් අවම වන බව (Vangen, 2020) තම පර්යේෂණය මගින් සොයා ගන්නා ලදී.

Masud et al. (2008) අනුව වැඩිහිටි කාන්තාවන් සතුව පවතින්නේ සීමිත ආදායම් ප්‍රමාණයක් බැවින් පැරණි ආදායම ලබා ගත නොහැකි වීම ඉපැයීම් වෙනස් වීම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. එසේ ම කාන්තාවන් හා පුරුෂයින් සමග සංසන්දනය කරන විට දී පුරුෂයින් මහලු වියේ දී පවා ඉහළ ආදායමක් උපයන බව (Masud et al., 2008) තම පර්යේෂණය මගින් අනාවරණය කර ඇත. Qi and Dong (2016) පර්යේෂකයන් විසින් අවුරුදු 15 -64 පුද්ගලයන් යොදා ගනිමින් සිදු කරන ලද පර්යේෂණයට අනුව 74%ක කාන්තා නියෝජනයක් ශ්‍රම බලකාය තුළ පවතින බවත්, එයින් 90% පමණ පිරිසක් පූර්ණ කාලීන ව වැඩ කරන බවත් ය. Polachek (2008) අනුව වැඩිහිටි කාන්තාවන් පිරිමින්ට වඩා අඩුවෙන් ඉපැයීම් සිදු කරන බවත්, කලු ජාතිකයන් සුදු ජාතිකයන්ට සාපේක්ෂ ව අඩුවෙන් ඉපැයීම් සිදු කරන බවත් සොයා ගෙන ඇත. Senanayaka and Kumara (2012) පර්යේෂණයකට අනුව පෙන්වා දී ඇත්තේ විවාහක වැඩිහිටියන්ගේ සේවා නියුක්තිය ඉහළ බවත් ය. ඒ අනුව මෙම අධ්‍යයනයට අදාළ පළමු වෛකල්පිත කල්පිතය පහත පරිදි පෙන්නුම් කළ හැකි ය.

**වෛකල්පිත කල්පිතය 1 ($H_1$): වයස්ගත ස්ත්‍රී හා පුරුෂයින්ගේ ඉපැයීම් හා ප්‍රජා විද්‍යාත්මක සාධක අතර සම්බන්ධයක් පවතී.**

සමාජ විද්‍යාත්මක සාධකයන් සැලකීමේ දී අධ්‍යාපනය, රැකියා පුහුණුව යන සාධකයන් වැඩිහිටි ඉපැයීම් සඳහා බලපා ඇති බව පූර්ව අධ්‍යයනයන් මගින් හඳුනා ගෙන


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

තිබේ. ඒ අනුව Sienaert (2008) පර්යේෂණය මගින් පෙන්වා දී ඇත්තේ වැඩිහිටි ස්ත්‍රී පුරුෂ ඉපැයීම් හා අධ්‍යාපනය අතර ධනාත්මක සම්බන්ධයක් පවතින බවයි. Alam and Mitra (2012) අවම වශයෙන් මධ්‍යම අධ්‍යාපනයක් හෝ ලබා ඇති වැඩිහිටියන් අනෙක් අයට සාපේක්ෂ ව රැකියාවක් ලබා ගැනීමට ඉහළ ප්‍රගතියක් පවතින බවයි. කාන්තාවන්ගේ ඉපැයීම් හා අධ්‍යාපනය අතර අනන්‍යය සම්බන්ධයක් පැවතිය ද පුරුෂයින්ගේ ඉපැයීම් හා අධ්‍යාපනය අතර සම්බන්ධය නම්‍ය බව (Kingdon and S derbom, 2007) යන අය විසින් සොයා ගෙන ඇත. Blau and Goodstein (2007) වැඩිහිටි ඉපැයීම්, අධ්‍යාපන සංයුතිය ශ්‍රම බලකා සහභාගීත්වය සඳහා සැලකිය යුතු බලපෑමක් සිදු කරන බවත් ය. Paraponaris et al. (2012) යන අය සිදු කරන ලද පර්යේෂණයකට අනුව උපාධිධාරී නොවන වැඩිහිටියන් අවිධිමත් අංශයේ රැකියාවන්හි නිරත වීම හේතුවෙන් ඉපැයීම් අවම බව පෙන්වා දී ඇත. ඉහළ අධ්‍යාපනය ලැබූ වැඩිහිටියන් විධිමත් අංශයේ රැකියාවක නියැළීමට අවස්ථාවක් පවතින බව (Paraponaris et al., 2012) යන අය විසින් සොයා ගන්නා ලදී.

සමාජ ආර්ථික තත්ත්වය සහ පවුල් ව්‍යුහය ඉපැයීම් සඳහා සැලකිය යුතු බලපෑමක් සිදු කරන බව (Raymo et al., 2004) යන පර්යේෂකයන් විසින් පෙන්වා දී ඇත. තව ද Walker (1990) රැකියා අඛණ්ඩතාව සඳහා පුහුණුව වැදගත් වන බවත් පෙන්වා දී ඇත. Turek and Perek-Bialas (2013) පෙන්වා දී ඇත්තේ පැරණි ශ්‍රමයට වඩා නූතන ශ්‍රමය වෙනස් බැවින් යාවත්කාලීන කර ගැනීම සඳහා අත්දැකීම් වැදගත් වන බව ය. ඒ අනුව මෙම අධ්‍යයනයට අදාළ දෙවන වෛකල්පිත කල්පිතය පහත පරිදි පෙන්නුම් කළ හැකි ය.

**වෛකල්පිත කල්පිතය 2 ($H_2$): වයස්ගත ස්ත්‍රී හා පුරුෂයින්ගේ ඉපැයීම් හා සමාජ විද්‍යාත්මක සාධක අතර සම්බන්ධයක් පවතී.**

භූගෝල විද්‍යාත්මක සාධකයන් ලෙස ජීවත් ව සිටින ප්‍රදේශය හා පළාත ද ආර්ථික සාධකයන් ලෙස ශ්‍රම නොවන ආදායම, සේවා නියුක්ති ස්වභාවය, සේවා නියුක්ත අංශයන් වැඩිහිටි ඉපැයීම් සඳහා බලපා ඇති බව පූර්ව අධ්‍යයනයන් මගින් හඳුනා ගෙන තිබේ. නාගරික ප්‍රදේශ හා සැසඳීමේ දී ග්‍රාමීය ව ජීවත්වන වැඩිහිටියන්ගේ ආර්ථික අවදානම ඉහළ මට්ටමක පවතින බව (Rubb, 2003) පෙන්වා දී ඇත. Wu et al. (2020) අනුව වයස අවුරුදු 16-64 වයස්වල සිටින පුරුෂයින් සතියකට පැය 60කට වඩා වැඩ කරන බවත් නාගරික ප්‍රදේශවල ජීවත්වන පුරුෂයින්ගේ ඉපැයීම් කාන්තාවනගේ ඉපැයීම්වලට සාපේක්ෂ ව සැලකිය යුතු වෙනසක් ඇති කිරීමට හේතුවන බවත් (Wu et al., 2020) යන පර්යේෂකයන් විසින් සොයා ගෙන ඇත.

Avram and Popova (2020) සාමාන්‍ය ශ්‍රම බලකායෙහි ශ්‍රම නොවන ආදායම් පුරුෂයින්ගේ ශ්‍රම සැපයුම හා ඉපැයීම් සඳහා සෘණාත්මක ව බලපාන බව සොයා ගෙන ඇත. Nguyen et al. (2012) එසේ ම ශ්‍රම නොවන ආදායම් වැඩිහිටි ඉපැයීම් සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති නොකරන බවයි. වැඩිහිටි කාන්තාවන්ගෙන් 39 ක් දරුවන්ගේ ආදායම්, වෙනත් ආදායම් මත යැපෙන බැවින් වැඩිහිටි ඉපැයීම් සඳහා සෘණාත්මක ව බලපාන බව (Masud et al., 2008) සොයා ගෙන ඇත. Masud et al. (2008) පුරුෂයින්ගෙන් 70% ක් හා කාන්තාවන් 37% පූර්ණ කාලීන රැකියාවන්හි නිරත බව හඳුනා ගෙන ඇත. Ghosh (2019) අනුව පෙන්වා දී ඇත්තේ තේරීම් මත පදනම් වූ පුද්ගල සහභාගිත්වයේ දී පුද්ගලයන් රැකියාවක් සඳහා අනුගත වන්නේ ප්‍රශස්ත ලෙස ප්‍රතිලාභ ලැබේ නම් පමණි. අපේක්ෂිත ඉපැයීම් සැක සහිත වන විට දී වැඩ කිරීමට පවතින නැඹුරුව අවම බව (Ghosh, 2019) විසින් සොයා ගෙන ඇත.

Rubb (2003) අනුව වැඩිහිටි කාන්තාවන් මෙන් ම පුරුෂයින් ද කෘෂිකාර්මික හා සේවා අංශයේ සේවා නියුක්ත වීමෙන් ඉපැයීම් ඉහළ යා හැකි බව පෙන්වා දී ඇත. එසේ ම නාගරික අංශයේ ඇතැම් වෙළෙඳපොළ රැකියා අවස්ථාවන්වල දී සේවායෝජකයින් විසින් වැඩිහිටි සේවකයින් සඳහා ප්‍රවාහන ගාස්තු ගෙවීමක් සිදු කරන බව (Rubb, 2003) තම පර්යේෂණයට අනුව පෙන්වා දී ඇත.

Graf et al. (2011) කර්මාන්ත ව්‍යුහය මත පදනම් ව නිෂ්පාදන හා වෙළෙඳ ශ්‍රමිකයින්ගේ වැඩිහිටි ශ්‍රමයෙහි ඉහළ නියෝජනයක් ඇති කරන බව දක්වා ඇත. Alam and Mitra (2012) යන පර්යේෂකයන්ට අනුව අවම වශයෙන් මධ්‍යම අධ්‍යාපනයක් ලබා ඇති වැඩිහිටියන් නූගත් අයට සාපේක්ෂ ව ස්වයං රැකියාවක් කිරීම සඳහා විශාල ප්‍රවණතාවක් පවතින බව දක්වා ඇත. ඒ අනුව මෙම අධ්‍යයනයට අදාළ තුන්වන වෛකල්පිත කල්පිතය පහත පරිදි පෙන්නුම් කළ හැකි ය.

**වෛකල්පිත කල්පිතය 3 ($H_3$): වයස්ගත ස්ත්‍රී හා පුරුෂයින්ගේ ඉපැයීම් හා ආර්ථික,භූගෝල විද්‍යාත්මක සාධක අතර සම්බන්ධයක් පවතී.**

## අධ්‍යයනයේ අරමුණ

ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් ව ශ්‍රී ලංකාවේ වැඩිහිටි ශ්‍රමිකයින්ගේ ඉපැයීම් සඳහා බලපාන සාධක පිළිබඳ සංසන්දනාත්මක ව අධ්‍යයනය.


## පර්යේෂණ ගැටලුව

වැඩිහිටි පුද්ගලයින්ගේ ඉපැයීම් තීරණය වීමට බලපාන ප්‍රධාන සාධක මොනවා ද? මෙම සාධක ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙනස් වන්නේ කෙසේ ද? යන්න ශ්‍රී ලංකාවෙහි ජීවත්වන වැඩිහිටියන් ආශ්‍රිත ව අධ්‍යයනයක් සිදු කිරීමෙන් ඔවුන් අතර පවතින ඉපැයීම් විෂමතාවන් හඳුනා ගැනීම.

## අධ්‍යයනයේ වැදගත්කම

ආයු අපේක්ෂාව ඉහළ යාමත් සමග වැඩිහිටි ජනගහනය ශ්‍රී ලංකාවේ ශීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් පතුළ බරැති ජනගහන පිරමීඩයක හැඩයක් ගෙන ඇත. මෙම හේතුව නිසා වැඩිහිටියන් ආශ්‍රිත ව සේවා නියුක්ත අවස්ථාවන් වැඩි දියුණු කිරීම වැදගත් වේ. එසේ ම ඔවුන්ගේ ඉපැයීම්


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය




**රූපසටහන් අංක 1:** වැඩිහිටි ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් ව වැඩිහිටි පැයක සාමාන්‍ය ඉපැයීම් (රුපියල්)

මූලාශ්‍රය - LFS සූක්ෂම දත්ත සමීක්ෂණය, 2018

වර්ධනය කර ගැනීමට අවශ්‍ය වෙළෙඳපොළ යාන්ත්‍රණය සවිබල ගැන්වීම ද වැදගත් ය. එමගින් ඉහළ යන වැඩිහිටි ජනගහනය නිසා ආර්ථිකයට මෙන් ම සමාජීය වශයෙන් සිදු වන බලපෑම අවම කර ගැනීමට හැකියාවක් පවතී. මෙම පර්යේෂණය මගින් ප්‍රධාන වශයෙන් සේවා නියුක්ත ව සිටින වැඩිහිටියන්ගේ පැයක ඉපැයීම් තීරණය වීමට බලපානු ලබන සාධකයන් පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කර ඇත.

## ක්‍රමවේදය

ද්විතීයික දත්ත සැපයීමේ මූලාශ්‍රය ලෙස 2018 ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණය යොදා ගත් අතර, මෙය ප්‍රායෝගික ප්‍රශ්නයකට පිළිතුරු සපයන බැවින් ප්‍රායෝගික පර්යේෂණයක් ද වේ. එසේ ම ශ්‍රී ලංකාවෙහි ජීවත් ව සිටින 60ට වැඩි වැඩිහිටි සේවා නියුක්ත පිරිස සංගහනය ලෙසත්, එම පිරිස අතරින් සේවා නියුක්ත ව සිටින වැඩිහිටියන් 3911ක් නියැදිය ලෙස යොදා ගෙන ඇත. එහි දී විශේෂ අධ්‍යාපනය ලබන පුද්ගලයින් තිදෙනෙකු ඉවත් කිරීමට සිදු වූයේ අධ්‍යාපනය ලැබූ වසර ගණන නිශ්චිත ව සඳහන් නොවීම හේතුවෙනි. වැඩිහිටි ඉපැයීම් නිර්ණය කිරීම සඳහා Semi Log ආකෘතියේ දී අඛණ්ඩ දත්ත හා පඹ විචල්‍යයන් විශ්ලේෂණයන් සඳහා යොදා ගනු ලබයි. දත්ත විශ්ලේෂණය සඳහා STATA/MP 13 (64-bit) යන මෘදුකාංගය යොදා ගෙන ඇත.

$$ln\ y = \beta_0 + \beta_1 x_i + \epsilon$$

$$ln\ y = \beta_0 + \beta_1 x_1 + \beta_2 x_2 + \beta_3 x_3 + \beta_4 x_4 + \beta_5 D_{1-3} + \beta_6 D_4 + \beta_7 D_{5-6} + \beta_8 D_{7-9} + \epsilon$$

මෙම Semi Log ප්‍රතිපායනයේ දී වයස, වයසේ වර්ගය, ගෘහ කුටුම්භයේ සිටින සාමාජික සංඛ්‍යාව, අධ්‍යාපනය ලැබූ වසර සංඛ්‍යාව අඛණ්ඩ දත්තයන් ලෙස යොදා ගන්නා ලදී. ස්ත්‍රී පුරුෂභාවය, ගෘහ කුටුම්භය තුළ ළමුන් සිටීම, විවාහක අවිවාහකභාවය, වෘත්තීය පුහුණුව, ජීවත්වන ප්‍රදේශය හා පළාත, සේවා නියුක්ති ස්වභාවය හා රැකියාව, විශ්‍රාම වැටුප යන්න පඹ විචල්‍යයන් ලෙසත් පෙන්වා දී ඇත.

## දත්ත විශ්ලේෂණය

වැඩිහිටි සේවා නියුක්ත පිරිස පමණක් තෝරා ගනිමින් ඔවුන්ගේ ඉපැයීම්වල වෙනස් වීම ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙනස් වන ආකාරය පිළිබඳ ව සංසන්දනාත්මක ව ඉදිරිපත් කිරීම සඳහා semi log ප්‍රතිපායන ආකෘතිය යොදා ගන්නා ලදී. එහි දී වැඩිහිටි සේවා නියුක්ත කාන්තාවන් 1136 හා පුරුෂයින් 2775ක නියැදි ප්‍රමාණයක් මෙම පර්යේෂණය සඳහා යොදා ගන්නා ලදී. තව ද විස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණයක් ද සිදු කර ඇත.

රූප සටහන 01 අනුව වැඩිහිටි කාන්තාවන්ට සාපේක්ෂ ව පුරුෂයින්ගේ සාමාන්‍ය පැයක ඉපැයීම්වල (රුපියල් 188) වර්ධනයක් මෙමගින් පෙන්නුම් කරයි. එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ කාන්තාවන්ට සපේක්ෂ ව පුරුෂයින්ට පවතින රැකියා අවස්ථාවන්හි වර්ධනය හා ඉපැයීම් බහුල වීමත් ය. එනම් උදාහරණ ලෙස වැඩිහිටි පුරුෂයින් වඩු කාර්මික, පෙදෙරේරුවන්, වාණිජ විකුණුම් නියෝජිතයන් වැනි රැකියාවන්හි නියැළීම හේතුවෙන් ඔවුන්ගේ පැයක සාමාන්‍ය ඉපැයීම් මෙසේ ඉහළ මට්ටමක පැවතිය හැකි ය. නමුත් වැඩිහිටි කාන්තාවන් ඇඳුම් මැසීම හා සැකසීම, හෝටල් පිරිසිදු කිරීම වැනි රැකියාවන්හි නියැළීම හේතුවෙන් මෙසේ පැයක සාමාන්‍ය ඉපැයීම් අවම වීමට හේතු වී ඇත.

වගු අංක 1 ට අනුව තාක්ෂණික ශිල්පීන් (technician) ලෙස රැකියාවක් කරනු ලබන වැඩිහිටි පුරුෂයින්ගේ මෙන් ම කාන්තාවන්ගේ පැයක ඉපැයීම් ඉහළ මට්ටමක පවතින බව මෙයින් පෙන්වා දිය හැකි ය. වාණිජ හා විකුණුම්


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වගුව 1: වැඩිහිටි ශ්‍රමිකයින් සේවා නියුක්තව සිටින රැකියා කාණ්ඩයන් අනුව පැයක සාමාන්‍ය ඉපැයීම් ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් ව සංසන්දනය :පැයක සාමාන්‍ය ඉපැයීම් රුපියල්

| | වැඩිහිටියන් | | |
|---|---|---|---|
| රැකියාවේ ස්වභාවය | සමස්ත | පුරුෂයින් | කාන්තාවන් |
| කළමනාකරුවන් | 364 | 414 | 153 |
| වෘත්තිකයන් | 286 | 292 | 277 |
| තාක්ෂණික ශිල්පීන් | 434 | 495 | 156 |
| ලිපිකරු | 134 | 139 | 64 |
| සේවා අංශයේ රැකියාවක් කරන්නෙකු | 106 | 120 | 65 |
| කෘෂිකාර්මික අංශයේ රැකියාවක් කරන්නෙකු | 105 | 113 | 75 |
| නිෂ්පාදන අංශයේ රැකියාවක් කරන්නෙකු | 126 | 152 | 58 |
| කම්කරුවන් | 141 | 205 | 56 |
| හමුදා සහ හඳුනා නොගත් රැකියාවක් කිරීම | 60 | 70 | 30 |

මූලාශ්‍රය: LFS සුක්ෂම දත්ත සමීක්ෂණය, 2018

නියෝජිතයන්, යාන්ත්‍රික ඉංජිනේරු, ගිලන් රථ සේවකයින්, බලශක්ති නිෂ්පාදන යාන්ත්‍රාගාර ක්‍රියාකරුවන් වැනි රැකියාවන්හි නියැළීම හේතුවෙන් වැඩිහිටි පුරුෂයින්ගේ පැයක ඉපැයීම් කාන්තාවන්ට සාපේක්ෂ ව මෙසේ වර්ධනයක් පෙන්නුම් කරයි. එසේ ම හමුදා සහ හඳුනා නොගත් අංශයේ රැකියාවන් ලෙස ස්ථිර වගාවන්හි නිරත වන එනම් රබුටන්, කටු පොල් වැනි වගා කටයුතු ද ස්ථිර නොවන රැකියාවන් වන ධාන්‍ය, වී, එළවළු වගාවන්හි නිරත වීමත්, සත්ත්ව නිෂ්පාදන, මිශ්‍ර භෝග වගාව, දර එක් රැස් කිරීම, හතු වර්ග නිෂ්පාදනය වැනි වර්ග නොකළ අංශයන්හි වැඩිහිටි කාන්තාවන් (රුපියල් 30) හා පුරුෂයිනගේ (රුපියල් 80) පැයක සාමාන්‍ය ඉපැයීම් මෙසේ පහළ යාමක් සිදු ව ඇත. සෑම රැකියා කාණ්ඩයක ම පුරුෂයින්ට සාපේක්ෂ ව කාන්තාවන්ගේ පැයක ඉපැයීම් අවම අගයක පවතින බව මෙසේ පෙන්නුම් කළ හැකි ය.

නාගරික නොවන එනම් වතු හා ග්‍රාමීය අංශයේ ජීවත්වන වැඩිහිටි කාන්තාවන් මෙන් ම පුරුෂයින්ගේ ඉපැයීම්වල වර්ධනයක් පෙන්නුම් කරයි. නමුත් නාගරික ව ජීවත්වන වැඩිහිටි කාන්තාවන්ට සාපේක්ෂ ව පුරුෂයින්ගේ පැයක සාමාන්‍ය ඉපැයීම් (රුපියල් 503) ඉහළ අගයක පවතී. නාගරික අංශයේ පවතින රැකියා විවිධාංගීකරණය, සේවා නියුක්ත වැඩිහිටියන්ට අවශ්‍ය පහසුකම් පැවතීමත් මත නාගරික කාන්තා මෙන් ම පුරුෂයින්ගේ සාමාන්‍ය පැයක ඉපැයීම්වල මෙසේ වර්ධනයක් සිදු වීමට හේතු වී ඇත. ග්‍රාමීය හා වතු අංශයේ ජීවත්වන වැඩිහිටියන් අඩු ඉපැයීම් සහිත රැකියාවන් වන තේ දලු නෙලීම, එළවළු හා ක්ෂේත්‍ර භෝග වගාවන්හි නියැළීම මෙසේ අඩු වීමට හේතු විය හැකි ය. අවුරුදු 16-64 වයස්වල සිටින පුරුෂයින් සතියකට පැය 60ට වඩා සේවා නියුක්ත වීම හේතුවෙන් නාගරික ප්‍රදේශවල ජීවත්වන පුරුෂයින්ගේ ඉපැයීම් කාන්තාවන්ට සාපේක්ෂ ව සැලකිය යුතු වෙනසක් පවතින බව (Wu et al., 2020) යන පර්යේෂකයන් විසින් පෙන්වා දී ඇත.

1%, 5%, 10% යන වෙසෙසියා මට්ටම් යටතේ ඉපැයීම් සඳහා බලපාන සාධක සංඛ්‍යාත්මක වශයෙන් වෙසෙසියාත්මක වේ.

මෙහි දී පදනම් කාණ්ඩය ලෙස විවාහක කාන්තාවක් වන ගෘහ කුටුම්භය තුළ ළමුන් නොසිටින, නාගරික බස්නාහිර පළාත තුළ ජීවත් වන, වෘත්තිය පුහුණුවක් සහිත, විශ්‍රාම වැටුපක් හිමි, පුහුණු සේවකයකු මෙහි දී semi log ආකෘතියේ අඛණ්ඩ දත්තයන්ගේ සංගුණක අගය පහත ආකාරයට සකසා ගනිමින් විස්තර කර ඇත.


$$e^{0.2749} = 1.3164 - 1 = 0.3164 \times 100 = 31.64\%$$

සේවා නියුක්ත වැඩිහිටි 60ට වැඩි පිරිස පමණක් යොදා ගනිමින් 'semi log' ප්‍රතිපායන ආකෘතිය තුළින් සමස්ත හා වැඩිහිටි ස්ත්‍රී හා පුරුෂභාවයමත ඉපැයීම් වෙනස් වීම සඳහා බලපාන සාධකයන් සංසන්දනාත්මක ආකාරයට ඉදිරිපත් කිරීමක් සිදු කර ඇත.

කුටුම්භය තුළ ළමුන් නොමැති වීමට සාපේක්ෂ ව වයස අවුරුදු 6ට අඩු ළමුන් ගෘහ කුටුම්භය තුළ වැඩි වන විට දී රැකියාවක් කිරීම සඳහා වැඩිහිටියන් පෙළඹවීමක් ඇති නොවීම මත වැඩිහිටි කාන්තාවන්ගේ ඉපැයීම් සඳහා ඇති කරන බලපෑම සෘණාත්මක වේ. නමුත් පුරුෂයින්ගේ ඉපැයීම් සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති නොකරයි. Vangen (2020) අනුව කාර්යබහුල ජන සමාජයක් වීම හේතුවෙන් මුණුබුරන් සහ මිණිබිරියන් බලා ගැනීමට සිදු වීම නිසා ඔවුන්ට රැකියා කිරීමට පවතින නිදහස සීමා වීම මත කුඩා දරුවන් සිටින විට දී ඉපැයීම් අවම වන බව තම පර්යේෂණයට අනුව පෙන්වා දී ඇත. තව ද Avram and Popova (2020) යන පර්යේෂකයන් විසින් ද පෙන්වා දී ඇත්තේ කුඩා ළමුන් සිටින විට දී කාන්තා ඉපැයීම් පරතරය සඳහා සෘණාත්මක බලපෑමක් ඇති කළ හැකි බවත් ය. මෙය 2018 ශ්‍රම බලකා සමීක්ෂණ වාර්තාවෙහි ලැබෙන ප්‍රතිඵලයන්ට සමාන අදහසකි.

වැඩිහිටි පුරුෂයෙකු වීම මත ඉපැයීම් සඳහා ධනාත්මක බලපෑමක් ඇති කරනු ලැබේ. වැඩිහිටි කාන්තාවන්ට සාපේක්ෂ ව වැඩිහිටි පුරුෂයකු වීම හේතුවෙන් ඔවුන්ගේ මාසික ඉපැයීම්වල වර්ධනයක් පෙන්වයි. මෙසේ ඉපැයීම් ඉහළ මට්ටමක පැවතීමට ප්‍රධාන වශයෙන් හේතු වනුයේ


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය




**රූපසටහන් අංක 2:** වැඩිහිටියන් ජීවත්ව සිටින ප්‍රදේශය අනුව පැයක සාමාන්‍ය ඉපැයීම් ස්ත්‍රී පුරුෂභාවය මත පදනම්ව සංසන්දනය. (පැයක සාමාන්‍ය ඉපැයීම් රුපියල්)

මූලාශ්‍රය - LFS සුක්ෂම දත්ත සමීක්ෂණය, 2018

වයස්ගත කාන්තාවන්ට සාපේක්ෂ ව වැඩි ඉපයීම් සහිත රැකියා අවස්ථාවන් පැවතීමයි. උදාහරණ ලෙස වඩු කාර්මික හා ලී බඩු සාදන්නන්, පෙදෙරේරුවන්, වාණිජ හා විකුණුම් නියෝජිතයන්, වෙළෙඳාම පිණිස තේ හා වී වගාවන්හි නියැළීම දක්විය හැකි ය. වැඩිහිටි කාන්තාවන්ට පවතින රැකියාවන් ලෙස ඇඳුම් මැසීම, ඇඳුම් සැකසීම් හා හෝටල් වෙනත් ආයතන පිරිසිදු කරන්නන්, වතු ආශ්‍රිත ව ජීවත්වන කාන්තාවන් තේ දලු නෙලීම, දුම්කොළ පිළියෙළ කිරීම හා ඒ ආශ්‍රිත නිෂ්පාදන වැනි අවම වැටුපක් ලැබෙන රැකියාවන්හි නිරත වීමක් දැකිය හැකි ය. මෙසේ අවම ආදායම් සහිත රැකියාවන්හි නිරත වීම හේතුවෙන් කාන්තාවන්ගේ ඉපැයීම්වල මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කරයි. Kottutt and etal (2020) පර්යේෂකයන් විසින් පෙන්වා දී ඇත්තේ ස්ත්‍රී පුරුෂභාවය ධනාත්මක ලෙසින් වයස්ගත ඉපැයීම්වලට බලපාන බවත් ය. Masud et al. (2008) පර්යේෂණයේ $p = 0.042$ වීම මගින් ස්ත්‍රී-පුරුෂභාවය සංඛ්‍යාත්මක වශයෙන් වෙසෙසියාත්මක බව පෙන්වා දී ඇත. මෙය 2018 ශ්‍රම බලකා සමීක්ෂණ වාර්තාවෙහි ලැබෙන ප්‍රතිඵලයන්ට සමාන අදහසකි.

අධ්‍යාපනය ලැබූ වසර ගණන වැඩිහිටි ඉපැයීම් තීරණය වීම සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ලබයි. මෙහි දී පාසල් යන වසර ගණන වැඩි වීමත් සමග වැඩිහිටි පුරුෂයින්ගේ (2.75%) හා කාන්තාවන්ගේ (2.5%) පැයක ඉපැයීම්වල වර්ධනය වීමක් පෙන්නුම් කරනු ලැබේ. වැඩිහිටි කාන්තාවන්ට සාපේක්ෂ ව පුරුෂයින්ගේ අධ්‍යාපනය ඉහළ යාමත් සමග ඉපැයීම්වල වර්ධනයක් පෙන්නුම් කරයි. එහි දී සාම්ප්‍රදායික රැකියාවලින් බැහැර ව වැඩි ඉපැයීම් සහිත රැකියාවන්හි නියැළීමට හැකියාවක් පැවතීම, වැඩිහිටි පුරුෂයින් සඳහා පවතින අධ්‍යාපන ආයතන ප්‍රමාණය ද කාන්තාවන්ට සපේක්ෂ ව වැඩි වීම පෙන්වා දිය හැකි ය. නමුත් ඉහළ අධ්‍යාපනයක් සහිත වැඩිහිටි කාන්තාවන් සාප්පු කළමනාකරණ වැනි රැකියාවන්හි නියැළීම සහ පුරුෂයින්ට සාපේක්ෂ ව ආයු කාලය ඉහළ මට්ටමක පැවතීම මත වැඩිහිටි කාන්තාවන්ගේ සේවා නියුක්තියේ ඉහළ යාමක් පෙන්නුම් කරයි. 2018 ශ්‍රම බලකා සමීක්ෂණ වාර්තාවෙහි ලැබෙන ප්‍රතිඵලයන්ට සමාන අදහසක් ලෙස Alam and Mitra (2012) අවම වශයෙන් මධ්‍යම අධ්‍යාපනයක් හෝ ලබා ඇති වැඩිහිටියන් අනෙක් අයට සාපේක්ෂ ව රැකියාවක් ලබා ගැනීමට ඉහළ ප්‍රගතියක් පවතින බවත් ය. තව ද කාන්තාවන්ගේ ඉපැයීම් හා අධ්‍යාපනය අතර අනන්‍යය සම්බන්ධයක් පැවතිය ද පුරුෂයින්ගේ ඉපැයීම් හා අධ්‍යාපනය අතර සම්බන්ධය නම්‍ය බව (Kingdon and S derbom, 2007) යන අය විසින් සොයා ගෙන ඇත.

පුහුණුවක් ඇති වැඩිහිටියන්ට සාපේක්ෂ ව පුහුණුවක් නොමැති වැඩිහිටියන්ගේ ඉපැයීම් සඳහා ඇති කරනු ලබන බලපෑම සෘණාත්මක වේ. වර්තමාන රැකියා අවස්ථාවන්ගෙන් බොහොමයක් පුහුණුව මත රඳා පවතී. එසේ ම දීර්ඝ කාලීන ව එක ම රැකියාවක නියැළීම හේතුවෙන් වැඩිහිටි කාන්තාවන්ගේ ඉපැයීම් පුරුෂයින්ට සාපේක්ෂ ව අවම අගයක් ගෙන ඇත. වැඩිහිටි කාන්තාවන් හා පුරුෂයින් බොහෝමයක් අවිධිමත් අංශයේ රැකියාවන් ලෙස තේ දලු නෙලීම, ක්ෂේත්‍ර භෝග හා එළවළු වගා කිරීම, ගෘහස්ථ හා හෝටල් පිරිසිදු කිරීම හා වී ගොවිතැන් වැනි රැකියාවන් සිදු කිරීම මෙලෙස ඉපැයීම් අඩුවීමට හේතු වී ඇත. නමුත් එම රැකියාවන් සඳහා පුහුණුවක් තිබීම අවශ්‍ය නොවීම, සේවා නියුක්තවන පැය ගණන වැඩි වුව ද ශ්‍රමය සුරා කෑමක් සිදුවන බැවින් මෙසේ ඉපැයීම්වල අඩුවක් පෙන්නුම් කෙරේ. Walker (1990) පර්යේෂණයට අනුව


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වගුව 2: වැඩිහිටි ඉපැයීම් සඳහා වන semi log ප්‍රතිපායන ආකෘතිය

| | සමස්ත N=3911 | | පුරුෂ N=2775 | | කාන්තාවන් N=1136 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපායන ආකෘතිය 01 | | ප්‍රතිපායන ආකෘතිය 02 | | ප්‍රතිපායන ආකෘතිය 03 | |
| වයස ($X_1$) | -0.0346 | 0.519 | -0.0369 | 0.568 | -0.0519 | 0.582 |
| වයස වර්ගය ($X_2$) | 0.0002 | 0.589 | 0.0002 | 0.668 | 0.0004 | 0.53 |
| කුටුම්භයේ සිටින ($X_3$) සාමාජික සංඛ්‍යාව | 0.0013 | 0.912 | -0.0057 | 0.694 | 0.023 | 0.254 |
| අධ්‍යාපනය ලැබූ වසර සංඛ්‍යාව ($X_4$) | 0.0275 | 0.000**** | 0.0272 | 0.000**** | 0.0251 | 0.000**** |
| **පඹ විචල්‍යයන්** | | | | | | |
| ස්ත්‍රී-පුරුෂභාවය | | | | | | |
| පුරුෂයකු වීම ($D_1$) | 0.2749 | 0.000**** | | | | |
| කුටුම්භයේ සිටින ($D_2$) ළමුන් | | | | | | |
| අවුරුදු 6ට අඩු ළමුන් | -0.2067 | 0.016** | -0.1454 | 0.174 | -0.3497 | 0.015** |
| අවුරුදු 6-17 අතර ළමුන් | 0.0329 | 0.411 | 0.0408 | 0.4 | 0.0196 | 0.784 |
| අවුරුදු 18ට වැඩි ළමුන් | 0.0185 | 0.448 | 0.0271 | 0.342 | -0.0279 | 0.553 |
| විවාහක-අවිවාහකභාවය ($D_3$) | | | | | | |
| විවාහක නොවන | 0.0953 | 0.227 | 0.1119 | 0.335 | 0.0776 | 0.454 |
| වෘත්තීය පුහුණුව ($D_4$) | | | | | | |
| වෘත්තීය පුහුණුවක් නොමැති | -0.3495 | 0.000**** | -0.2567 | 0.021** | -0.6061 | 0.000**** |
| ජීවත්වන පළාත හා ප්‍රදේශය | | | | | | |
| නාගරික නොවන ($D_5$) | -0.1761 | 0.000**** | -0.1505 | 0.008**** | -0.2327 | 0.011** |
| බස්නාහිර නොවන ($D_6$) | -0.1572 | 0.000**** | -0.1769 | 0.000**** | -0.1159 | 0.10* |
| සේවා නියුක්ති ස්වභාවය ($D_7$) | | | | | | |
| සේවා යෝජකයින් | 0.8193 | 0.000**** | 0.8249 | 0.000**** | 0.7459 | 0.004**** |
| ස්වයං සේවකයින් | -0.3015 | 0.000**** | -0.3384 | 0.000**** | -0.0843 | 0.374 |
| පවුලේ ගිණුම් කටයුතුවල නියැලෙනන් | 2.361 | 0.000**** | 2.1782 | 0.000**** | 2.4962 | 0.000**** |
| රැකියාව ($D_8$) | | | | | | |
| කළමනාකරුවන් සහ වෘත්තිකයන් | 0.2294 | 0.001**** | 0.2579 | 0.001**** | 0.1043 | 0.421 |
| කෘෂිකාර්මික සේවකයින් | -0.008 | 0.885 | -0.0254 | 0.705 | 0.0389 | 0.709 |
| නිෂ්පාදන ශ්‍රමිකයින් | 0.0608 | 0.289 | 0.2049 | 0.002**** | -0.3691 | 0.001**** |
| කාර්මික සේවකයින් | -0.0084 | 0.881 | -0.0123 | 0.857 | -0.0239 | 0.813 |
| විශ්‍රාම වැටුප් ($D_9$) | | | | | | |
| විශ්‍රාම වැටුප් නොවන | -0.1823 | 0.001**** | -0.1996 | 0.002**** | -0.0775 | 418 |
| අන්තඃඛණ්ඩය | -0.7521 | 0.683 | -0.3703 | 0.868 | -0.3784 | 0.907 |

මූලාශ්‍රය: LFS සුක්ෂම දත්ත සමීක්ෂණය, 2018

පෙන්වා දී ඇත්තේ රැකියාවේ අඛණ්ඩතාවය රැකියා පුහුණුව වැදගත් වන බවත් ය.

නාගරික නොවන එනම්, ග්‍රාමීය හා වතු ආශ්‍රිත ව ජීවත්වන වැඩිහිටි ස්ත්‍රී හා පුරුෂයින් වෙන් ව ගන්නා විට දී ඉපැයීම් සඳහා ඇති කරනු ලබන බලපෑම සෘණාත්මක වේ. වගු අංක 02 අනුව වැඩිහිටි පුරුෂයින්ට සාපේක්ෂ ව ස්ත්‍රීන්ගේ ඉපැයීම්වල මන්දගාමීභාවය ඉහළ මට්ටමක පවතී. නාගරික නොවන ප්‍රදේශයන්හි රැකියාවන්වල විවිධාංගීකරණයක් සිදු නොවීම, ග්‍රාමීය හා වතු ආශ්‍රිත ව ජීවත්වන වැඩිහිටියන්


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කාලයත් සමග එක ම රැකියාවක නියැළීමට සිදු වීම නිසා ඔවුන් තව දුරටත් එම රැකියාව තුළ නියැළීමට අකමැති වීම සහ වෙහෙසකරභාවය ද මෙසේ ඉපැයීම් අඩු වීමට හේතුවන බව ය. තව ද අවිධිමත් අංශයේ රැකියාවන්හි නිරත වීමට සිදු වීම මත වැඩිහිටියන්ට අවශ්‍ය පහසුකම් නොමැති වීමත් බොහෝ අවස්ථාවන්වල දී අවිධිමත් අංශයේ ශ්‍රමය සූරා කෑමක් සිදු වීමත් මෙසේ ඉපැයීම් අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය හැකි ය. වතු ආශ්‍රිත ව ජීවත්වන කාන්තාවන් තේ දලු නෙළීම වැනි කටයුතුවල දීර්ඝ කාලීන ව නිරත වීම නිසා වයස්ගත වීමත් සමග ඔවුන් තව දුරටත් පෙර වැඩ කරන ලද පැය ගණන වැඩ කිරීමට අකමැති වීම වැනි හේතු මත පදනම් ව ඉපැයීම් අවම වීමක් දැකිය හැකි ය. Khan et al. (1985) දී පැයක වැටුප අවිධිමත් අංශයට සාපේක්ෂ ව විධිමත් අංශයේ ඉහළ යාම හේතුවෙන් ඉපැයීම්වල විශාල වෙනසක් ඇති බව තම පර්යේෂණය මගින් පෙන්වා දී ඇත.

වැඩිහිටි ඉපැයීම් සඳහා ඔවුන් ජීවත් වන පළාත සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. වැඩිහිටි ස්ත්‍රී හා පුරුෂ වශයෙන් වෙන් ව ගන්නා විට දී ඉපැයීම් සඳහා ඇති කරනු ලබන්නේ සෘණාත්මක බලපෑමක් වේ. වැඩිහිටි පුරුෂ හා කාන්තා ඉපැයීම් මන්දගාමී ස්වරූපයක් ගෙන ඇත. නැගෙනහිර පළාතේ වැඩිපුර මුස්ලිම් ජාතිකයන් ජීවත්වන බැවින් එම ප්‍රදේශවල සිටින කාන්තාවන්ගේ ඉපැයීම් සංස්කෘතික හේතුමත පදනම් ව අඩු විය හැකි ය. උතුරු ප්‍රදේශයේ වැඩිපුර දෙමළ ජාතිකයින් සිටින බැවින් එම ප්‍රදේශයන්හි ජීවත්වන කාන්තාවන්ගේ ද ඉපැයීම්වල ද අඩුවක් පෙන්නුම් කෙරේ. මෙම ප්‍රදේශවල අවිධිමත් අංශයේ රැකියා වන වී, තේ, එළවළු සහ සුළු අපනයන භෝග වගාවන්හි නිරත වන අතර කාලගුණික හේතු හා විවිධ ආර්ථික සාධකයන් මත වැඩිපුර පැය ගණනක් වැඩ කළ ද අස්වැන්න අඩු වීම මත ඉපැයීම් අවම වීමක් සිදු විය හැකි ය. එසේ ම බස්නාහිර පළාතට සාපේක්ෂ ව අනෙක් ප්‍රදේශයන්හි පවතින යටිතල පහසුකම් නොමැති වීම තවත් හේතුවක් වශයෙන් පෙන්වා දිය හැකි ය. Senanayaka and Kumara (2012) සිදු කරන ලද පර්යේෂණයකට අනුව පෙන්වා දී ඇත්තේ මධ්‍යම, උතුරු මැද, වයඹ පළාත්වල ජීවත්වන වැඩිහිටියන් රැකියාවල නිරත වීම අවම මට්ටමක පවතින බව ය.

සේවා නියුක්ති තත්ත්වය වැඩිහිටි ඉපැයීම් තීරණය කිරීම සඳහා සැලකිය යුතු ධනාත්මක බලපෑමක් ඇති කරනු ලබයි. සේවකයින්ට සාපේක්ෂ ව සේවා යෝජකයින් මෙන් ම ස්වයං සේවකයින්, වැටුප් නොලබන පවුලේ ශ්‍රමිකයින් රැකියාවල නිරත වැඩිහිටි කාන්තාවන් මෙන් ම පුරුෂයින්ගේ ඉපැයීම්වල වර්ධනයක් පෙන්නුම් කරයි. එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ වයසට යාමත් සමග කායික දුබලතාවයන් හේතුවෙන් ඔහුට යම් ස්ථානයක රැඳී සිටිමින් රැකියාවක නිරත වීමට සිදු වීමයි. බොහෝ වැඩිහිටියන් සාප්පු කළමනාකරුවන්,වාණිජ හා විකුණුම් නියෝජිතයන් වැනි අංශයන්හි සේවා නියුක්තවීම හේතුවෙන් ඉපැයීම් වැඩි වීමක් සිදු විය හැකි ය. ප්‍රතිපායන ආකෘති 2 හා 3 ට අනුව පුරුෂයින් හා කාන්තාවන්ගේ පැයක ඉපැයීම්වල වර්ධනය වීමක් පෙන්නුම් කරයි. නමුත් සේවකයින්ට සාපේක්ෂ ව වැඩිහිටි පුරුෂ ස්වයං සේවකයින්ගේ ඉපැයීම් 30%කින් අවම වීමක් පෙන්වයි. වැඩිහිටි ස්වයං සේවකයින් දිරි ගැන්වීම සඳහා අවශ්‍ය පහසුකම් නොමැති වීම මත සේවා නියුක්ත වුව ද ඉපැයීම් පහළ යා හැකි ය.

රැකියා කරන අංශයන් අනුව වැඩිහිටි ඉපැයීම් අධ්‍යයනය කිරීමේ දී කුසලතා අංශයේ ලිපිකරු, තාක්ෂණවේදීන්, සේවා සහ විකුණුම් සේවකයින්, ආරක්ෂක හමුදා ආදිය ද රැකියාවක් කරන සේවකයින්ට සාපේක්ෂ ව කළමනාකරුවන් හා වෘත්තිකයන් ලෙස රැකියාවක් කිරීම ඉපැයීම් සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ලබයි. ප්‍රධාන වශයෙන් වැඩිහිටි පුරුෂයින් සිදු කරනු ලබන රැකියා වන සාප්පු කළමණාකරුවන් වැනි රැකියාවන් සිදු කිරීමත්, එසේ ම වාණිජ හා විකුණුම් නියෝජිතයන් ලෙස කටයුතු කිරීම මත වැඩිහිටි කාන්තා හා පුරුෂයින්ගේ ඉපැයීම්වල වර්ධනයක් පෙන්නුම් කරයි. තව ද කාන්තාවන්ගේ ඉපැයීම් පුරුෂයින්ට සාපේක්ෂ ව ඉහළ මට්ටමක පවතී. වගු අංක 2 අනුව පුරුෂයින්ගේ ඉපැයීම්වල වර්ධනයක් පෙන්නුම් කළ ද නිෂ්පාදන අංශයේ සේවා නියුක්ත වැඩිහිටි කාන්තාවන්ගේ ඉපැයීම් පහළ යාමක් පෙන්නුම් කරයි. වඩු කාර්මිකයන් හා ලී බඩු සෑදීම, පෙදෙරේරුවන් වැනි රැකියාවන්හි නිරත වීම මගින් පුරුෂයින්ගේ ඉපැයීම් වර්ධනයක් පෙන්නුම් කරයි. Avram & Popova (2020) 16-60 වයස් කාණ්ඩවල සිටින පුද්ගලයින් අනුව ඉදිකිරීම් අංශයේ 18% පුරුෂයින් සේවා නියුක්ත වන බවත්, 4% ක් කාන්තා සේවා නියුක්තියක් පවතින බව තම පර්යේෂණය මගින් සොයා ගෙන ඇත. Graf et al. (2011) පර්යේෂකයන්ට අනුව පෙන්වා දී ඇත්තේ කර්මාන්ත ව්‍යුහය හෙවත් රැකියාව මත පදනම් ව නිෂ්පාදන හා වෙළෙඳාම් අංශයේ රැකියාවන්හි ඉහළ නියෝජනයක් පවතින බවත් ය.

**සමස්ත ආකෘතීවල යෝග්‍යතාව පරීක්ෂා කිරීම**

නිර්ණන සංගුණකය ($R^2$) අනුව ස්වායත්ත විචල්‍යයන් මගින් පරායත්ත විචල්‍යය වන ඉපැයීම් විස්තර කරන ප්‍රමාණය සමස්ත ආකෘතිය තුළ 39.32%ක් ද ස්ත්‍රීන් වෙන්ව ගන්නා විට දී 63.8% හා වැඩිහිටි පුරුෂයින්ගේ 22% ද වේ. වැඩිහිටි පුරුෂයින්ගේ ආකෘතියට සාපේක්ෂ ව වැඩිහිටි කාන්තාවන්ගේ ආකෘතියෙහි යෝග්‍යතාව ඉහළ මට්ටමක පවතී. හැඩගසන ලද නිර්ණන සංගුණකය (Adjusted $R^2$) අනුව ඉපැයීම් විස්තර කරන ප්‍රමාණය සමස්ත ආකෘතිය තුළ 39% ක් ද ස්ත්‍රීන් වෙන් ව ගන්නා විට දී 63.2% හා වැඩිහිටි පුරුෂයින්ගේ 21.65% ද වේ. වැඩිහිටි පුරුෂයින්ගේ ආකෘතියට සාපේක්ෂ ව වැඩිහිටි කාන්තාවන්ගේ ආකෘතියෙහි යෝග්‍යතාව ඉහළ මට්ටමක පවතී. ඉපැයීම් සඳහා අදාළ සමස්ත වැඩිහිටි ආකෘතිය තුළ 126.03 ද වැඩිහිටි කාන්තාවන් වෙන් ව ගන්නා විට දී 104 ද පුරුෂ ආකෘතිය තුළ 41.33 ද වේ. මෙය වගු අගයට වඩා වැඩි බැවින් ($F\text{-cal} > F_t$) 5% සහ 10% යන වෙසෙසියාත්මක මට්ටම් 02ක යටතේ අභිශූන්‍ය කල්පිතය ($H_0$) ප්‍රතික්ෂේප කළ හැකි ය. එම නිසා අර්ධ ලඝු ඉපැයීම් ආකෘතීන් සියල්ල ම සංඛ්‍යාත්මක වශයෙන් වෙසෙසියත්මක වේ. සමස්ත ආකෘතියේ යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා සම්භාවිතා අගය (p) භාවිත කර ඇත. මෙහි දී ආකෘතීන්


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

3හි ම 5% විශ්වාස මට්ටම යටතේ සංඛ්‍යාත්මක වශයෙන් වෙසෙසියාත්මක වේ (0.05% > 0.000).

## නිගමනය

වෘත්තීය පුහුණුවක් නොමැති වීම, ජීවත් ව සිටින ප්‍රදේශය හා පළාත, සේවා නියුක්ති ස්වභාවය යටතේ ස්වයං සේවකයකු වීම වැඩිහිටි කාන්තාවන්ගේ මෙන් ම පුරුෂයින්ගේ ඉපැයීම් සඳහා සෘණාත්මක බලපෑමක් ඇති බව පෙන්වා දිය හැකි ය. නමුත් අධ්‍යාපනය ලැබූ වසර ගණන, සේවා නියුක්ති ස්වභාවය යටතේ සේවා යෝජකයකු වීම, පවුලේ කටයුතුවලට දායකවන වැඩිහිටි කාන්තාවන්ගේ හා පුරුෂයින්ගේ ඉපැයීම් සඳහා ධනාත්මක බලපෑමක් ඇති කරනු ලබයි. තව ද ගෘහ කුටුම්භයේ 6ට අඩු ළමුන් සිටීම, නිෂ්පාදන අංශයේ සේවකයකු වීම වැඩිහිටි කාන්තා ඉපැයීම් සඳහා සෘණාත්මක බලපෑමක් ඇති කරයි. එසේ ම විශ්‍රාම වැටුපක් නොමැති වීම, වැඩිහිටි පුරුෂ ඉපැයීම් සඳහා ඇති කරනු ලබන බලපෑම සෘණාත්මක වේ. සේවා නියුක්ත අංශයන් අනුව කළමනාකරුවකු හා නිෂ්පාදන අංශයේ රැකියාවක් කරනු ලබන වැඩිහිටි පුරුෂයින්ගේ ඉපැයීම්වල වර්ධනයක් පෙන්නුම් කරයි. අවසාන වශයෙන් වැඩිහිටි කාන්තාවන්ට සාපේක්ෂ ව පුරුෂයින්ගේ ඉපයීම් ඉහළ බව මෙයින් පෙන්වා දිය හැකි ය. කාර්යබහුල ජන සමාජයක් වීම හේතුවෙන් මුණුබුරන් සහ මිණිබිරියන් බලා ගැනීමට සිදු වීම නිසා ඔවුන්ට රැකියා කිරීමට පවතින නිදහස සීමා වීම මත කුඩා දරුවන් සිටින විට දී ඉපැයීම් අවම වීමක් සිදු ව ඇත. වයස්ගත කාන්තාවන්ට සාපේක්ෂ ව වැඩි ඉපැයීම් සහිත රැකියා වන වඩු කාර්මික හා ලී බඩු සාදන්නන්, පෙදෙරේරුවන්, වාණිජ විකුණුම් නියෝජිතයන්, වෙළෙඳාම පිණිස තේ හා වී වගාවන්හි නියැළීම හේතුවෙන් මෙසේ ඉපැයීම්වල වර්ධනයක් පෙන්නුම් කරයි. සාම්ප්‍රදායික රැකියාවලින් බැහැර ව වැඩි ඉපැයීම් සහිත රැකියාවන්හි නියැළීමට හැකියාවක් පැවතීම, වැඩිහිටි පුරුෂයින් සඳහා පවතින අධ්‍යාපන ආයතන ප්‍රමාණය ද කාන්තාවන්ට සාපේක්ෂ ව ඉහළ මට්ටමක පැවතීම මෙසේ ඉපයීම් ඉහළ යාම සඳහා හේතු වී ඇත. වැඩිහිටි කාන්තාවන් හා පුරුෂයින්ගෙන් බොහෝමයක් අවිධිමත් අංශයේ රැකියාවන් ලෙස තේ දලු නෙලීම, ක්ෂේත්‍ර භෝග හා එළවළු වගා කිරීම, ගෘහස්ථ හා හෝටල් පිරිසිදු කිරීම රැකියාවන් සුලබ ව සිදු කරන බැවින් පුහුණුවක් නොමැති වීම මත ඉපැයීම්වල අවම වීමක් සිදු ව ඇත. එසේ ම රැකියාවන්හි විවිධාංගීකරණයක් සිදු නොවීම, ග්‍රාමීය හා වතු ආශ්‍රිත ව ජීවත් වන වැඩිහිටියන් කාලයත් සමග එක ම රැකියාවක නියැළීමට සිදු වීම නිසා ඔවුන් තව දුරටත් එම රැකියාව තුළ නියැළීමට අකමැති වීම සහ වෙහෙසකරභාවය ද මෙසේ ඉපැයීම් අඩු වීමට හේතු වී ඇත. අවිධිමත් අංශයේ රැකියාවන්හි නිරත වීමට සිදු වීම මත නාගරික නොවන හා බස්නාහිර නොවන පළාත්හි ජීවත්වන වැඩිහිටියන්ගේ ඉපැයීම් අවම අගයක පවතී. සාප්පු කළමනාකරුවන් වැඩිහිටි පුරුෂයන් සඳහා වාණිජ විකුණුම් නියෝජිතයන් වැනි රැකියා අවස්ථාවන් පැවතීමත්, වැඩිහිටි කාන්තාවන් සඳහා ඇඳුම් මැසීම හා සැකසීම වැනි රැකියා අවස්ථාවන්හි නිරත වීමත් හේතුවෙන් මෙසේ ඉපැයීම්වල වෙනස් වීමක් සිදු විය හැකි ය. වයස අවුරුදු 60ට වැඩි වැඩිහිටි කාන්තාවන් ආර්ථික කටයුතු සඳහා සක්‍රීය දායකත්වයක් ලබා දුන්න ද ඉපැයීම් ඉතාමත් අවම මට්ටමක පවතින බැවින් මෙම කණ්ඩායම් ආවරණය කරමින් කම්කරු අමාත්‍යාංශයේ සහාය ඇති ව විශේෂිත වැඩිහිටි කාන්තා ඉපැයීම් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය. තව ද අවිධිමත් අංශයේ සේවා නියුක්ත වැඩිහිටි සේවකයින් උදාහරණ වශයෙන් ගොවීන් සහ ධීවරයින් සඳහා අවශ්‍ය පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් කම්කරු අමාත්‍යාංශය හා සමාජ ආරක්ෂණ දෙපාර්තුමේන්තුවේ සහය ඇති ව පවත්වාගෙන යාම මගින් ඉපැයීම් සඳහා අවශ්‍ය පදනම සකස් කිරීම. එසේ ම වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන මගින් වයස්ගත පුද්ගලයින් සඳහා අවශ්‍ය වෘත්තීය දැනුම ලබා දීමට කටයුතු කළ යුතු ය. එකිනෙකා අතර සුහදතාව වර්ධනය කර ගැනීම, ආදායම් උත්පාදනය කරන අංශයන් පිළිබඳ දැනුවත් කිරීම් සඳහා අවශ්‍ය වැඩ සටහන් ප්‍රදේශීය වශයෙන් ක්‍රියාත්මක කළ යුතු ය. සමාජ ආරක්ෂණ ජාලය ඉපැයීම් දිරිමත් කිරීම සඳහා යෙදවීමට කටයුතු කිරීම මගින් නාගරික නොවන හා බස්නාහිර නොවන පළාත්වල වැඩිහිටි ඉපැයීම් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම වැදගත් ය.

## පරිශීලිත මූලාශ්‍රය


Alam, M. and Mitra, A., 2012. Labour market vulnerabilities and health outcomes: older workers in India. Journal of Population Ageing, 5(4), pp.241-256.

Avram, S. and Popova, D., 2020. Do Welfare State Taxes and Transfers Reduce Gender Income Inequality? Evidence from Eight European Countries (No. EM9/20). EUROMOD at the Institute for Social and Economic Research.

Ben-Porath, Y., 1967. The production of human capital and the life cycle of earnings. Journal of political economy, 75(4, Part 1), pp.352-365.

Blau, D.M. and Goodstein, R., 2007. What explains trends in labor force participation of older men in the united states?.

Department of Census and Statistics.,2018. Annual report of the Sri Lanka Labour Force Survey (Colombo, Sri Lanka).

Ghosh, D., 2019. Diversity and earning dissatisfaction among the elderly workforce in India. International Journal of Social Science and Economic Research, 4(2), pp.988-1007.

Graf, N., Hofer, H. and Winter-Ebmer, R., 2011. Labor supply effects of a subsidized old-age



© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

part-time scheme in Austria. Zeitschrift f r ArbeitsmarktForschung, 44(3), p.217.

G nther, I. and Launov, A., 2012. Informal employment in developing countries: Opportunity or last resort?. Journal of development economics, 97(1), pp.88-98.

Heckman, James J., and V. Joseph Hotz. "An Investigation of the Labor Market Earnings of Panamanian Males: Evaluating Sources of Inequality." (1985).

Khan, S.R., Irfan, M. and Cohen, S.I., 1985. Rates of Returns to Education and the Determinants of Earnings in Pakistan [with Comments]. The Pakistan Development Review, 24(3/4), pp.671-683.

Kingdon, G. and S derbom, M., 2007. Education, skills, and labour market outcomes: evidence from Pakistan.

Kottutt, S.K., Sumukwo, J.Y. and Omondi, P., 2020. Determinants of Rural Household Choice of Income Dependency Strategies in Eastern Mau, Kenya. African Journal of Education, Science and Technology, 5(4), pp.157-173.

Kozel, V. and Alderman, H., 1990. Factors determining work participation and labour supply decisions in Pakistan's urban areas. The Pakistan Development Review, pp.1-17.

Masud, J., Haron, S.A. and Gikonyo, L.W., 2008. Gender differences in income sources of the elderly in Peninsular Malaysia. Journal of Family and Economic Issues, 29(4), pp.623-633.

Mincer, J., 1958. Investment in human capital and personal income distribution. Journal of political economy, 66(4), pp.281-302.

Nguyen, H.T., Liu, A.Y. and Booth, A.L., 2012. Monetary transfers from children and the labour supply of elderly parents: evidence from Vietnam. Journal of Development Studies, 48(8), pp.1177-1191.

Nimoh, N.C., Ali, A. and Syme, T., 2020. Earnings gaps, Segmentation and Competitiveness in the Ghanaian Labour Market.

Paraponaris, A., Davin, B. and Verger, P., 2012. Formal and informal care for disabled elderly living in the community: an appraisal of French care composition and costs. The european Journal of Health economics, 13(3), pp.327-336.

Polachek, S.W., 2008. Earnings over the lifecycle: the Mincer earnings function and its applications (Vol. 16). Now Publishers Inc.

Qi, L. and Dong, X.Y., 2016. Unpaid care work's interference with paid work and the gender earnings gap in China. Feminist Economics, 22(2), pp.143-167.

Raymo, J.M., Liang, J., Sugisawa, H., Kobayashi, E. and Sugihara, Y., 2004. Work at older ages in Japan: Variation by gender and employment status. The Journals of Gerontology Series B: Psychological Sciences and Social Sciences, 59(3), pp.S154-S163.

Rubb, S., 2003. Social Security's earnings test penalty and the employment rates of elderly men aged 65 to 69. Eastern Economic Journal, 29(3), pp.415-431.

Salem, M.B. and Bensidoun, I., 2012. The heterogeneity of informal employment and segmentation in the Turkish labour market. Journal of the Asia Pacific economy, 17(4), pp.578-592.

Senanayaka, T.S. and Kumara, A.S., 2012. The Employment Status of the Elderly in Sri Lanka: Patterns and Determinants.

Sienaert, A., 2008. The labour supply effects of the South African state old age pension: Theory, evidence and implications.

Turek, K. and Perek-Bialas, J., 2013. The role of employers opinions about skills and productivity of older workers: example of Poland. Employee Relations.

Vangen, H., 2020. The Impact of Informal Caregiving on Labour Supply Before and After a Parent's Death.

Vodopivec, M. and Arunatilake, N.K., 2008. The impact of population aging on the labor market: The case of Sri Lanka. Available at SSRN 1136177.


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
එකොළොස්වන කලාපය 2020 දෙසැම්බර්
පිටු 64-76
ISSN 1800-1459 eISSN 2386-2041
© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# යටත්විජිත ලංකාවේ සමාජ ස්තරණය: නූතන සිංහල ප්‍රබන්ධ කතාව ආශ්‍රිත විමර්ශනයක්

## (Status of Social Stratification in Colonial Sri Lanka: Study based on Modern Sinhala Fiction)

කුමුදු කරුණාරත්න රණවීර

සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
*kumudu@sinhala.cmb.ac.lk

**සාරසංක්ෂේපය**

දහනව වන සියවසේ මෙරට සමාජ ව්‍යුහයේ සිදු කෙරුණු ප්‍රතිසංස්කරණ හේතු කොට ගෙන සමාජ ස්තරණයෙහි සිදු වූ විපරිවර්තනය තත්කාලීන සිංහල ප්‍රබන්ධවලින් නිරූපණය කෙරෙන ආකාරය මෙම අධ්‍යයනයෙන් විමර්ශනය කෙරේ. එකී අධ්‍යයනයේ දී සමාජීය සාහිත්‍ය අධ්‍යයන ක්‍රමවේදයෙහි දක්වෙන සාහිත්‍ය වනාහි එය පහළ වූ යුගයේ පර්යාවලෝකනයකි යන ප්‍රවාදය ද මාක්ස්වාදී සාහිත්‍ය න්‍යාය, පශ්චාත් යටත්විජිත සාහිත්‍ය න්‍යාය හා අනුජන (subaltern) අධ්‍යයන ප්‍රවේශය ද පදනම් කොට ගෙන තිබේ. දත්ත විශ්ලේෂණය, ගුණාත්මක දත්ත විශ්ලේෂණ විධි ක්‍රමයට අනුව සිදු කෙරේ. වසර දහස් ගණනක් මෙරට ක්‍රියාත්මක වූ කුලය පදනම් කොට ගත් සාම්ප්‍රදායික සමාජාර්ථික රටාව බිඳ වැටීම හා ප්‍රධාන වශයෙන් වෙළෙඳ භෝග නිෂ්පාදනය මත පදනම් වූ ධනවාදී අර්ථ ක්‍රමයෙහි ආරම්භය සිදු වන්නේ බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේදීය. ඒ අනුව බටහිර සමාජ සංස්ථා මෙන් ම සමාජ අගයන් ද උකහා ගනිමින් අභිනව සමාජාර්ථික පසුබිමක් නිර්මාණය වීමත්, නව අධ්‍යාපන ආයතන බිහිවීම හේතුවෙන් ද්විභාෂික උගතුන් පිරිසක් බිහි වීමත් නව ආර්ථික හා සමාජ ආයතන සමග සම්බන්ධ වීමෙන් පන්තිය ප්‍රමුඛ කොට ගත් අභිනව සමාජ ස්තරයක ප්‍රාදුර්භවය ද සිදු විය. මෙතෙක් බුදු දහමට තිබූ සමාජ පිළිගැනීම හා රාජ්‍ය අනුග්‍රහය ක්‍රිස්තියානි ආගම විසින් ලබා ගැනීමත් සමග ම යුරෝ කේන්ද්‍රීය නූතන සමාජ චින්තනයක් මෙරට ප්‍රචලිත විය. සමාජීය සාහිත්‍ය ආඛ්‍යාන මාර්ගය අනුව කෘතියෙහි අන්තර්ගතය තත්කාලීන සාමූහික විඥානයෙහි පර්යාවලෝකනයක් සේ සැලකෙන බැවින් ආරම්භක යුගයෙහි ප්‍රකාශිත ප්‍රබන්ධවලින් තත් යුගයෙහි සමාජ ස්තරණ ස්වභාවය විශ්වසනීයත්වයෙන් හා තත්වානුරූපී ව නිරූපණය කිරීමට සමත් වී ද යන්න මෙහි ලා විමසා බැලේ.

කේන්ද්‍රීය වචන: කුලය, පන්තිය, පූර්ව යටත්විජිත සමාජය, යටත්විජිත සමාජය, සමාජ ස්තරණය

This research investigates how the changes based on the social reforms of the 19th century effected the transformation in the social strata through an in-depth sociological study of the contemporary Sinhala fiction. Sociology of literature has showed that the literature is not merely about imaginations but systematically mirrors the contemporary society to which it relates. Therefore, theories on sociology of literature is a reflection of the society in which the fiction is stated. Apart from that, theories of Marxism and post-colonial literature were utilized to probe the concepts of marginalized society. Data analysis was based on qualitative research methodologies. The fall of the feudalism that existed for thousands of years in this country and the start of the capitalist society based on commercial agriculture began during British colonial era. Accordingly, the social institutions and social values derived from the West created a new socio economic background. New social layer starting on a new socio economic status could be observed with the establishment of new educational institutions and the rise of the emergence of bilingual elite class could also be evident. The societal and state recognition privileges given to Buddhism was taken over by Christianity. Thus, a euro – centric modern social ideology became popular in Sri Lanka. According to the sociology of literature, the context of the fiction reflects the collective conscience of the contemporary society. Hence the study on the early works of the modern Sinhala fiction which was originated during this era shows the status of social stratification as a realistic and believable representation.

Key words: Caste, Class, Contemporary Sinhala fiction, Contemporary society, Social stratification

## හැඳින්වීම

ශ්‍රී ලංකාව පූර්ණ වශයෙන් බ්‍රිතාන්‍ය යටත්විජිතයක් බවට පත්වීමත් සමග ම මෙරට සමාජයෙහි විපර්යාස රැසක් සිදු විය. වර්ෂ 1833 කෝල්බ්‍රෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ මගින් ධනවාදී සංවර්ධනය සඳහා පදනම සලසමින් මෙරට දේශපාලන හා ආර්ථික ව්‍යුහය ද තදනුබද්ධ සංස්කෘතික පසුබිම ද වෙනසකට ලක් කෙරිණි. ඒ අනුව රාජකාරි ක්‍රමය අහෝසි කිරීම හා 1840 අංක 05 දරන ඉඩම් පනත හා 1840 අංක 12 දරන මුඩුබිම් පනත මගින් එතෙක් මෙරට ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සමාජාර්ථික රටාව හා සම්බන්ධ සමාජ සංස්ථා අහෝසි වී යාමත් සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස ඉඩම් හා ශ්‍රමය සම්බන්ධයෙන් රාජ්‍යත්වය සතු වූ අයිතිය අහෝසි වූ අතර නව ධනේශ්වර සංවර්ධනය සඳහා පෞද්ගලික ව්‍යවසායකයන්ට භූමිය හා ශ්‍රමය විවෘත වූ අතර වැවිලි ආර්ථික ස්ථාපනයෙහි පදනම දැමීමත් සිදු විය. රැකියා සඳහා කුල ක්‍රමය නොතකා හැරීම ද මේ ප්‍රතිසංස්කරණයන්හි ප්‍රතිඵලයක් වූයේ ය. ඒ අනුව මෙරට

ධනේශ්වර අර්ථ ක්‍රමයේ ප්‍රවර්ධනයට අවශ්‍ය නෛතික හා දේශපාලන මෙන් ම විඥානමය පසුබිම ද සැකසිණි (Bandarage (1982) 1985: 59; Mendis 1956 I: 57, 65). මෙසේ වසර දහස් ගණනක් මෙරට ක්‍රියාත්මක වූ යැපුම් වගා අර්ථ ක්‍රමය මත වැවිලි කර්මාන්තය පදනම් කොට ගත් වාණිජ අර්ථ ක්‍රමයක් අධිරෝපණය මගින් නව ආර්ථික හා සමාජ ආයතන සමග සම්බන්ධ වූ අභිනව සමාජ ස්තරයන්හි ප්‍රාදුර්භවය සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස සමාජයේ නව පංති ව්‍යුහයක් සැකසිණි. මෙසේ ප්‍රතිස්තරණය වූ ලාංකේය යටත්විජිත සමාජය තත්කාලීන ප්‍රබන්ධ රචකයන්ගේ අවධානයට ලක් වූ ආකාරය සමාජ ස්තරීකරණය කේන්ද්‍ර කොට ගනිමින් විමර්ශනය කෙරේ.

## සාහිත්‍ය විමර්ශනය

අධ්‍යයනයට පාදක වන කාලය සම්බන්ධ පුරෝගාමී අධ්‍යයන කිහිපයක් කෙරෙහි මෙහි දී අවධානය යොමු කෙරේ. කොල්වින් ආර්. ද සිල්වා විසින් 1941 දී ප්‍රකාශිත Ceylon Under the British Occupation (1795-1833) කෘතිය මූලික වශයෙන් මෙරට බ්‍රිතාන්‍ය පාලනයේ ආරම්භක අවධිය අළලා සිදු කරන ලද පර්යේෂණයක ප්‍රතිඵලයකි (de Silva, (1941) 1995). මෙරට පූර්ණ යටත්විජිතයක් බවට පත්වීමෙන් අනතුරු ව ගොඩනැගුණු දේශපාලන, ආර්ථික හා පරිපාලන ව්‍යුහයෙහි ස්වභාවයත්, ඒවාහි ක්‍රියාත්මක ස්වරූපයත් මෙහි දී කතුවරයන්ගේ අවධානයට ලක් වේ. මේ අධ්‍යයනය, බ්‍රිතාන්‍ය පාලන සමය ආරම්භයේ සිට කෝල්බ්රූක් ප්‍රතිසංස්කරණ සිදු වූ 1833 දක්වා කාල පරාසය පිළිබඳ අවධානය යොමු කරයි. මෙරට සමාජාර්ථික තත්ත්වයෙහි පැහැදිලි වෙනසක් ඇති කිරීමෙහි ආරම්භක පියවර තැබූ කාල වකවානුවක් වශයෙන් මේ අවධිය වැදගත් වේ. එහෙයින් මේ අධ්‍යයනය එකී අවධියෙහි සිදු වූ වෙනස්කම්වල වඩා පෘථුල ප්‍රකාශනයක් වන 1833න් පසු අවධියෙහි සමාජාර්ථික තත්ත්ව නිරීක්ෂණයෙහි ලා අතිශය වැදගත් වේ.

ලක්දිව බ්‍රිතාන්‍ය පාලන සමයේ සමාජාර්ථික මෙන් ම දේශපාලනික හා සංස්කෘතික පසුබිම විමර්ශනය කරමින් පී. ජී. වී. සෝමරත්න විසින් සංස්කරණය කළ ලංකා ඉතිහාස බ්‍රිතාන්‍ය යුගය (සෝමරත්න, 1991) කෘතිය අධ්‍යයනයට අදාළ යුගය පිළිබඳව විවිධ අංශ ඔස්සේ ඉදිරිපත් වූ ශාස්ත්‍රීය ලිපි සංග්‍රහයකි. බ්‍රිතාන්‍ය යුගයෙහි මෙරට දුම්රිය මාර්ග හා මහාමාර්ග සංවර්ධනය, වතු වගා ආර්ථිකයේ වර්ධනය, පරිපාලන ක්‍රියාවලිය සහ මෙරට සාහිත්‍යයෙහි සිදු වූ වෙනස්කම් ආදිය ද මෙහි දී සාකච්ඡා කෙරේ.

ඩබ්ලිව්. එම්. ඩී. ඩී. අන්ද්‍රාදි ආචාර්ය උපාධිය සඳහා 1967 දී ලන්ඩන් විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කළ English – Educated Ceylonese in the Official Life of Ceylon from 1865-1883 නම් නිබන්ධය 2011 දී Sri Lanka Subordinates of the British නමින් ප්‍රකාශයට පත් කොට ඇත (Andradi, 2011). බ්‍රිතාන්‍ය පාලනය යටතේ පැවති වසර 20ක් මෙම අධ්‍යයනය සඳහා පාදක කොට ගැනේ. මෙරට ඉංගිරිසි උගත් ලාංකිකයන් විවිධ වෘත්තීන් මගින් බ්‍රිතාන්‍ය පාලනයට සම්බන්ධ වූ ආකාරය මෙහි විමසා බැලේ. ඒ අනුව පරිපාලන සේවය, නීති අංශයේ උසස් රැකියා, පොලිස් සේවය, පාඨශාලා ප්‍රධානාචාර්ය, වෛද්‍ය සේවය හා සම්බන්ධ වූ ප්‍රජාවගේ ජීවිත සුවිශේෂ කොට ගැනේ.

අධ්‍යයනයට අදාළ යුගය නියෝජනය කරමින් මෙරට සමාජාර්ථික විචල්‍යයන් සම්බන්ධයෙන් සිදු කෙරී ඇති පූර්ව අධ්‍යයන අතර අශෝකා බණ්ඩාරගේගේ ශ්‍රී ලංකාවේ යටත්විජිතවාදය (බණ්ඩාරගේ, 2005) කෘතිය ද වැදගත් වේ. බ්‍රිතාන්‍ය වතු වගා ආර්ථිකය හා යටත්විජිත දේශපාලන අධිකාරිය ලංකාවේ උඩරට ප්‍රදේශවලට බල පෑ ආකාරය මෙමගින් අධ්‍යයනය කෙරේ. 1833-1886 අතර වූ අඩසියවසක කාල පරිච්ඡේදය මේ අධ්‍යයනයට පසුබිම් වෙයි. මෙරට වතු ආර්ථිකය ස්ථිර පදනමක් මත ස්ථාපනය ද අමුද්‍රව්‍ය නිෂ්පාදකයකු ලෙස ලංකාව ධනවාදී ලෝක ආර්ථිකයට ඇතුළත් වීම ඇරඹුණේ මේ කාලයේ දී ය (බණ්ඩාරගේ, 2005: 21). මෙරට යටත්විජිතමය පරිවර්තනයේ ගතිකත්වයෙහි අර්ථ නිරූපණයක් වීමත් ලංකාවේ නිශ්චිත යුගයක, නිශ්චිත ප්‍රදේශයක දේශපාලන හා සමාජාර්ථික වෙනස්වීම් පිළිබඳ සිදු කෙරුණු අධ්‍යයනයක් වීමත් හේතුවෙන් මෙම අධ්‍යයනය වැදගත් වේ. එපමණක් නොව, දහනව වන ශතවර්ෂයේ මෙරට සමාජාර්ථික තත්තවයෙහි නිශ්චිත ඓතිහාසික තොරතුරු සංස්ලේෂණය කිරීමෙන් අනතුරු ව ඒවා විවිධ න්‍යායාත්මක දෘෂ්ටිකෝණවලින් සහ සමාජ සංවර්ධනයේ හා ඌන සංවර්ධනයේ සමාජ විද්‍යාව ඔස්සේ ඇගයීමට ලක් කිරීමත් හේතුවෙන් මෙම අධ්‍යයනය පූර්ව අධ්‍යයන අතර වඩා වැදගත් වෙයි.

ධනේශ්වරයක් බිහි වීමට පාදක වූ සමාජාර්ථික මෙන් ම දේශපාලන හේතු ද විමර්ශනය කරමින් 1830-1940 කාල පරිච්ඡේදය අළලා කුමාරි ජයවර්ධන විසින් සම්පාදිත සොක්කන් ලොක්කන් වූ වගයි (ජයවර්ධන 2006) සමකාලීන අධ්‍යයනයකි. මෙමගින් බ්‍රිතාන්‍ය පාලන කාලයෙහි මෙරට ධනේශ්වරයේ ප්‍රභවය හා වර්ධනය විභාග කෙරේ. මෙරට ධනපති ක්‍රමයේ ස්වභාවය, දේශීය ධනේශ්වරය ඒකරාශි කර ගත් ආරම්භක ප්‍රාග්ධනයේ ස්වභාවය හා නව පංති බිහි වීම, ජනවාර්ගික ආගමික හා ස්ත්‍රී-පුරුෂ සංයුතිය මෙන් ම සමාජ තරාතිරම, අනන්‍යතාව, දේශපාලන බලය සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ආදිය ද මෙහි දී වැඩි දුරටත් අවධානයට යොමු වේ. අභිනව ප්‍රාග්ධන හිමියන්ගේ බිහි වීමත් සමග ම කුලය මත පදනම් වූ පැරණි ශ්‍රම විභජනය අභියෝගයට ලක් වූ ආකාරය මෙන් ම දේශීය ධනවාදය නැගීමේ දී පන්ති සාධකය අවධාරණය කරන අතර කුල, ජනවාර්ගික හා ආගමික අනන්‍යතා යළි ක්‍රියාත්මක වූ ආකාරය ද විමසා බැලෙයි. බ්‍රිතාන්‍ය පාලන සමයෙහි මෙරට සිදු වූ සමාජාර්ථික පරිවර්තනය සම්බන්ධයෙන් පෘථුල විග්‍රහයක් ලෙස හැඳින්විය හැකි මේ අධ්‍යයනය මාක්ස්වාදී න්‍යාය ඇසුරෙන් යටත්විජිත ලංකාවේ සමාජාර්ථික පරිවර්තනය විශ්ලේෂණය කිරීමේ විද්‍යාත්මක ප්‍රවේශයක් ලෙස වඩා වැදගත් වේ.

ප්‍රස්තුත අධ්‍යයනයට අදාළ සිංහල සාහිත්‍යයේ නූතන අවධිය පිළිබඳ සිදු කෙරුණු අධ්‍යයන අතර ප්‍රාමාණික


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

විමර්ශන කීපයකි. මේ අවධිය හා සිංහල නවකතාව පිළිබඳ විචාරාත්මක ප්‍රමිතියකින් රචිත ආරම්භක කෘතිය 1951 දී පළ වූ එදිරිවීර සරච්චන්ද්‍රගේ සිංහල නවකතා ඉතිහාසය හා විචාරය කෘතියයි (සරච්චන්ද්‍ර 1951). දහඅට හා දහනව වන සියවස්වල මෙරට සිදු වූ සමාජ විපරිවතනය දහනව වන සියවස මධ්‍ය භාගයෙහි බිහි වූ නව සිංහල සාහිත්‍යය කෙරෙහි බල පෑ ආකාරය මෙහි දී විමසා බැලෙයි. මෙය සිංහල නවකතාව සම්බන්ධ පුරෝගාමී වූත්, සාධනීය වූත් අධ්‍යයනයක් වුව ද සමකාලීන සමාජ ඓතිහාසික බලවේගවල ක්‍රියාකාරීත්වය හා ඒවා නවකතාවට කෙරෙහි කළ බලපෑම සම්බන්ධයෙන් අවධානාත්මක වූ කෘතියක් නොවේ.

ආරිය රාජකරුණාගේ දහනව වන සියවසේ සිංහල ගද්‍ය (රාජකරුණා 1992) සිංහල නවකතාවේ ආරම්භය (රාජකරුණා 1972) හා සාහිත්‍ය රුචිය හා නවකතා විචාරය (රාජකරුණා 1970) යන කෘති දහනව වන සියවසේ මෙරට බිහි වූ අභිනව ගද්‍ය සාහිත්‍යය පිළිබඳ සුවිශේෂ අධ්‍යයන අතර වේ. විසි වන සියවස ආරම්භය වන විට සිංහල නවකතාව බිහි වීමට අවශ්‍ය පදනම සැකසීමෙහි ලා ආරම්භක ගද්‍ය සාහිත්‍යයෙහි වැදගත්කම මේ මගින් අවධාරණය කෙරේ. එමෙන් ම මෙරට තත්කාලීන සාහිත්‍ය රුචිය පිළිබඳවත්, නවකතා විචාරය කෙරෙහිත් ඔහු විමසිලිමත් වෙයි.

දහනව වන සියවසෙහි ප්‍රකාශිත ප්‍රබන්ධ නොවන ලේඛනයන්හි භාෂා භාවිතය පිළිබඳ ව විමසමින් නව්‍ය අත්දැකීම් ප්‍රකාශනයට යෝග්‍ය භාෂා ව්‍යවහාරයක් සකස්වීම පිළිබඳ අධ්‍යයනයක් වන රත්නසිරි අරංගලගේ නූතන සිංහල සාහිත්‍යයේ ප්‍රභවය (අරංගල 2004) ද පූර්ව අධ්‍යයන අතර වැදගත් වූවකි. මෙරට මුද්‍රණාලයෙහි ආරම්භයත්, එහි ප්‍රතිඵල ලෙස ඇති වූ සිංහල සාහිත්‍ය ව්‍යාප්තියත් පිළිබඳ පුළුල් විග්‍රහයක් මෙහි අන්තර්ගත වේ. අප අධ්‍යයනය හා සම්බන්ධ සාහිත්‍ය විමර්ශන අතර වඩා වැදගත් මෙන් ම අදාළ පූර්ව අධ්‍යයන ලෙස මේවා කැපී පෙනේ.

## පර්යේෂණ ගැටලුව

බ්‍රිතාන්‍ය ආධිපත්‍යය යටතේ පැවති ලංකාවේ සමාජ ව්‍යූහයේ සිදු කෙරුණු ප්‍රතිසංස්කරණ හේතුවෙන් ඇති වූ නව සමාජ ස්තරණය තත්කාලීන ප්‍රබන්ධවලින් නිරූපණය වන්නේ කෙසේ ද?

## පර්යේෂණ අරමුණු

- 19 වන සියවසෙහි මෙරට සිදු වූ සමාජ විපරිවර්තනය හේතුවෙන් ඇති වූ සමාජ ස්තරණය තත්කාලීන ප්‍රබන්ධ සාහිත්‍යයෙහි පිළිබිඹු වේ දැයි විමසීම.
- අභිනව සමාජ ස්තරණය හේතුවෙන් බිහි වූ බලය, ගරුත්වය, ධනය, කුල ක්‍රමය සහිත නව පන්ති ක්‍රමයක ස්වභාවය සිංහල ප්‍රබන්ධ කථාවෙහි ප්‍රතිනිර්මාණය වන්නේ දැයි විමර්ශනය කිරීම.

## පර්යේෂණයේ වැදගත්කම

- සාහිත්‍යය සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් විමර්ශනය කිරීමේ දී ‘සාහිත්‍යය යනු සමාජ පර්යාවලෝකනයකි’ යන ප්‍රවාදය මුල් කර ගනිමින් නූතන සිංහල සාහිත්‍යයේ ආරම්භක යුගය විමර්ශනය කිරීම.
- සමාජීය සාහිත්‍ය අධ්‍යයන මාර්ගය අනුව කෘතියෙහි අන්තර්ගතය තත්කාලීන සාමූහික විඥානයේ පර්යාවලෝකනයක් සේ සැලකෙන බැවින් අදාළ අවධියේ කෘතිවල සාහිත්‍යික අගය විමසීම.
- සිංහල සාහිත්‍යය මෙකී දෘෂ්ටියෙන් මෙතෙක් ප්‍රමාණවත් අවධානයට ලක් වී නොතිබුණු අතර, ප්‍රබන්ධ මගින් එකී අවධිය කෙතෙක් දුරට තත්ත්වානුරූපී ව නිරූපණය වේ දැයි විමසීම.

## පර්යේෂණ ක්‍රමවේදය

මේ අධ්‍යයනය මූලික වශයෙන් සාහිත්‍යමය මූලාශ්‍රය පදනම් කොට ගත්තකි. වර්ෂ 1866 සිට 1925 දක්වා ප්‍රකාශිත සිංහල ප්‍රබන්ධ මේ අධ්‍යයනයෙහි ප්‍රාථමික මූලාශ්‍රය වෙයි. මෙහි දී සමාජීය සාහිත්‍ය අධ්‍යයන න්‍යාය, සමාජ ස්තරීකරණය පිළිබඳ සමාජ විද්‍යාත්මක න්‍යායන්, මාක්ස්වාදී න්‍යාය සහ එයට අමතර වශයෙන් පශ්චාත් යටත්විජිත න්‍යායික ප්‍රවේශය මෙන් ම අනුජන[1] අධ්‍යයන ප්‍රවේශය හා ඊට අදාළ සංකල්ප ද අවශ්‍ය පරිදි භාවිත කෙරේ. දත්ත විශ්ලේෂණය සඳහා ගුණාත්මක දත්ත විශ්ලේෂණ විධි ක්‍රමය ඉවහල් කොට ගැනේ.

### සමාජ ස්තරණය හා යටත්විජිත සමාජය

සමාජයෙහි ක්‍රියාත්මක වන, සමාජය විසින් ම නිර්මාණය කර ගන්නා ලද විෂමතා හැඳින්වීම සඳහා ‘සමාජ අසමානතාව’ යන්න භාවිත වේ. ඉතා ම සරල මට්ටමේ සමාජවල සිට සංකීර්ණ සමාජයක් දක්වා ම කුමන හෝ ආකාරයක සමාජ අසමානතාවක් දැකිය හැකි ය. එනම් මූලික වශයෙන් බලය (Power), ගරුත්වය (Prestige) හා ධනය (Wealth) යන සංකල්ප තුන පදනම් කොට ගනිමින් මෙම සමාජ අසමානතාව ගොඩනැගෙයි. එකී අසමානතාවෙහි විශේෂ ස්වභාවය ‘සමාජ ස්තරණය’ (Social Stratification) නමින් හැඳින්වේ. කිසියම් සමාජයක පවත්නා සමාජ පන්තිය, කුලය හා වෙනත් ස්තරණයන්හි අනුපිළිවෙළ, ධුරාවලිය මත සංවිධානය වන

[1] subaltern යන යෙදුම සඳහා සුලබ ව සිංහලයෙන් යෙදෙනුයේ ‘නිර්ප්‍රභූ’ යන්න යි. නෛරුක්තික ව සලකන කල subaltern යන්නට මුල් වූ sub හා alternus යන ලතින් මූලයන්හි අරුත එයින් නො පැවසේ; sub යන්නෙන් ‘පහළ’ යන අරුතත් alternus යන්නෙන් ‘අන් සියල්ලන්’ යන අරුතත් පැවසෙයි. සිංහල අක්ෂර වින්‍යාසයට බල පාන සංස්කෘත අක්ෂර වින්‍යාස රීති අනුව ‘ප්‍රභූ’ සමඟ සන්ධි වන ‘නිර්’ උපසර්ගය ආදි ප-කාරය හේතුවෙන් ‘නිෂ්’ බවට පෙරළේ. ඒ අනුව ‘නිෂ්ප්‍රභූ’ යන්න නිවැරදි රූපය වුවත් ඉහතින් දක්වන ලද නෛරුක්තිකාර්ථයට එය නොගැළපෙයි. sub යන ඉංගිරිසි නිපාතය සඳහා ‘අනු-’ යන උපසර්ගයත් alternus යන්නෙන් පැවසෙන ‘අන් සියල්ලන්’ යන අරුත සඳහා ‘ජන’ යන්නත් සහිත ව මේ ලේඛනයේ දී subaltern යන්නට පර්යාය සිංහල යෙදුම ලෙස ‘අනුජන’ යන්න භාවිත කෙරේ. මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන ආදි විද්වතුන් ද ‘අනුජන’ යන්න මේ අරුත්හි යොදා ඇත.


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ආකාරය 'සමාජ ස්තරණය' ලෙස හැඳින්වේ (Dictionary of the Social Sciences 1964 : 310). එනම් ඕනෑ ම සමාජයක පුද්ගලයන් අතර කුලය, ආගම, ජාතිය, වර්ණය, ලිංගිකත්වය, වයස, පන්තිය යනාදිය පදනම් කරගෙන ඇති වන වෙනස්කමෙහි ක්‍රියාවලිය, සමාජ ප්‍රභේදනය හෙවත් සමාජ ස්තරණය ලෙස අර්ථ දක්වේ (The New Encyclopedia Britanica 1964: 314). සමාජ ස්තරණයේ සංයුතිය, පදවි පද්ධතිය (Estate System), කුල පද්ධතිය (Caste System) හා පන්ති පද්ධතිය (Class System) යන අංගයන්ගෙන් සැදුම් ලද්දෙකි (Tumin 1967: 02).

පූර්ව යටත්විජිත අවධියේ මෙරට සමාජය මූලික වශයෙන් කුල පද්ධතිය පදනම් කොට ගෙන ඒ මත ක්‍රියාත්මක වූ පදවි සහ පන්ති පද්ධතිවලින් යුක්ත වූවකි. ලුණු හැර බාහිර ලෝකයෙන් කිසිවක් ගැමියන්ට අවශ්‍ය නොවූ අතර ගැමියන්ට අවශ්‍ය දේ ගම තුළ ම නිෂ්පාදනය කිරීමට හේතු වූයේ කුල ස්තරීකරණය මත පදනම් වූ නිෂ්පාදන ක්‍රියාවලියයි. ගම තුළට නිෂ්පාදන වූ මෙම ක්‍රියාවලිය සඳහා ශ්‍රමය සපයා ගන්නා ලද්දේ අත්තම් ක්‍රමයකටයි (Gunasinghe 1990: 95, 96). බ්‍රිතාන්‍ය පාලකයන්ගේ සමාජාර්ථික ප්‍රතිපත්ති හේතු කොටගෙන තත්කාලීන ලාංකේය සමාජය අභිනව ස්තරණයකට ලක් විය. එතෙක් පැවති කුල ක්‍රමය, පන්ති ස්තරණය විසින් වෙනස් කරනු ලැබිණ. ශ්‍රම විභජන විධියක් වශයෙන් ක්‍රියාත්මක වූ කුල ක්‍රමය කැඩී බිඳී ගොස් කුලයේ පැවැත්ම හා අන්තර් කාවැදීම හේතුවෙන් පන්තිය ද පන්තියේ පැවැත්ම හා අන්තර් කාවැදීම හේතුවෙන් කුලය ද වශයෙන් ප්‍රතිනිෂ්පාදනය විය (Gunasinghe 1990: 130, උයන්ගොඩ 1990: 135). ඒ අනුව පූර්ව යටත්විජිත යුගයේ ක්‍රියාත්මක වූ කුලය මෙරට සමාජයේ පූර්ණ වශයෙන් අතුරුදහන් වීමට මේ වෙනස්කම් ප්‍රමාණාත්මක නොවීය. එහෙත් පූර්ව යටත්විජිත සමාජයේ කුලය ආශ්‍රිත ව ක්‍රියාත්මක වූ සමාජ ස්තරණ පදනමට නව ස්වරූපයක් ආරෝපණය මෙන් ම එතෙක් සමාජයේ ක්‍රියාත්මක වූ ගරුත්ව ධුරාවලියෙහි ප්‍රබල වෙනස්කම් ද මෙයින් ඇති විය. ප්‍රධාන වශයෙන් කුලය මත පදනම් වූ වෙන් වෙන් ව පිහිටි නිවාසවලින් යුක්ත වූ ගම් වෙනුවට බටහිර ලක්ෂණ සහිත නගර ආශ්‍රිත ව පන්ති දෙකක් නිර්මාණය වූ අතර ඉංග්‍රීසි උගත්, කලිසංකාර, සුදු කරපටි පළඳින ඉහළ පාන්තික ප්‍රජාව සහ පාවහන් නොපළඳින, සිංහල කතා කරන ශ්‍රමික නැතහොත් කම්කරු පන්තිය වශයෙනි (Rayan 1953: 308).

**පන්තිය**

සමාන ජීවන අවස්ථාවල රැඳී සිටීමට යම් යම් හේතු සාධක මත එක් වූ සමූහයක් 'පන්තිය' ලෙස හැඳින්වේ (Maxweber1958, Desktop/Class International Encyclopedia of the Social Sciences, 2 ed. Vol. William A. Darity (Jr.) ed. pdf). ජීවන අවස්ථා යනු කිසියම් මට්ටමක ජීවන තත්තවයක් පවත්වා ගැනීමට ඒ ඒ සමාජ කොටසට ඇති ඉඩකඩ හෝ හැකියා හෝ වේ. නූතන සමාජ විෂමතා අධ්‍යයනයෙහි ලා අවධානය යොමු කළ සමාජ චින්තකයකු වූ කාල් මාක්ස්ට අනුව නිෂ්පාදන ක්‍රියාවලිය මත සමාජයේ මූලික ව්‍යුහය සකස් වන අතර සමාජ පරිණාමයේ ඒ ඒ අවධියට ආවේණික වූ නිශ්චිත නිෂ්පාදන රටාවක් පවතී. ඒ ඒ නිෂ්පාදන රටාවෙහි නිෂ්පාදන සාධකවලට ඇති අයිතීන්ගේ ස්වභාවය අනුව අදාළ ඓතිහාසික අවධියට අයත් පන්ති ක්‍රමය සකස් වේ (එංගල්ස් 1979: 86). ඒ අනුව වැඩවසම් අවධියෙහි ඉඩම් හිමි රදලයන්, ධනවාදී අවධියෙහි ධනපතියාත් දේපළ හිමි පන්තිය ලෙසත් එහි ප්‍රතිපක්ෂ වූ ප්‍රවේණි දාසයා හා කම්කරුවා දේපළ අහිමි පන්තියේ නියෝජනය ලෙසත් හඳුන්වයි (එංගල්ස් 1979: 84, ජ්රං 1942ඵ 532).

මාක්ස්වාදී සමාජ විග්‍රහයට අනුව ඓතිහාසික සමාජ විකාශනයෙහි යථාර්ථය සනාථ කරමින් මෙරට යටත්විජිත යුගයේ නිර්මිත ධනේශ්වර සමාජයෙහි පුද්ගල ආර්ථික ශක්තිය මත සමාජ තත්ත්වය තීරණය කෙරිණි. එක් පසෙකින් කුලී ශ්‍රමික, මෙහෙකාර වැනි අවම වැටුප් තලය නියෝජනය කරන සමාජයේ ආන්තීකරණය වූ ජන කොට්ඨාසයන් බිහි විය. එහි ප්‍රතිපක්ෂය ලෙස රේන්ද හෝ මිනිරන් ව්‍යාපාර මගින් මෙන් ම නව වතු වගාවෙන් විශාල ධන උත්පාදනයෙහි සමත් වූ වාණිජ ධනපති පන්තියක් ද බිහි විය. එමෙන් ම නව අධ්‍යාපන ක්‍රමයෙහි ප්‍රතිඵල ලෙස වෛද්‍ය, නීතිඥ වැනි කය වෙහෙසා වැඩ නො කරන (white-collar) රැකියාවන්හි නියුතු උගත් මධ්‍යම පන්තියක් ද බිහි විය.

මෙරට සමාජයෙහි චල්‍යතා අවකාශය පුළුල් වෙමින් සමාජ ස්තරණ සාධකයක් ලෙස නූතන පන්ති ක්‍රමයක් බිහි වූයේ යටත්විජිත අවධියෙහි දී ය. මේ නව සමාජය වාණිජ භෝග හා ව්‍යාපාරික ධනවාදයේ අවශ්‍යතා හා ඉල්ලුම විසින් මෙහෙයවනු ලැබිණි (වික්‍රමසිංහ 2012: 185). අධ්‍යාපනය සහ ධනය යන සාධක හේතු කොට ගෙන පුද්ගලයාට ඉහළ සමාජ තලයක් වෙත යොමු වීමේ අවකාශ විවෘත වීමත් සමග ම මෙම පන්ති ක්‍රමය නිර්මාණය විය. අභිනව ධනේශ්වර සමාජයේ ලක්ෂණයක් වූයේ සමාජයේ උපරිතලය නියෝජනය කළ සමස්ත ජනගහනයෙන් අතලොස්සක් වූ සමාජ කොට්ඨාසයක් නිර්මාණය වීම යි (ජයවර්ධන 2006: 65). දහනව වන සියවස මධ්‍ය භාග පමණ වන විට මුහුදුබඩ ප්‍රදේශවල ධනේශ්වර පන්තියක්, සුළු ධනේශ්වර ස්තරයක් හා කම්කරු පන්තියක් ලෙසින් මෙම නූතන පන්ති ක්‍රමය ක්‍රියාත්මක වන්නට විය. මෙසේ මෙරට සමාජය නූතනත්වයට මුහුණ දීමේ දී නිර්මාණය වූ සුවිශේෂ තත්ත්වයක් වූයේ මධ්‍යම පන්තියක් බිහි වීම යි. මෙකී මධ්‍යම පන්තියේ ආරම්භක පුරුක වන්නේ මුදලි පැලැන්තියයි. අනතුරු ව අරක්කු රේන්ද මගින් ධනවත් වූ මොරටුව ආශ්‍රිත කරාව කුලයට අයත් ව්‍යාපාරික ප්‍රජාව ගොඩනැගෙයි. අරක්කු පෙරීම, තොග සහ සිල්ලර වෙළඳාම ආදී අංශ ඇසුරෙහි මෙසේ මෙරට දේශීය ධනේශ්වර පන්තියේ පදනම වැටුණි. මේ දෙපිරිස ම තම දරුවන්ට හොඳ ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබා දෙමින් ධනය එක්රැස් කර ගැනීමටත්, උචිත වෘත්තීන් ඇරඹීමටත් යොමු කළහ (වික්‍රමසිංහ 2012: 200). අනතුරු ව එම පන්ති, වාර්ගික හා කුල වශයෙන් ද බෙදීමකට ලක් විය.

කොළඹට පමණක් ප්‍රධාන වශයෙන් ම කේන්ද්‍රගත වූ


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නාගරික කම්කරු පන්තිය වාර්ගික වශයෙන් ප්‍රධාන වශයෙන් ම සිංහලයන්ගෙන් යුක්ත විය. දකුණු ඉන්දියානු ප්‍රභවයකින් යුතු උඩරට වතු කම්කරු ජනතාව පීඩිත කුලවලට අයත් වූවෝ වූහ. ඒ අනුව යටත්විජිත යුගයේ මෙරට බිහි වූ පන්ති ක්‍රමය තත්කාලීන ලාංකේය සමාජයේ වූ අභ්‍යන්තර බෙදීම් ඉක්මවා ගිය පන්ති විඥානයක් ඇති කිරීමෙහි සමත් විය (ගුණසිංහ 2011: 25).

මෙරට ග්‍රාමීය පන්ති ස්තරණයට අනුව ඉහළින් ම ග්‍රාමීය මධ්‍යම පන්ති ස්තරය විය. මේ පන්තියේ ප්‍රධාන ආර්ථික ශක්තිය මධ්‍යම ප්‍රමාණ ඉඩම් හිමිකාරිත්වයයි. මෙම පන්තිය ග්‍රාමීය ප්‍රභූ පන්තිය ලෙස හැඳින්වෙන අතර මෙයට අමතර වශයෙන් මහා පරිමාණ අදෘශ්‍යමාන ඉඩම් හිමියන්ගෙන් සමන්විත වූ ග්‍රාමීය ඉහළ මැද පන්තිය වෙයි. අනතුරුව සුළු ඉඩම් හිමිකාරිත්වයක් සහිත ග්‍රාමීය පහළ මධ්‍යම පන්තිය හඳුනා ගත හැකිය (දේවසිරි 2007: 77, 280-81).

මෙරට යටත්විජිත සමාජය, ආරෝහණ සමාජ චලනතාවට අවකාශ සැලසූ පුළුල් පරාසයක ක්‍රියාත්මක වූ විවෘත සමාජයකි. ඊට සාපේක්ෂ වශයෙන් පූර්ව යටත්විජිත සමාජය, සමාජ චලනතා අවකාශය සීමා සහිත වූ ආවෘත සමාජයක් ලෙස ක්‍රියාත්මක වූවකි. සමාජ ස්තරණ සාධකයක් වන 'කුලය' පුද්ගලයකුට උපතත් සමග ම උරුම වන අනන්‍ය ස්වරූපයක් සහිත තත්ත්වයක් වීමත්, කුලය පදනම් කොට ගත් අර්ථ ක්‍රමයක් ක්‍රියාත්මක වීමත්, එකී ආවෘත සමාජයෙහි කැපී පෙනෙන ලක්ෂණ විය. එහෙයින් ම එම සමාජීය ස්ථාවර ලෙස අතික්‍රමණය කිරීම කේවල පුද්ගලයකුට හෝ සමාජ කණ්ඩායමකට හෝ කළ නොහැකි වූවකි.

නව ධනේශ්වර කාර්මික සමාජයේ යම්කිසි පුද්ගලයකුගේ සමාජ තත්ත්වය බොහෝ විට ඒ පුද්ගලයා විසින් ම සාධනය කොට ගත හැක්කකි. මෙහි ප්‍රතිඵලයක් ලෙස කිසියම් පුද්ගලයකුට දෙමාපියන්ගේ සමාජ තත්ත්වය වැන්නක් නොසලකා හැර ස්වකීය සුදුසුකම් හා හැකියාවට අනුරූපී සමාජ භූමිකාවක් නියෝජනය කළ හැකි විය. පූර්ව යටත්විජිත ලාංකේය සමාජය හා සසඳා බැලීමේ දී අභිනව පන්ති සමාජයේ දී සමාජ සංචලනයට ඇති අවකාශය සාපේක්ෂ වශයෙන් ඉතා ඉහළ මට්ටමක පැවතීම ඊට හේතුව යි. 'කුලය' වැනි අනන්‍ය සාධකයකට අනුරූප ව 'පන්තිය' යන්න පුද්ගලයකුට සාධනය කර ගත හැකි සමාජ තත්ත්වයක් විය. ඒ සඳහා ප්‍රධාන කොට අවශ්‍ය වූයේ හැකියාව යි. එනම් යටත්විජිත යුගයේ මෙරට ආර්ථික වශයෙන් විවර වූ පුළුල් අවකාශයත්, අධ්‍යාපන අවස්ථා සමග ලැබූ වෘත්තීය තත්ත්වයත් හේතුවෙන් එතෙක් සමාජයේ පහළ පන්තියක් නියෝජනය කළ පුද්ගලයකුට වුව ද ක්‍රමයෙන් වරප්‍රසාද හිමි පන්තියට ඇතුළුවීමේ අවකාශය ලද හැකි විය. සිරස් සමාජ චලනකාරකයක් ලෙස මෙරට යටත්විජිත අධ්‍යාපනය ක්‍රියාත්මක වීම එයට හේතුව යි. සිංහල හා දෙමළ භාෂා මෙරට සාමාන්‍ය ව්‍යවහාර භාෂා බවටත්, ඉංග්‍රීසි භාෂාව පරිපාලනයේ, ව්‍යවහාර ලෝකයේ, වෘත්තීන්ගේ හා අධ්‍යාපනයේ ඉහළ මට්ටමෙහි භාවිත වූ භාෂාව බවටත් පත් වීම යටත්විජිතකරණයත් සමග මෙරට පන්ති ව්‍යුහය කෙරෙහි සිදු වූ ප්‍රබල වූත් නිශ්චිත වූත් බලපෑමක් ලෙස සැලකිය හැකි ය. ඒ අනුව ඉංග්‍රීසි භාෂාව ද මෙරට යටත්විජිත යුගයෙහි සමාජ ස්තරණ සාධකයක් බවට පත් විය. වසර එකසිය පනහක් පමණ මෙරට ක්‍රියාත්මක වූ ඉංග්‍රීසි පාලන අවධියෙහි පාලකයා සහ යටත්වැසියා අතර වූ භාෂා පරතරයට විසඳුම් ලබා දෙන ලද්දේ මෙරට ඉංග්‍රීසි උගත් පන්තියක් බිහි කිරීම මගිනි (Kandiah 1978: 07). ඉංග්‍රීසි අධ්‍යාපනය මුල දී ආරම්භ කළේ මුදලි පවුල්වල දරුවන්ට වෙන් වූ වරප්‍රසාදයක් ලෙසිනි. පසු ව අලුතින් ධනය සපයා ගත් පිරිස්වලට ඒ අවස්ථාව ලබා ගත හැකි පරිදි ගාස්තු අය කිරීමේ අධ්‍යාපන ක්‍රමයක් දක්වා එහි සීමා පළල් කරන ලදී. ජෙරෝනිස් ද සොයිසා වැනි කරාව කුලයේ පුද්ගලයකු ප්‍රධාන මුදලි තනතුරකට පත් කිරීම අලුත් ධනවතුන්ගේ තත්ත්වය නිල වශයෙන් පිළිගැනීම ප්‍රකාශයට පත් කිරීමකි (නවරත්න බණ්ඩාර 2007: 307-308). නව ධනේශ්වර පන්තික උගත් පිරිස සංස්කෘතික වශයෙන් බටහිරකරණයට ගොදුරු වී සිටි අතර තම පළමු බස ලෙස ඉංග්‍රීසිය භාවිත කළහ (Passe 1948: 09). ජේම්ස් ද අල්විස්ට අනුව ග්‍රීක්, ලතින් හා ඉංග්‍රීසි භාෂාවන්හි නිපුණතාවක් පැවතියත් සාමාන්‍ය සිංහල නිවැරදි ව කතා කළ නොහැකි පිරිසක් ද යටත්විජිත යුගයෙහි මෙරට දක්නට ලැබුණහ (ද අල්විස් 1939: 17).

මෙයට අමතර වශයෙන් ආගම ද යටත්විජිත යුගයෙහි මෙරට සමාජ ස්තරණ සාධකයක් ලෙස ක්‍රියාත්මක විය. මේ අනුව පුද්ගලයකුට තමා ජීවත් වන සමාජයේ පවත්නා පිළිගැනීම, සාධක එකක් හෝ කිහිපයක් මත තීරණය විය හැකි ය. මෙසේ යටත්විජිතකරණයත් සමග ම ලාංකේය සමාජය විශේෂිත වූ ස්තරණයකට ලක් වීම හේතුවෙන් පූර්ව යටත්විජිත ආවෘත සමාජයෙහි පැවති සමාජ තත්ත්ව වෙනස් වූ ආකාරය තත්කාලීන ප්‍රබන්ධ කථාවෙහි කවරාකාරයෙන් නිරූපණය වන්නේ දැයි විමසා බැලීම මේ ලිපියේ අරමුණයි.

## දත්ත විශ්ලේෂණය

පූර්ව යටත්විජිත අවධියෙහි මෙරට අධ්‍යාපනය පිළිබඳ පවත්නා සාක්ෂ්‍යවලට අනුව මෙරට රාජකීය සහ උසස් පවුල්වල සාමාජිකයන්ට ලැබුණු අධ්‍යාපන වරප්‍රසාදය සාමාන්‍ය ජනතාවට ලැබුණු බවට පැහැදිලි හෝ නිශ්චිත තොරතුරු දක්නට නොලැබේ. එහෙත් සාක්ෂරතාව ඉක්මවූ ඉගෙනීමක් කෙරෙහි පොදු ජනතාව යොමු නොවූ බවත්, නගරයෙන් පරිබාහිර ව ජීවත්වූ බහුතරයක් නියෝග හෝ පණිවුඩ, අකුරු දත්තවුන් ලවා කියවා ගත් බව ඓතිහාසික ලේඛනවලින් සනාථ කෙරී ඇත. එහෙයින් පොදු ජනතාවගේ සමාජ තත්ත්වය නිර්මාණය කිරීමට හෝ සමාජ ස්තරණයෙහි ලා බලපෑම් සහගත වීමට පූර්ව යටත්විජිත අධ්‍යාපනයට හැකියාවක් නොවී ය. එම සමාජයෙහි පුද්ගලයකුගේ සමාජ තත්ත්වය මෙන් ම අධ්‍යාපනය ද කුලය විසින් තීරණය කරනු ලැබිණ. එහි අඛණ්ඩ පැවැත්ම තව දුරටත් තහවුරු කරනු වස් කුලීන පවුල්වල දරුවන්ට පමණක් අධ්‍යාපනයට අවකාශ සැලසිණි. සම්ප්‍රදාය මත ගොඩනැගුණු සමාජ ක්‍රමය සියලු ජනයාට ජීවනෝපාය මාර්ග සකසා තිබුණ ද පුද්ගලයාට තිරස් හෝ සිරස් සමාජ සංචලනයක් සඳහා අධ්‍යාපන ක්‍රමයෙන් පිටිවහලක් නොලැබිණ (ලංකාවේ අධ්‍යාපනය, සියවස

ප්‍රකාශනය (1969) 1995 : xivi). මෙරට ජනයා ක්‍රිස්තියානි ආගමට හැරවීමෙහිලා අධ්‍යාපනයෙන් ලැබෙන සීමාරහිත පිටිවහලත්, අධ්‍යාපනයෙන් හා නිලයෙන් එංගලන්තය හා බැඳුණු දිවයිනේ ප්‍රධාන පවුල්වලට අයත් පුද්ගලයන් රාජ්‍ය නිලධාරීන් ලෙස පුහුණු කර ගැනීමේ මාර්ගයක් වශයෙනුත් යටත්විජිත ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ උනන්දුව ඇති විය. එමෙන් ම පලාත් පාලන ආයතන හා පුද්ගලයන් එකතු වී සපයන මුදලින් පවත්වා ගෙන ගිය ඉරු දින පාසල් හා පුණ්‍ය පාඨශාලා මගින් මෙරට කම්කරු ජනතාවට ද අධ්‍යාපනය ලබා දීම සිදු විය. මෙසේ සමාජයේ විශාල පිරිසකට අධ්‍යාපන අවස්ථා ලබා දුන්න ද සමාජ පන්ති වෙන් කොට පවත්වා ගැනීමේ පාසල් ක්‍රමයක් ද මේ මගින් වර්ධනය කෙරුණි (Mendis (1952) 2005: 42).

වර්ෂ 1876 එච්. කන්නන්ගර දේවගැතිතුමා විසින් රචිත ග්‍රාම ප්‍රවෘත්තියක් ප්‍රබන්ධයෙහි නිරූපිත දිනෙස් ගමරාල නමැති කුලීකරුවාගේ දරුවන් ලද අධ්‍යාපනය සහ ගමරාලගේ බිරිඳ කුලී වැඩ කළ ස්වාමියාගේ දරුවන් ලද අධ්‍යාපනය තුලනය කිරීමෙන් යටත්විජිත ලංකාවේ අධ්‍යාපනය එක් පසෙකින් පුද්ගලයාට සිරස් චලතාවට අවකාශ ලබා දෙන අතර ම අනෙක් පසින් පන්ති පදනම් තහවුරු කිරීමෙහි ලා ද කටයුතු කළ ආකාරය ද පෙන්නුම් කෙරෙයි (කන්නන්ගර (1876) 1903: 24).

මේ සමාජ අන්ත දෙක අතර වූ සුළු ඉඩම් හිමියන්ගේ හා ග්‍රාමීය සුළු ධනේශ්වර පාන්තික දරුවන්ගේ අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි ස්වභාෂා පාසැල් ඇරඹිණි. ඒ මගින් ස්වභාෂා දැනුම හා ඉංග්‍රීසි භාෂාව මූලික වශයෙන් පරිහරණය කිරීමේ අවකාශ විවර විය. එමෙන් ම විවිධ වෘත්තීන් සඳහා ඉලක්කගත අධ්‍යාපනයක් ලැබීමේ අවස්ථාව ද ලැබිණි. ගම්වල සිට නගර කරා පැමිණි මෙවන් පහළ සහ අතරමැදි තරුණයෝ විවිධ ජීවනෝපායයන්හි යෙදෙමින් වඩා පිළිගත් රැකියා සඳහා අධ්‍යාපන කටයුතුවල ද නිරත වූහ. ඩබ්ලිව්. ඒ. සිල්වාගේ පාසල් ගුරුවරී (1924) නමැති ප්‍රබන්ධයෙහි බැනට් නම් තරුණයා නගරයට පැමිණ තාවකාලික රැකියාවන්හි නිරත වෙමින් දැඩි උත්සාහයෙන් නීතිය හැදෑරීමෙන් නව සමාජ පරිවර්තනයේ සිරස් සමාජ සංචලන හැකියාවෙහි ඵල ලැබූවෙකි.

> ''...... බැනට් නම් තරුණයා සම්බ කරමින් ඉගෙන ගත්තේය. ගෙවල් කුලියටත්, කෑම් බීම්වලටත්, පොතපත ගැනීමටත් ගුරු පිඩුරුවලටත් මුදල් සැපයීමටත් තිස් පැයේම වැඩ කරන්නේය'' (සිල්වා 1924 : 22).

පූර්ව යටත්විජිත අඳ ගොවියා වෙනුවට යටත්විජිත යුගයෙහි වැටුප් ශ්‍රමිකයා ආදේශ වූ ආකාරයෙන් ශිල්ප ශ්‍රේණි මත පදනම් වූ අධ්‍යාපනයට සාපේක්ෂ ව යටත්විජිත යුගයේ ක්‍රියාත්මක වූ අධ්‍යාපනය ඕනෑ ම පුද්ගලයකුට මුදල් මගින් අත් කර ගත හැකි වූවක් බවත් මේ මගින් ප්‍රකට වේ.

> ''බැනට් අල්විස් දන් මුළු ලක පතළ ප්‍රසිද්ධියක් ඇති මහතෙකි. පරාර්ථකාමී ජාති හිතෛෂියෙකු වශයෙන් ද විශාරද නීතිවේදියෙකු වශයෙන් ද ජීවිතය ආරම්භ කළ ඔහුට ස්වකීය උද්යෝගිමත් භාවය නිසා මඳ කලකින්ම ධනය ගං වතුරක් සේ මෙන් ගලන්නට පටන් ගත්තේය ...'' (සිල්වා 1924: 153).

එහෙත් පුද්ගලයකු නැතහොත් පවුල් සංස්ථාවක් කිසියම් පන්තියකට අන්තර්ග්‍රහණය වීම යනු හුදෙක් අදාළ පන්තියට අනුකූල වන ආර්ථික ශක්තියෙන් සමන්විත වීමෙන් පමණක් සිදු කළ හැක්කක් නොවේ. ඒ ඒ සමාජ කණ්ඩායම ඉලක්කගත 'පන්තිය' සතු වන්නා වූ භෞතික මෙන් ම ආධ්‍යාත්මික සංස්කෘතියෙහි ද හිමිකරුවන් විය යුතු ය. එනම් අදාළ සමාජ පන්තියෙහි සංස්කෘතික ලෝකයෙහි ස්වකීය පැවැත්ම තහවුරු කර ගැනීමෙහි සමත් විය යුතු ය. විශේෂයෙන් ම ඉලක්කගත පන්තිය සමාජයේ අධිපතිවාදී පන්තිය නැතහොත් බලාධිකාරයේ කේන්ද්‍රය වන අවස්ථාවක දී මේ තත්ත්වය වඩාත් අභියෝගාත්මක වේ. සලමන් දල්පදාදුගේ ලිසීගේ වාසනාව (1910) කෘතියෙහි රොමියෙල් අතිශය දුක්ඛිත පවුලක ජන්මලාභී ව වයස අවුරුදු එකොළහේ දී පමණ පාරුවක කුලීකරුවකු ලෙස කටයුතු කෙළේ ය.

> ''එක්තරා දුප්පත් කුලයක ඉපිද බාල කාලයෙහි මහත් සේ දුක් විඳිනු ලැබ දැඩි උත්සාහය හේතු කොටගෙන ක්‍රම ක්‍රමයෙන් ධනය උපදවා අධික ධනවන්තභාවයට පැමිණියා වූ රොමියෙල් මුදලාලි යැයි තැනැත්තෙක් විය...... කවර දිනකවත් අමුඩය හැර වෙන ඇඳුමක් එවකට නැතුවායින්දෝ මොහු ඇන්දේම නැත..... සොළ සැවිරිදි වයස් වූ කල්හි පාරුවල බඩු පටවා ගෙන යමින් කොළඹ හා රත්නපුර අතරෙත් වෙළඳාම් කරණ එවකට ලොකු වෙළෙන්දෙක් වූ අබන්චි මුදලාලිගේ පාරුවක කුලියට වැඩ කිරීම පිණිස ගියේය'' (දල්පදාදු 1910: 1-2).

යම් පුද්ගලයකුට හිමි වන ආර්ථික ස්ථාවරත්වය අනුව ඔහුගේ පන්තිය තීරණය වීමේ මාක්ස්වාදී විග්‍රහයට අනුව රොමියෙල් සතු ධනය මගින් සමාජමය වශයෙන් සිරස් චලතා ශක්‍යතාවෙන් යුතු වූවෙකි (Marx 1942: 532). එහෙත් රොමියෙල් මුදලාලි කෙතරම් ධනවත් වී භෞතික වශයෙන් ධනේශ්වර පන්තියට සම කළ ද ඔහුට සංස්කෘතික වශයෙන් එකී පන්තිය හා අනුකූල විය නොහැකි විය.

> ''... නිල මැස්සා මලෙහි සුවඳ නොදන්නාක් මෙන් ඉගෙනීමෙහි නිලතල ලැබීමෙහි අගය හෙතෙම නොදැනීමය. මේ මුදලාලි නිදසුන් කර පෙන්වූයේ තමන්ගේ ධනවන්ත භාවයයි. මොහුගේ මහා ධනයේ හැටියට උගතෙක්ව නිල දරන්නෙක්ව සිටියා නම් එවිට ඇති වන්නා වූ බැබලීමෙහි හා ගරුත්වයෙහිත් මාහැඟිකම කල්පනා නොවන්නේ නුගත්කමේම දෝෂයෙන්ම යැයි කීම වරද රහිතය'' (දල්පදාදු 1910: 18).

මෙවන් පසුබිමක දී සිදු වන නව පන්ති නිර්මාණය හා පුද්ගල චලතාව එක් පරම්පරාවකින් සිදු කළ හැකි දෙයක්

නොවන බව ප්‍රත්‍යක්ෂ වේ. උත්සාහයෙන් ධනවත් වූ රොමියෙල්ගේ නූගත්කම, විශේෂයෙන් ම ඉංග්‍රීසි භාවිතයෙහි නොහැකියාව හා බටහිර සංස්කෘතිකාංග අවශෝෂණයෙහි අපොහොසත්වීම මෙරට ගොඩනැගී තිබුණු ඉහළ සමාජ ස්තරය හා අනුබද්ධ වීමේ අවකාශය අහුරවා ලීය. ජන්මයත් සමගම උරුම වූ සමාජ ස්තරණයේ සංචලන සාධක නොවූ 'කුලය' හා 'වංශය' හේතු කොට ගෙන බලය හිමි ඉහළ සමාජය වෙත සංකේන්ද්‍රණය විය නොහැකි විය. ලංකාවේ සමාජ පරිණාමයෙහි දී නූතනත්වයට ප්‍රවිෂ්ට වීමෙහි ස්වභාවය මෙයට හේතු විය. එනම් පූර්ව යටත්විජිත යුගයක මෙරට ක්‍රියාත්මක වූ වැඩවසම් සමාජ සංස්ථා පූර්ණ වශයෙන් අහෝසි වී ධනේශ්වර සමාජ ක්‍රමයක් බිහි වීම සිදු නොවීමයි. එහෙයින් යටත්විජිත යුගයෙහි මෙරට බිහි වූ අභිනව සමාජයට සාම්ප්‍රදායික සමාජ සංස්ථාවන්හි බලපෑමෙන් පූර්ණ වශයෙන් වියුක්ත විය නොහැකි විය. එකී සමාජ යථාර්ථය රොමියෙල්ගේ චරිතයෙන් වඩාත් යථාර්ථවාදී ලෙස ප්‍රතිනිර්මාණය වී තිබේ. රොමියෙල්ගේ ධනවත්කම හේතුවෙන් තම එක ම දියණියන්ට කුලයෙන්, වංශයෙන් උසස් සහකරුවෙකු සොයා ගැනීමට හැකි වූ අතර ඒ අනුව රොමියෙල්ගේ දෙවන පරපුරට ඉහළ පන්තිය වෙත ප්‍රවිෂ්ට වීමේ සමාජ අවකාශ ලබා ගත හැකි විය.

> ''.... මේ අතුරෙහි නීතිඥයන් නියමයෙන් කැක්සර් නෝනා ලිසීට චාරිත්‍රාදිය උගන්වනු පිණිස මුදලාලිගේ නිවසෙහි මඳ කලක් නැවතීමට පත් විය. එවිට ලිසී කොයි ආකාරයෙන් නමුත් කාගෙන් වුව කාලයට යෝග්‍ය වූ හොඳ චාරිත්‍රය ඉගැනීම සුදුසු යැයි මෙනෙහි කොට මැලි සිත් නොව කැක්සර් නෝනාගේ සිරිත් ආදිය උද්ග්‍රහණය කළාය...'' (දල්පදාදු 1910: 47-50).

තත්කාලීන පුද්ගල හා සමාජ යථාර්ථය මෙම ප්‍රබන්ධය මගින් න්‍යායාත්මක ව මෙන් ම ප්‍රායෝගික වශයෙන් ද සනාථ කෙරෙයි.

අඳ ගොවියන් ලෙස එතෙක් ඉඩම් සමග බැඳී සිටි ගැමියා නිදහස් ශ්‍රමිකයෙකු බවට පත් වී නව ආර්ථික ක්‍රියාවලියෙහි ප්‍රතිඵල ලෙස නාගරික වැටුප් ශ්‍රමිකයකු ලෙස නිර්මාණය විය. එමෙන් ම තම අයිතිය තහවුරු කොට ගත නොහැකි වීමේ හේතුවෙන් ඉඩම් අහිමි වූ ප්‍රජාව වැටුප් ශ්‍රමිකයෝ ලෙස නගර කරා ඇදී ගියහ. එහි ප්‍රතිඵල ලෙස නාගරීකරණය ඇති වූ අතර නාගරික අඩු ආදායම්ලාභී පුහුණු නුපුහුණු කම්කරුවෝ නව සමාජ ස්තරයක් ලෙස බිහි වූහ. මේ යථාර්ථය ප්‍රතිනිර්මාණය කළ ප්‍රබන්ධ ද දුර්ලභ නොවේ (සිරිසේන 1909: 54, සිල්වා 1924: 21, ගුණවර්ධන 1912: 31, ජිනදාස 1923: 33, රාජකරුණා 1925 : 03).

> ''... පරම්පරාගත ගරුභාවය ගැන නිරන්තරයෙන්ම විශේෂ සැලකිලි කිරීම බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ධර්මතාවකි(sic). ඒ ධර්මතාවයට (sic) අනුව මොහුට ද ''වාසල මුදලි'' නාමය ආණ්ඩුවෙන් ලැබී තුබුනේය. ...... මොහු ඉතා යෞවන කාලයෙහිම සුසානා වීරවික්‍රම සමරනායක හාමු නම් වංශවත් තරුණියක් හා විවාහ වීය. මෝ තොමෝ කලක් මාගම්පත්තුවේ මුදලි තනතුරු ඉසුළු ජොරොනිමුස් වීරවික්‍රම සමරනායක මහතාගේ එකම දියනියයි. එබැවින් ස්වකීය ලමාතැනියගේ පාර්ශවයෙන් ද පරම්පරාගත මහා ධනය මේ වීරකෝන් මුදලිතුමාට අත් විය'' (පෙරේරා 1908 : 02).

ලංකාවේ බැංකු ක්‍රමයක ආරම්භය ඇති වීමට බලපෑම් කළේ වතු වගාවේ වර්ධනයත් ඒ සමාන්තරව වැඩුණු ආයාත වෙළඳ කටයුතුත් ය. වතුකරයේ අවශ්‍යතා හා ආයාත වෙළඳ කටයුතු සඳහා අවශ්‍ය මුදල් සැපයීමට ද විදේශීය ලැබීම් හුවාමරු කිරීමේ අතරමැදි කටයුතු ඉටු කිරීම සඳහා ද බැංකුවල අවශ්‍යතාව පැනනැගිණි (බණ්ඩාර 2007: 115-116).

> ''... ඔවුන් සඳහා ම හොඳ ඉංග්‍රීසි මාධ්‍යයේ පාසල් පිහිටුවන ලදී. එක් අවස්ථාවක ස්වදේශීය ප්‍රධානීන් ඉංග්‍රීසි පිළිබඳ ව දැනුමක් ලබා සිටීම අවශ්‍ය බව ආණ්ඩුව දන්වා සිටියේය'' (බණ්ඩාර 2007: 149).

වර්ෂ 1876 දී ප්‍රකාශයට පත් ග්‍රාම ප්‍රවෘත්තියක් (කන්නන්ගර 1876) නමැති ප්‍රබන්ධයෙහි නිරූපිත 'දිනෙස් ගමරාල' ද දිනකට සිලිං 15ක් ලබන වැටුප් ශ්‍රමිකයකු ලෙස අගනුවර වෙත සංක්‍රමණය වූවෙකි. ඔහුගේ බිරිඳ ද සිලිං 10ක මාසික වැටුපකට ගම් ප්‍රදේශයේ ම මහත්මයකුගේ ගෙවත්ත පිරිසිදු කිරීමේ රැකියාවක නිරත වූවා ය.

> ''...සමහර දවස්වල දී ලමයින්ගේ හාමත වළකන තරම් කෑම සපයා දෙන්නටත් බැරි විය. එබැවින් මාසේට සිලිම් දහය බැගින් පඩි ලබනු කැමතිව ගමමහගේ ඒ අසල මහත් කෙනෙකුගේ අඹ උයනයේ පරිඩලා පත් අතුගෑමේ වැඩට පත්වුණාය'' (කන්නන්ගර (1876) 1903: 28).

ඇය මසකට සිලිං 10ක් ලබන විට නගරයේ කුලී රැකියාවෙන් ඇයගේ ස්වාමියා දිනකට සිලිං 15 බැගින් මසකට සිලිං 450ක වැටුපක් ලැබී ය.

> ''... කුලී වැඩක් කරන්නට හිතාගෙන වැඩ තිබෙන තැනක් සොයන පිණිස කොළඹට ගිය ගමරාල... මාසේ ඉකුත් වූ කල ගමරාළට සිලිම් පහලොහක් දවස් කුලිය වශයෙන් ලැබුණාය'' (කන්නන්ගර (1876) 1903: 41).

ග්‍රාමීය පහළ පාන්තික ජනයා අභිනව සමාජාර්ථික ක්‍රමයට අනුගත වෙමින් වඩා උසස් ජීවන තත්ත්වයක් උදෙසා නගර වෙත සංක්‍රමණය වීමෙහි ප්‍රධාන උත්තේජකයක් වූයේ මෙම වැටුප් තලය යි. මෙහි ප්‍රතිඵලය වූයේ යටත්විජිත යුගයෙහි නාගරික පීඩිත පන්තියක් නිර්මාණය වීම යි.

අභ්‍යන්තර සංක්‍රමණය වනාහි සාම්ප්‍රදායික නිෂ්පාදන ක්‍රමයේ සිට නූතන ක්‍රමයට මාරු වීමේ ක්‍රියාවලියේ දී භූගෝලීය කලාපයක් මුදවා දෙන ප්‍රධාන ගැටලුවලින් එකකි (International Journal of Economics & Business Administration, Volume I, Issue (4) 2013 : 27-30 pp.*.


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

''වඩා හොඳ අනාගතයක් සොයායෑමේ පරමාර්ථයෙන් ග්‍රාමීය ඉඩම් අහිමි දිළිඳු ගොවියෝ නගර කරා සංක්‍රමණය වූහ. සිත්ඇදගන්නාසුලු ජීවිතය මෙන් ම වේගයෙන් හා පහසුවෙන් මුදල් ඉපයීමේ හැකියාව සහ නිර්නාමිකභාවය ලබා දෙන නිදහස නාගරීකරණ සඳහා ජනයා පෙලඹවීමෙහි ප්‍රධාන හේතුවක් විය'' (Irudaya Rajan; Sumeetha M. (Ed.) Arup Mitra 2020).

මෙරට යටත්විජිත සමාජ ස්තරණයෙහි තිරස් සමාජ සංචලනයෙහි ස්වභාවය ප්‍රකට කෙරෙන නිර්මාණයක් වන මෙම ප්‍රබන්ධය මගින් සමාජයෙහි ආන්තික ජීවිත ගත කළ කුලී ශ්‍රමිකයන් තම දරුවන්ට අධ්‍යාපනය ලබා දීමේ ප්‍රතිඵල ලෙස ස්වකීය පරම්පරාව ඉක්මවූ සමාජ තලයක් වෙත තම දරුවන් යොමු කිරීමේ අවකාශ ලබා ගත් ආකාරය විශද කෙරේ (කන්නන්ගර 1876: 62). මේ අනුව පන්ති ක්‍රමය ක්‍රියාත්මක වූ නව සමාජ ව්‍යූහය පූර්ව යටත්විජිත යුගයෙහි මෙරට ක්‍රියාත්මක වූ අනම්‍ය ධුරාවලිගත වැඩවසම් ක්‍රමයට සාපේක්ෂ වශයෙන් නම්‍යශීල ස්වභාවයක් ප්‍රකට කිරීමේ සමාජ යථාර්ථය කෙරෙහි ප්‍රබන්ධ රචකයින්ගේ අවධානය යොමු වී තිබුණි (පෙරේරා 1907: 06, සිල්වා 1903: 34, සිරිසේන 1909: 03).

දහනව වන සියවසෙහි දී අභිනව සමාජයෙහි ධනපති පන්තියේ මුදලිවරු තම තත්ත්වය තහවුරු කර ගැනීමෙහි අරමුණු පෙරදැරිව පවුල් කවය ඇතුළත විවාහ සන්ධාන ගොඩනගා ගැනීමට උත්සුක වූහ (ජයවර්ධන 2006: 246). තම පන්තිය නියෝජනය කරන පවුලක් සමග පවත්වන විවාහ සම්බන්ධතා සමාජ පිළිගැනීම මෙන් ම විශේෂයෙන් ම සංස්කෘතික අන්තර්ග්‍රහණය හේතුවෙන් පොදු අනුමතිය ලද විවාහ ලෙස ප්‍රකට විය. යටත්විජිත අවධියෙහි රචිත ප්‍රබන්ධවල නිරූපිත ඉහළ පන්තික විවාහ බහුතරයක් ස්වකීය පන්තිය ඇතුළත ම සිදු වූ ඒවා වෙයි. ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ඉහළ තලයට පිවිසි පවුල්වල දියණියන් දායාද සහිත ව වෛද්‍ය, නීතිඥ වැනි රජයේ උසස් රැකියා මගින් ඉහළ සමාජ තත්ත්වයක් වෙත ප්‍රවිෂ්ට වූ තරුණයන්ට විවාහ කර දීම මේ අනුව සිදු විය.

''ධනවත් පවුලක දියණිය වූ මේරා පවුන්ඩ් හයදාහක පමණ දායාද සමග පෙරකදෝරුවකුට විවාහ යෝජනා කරයි... ඒ දායාදයක් මට උවමනා නොවේ. තමුන්නාන්සේ කැමැත්තෙහි නම් යම්කිසි ත්‍යාගයක් සිය දුවණියට දීම ගැන මම අකමැති ද නොවෙමි'' (පෙරේරා 1908 : 68).

සමකුල සමපන්තික විවාහ සමාජ පිළිගැනීමට මෙන් ම පවුල් අතර පොදු එකඟ බව ලැබීමට ද හේතු වූවා පමණක් නොව, ස්වකීය පවුල් අතර වන අන්‍යෝන්‍ය බැඳීම මෙන් ම ආර්ථික සුරක්ෂිතතාව හා සමෘද්ධිය තහවුරු කිරීමට ද හේතු විය. එඩ්මන්ඩ් ගුණරත්නගේ දීප්තිමතී ප්‍රබන්ධයෙහි මේ විවාහ කටයුතුවල ස්වභාවය මෙසේ දැක්වේ:

''ලක්දිව ඉතා වංශවත් පවුල් දෙකක සම්බන්ධතාව ඇති වූයේය. ධනධාන්‍යාදියෙන් ආඪ්‍ය වූ, ප්‍රශස්ත කුල පරම්පරාවකින් පැවත එන දහස් ගණන් ජනයා විසින් එකහෙළා ගෞරව සම්භාවනා කරනු ලබන සැම්සන් අමරසිංහ රජ වාසල මුදලිතුමාගේ එකම පුත්‍රයා වන වින්සන්ට් වික්ටර් අමරසිංහ තරුණ බැරිස්ටර්තුමා, ලොකු බණ්ඩා ධර්මවර්ධන රදල මන්ත්‍රීවරයානන්ගේ වැඩිමහල් දුහිතෘ වන ලැටීෂියා ධර්මවර්ධන තරුණ කුමාරිහාමි සමග විවාහ බන්ධනයට ඇතුළත් වීම මේ උසස් වූ බලසම්පන්න වූ පවුල් දෙකට අයත් ස්ත්‍රී-පුරුෂයින්ට මෙන්ම අන්‍ය බොහෝ දෙනාටත් අතිශය තුෂ්ටිදායක කරුණක් වූයේය'' (ගුණරත්න 1919 : 01).

විවාහය පෞද්ගලික ව පවුල විසින් සූදානම් කරනු ලැබීමත්, කුලය හා ධනය මත පදනම් වීමත් හේතුවෙන් වෙළඳාම හා අරක්කු රේන්ද අයිතිය මගින් ඉදිරියට ගිය පවුල් අතර බොහෝ විට අන්‍යෝන්‍ය විවාහ සිදු විය. පුරෝගාමී කරාව පවුල් බොහොමයක් ද විවාහ මගින් සම්බන්ධ වී තිබිණ. බාලප්පු වඩුගේ ගබ්රියෙල් මෙන්දිස්ගේ පුත් වූ බී. සයිමන් මෙන්දිස් විවාහ වූයේ හෙට්ටියකන්දගේ ජුවන් ප්‍රනාන්දුගේ දියණියන් වූ ලියොනෝරා සමගය (ජයවර්ධන 2006: 76). තෙල්පේ පීරිස් පවුල හා විදානෙලාගේ මෙල් පවුල විවාහ සම්බන්ධතා ඇති කර ගෙන සිටි තවත් පවුල් දෙකකි. එමෙන් ම වරුසහැන්නැදිගේ සොයිසලා සහ හැන්නැදිගේ පීරිස්ලා විවාහය මගින් සම්බන්ධ වූ පවුල් වූහ (Roberts 1975: 05). එම්. සී. එෆ්. පෙරේරාගේ මගේ කරුමේ ප්‍රබන්ධයෙහි දැක්වෙන මොරටුවේ 'උයන' පදිංචි තියෝබෝල්ඩ් ප්‍රනාන්දු ධනවත් මිනිරන් වෙළෙන්දෙකු වූ කොළඹ ජෙරෝම් පෙරේරා රේන්ද මහතාගේ දුවක වූ මාර්තා මරිය පෙරේරා හා විවාහ විය (පෙරේරා 1907: 47). යටත්විජිත යුගයෙහි නව ආර්ථික ක්‍රමය හේතුවෙන් බිහි වූ ධනපති පන්තික විවාහ කටයුතු මගින් තත්ත්ව හෝ ප්‍රතිමාන හෝ ප්‍රතිෂ්ඨාපනයෙහි ලා උත්සුක වීමේ යථාර්ථය ප්‍රබන්ධකරුවන්ගේ අවධානයෙන් බැහැර නොවී ය. මෙහි ඇති තවත් වැදගත් කරුණක් වන්නේ වැඩවසම් ක්‍රමයෙහි පූර්ණ බිඳවැටීමක් මත ප්‍රතිෂ්ඨාපිත ධනේශ්වර සමාජයක් මෙරට යටත්විජිත පාලනයෙහි ප්‍රතිඵල ලෙස බිහි නොවුණු යථාර්ථය ද උක්ත නිදසුන් මගින් සනාථ වීම යි. එනම් අභිනව පන්ති ක්‍රමය බිහි වීමේ දී 'කුලය' නමැති වැඩවසම් ස්තරීකරණ පදනම පූර්ණ වශයෙන් අහෝසි නොවීම යි. එහි ප්‍රතිඵලයක් වූයේ නව පංති බිහි වීමේ දී එහි අනන්‍යතා සාධකයක් ලෙස 'කුලය' තව දුරටත් පවුල් හෝ පෞද්ගලික අවකාශයෙහි සැලකිය හැකි මට්ටමක ශේෂව පැවතීමයි (පෙරේරා 1907: 25, ගුණවර්ධන 1912: 98, ජයසේකර 1907: 16, අභයරත්න 1916: 78, නිශ්ශංක 1923: 46, රණසිංහ 1924: 112, ගුණරත්න 1919: 01, විමලනාථ 1925: 132, ධර්මබන්ධු 1925: 45, ජිනදාස 1925: 08, කනකරත්න 1921: 34, ගුණරත්න 1919: 11, සිරිසේන 1918: 131). තම කුලයට වඩා පහත් යැයි සම්මත කුලයක තරුණියක සමග විවාහ වීම හේතුවෙන් ජුවන් මුදලාලි ස්වකීය ඥාති සමූහයාගෙන් ප්‍රතික්ෂේප වූ ආකාරය එම්. සී. එෆ්. පෙරේරාගේ විනාශ වූ නෞකාව ප්‍රබන්ධයේ දැක්වේ (පෙරේරා 1910: 14). මෙය යටත්විජිත යුගයේ දී ද විවාහය සම්බන්ධ කටයුතුවල දී කුලය සැලකිය යුතු බලපෑමක් සිදු කළ බවට සාක්ෂ්‍ය සපය යි.


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මෙය කුල ධුරාවලිය මත පදනම් වූ හා කුලය හා වෘත්තිය එකිනෙක සම්බන්ධ කළ ප්‍රාග් ධනවාදී සමාජයක සිට කුල භේදයෙන් තොර ආර්ථිකයක් වෙතට දුවැන්ත හැරීමක් ඇති වූ යටත්විජිත යුගයේ දී ආර්ථිකය විසින් කුල භේදය නිවස හා පවුල පිළිබඳ පෞද්ගලික ක්ෂේත්‍රයට විතැන් කරනු ලැබීමෙහි සාහිත්‍යික ප්‍රකාශනයක් ලෙස දැක්විය හැකි ය.

පියදාස සිරිසේනගේ මහා වියවුල ප්‍රබන්ධයෙහි ජෝන් ද මැල් කරාව කුලයේ ධනවත් තරුණයෙකි. නන්දාවතී පියා මිය ගොස් ඉඩම්කඩම් අහිමි ව මව සමග වාසය කරන ගොවිගම කුලයේ තරුණියකි. ජෝන් ඇයට විවාහ යෝජනා කරයි:

> ''දැන් අපේ කුලයේ මිනිස්සු කී දෙනෙක් ගොවි කුලයේ ස්ත්‍රීන් විවාහ කරගෙන සිටිත් ද?
>
> එසේම ගොවි කුලයේ කී දෙනෙක් කරාව කුලයේ ස්ත්‍රීන් විවාහ කරගෙන සිටිත් ද?'' (සිරිසේන 1909: 87).

යටත්විජිත යුගයේ බිහි වූ නව ධනපති පන්තිය පෙළපත අතින් හෝ උගත්කමෙන් හෝ උසස් වූ නමුත් ආර්ථික වශයෙන් පහළ තත්ත්වයක සිටි පුද්ගලයින් හා ඉතා ධනවත් නමුත් උගත්කමක් හෝ තත්ත්වයක් නොතිබුණු පවුල් අතර ඇති වූ මෙවැනි විවාහ ''පරිපූර්ණ විවාහ'' ලෙස සලකනු ලැබේ (ජයවර්ධන 2006: 341).

> ''ඉස්සර නම් ඔවුන්ගෙන් දියවත් බොනවැයි?
>
> දැන් ඉතිං නරක මොකද සල්ලි තියෙන කොට''
>
> ''ඒක නම් හැබෑ තමයි. නමුත් දැන් ඔය පරණ නම්බු ආදිය වැඩි දෙනෙක් නොතකයි. ශාස්ත්‍රය, ධර්මය, ධනය යනාදියෙන් වැඩිදියුණුව සිංහල ශීලාචාරය ලෙස ක්‍රියා කිරීම පමණක් නම්බුව හැටියට පිළිගැනීම යෝග්‍යයි. රොමියෙල් කොතරම් හොඳ ගතිගුණ ඇති කොයිතරම් ධනවත් මිනිහෙක් ද?'' (දල්පදාදු 1910 : 34).

මෙහි දැක්වෙන පරිදි යහපත් ගතිගුණ සහ ධනය ප්‍රමුඛ කොට සැලකීමෙන් කුල සාධකය විස්ථාපනය කළ හැකි වෙයි. 19 වන සියවසෙහි පමණ ලාංකේය සන්දර්භයෙහි කුලය, සාපේක්ෂ වශයෙන් කිසියම් නම්‍යශීල ආකාරයෙන් ක්‍රියාත්මක වූ බව මින් පැහැදිලි වේ. පූර්ව යටත්විජිත යුගයේ කුලය මත ඒකරාශී වී තිබුණු සමාජ තත්ත්වය, යටත්විජිත ධනේශ්වර ආර්ථික ක්‍රියාවලියෙහි දී 'ධනය' වෙත විතැන් වීම හේතුවෙන් සමාජ ස්තරණ සාධක අතර මුදලට ප්‍රමුඛත්වය හිමි විය.

එසේ වුව ද වැවිලි ආර්ථිකයේ ප්‍රතිඵල ලෙස මෙරට ගොඩ නැගුණු නව ධනපති පන්තිය ක්‍රමයෙන් තම පවුල් කවය ඇතුළත පමණක් නොව සමාජ, ආර්ථික හා සංස්කෘතික වශයෙන් සමාන පවුල් සමග කටයුතු කිරීමට උත්සුක වීම ද තත් යුගයෙහි කැපී පෙනෙන ලක්ෂණයක් විය. සියලු අංශවලින් තමා හා සමාන වූත්, සමාගම් පැවැත්විය හැකි වූත් විවාහ කටයුතු කළ හැකි වූත් සම්මත කුල ගෙවල් කිහිපයක් සමග ඇසුර පැවැත්වූ අතර මේ තත්ත්වය තත්කාලීන ප්‍රබන්ධකරුවන්ගේ අවධානයට ලක් වී තිබිණි (සිල්වා 1923: 64). සම පාන්තික විවාහයට වඩා වැඩි නම්‍යතාවක් ප්‍රකට කිරීමේ යථාර්ථය එම්. සී. එෆ්. පෙරේරාගේ සිරිමැදුර (1908) ප්‍රබන්ධයෙන් මෙසේ ප්‍රතිනිර්මාණය කෙරෙයි.

> ''... ඒ කොයිහැටි වුවත් අපගේ දියණිය අප විසින් ධනවතකුගේ පුත්‍රයකුට විනා අන්‍යයකුට පාවාදීම නොසැහෙන්නේය. දුප්පත් අයෙක් අප වැනි පොහොසත් පවුලකට ඇතුළත් උනාම ඔහුට මහත් හිරිහැර කරදර ලැබීම සත්‍යයයි'' (පෙරේරා 1908: 31).

සාම්ප්‍රදායික සමාජ ක්‍රමයෙහි මුඛ්‍යාංගය වූ රාජකාරි ක්‍රමය කුල ක්‍රමය හා සම්බන්ධ ව ක්‍රියාත්මක වූවකි. පෞද්ගලික නිදහසට එරෙහි ව බලාත්මක වූ සමාජ ආයතනයක් වූ එය අහෝසි කිරීමත් සමග ම ධනෝපායන මාර්ගයන්හි රජය සතු වූ ඒකාධිකාරය ද අහෝසි විය. ඒ අනුව තම උත්සාහය හා හැකියාව අනුව පුද්ගලයකුට ආර්ථික වශයෙන් ඉහළ තත්ත්වයකට එළඹීමෙහි අවකාශ විවර විය. මෙය දේශීය ධනේශ්වර පන්තියක් බිහි වීමෙහි පදනම සැකසූ අතර එතෙක් කුලය ආශ්‍රිත ව ගොඩනැගුණු සමාජ අගයන් ධනය සමග සම්බන්ධව ක්‍රියාත්මක වීමෙහි ආරම්භය ද විය. මෙරට ආරම්භක යුගයෙහි ප්‍රබන්ධකරුවකු වන අයිසැක් ද සිල්වාගේ වාසනාවන්ත පවුල හා කාලකණ්ණි පවුල (1888) ප්‍රබන්ධයෙහි නිරූපිත චාල්ස් නම් තරුණයා ධනෝපායන මාර්ගයක් ලෙස කඩ වෙළෙඳාමෙහි යෙදෙ යි. ඔහුගේ විවාහයේ දී දෙමාපියෝ විශාල දෑවැද්දක් ලබා ගැනීමෙහි උත්සාහ දරති. එමෙන් ම මුදල් ඉතිරි කිරීමේ අරමුණින් ඔහු සේවිංස් බැංකුවේ මුදල් තැන්පත් කරයි (ද සිල්වා, 1888: 54). සයිමන් සිල්වාගේ මීනාහි ඩැනී ද ඉහළ පවුලකින් විවාහයක් සිදු කර ගැනීමට උත්සාහ කිරීමෙහි අරමුණ ද මුදලෙහි වලංගු බව හා සමාජ අගය නිර්මාණයෙහි පවත්නා ඍජු සම්බන්ධයයි.

> ''...... අපට මුදල් හදල් රැකී රක්ෂාවල් ඕනෑ කෙරේ. ඒ කොයිවත් ලබා ගැනීමට දැන් මාර්ගය එළිව තිබේ'' (ද සිල්වා 1905: 110).

එම්. සී. එෆ්. පෙරේරාගේ මගේ කරුමෙ (1906) ප්‍රබන්ධයෙහි ද බොහෝ සිදුවීම් ධනය කේන්ද්‍ර කොට ගෙන ගොඩනැගී තිබේ. එහි රත්නසේකර නම් තරුණයා සිල්වියා නමැති තරුණිය විවාහ කර ගැනීමෙහි අරමුණ වන්නේ ඇයගේ පියා සතු ධනස්කන්ධය ඇයට හිමිවේය යන අපේක්ෂාවෙනි. එය නොලැබුණු විට ඇය වෙත වූ ප්‍රේමය ද ක්ෂය වී යයි. මෙහි අන්තර්ගත ප්‍රධාන චරිතය ධනය විසින් හසුරුවනු ලබන ආකාරය ද හඳුනාගත හැකි ය. පෙරේරාගේ ලංකා අභිරහස් (1907) නමැති ප්‍රබන්ධයෙහි මහරේන්ද්‍රරාලගේ දියණියන් වන සැල්මිනා නම් තරුණිය විවාහ කර ගැනීමට ඩේවිඩ් ද සිල්වා නම් නීතිඥයා උත්සුක වූයේ ඇය කෙරෙහි වූ


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ප්‍රේමයෙන් නොව, ඇයගේ පියා සතු ධනයෙහි ලෝභයෙනි (පෙරේරා 1907: 34). මේ කතුවරයාගේ ම ආලයේ ලීලය (1908) නම් ප්‍රබන්ධයෙහි අන්තර්ගත ගැටුම්, දිවි නසාගැනීම් ආදි වූ බොහෝ අර්බුද හා සිද්ධි ධනය හා සම්බන්ධ ව ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි ව නිරීක්ෂණය කළ හැකි ය. පියදාස සිරිසේනගේ අපට වෙච්ච දේ (1909) හා තරුණියකගේ ප්‍රේමය (1910) ප්‍රබන්ධවල දී නූතන සමාජයේ ධනයෙහි තීරණාත්මක බව අවධාරණය කෙරෙ යි. විජයදාස නමැති දිළිඳු තරුණයා කැරොලයින් නම් ධනවත් තරුණියගෙන් ලද මුදලින් අධ්‍යාපන කටයුතු කිරීමේ ප්‍රතිඵල ලෙස විශාල ධනවතකු සේ ගොඩනැගෙ යි. මෙම නව සමාජ ක්‍රමයත් සමග ම එතෙක් පැවති සමාජ වටිනාකම් අබිබවා ධනය පෙරට පැමිණීමත්, සාමාන්‍ය ජනයාට ධනෝපායන මාර්ග විවර වීමත් කැපී පෙනිණි.

මේ පසුබිමෙහි මිනිරන් කර්මාන්තය කෙරෙහි ද ලාංකිකයන්ගේ අවධානය යොමු විය. 1911 පමණ සිට මෙරට අපනයනයෙන් 3.7%ක ආදායම් ලැබුවේ මිනිරන් වෙළඳාමෙනි (Ceylon Blue Book 1922: 63). මේ අතර බහුතරය ඉහළ මධ්‍යම පන්තික සිංහලයෝ වූහ. ඒ වන විට මෙරට ප්‍රධාන ජීවනෝපාය මාර්ග ලෙස ද මිනිරන් කර්මාන්තය ආශ්‍රිත රැකියා ව්‍යාප්ත ව පැවතිණි. මේ ආර්ථික තත්ත්වය ප්‍රබන්ධ රචකයන්ගේ අවධානයට ද ලක් විය. පියදාස සිරිසේනගේ විමලතිස්ස හාමුදුරුවන්ගේ මුදල් පෙට්ටිය (1919) ප්‍රබන්ධයෙහි 'වික්‍රමපාල' නම් රහස් පරීක්ෂකයා බොහෝ අවස්ථාවල දී වෙස් වලා ගන්නේ මිනිරන් අලෙවියෙහි අතරමැදියෙකු ලෙස හෝ පතල් කම්කරුවකු වශයෙනි (සිරිසේන 1919: 68). ඔහුගේ අපට වෙච්ච දේ (1909) කෘතියෙහි දැක්වෙන පරිදි කලක් දුප්පතකු ව සිටි 'විල්ෆ්‍රඩ් විජයරත්න' නමැත්තා ධනවතකු බවට පත් වන්නේ මිනිරන් කර්මාන්තයෙනි (සිරිසේන 1909: 27). ධනය ඉපයීමේ මාර්ගවල විවෘත ස්වභාවය විසින් ඇති කරනු ලැබූ සමාජ චලනාතාව මෙරට සමාජය නව ස්තරණයකට ලක් කිරීමෙහි සමත් වූ ආකාරය මෙසේ ලේඛකයන්ගේ අවධානයට ලක් වී තිබේ.

පූර්ව යටත්විජිත ලංකාවේ සාම්ප්‍රදායික අනන්‍යතාවලින් වියුක්ත කිසියම් ලිබරල් ජන කොටසක් ලෙස ක්‍රියාත්මක වූ යුරෝපීය මිශ්‍ර සම්භවයකින් යුක්ත බර්ගර් ජනයා ද මෙරට යටත්විජිත ධනපති පන්තිය නියෝජනය කළහ. නව ආර්ථික හා සමාජ අවකාශය උපයෝගි කොට ගනිමින් විද්වත් වෘත්තිකයන් ලෙස ධනපති පන්තියේ දෘෂ්ටිය සැකසීමෙහි ලා ඔවුන්ගේ දායකත්වය සුවිශේෂ විය (ජයවර්ධන 2006: 291). ඉංග්‍රීසි භාවිතයත්, බටහිර සංස්කෘතිකාංග අවශෝෂණයත් අරමුණු කොට ගනිමින් නගරයේ විසූ බර්ගර් ජනයාගේ නිවෙස්වල නැගී එන ධනපති පංතියෙහි පවුල්වල දරුවන් නේවාසික කිරීම යටත්විජිත යුගයේ දක්නට ලැබිණි. එම්. සී. එෆ්. පෙරේරාගේ මගේ කරුමේ ප්‍රබන්ධයේ සිල්වියා නම් වූ දූරිය ඉංග්‍රීසි ඉගැන්වීමට හා බටහිර සිරිත් පුරුදු කිරීමට 'මැකේ' නම් බර්ගර් කාන්තාවකගේ නිවසට යොමු කර තිබිණි (පෙරේරා 1910: 02). යටත්විජිත යුගයේ අභිනව පන්තියක් ලෙස ගොඩනැගුණු බර්ගර් ජනතාව බටහිර අධ්‍යාපනයත් සංස්කෘතියත් ඇසුරෙන් ස්වදේශික මධ්‍යම හා පහළ මධ්‍යම පන්තිකයින්ගේ සමාජානුයෝජන කාර්යයෙහිලා දායක වූ 'ආගම', 'ජාතිය' සහ 'අධ්‍යාපනය' පදනම් කොට ගනිමින් ඇති වූ වෙනස්කමෙහි ක්‍රියාවලිය මත මෙරට යටත්විජිත සමාජයෙහි බර්ගර් ජනයාගේ පන්ති අනන්‍යතාව ගොඩනැගුණු ආකාරය සිංහල ප්‍රබන්ධවල ප්‍රතිනිර්මාණය වෙයි (වික්‍රමසිංහ 1925, කුරුකුලසූරිය 1924).

නව අධ්‍යාපන ක්‍රමය ද මෙරට සමාජ අගයන් ප්‍රතිනිර්මිතියෙහි තීරණාත්මක සාධකයක් විය. වෘත්තිය ඉලක්ක කොට ගත් අධ්‍යාපන ක්‍රමය මගින් මෙරට පාලනයට අවශ්‍ය වෘත්තිකයන් බිහි කර ගැනීම අරමුණු කොටගත් අත්දැකීම් ප්‍රබන්ධකරුවාගේ අවධානයට ලක් විය. ඩබ්ලියු. ඒ. සිල්වාගේ ශ්‍රියාලතා නොහොත් අනාථ තරුණිය (1909) ප්‍රබන්ධයෙහි ප්‍රධාන චරිතය වන සිරිමාන්න රිටිගල වනාහි නීතිඥයෙකි. මාර්ටින් වික්‍රමසිංහගේ මිරිඟුව (1925) නවකතාවෙහි නිරූපිත තරුණයෝ දෙදෙනා ම නීතිඥයෝ වෙති. නව සමාජාර්ථික තත්ත්වය විසින් හඳුන්වා දෙනු ලැබූ අධ්‍යාපන ක්‍රමය නව රැකියා බිහි කිරීමටත්, එම රැකියාවලින් උපයන මුදල් හේතුවෙන් ධනවතකු වීමටත් ඉන් ලැබෙන පිළිගැනීම අභිනව සමාජ කේන්ද්‍ර ගොඩනැගීමටත් හේතු වූ ආකාරය මෙම ප්‍රබන්ධ මගින් නිරූපණය කෙරේ.

බ්‍රිතාන්‍ය පාලකයන්ගේ සමාජාර්ථික ප්‍රතිපත්තිවලට අනුරූප ව තත්කාලීන ලාංකේය සමාජය විශේෂ ස්තරණයකට භාජන වීම හේතුවෙන් මෙරට සමාජය මුහුණ දුන් අභියෝග රැසකි. එතෙක් පැවති කුල ක්‍රමය නව පන්ති ස්තරණය විසින් පූර්ණ වශයෙන් සමාජයෙන් විස්ථාපනය නොවීමත් ශ්‍රම විභජන විධියක් වශයෙන් අභිනවයෙන් ප්‍රවේශ වූ පන්ති ක්‍රමයට සාපේක්ෂ ව කුලය, විවාහය වැනි පෞද්ගලික ක්ෂේත්‍ර වෙත සීමා වීමත් හඳුනා ගත හැකි ය. එනම් අභිනව සමාජ පරිවර්තනය හමුවේ ප්‍රාග්ධනයේ ආධිපත්‍ය යටතේ ඇතැම් ආචීර්ණ කල්පික නිෂ්පාදන සම්බන්ධතා කිසියම් දුරකට ක්‍රියාත්මක විය. එමෙන් ම ඉංග්‍රීසි භාෂාව ද යටත්විජිත යුගයේ ස්තරණ සාධකයක් බවට පත් විය. තත්කාලීන රාජ්‍ය පරිපාලනය වාණිජ කටයුතු, නීතිය, අධ්‍යාපනය ආදි සියලු ම අංශයන්හි ඒකායන මාධ්‍යය ඉංග්‍රීසි භාෂාව බවට පත් විය. එය රටේ පරිපාලන භාෂාව බවට පත් වීම හේතුවෙන් පාලන තන්ත්‍රයත් යටත්වැසියාත් අතර ඇති වූ භාෂා පරතරය විසඳනු ලැබුවේ ඉංග්‍රීසි උගත් ලාංකික පන්තියක් බිහි කිරීමෙනි.

> "... මෙදින භෝජන සංග්‍රහයට කැඳවනු ලැබූ ටික දෙනා වූකලී දනසූරිය මැතිනිය ලාංකික සමාජයේ උත්තමාංශය යැයි සලකනු ලබන පක්ෂයේ කාන්තාවන් හා මහතුන් අතරෙන් ද විශේෂයෙන් තෝරාගනු ලැබූවන් බව කිවමනා නොවේ. දනසූරිය මැතිනිය උත්තමාංශයයි තෝරාගනු ලැබූ පක්ෂය, නිසගයෙන්ම ගුණදම් රැක්මෙහි දිරි ඇති ස්ත්‍රීන් හා පුරුෂයන්ගෙන් සමන්විත වූවයි සැලකිය යුතු නොවේ. උත්තමාංශය විනිශ්චය කෙරෙන්නේ ධනය හා බටහිර චාරිත්‍ර වාරිත්‍ර අගය කිරීම හා ඒ චාරිත්‍ර අනුව ජීවත්වීම, ආණ්ඩුවේ උසස් පදවියක් ඉසිලීම ආදී කරුණු සලකාගෙනය" (වික්‍රමසිංහ, 1925 : 25).


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

> "දනසූරිය මැතිනිය ඇගේ බාල දුව වූ මොලීට ද යුරෝපීය ඇදුරන් ලවා ඉංග්‍රීසි භාෂා ශාස්ත්‍රය ද යුරෝපීය කාන්තාවන් ගෙදරට ගෙන්වා ඔවුන් ලවා නැටුම්, ගැයුම්, වැයුම් ආදිය ද ඉගැන්වූවාය" (වික්‍රමසිංහ, 1925 : 22).

බටහිර ක්‍රමයට ඇඳුම්, ආහාර පමණක් නොව ඉංග්‍රීසි භාවිතය සමාජයීය ගෞරවයක් වශයෙන් ද සැලකුහ. මෙකී අභිනව සමාජ ස්තරය පිළිබඳ යථාර්ථය වික්‍රමසිංහ මෙසේ ප්‍රතිනිර්මාණය කරයි.

> "... ඇගේ මව වූ දනසූරිය මැතිනිය, උසස් පෙළපතකින් පැවත එන කාන්තාවකි. මැහුම් ගෙතුම් හා යුරෝපීය සිරිත් විරිත් හොඳින් දත් ඈ ඉංගිරිසියෙන් කතාබහ කිරීමෙහි ඉතා ශූර ය. ඈ ඉංගිරිසි ශබ්ද උච්චාරණය කළේ ඉංගිරිසි කාන්තාවක ලෙසිනි. නැටුම්, ගැයුම්, වැයුම් හොඳින් දත් ඇය සමග උරෙන් උර ගැටී නැටුම්, ගැයුම්, වැයුම් කළ හැකි එකියක් සිංහල කාන්තාවන් අතර නොවූවාය..." (වික්‍රමසිංහ 1925 : 20-21).

> "මට සිංහල හොඳට කියවන්ටත් බැහැ. තේරෙන්නෙත් නැහැ. පිඩිතුමාත් දැන් මේ ගැන කීප දවසක් ආවා. මේ රූපියල් පනහවත් අරගෙන යන්න... කියමින් වැන්ටික් දනසූරිය..." (වික්‍රමසිංහ 1925 : 41).

## නිගමනය

අභිනව සමාජය විවෘත සමාජ ලක්ෂණ ප්‍රකට කිරීමත් කාලයට සමගාමී ව සිදුවන සමාජ පරිවර්තනයේ සමාජීය පදනම වන ස්තරණ සාධක මත සංචලනය වීමත් හේතුවෙන් පූර්ව යටත්විජිත සමාජයට සාපේක්ෂ වශයෙන් කැපී පෙනෙන වෙනස්කම් ප්‍රකට කිරීමෙහි සමත් විය. මේ සමාජ විපරිවර්තනය තත්කාලීන සිංහල ප්‍රබන්ධ රචකයන්ගේ අවධානයෙන් බැහැර නොවූ අතර ප්‍රබන්ධගත සීමා ඇතුළත වුව ද යථාර්ථ ප්‍රතිනිර්මාණයෙහි ලා වූ ශක්‍යතාව ප්‍රකට කිරීමෙහි සමත් ආකාරය සමාජීය සාහිත්‍ය අධ්‍යයන න්‍යායට අනුව නිගමනය කළ හැකි ය. මෙරට ක්‍රියාත්මක වූ වැඩවසම් ක්‍රමය, යටත්විජිතභාවයෙහි ප්‍රතිඵලය ලෙස මූල්‍ය ආර්ථිකයක් වෙත විතැන් විය. මාක්ස්වාදී න්‍යායට අනුව සියලු සමාජ ගනුදෙනු හුදෙක් මුදල කේන්ද්‍ර කොට ගෙන සිදුවීමෙන් ධනේශ්වර සමාජයේ අභිනව සමාජ ස්තරණය හේතුවෙන් පන්ති ක්‍රමය බිහි විය. අනුජන අධ්‍යයන මාර්ගයට අනුව සමාජීය වශයෙන් බල රහිත ප්‍රජාව නියෝජනය කරන කුල හීන පුද්ගලයන්, වැටුප් ශ්‍රමිකයන්ගෙන් සමන්විත අනුජන සමාජ කුලකය ධනේශ්වරයේ නූතන සමාජ බලවේග හමුවේ තව දුරටත් ආන්තීකරණයට ලක් විය. මේ අනුව දහනව වන හා විසි වන සියවස්වල මෙරට සමාජ ව්‍යුහයේ ඇති වූ විපරිවර්තනය පිළිබඳ නූතන සිංහල ප්‍රබන්ධ රචකයන් සවිඥානක වූ ආකාරයත් එකී යථාර්ථය ප්‍රතිනිර්මාණය කිරීමෙහි උත්සුක වූ ආකාරයත් හඳුනා ගත හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය

### ප්‍රාථමික මූලාශ්‍රය

අභයරත්න, කේ. ඩී. ඒ. (1916) ශ්‍රී කාන්ත ශ්‍රී, කොළඹ, ප්‍රකාශක සඳහන් නොවේ.

කන්නන්ගර දේවගැතිතුමා, එච්. (1876) ග්‍රාම ප්‍රවෘත්තියක්, කොළඹ, ලංකා ආගමික ප්‍රචාරක සමිතිය.

කනකරත්න, ඒ. ද එස්. (1920) පියකරු ලිලියන් හෙවත් දියුණුවේ රහස, ජේ.සී. විමලසිරි සහ සමාගම.

කුරුකුලසූරිය, ඩී. පී. (1924) හිල්ඩා, ප්‍රකාශක සඳහන් නොවේ.

ගුණරත්න, ඊ. (1919) දීප්තිමතී, කොළඹ, පී.පී. ඩේවිඩ් සිල්වා.

ගුණවර්ධන, සේදිරිස්. (1912) ප්‍රේමවන්ත විවාහය හෙවත් වික්‍රමරත්න සහ ලිලියන්, ප්‍රකාශනය සඳහන් නොවේ.

ජයසේකර, ඩී. එස්. (1907) අධිෂ්ඨාන බලය හෙවත් මැගී, ප්‍රකාශනය සඳහන් නොවේ.

ජිනදාස, ඒ. ටී. සී. (1923) බද්ධ වෛරය හෙවත් නැන්දා සහ ලේලි, ප්‍රකාශනය සඳහන් නොවේ.

ජිනදාස, එන්. වී. ඩී. (1925) හේමකාන්තා හෙවත් පුදුම රාත්‍රී හතර, කොළඹ, ලංකාභිනව විස්තෘත මුද්‍රණාලය.

දල්පදාදු, සලොමන්. (1910) ලිසීගේ වාසනාව, ප්‍රකාශනය සඳහන් නොවේ.

ද සිල්වා, එල්. අයිසෙක්. (1888) 2009 වාසනාවන්ත පවුල හා කාලකණ්ණි පවුල, කොළඹ, වැස්ලියන් මිෂන් මුද්‍රණාලය.

ද සිල්වා, ඒ. සයිමන්. (1905) මීනා, කොළඹ, සිරි ලංකෝදය මුද්‍රණාලය.

නිස්සංක, පී. (1923) සමදරා, කොළඹ, ලක් සිතුමිණි මුද්‍රණාලය.

ධර්මබන්ධු, ටී. එස්. (1925) හේමකාන්තා, පානදුර, ස්ටාර් මුද්‍රණාලය.

පෙරේරා, එම්. සී. එෆ්. (1906) මගේ කරුමය, කොළඹ, සිංහල සමය මුද්‍රණාලය.

(1907) ලංකා අබිරහස්, කොළඹ, සිංහල සමය මුද්‍රණාලය.

(1908) මගේ පෙම්බරී, කොළඹ, සිංහල සමය මුද්‍රණාලය.



© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

(1908) ආලයේ ලීලය හෙවත් මළවුන් ජීවත්වීම, කොළඹ, ඇල්.ඇම්. ගුණරත්න සහ සමාගම.

බණ්ඩාරගේ, අශෝකා (2005) ශ්‍රී ලංකාවේ යටත්විජිතවාදය, පන්නිපිටිය, ස්ටැම්ෆර්ඩ්ලේක්.

බණ්ඩාර, නවරත්න ඒ. එම්. (2007). බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය,

කොළඹ, ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

රණසිංහ, ඩබ්ලිව්. ඒ. (1924) විවාහ නොවන්නේ ඇයි? කොළඹ, ලංකාභිවර්ධන විස්තෘත මුද්‍රණාලය.

රාජකරුණා, ආනන්ද. (1925) රහස් අනුශාසකයා හෙවත් වසන්තගේ දස්කම, කොළඹ, ආර්.ඒ. පෙරේරා.

වික්‍රමසිංහ, මාර්ටින්. (1925) මිරිඟුදිය, ප්‍රකාශනය සඳහන් නොවේ.

විමලනාථ, එන්. ජී. ඒ. (1918) තරුණියකගේ අන්තිම කැමැත්ත, කොළඹ, විද්‍යාදර්ශ

මුද්‍රණාලය.

සිරිසේන, පියදාස. (1909) අපට වෙච්ච දේ, ප්‍රකාශනය සඳහන් නොවේ.

(1919) විමලතිස්ස හාමුදුරුවන්ගේ මුදල් පෙට්ටිය, ප්‍රකාශනය සඳහන් නොවේ.

(1910) තරුණියගේ ප්‍රේමය, කොළඹ, සද්ධර්ම ප්‍රකාශන මුද්‍රණාලය.

(1918) ඩිංගිරිමැණිකා හෙවත් වික්‍රමපාලගේ පළමුවැනි වික්‍රමය,

සිල්වා, ඩබ්ලිව්.ඒ. (1909) සිරියලතා හෙවත් අනාථ තරුණිය, ප්‍රකාශනය සඳහන් නොවේ.

(1923) හිඟන කොල්ලා, කොළඹ, එන්.ජේ. කුරේ සහ ප්‍රකාශන.

(1924) පාසැල් ගුරුවරී, කොළඹ, එන්.ජේ. කුරේ සහ ප්‍රකාශන.

**ද්විතීය මූලාශ්‍රය**

උයන්ගොඩ, ජයදේව. (2000) 'ගේ ඇතුලේ මැද මිදුලේ : කුලය, සාධාරණත්වය සහ සමානත්වය පිළිබඳ ශ්‍රී ලංකාවේ දේශපාලන කතිකාව', ප්‍රවාද 6 කලාපය, කොළඹ, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

එංගල්ස්, ෆෙඩ්රික්. (අනු. දූදිගම වි. රුද්‍රිගු) (1979) පවුල, පෞද්ගලික දේපළ හා රජය ඇති වූ හැටි, මොස්කව්, ප්‍රගති ප්‍රකාශන මන්දිරය.

ගුණසිංහ, නිව්ටන්. (2011) තෝරාගත් ලිපි-1, සංස්කාරක, රංජිත් පෙරේරා, කොළඹ, සමාජ විද්‍යා)යින්ගේ සංගමය.

ජයවර්ධන, කුමාරි. (2006) සොක්කන් ලොක්කන් වූ වගයි. ශ්‍රී ලංකාවේ යටත්විජිත

ධනේශ්වරයේ නැගීම, කොළඹ, සමාජ විද්‍යා)යින්ගේ සංගමය.

දේවසිරි, නිර්මාල් රංජිත්. (1997) 'කුලය, පන්තිය හා ලාංකික සමාජය', ප්‍රවාද 13 කලාපය, කොළඹ, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය, (1969) සියවස ප්‍රකාශන 1995 සංස්කාරක යූ.ඩී.අයි. සිරිසේන, කොළඹ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

**English**

Alwis, D. James, (1939) Seneviratna, A.C. (ed.) Memories & Desultory Writings, (Reprint) The Ceylon Observer Press, Colombo.

Bandarage, Asoka. (1982) Colonialism in Ceylon, Colombo. Ceylon Blue Book. (1922)

Dictionary of the Social Sciences. (1964) New York. Free Press. Gunasinghe, Newton.

Gunasinghe, N. (1990) Changing Socio Economic Relations in the Kandyan Country Side, Colombo: Social Scientists Association.

International Journal of Economics & Business Administration (2013) Volume I, Issue 4.

Irudaya Rajan, S.; Sumeetha M. (ed.) (2020) Arup Mitra Rural Migrants with Urban Jobs SAGE Publications India Pvt. Ltd., New Delhi : India.

Kandiah, Tiru. (1978) Disinherited Englishes: the case of Lankan English. Conference on English in non-native, contexts, University of Illonois at Urbana Champaign, June 1978.

Mendis, G. C. (2005) Ceylon Under the British, New Delhi, Asian Educational Services.


© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

Rayan Bryce. (1953) Caste in Modern Ceylon, The Sinhala System in Transistion, New Jersy Rutgers University Press.

The Colebroke, Comeron Papers (1956) G.C. Mendis (Editor) The Commission of Eastern Inquire, London, Oxford University Press.

The New Encyclopedia Britannica (1990). Chicago : Chicago University Press.

Tumin, Melvin. (1967) Social Stratification, Tice Hall Wnglewood Cliffs, USA, Wiley, Blackwell Publishers.

Weber, Max. (1964) The theory of Social and Economic Organizations, The Free Press, New York.

Lexicons Dictionary of the Social Sciences. (1964) New York : Free Press.

The New Encyclopedia Britannica. (1964) Chicago : Chicago University Press.



© 2020 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
## එකොළොස්වන කලාපය - 2020 දෙසැම්බර්


ගෝලීය ත්‍රස්තවාදයේ ලංකාගමනය: ප්‍රචණ්ඩත්වයේ දේශපාලනය යළි වරනැගීම හෙවත් අප්‍රේල් 21 ට පසු ලංකාව 1-11
**ප්‍රියාන් ආර්. විජේබණ්ඩාර**

සිංහල හා දෙමළ වතු කම්කරුවන්ගේ ආර්ථික විෂමතාව පිළිබඳ ආර්ථික භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයක්: මාතර දිස්ත්‍රික්කයේ පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් 12-20
**කේ. පී. කේ. සඳමාලි**

ආයතනයක කාර්ය මණ්ඩලයේ පරිපාලන හැකියාව පාරිභෝගික තෘප්තියට ඇති කරන බලපෑම: ශ්‍රී ලංකාවේ මූල්‍ය සමාගමක සේවාලාභී පාරිභෝගිකයින් ඇසුරෙනි 21-30
**එම්. ටී. එස්. ඩී. කුරේ සහ එච්. එම්. එස්. ප්‍රියනාත්**

මිරිදිය වගුරු වනාන්තර පරිසර පද්ධති හායනය කෙරෙහි මානව ක්‍රියාකාරකම්වල බලපෑම: වලව්වේවත්ත වතුරාන වගුරු වනාන්තරය ආශ්‍රිත ජෛව භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයක් 31-39
**එස්. එච්. එස්. එම්. සිරිවර්ධන සහ ආචාර්ය පූජ්‍ය පින්නවල සංඝසුමන හිමි**

මිරිදිය මත්ස්‍ය විවිධත්වයේ අවකාශීය වෙනස කෙරෙහි බලපානු ලබන සාධක සහ සංරක්ෂණ අවශ්‍යතාව: ඉහළ කළු ගඟ ජල පෝෂක ප්‍රදේශයේ බලවනාව ඔය ආශ්‍රිත ව කරන ලද අධ්‍යයනය 40-53
**ජේ. පී. සී. ආර්. බී. නවරත්න සහ එම්. එස්. එම්. එල්. කරුණාරත්න**

ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් ව ශ්‍රී ලංකාවේ වැඩිහිටි ශ්‍රමිකයින්ගේ ඉපැයීම් සඳහා බලපාන සාධක පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනය 54-63
**පී. ජී.එන්. නිල්මිණී සහ ජී.ආර්.එස්.ආර්.සී. සමරවීර**

යටත්විජිත ලංකාවේ සමාජ ස්තරණය: නූතන සිංහල ප්‍රබන්ධ කතාව ආශ්‍රිත විමර්ශනයක් 64-76
**කුමුදු කරුණාරත්න රණවීර**



ISSN 1800-1459
eISSN 2673-1177